GROWTH WITHIN TRANSFORMATION

පරිවර්තනීය වර්ධනය

SLIC

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්

පියෙකු මෙන් මවක මෙන්

වාර්ෂික වාර්තාව 2021

GROWTH WITHIN TRANSFORMATION

පරිවර්තනීය වර්ධනය

මෙය ජාත්‍යන්තර හා ජාතික වශයෙන් අභියෝගාත්මක වසරක් වුවද, අපි සාමූහිකත්වය, සවිබලය සහ නායකත්වය පෙරදැරි කර ගනිමින් නොසැලෙන දැවැන්ත පවුරක් මෙන් රැඳී සිටියෙමු. අතීතයේදී ද අප විසින් සිදු කලාක් මෙන්, අපගේ ධෛර්යය අභියෝගයට ලක් විය හැකි වුවද, අග්‍රගන්‍ය අදහස් හඳුන්වාදීමේ පුරෝගාමීන් වශයෙන් නිසි පරිදි අනුගත වෙමින්ද අවැසි වෙනස්කම් සිදුකරමින්ද රක්ෂණ වපසරිය තුළ නිසැකවම වර්ධනය අත්පත් කරගැනීමට අපි කටයුතු කරන්නෙමු. අපගේ නව හඳුන්වාදීම් තුළින් අපගේ වටපිටාවෙහි තත්ත්වය ඉහළ නංවමින් අප විසින් ඉහතදී සකසන ලද ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඩිජිටල් දැනුම සහ හැකියාව ප්‍රශස්ත අයුරින් භාවිත කිරීමට ද අපි කටයුතු කලෙමු. අපගේ නිරවද්‍ය වූ සම්මතයන් පවත්වාගෙන යමින් පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කරන අතර, අනාගත අභියෝග ජය ගනිමින්, අපගේ ප්‍රජාව, ක්‍රියාවලීන් සහ එළඹෙන වසර ගණනාවක් සඳහා වන සැලසුම් පරිවර්තනීය වෙනසකට ලක් කරමින් සුවිශේෂී වර්ධනයක් අත්පත් කරගැනීමට අපි කටයුතු කරන්නෙමු.

පටුන

අප පිළිබඳව
4 - ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පිළිබඳව
6 - අධ්‍යක්ෂ මණ්ඩලය
12 - නියමු කණ්ඩායම
24 - සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමූහ ව්‍යුහය
26 - මූල්‍යමය විශේෂතා
28 - මූල්‍යමය නොවන විශේෂතා 2021

නියමු සමාලෝචනයන්
30 - සභාපතිවරයාගේ පණිවුඩය
33 - ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ පණිවුඩය

වාර්තාවේ ස්වභාවය
38 - වාර්තාවේ ස්වභාවය

ක්‍රමෝපාය සහ අවධානය
40 - ව්‍යාපාර ආකෘතිය
42 - ප්‍රාමාණික ගැටලු
43 - පාර්ශ්වකාර සබඳතා
45 - ක්‍රමෝපායික ප්‍රමුඛතා

කළමනාකාරිත්ව විචාරය
48 - මෙහෙයුම් වටපිටාව
49 - මූල්‍යමය ප්‍රාග්ධනය
54 - නිෂ්පාදිත ප්‍රාග්ධනය
58 - බුද්ධිමය ප්‍රාග්ධනය
62 - මානව ප්‍රාග්ධනය
70 - සමාජ හා සබඳතා ප්‍රාග්ධනය
85 - ස්වභාවික ප්‍රාග්ධනය

පාලන සහ අවදානම් විමර්ශනය
88 - ආයතනික පාලන වාර්තාව
92 - විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව
94 - ආයෝජන කමිටු වාර්තාව
96 - අවදානම් කළමනාකරණ වාර්තාව
107 - අනුකූලතා වාර්තාව
114 - අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය වාර්තා
116 - සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
120 - අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව
121 - ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ වගකීම පිළිබඳ ප්‍රකාශය
122 - රක්ෂණ සමාගමෙහි ආයුගණකවරයගේ සහතිකය
123 - වගකීම් ප්‍රමාණවත්තා පරීක්ෂාව
124 - දරන ලද නමුත් ප්‍රමාණවත් නොවන වාර්තාගත හිමිකම්පෑම් පිළිබඳ සහතිකය
125 - ස්වාධීන විගණකවරුන්ගේ ප්‍රකාශය
128 - මූල්‍යමය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය
130 - ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
132 - ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
138 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය
140 - ආංශික විමර්ශනය : මූල්‍යමය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය
142 - අංශික විමර්ශනය : ආදායම් ප්‍රකාශය
144 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

අනුශාංගික තොරතුරු
270 - ජීවිත රක්ෂණය පිළිබඳ මූල්‍යමය ස්ථාවරත්ව වාර්තාව
271 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල
276 - දස වසරක් සාරාංශ ආදායම් ප්‍රකාශය
278 - දස වසරක සාරාංශ ශේෂ පත්‍රය - සමූහය
280 - දස වසරක සාරාංශ ශේෂ පත්‍රය - සමාගම
284 - ශාඛා ජාලය
293 - ආයතනික තොරතුරු
294 - වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම
295 - සටහන්
297 - ලියාපදිංචි වීමේ පෝරමය
299 - පෙරකලාසි පෝරමය

මෙම වාර්ෂික වාර්තාව බැලීමට ස්කෑන් කරන්න
වෙබ් සබැඳිය https://www.srilankainsurance.com/en/about-us/annual-reports

අප පිළිබඳව

4 - ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පිළිබඳව
6 - අධ්‍යක්ෂ මණ්ඩලය
12 - නියමු කණ්ඩායම
24 - සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමූහ ව්‍යුහය
26 - මූල්‍යමය විශේෂතා
28 - මූල්‍යමය නොවන විශේෂතා 2021

GROWTH

වර්ධනය

අපි පර්වර්තනීය ක්‍රියාවලියක් ඔස්සේ වර්ධනය යන්න නිර්වචනය සහ යථාකරණය සිදු කරන්නෙමු.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පිළිබඳව

SLIC

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්

පියෙකු මෙන් මවක මෙන්

ශ්‍රී ලංකාවේ ජාතික රක්ෂණ සේවා සම්පාදකයා සහ මෙරට රක්ෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියා වශයෙන්, දශක ගණනාවක ක්ෂේත්‍රයේ විශේෂඥභාවය සහ මෙරට රක්ෂණ ක්ෂේත්‍රයේ වඩාත්ම පළපුරුදු තාක්ෂණික දැනුම් පදනම සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතු වේ.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ අභිවෘද්ධිය කෙරෙහි පෙරමුණ ගෙන කටයුතු කිරීමේ සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි දීර්ඝ වූ ඉතිහාසය තුළ, රු.බිලියන 39.5 ක විශාලතම හිමිකම්පෑම් ගෙවීම සහ සිය රක්ෂණ ඔප්පු හිමියන් වෙත රු. බිලියන 9.8 ක විශාලතම ප්‍රසාද දීමනා ගෙවීම වැනි සන්ධිස්ථාන රැසක් සනිටුහන් වේ. සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි සමස්ත වත්කම් රු. බිලියන 268 කින් සමන්විත වන අතර ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයෙහි රු.බිලියන 75 ක විශාලතම කොටස් හිමිකාර අරමුදල සහ රු.බිලියන 152.5 ක ඉහළම ජීවිත අරමුදලද සංස්ථාව සතු වේ.

වසරින් වසර ස්වකීය සේවා ව්‍යාප්තිය සහ සේවා තත්ත්වය ඉහළ නංවනු ලබන පසුබිමක් තුළ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් ශ්‍රී ලාංකේය ජනතාවගේ විශ්වසනීය රක්ෂණය වශයෙන් අභිමානනීය මෙහෙවරක් ඉටු කරනු ලබයි.

අපගේ දැක්ම

අප විසින් අපේක්ෂා කරනු ලබන සේවා විශිෂ්ටත්වය?

අපගේ දැක්ම

- අවදානම් සුරක්ෂිතතාව සහ ජීවිත රක්ෂණ ආයෝජනයන් ප්‍රශස්තීකරණයෙහි ජාතියේ පළමු තේරීම බවට පත්වීම

අපගේ මෙහෙවර

අප විසින් ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන්නේ කවර අරමුණක් උදෙසාද?

අපගේ මෙහෙවර

- අපගේ සේවාලාභීන් වෙත වටිනාකම් එක් කරමින් අවදානම් සුරක්ෂිතතාව සහ ජීවිත රක්ෂණ ආයෝජනයන් ප්‍රශස්තීකරණය සිදු කරනු ලැබේ.
- අප විසින් ඔවුන්ගේ විශිෂ්ට දායකත්වය හඳුනාගනු ලබන සහ ඇගයුමට ලක් කරන්නා වූ සේවයට ඇපකැප වූ වෘත්තික කණ්ඩායමක් ඔස්සේ
- එමගින් වගකීම් සහගත ආයතනික පුරවැසියකු වශයෙන් අති විශිෂ්ට වූ කොටස් හිමිකාර වටිනාකමක් නිර්මාණය කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

1. ඉංජිනේරු විජිත හේරත්
සභාපති

2. අනිල් කොස්වත්ත මහතා
අධ්‍යක්ෂ

3. එම්.පී. අනිල් කුමාර මහතා
අධ්‍යක්ෂ

4. ජේ සුරේකා අලස් මිය
අධ්‍යක්ෂ

5. එස්. ඒ. නිශාන්ත දයානන්ද මහතා
අධ්‍යක්ෂ

6. ආර්. ඒ. ලක්මිණි උදයකුමාර මහතා
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩලය

1. ඉංජිනේරු විජිත හේරත්
සභාපති

කීර්තිමත් වෘත්තීයවේදියකු වන ඉංජිනේරු විජිත හේරත් 2021 අගෝස්තු 03 වැනි දින සභාපතිවරයා වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමග සම්බන්ධ විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග සම්බන්ධ වීමට පෙර හෙතෙම ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් (2019 සිට 2021 දක්වා) සේවය කලේය.

වසර 2012 දී ශ්‍රී ලංකාව තුළ සාර්ථක ඉදිකිරීම් සමාගමක් අරඹන ලද ඉංජිනේරු හේරත් සතු ආයතනික පළපුරුද්ද දෙස් විදෙස් සමාගම් රැසක් පුරා විහිදේ. ඛණිජ තෙල් සහ ගෑස් සම්බන්ධ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ විශේෂඥභාවයක් උසුලන ඒ මහතා සව්දි අරාබියේ අක් වෙරළ ව්‍යාපෘතීන්හි (2003 - 2005 සහ 2009 - 2012) සේවයේ නිරත විය. ඉංජිනේරු ශිල්පය පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයකු වන ඒ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික තත්ත්වයන් මත පදනම් වූ රසායනික ඉංජිනේරු ශිල්පය පිළිබඳ විශේෂවේදී උපාධියක් හිමි කොට ගෙන ඇත. හෙතෙම කුරුණෑගල මලියදේව විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයෙකි.

හේරත් මහතා ටායිසේ ඇන්ඩ් මිට්සුබිෂි (Taisei & Mitsubishi) සහයෝගීතා ව්‍යාපෘතියෙහි ද සව්දි ආරාබියේ අල් බදාර් සමාගමෙහි (Al Bader Est.) ද (2003 සිට 2005) ඉන්දු ඊස්ට් ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගමෙහි ද (1999 සිට 2003 දක්වා) යාන්ත්‍රික ඉංජිනේරුවරයා වශයෙන් කටයුතු කලේය. තවද, හෙතෙම Lavinia Beach Resort හි අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කලේය. ඒ මහතා Abans Engineering and Central Air Conditioning හි ඉංජිනේරු කළමනාකරු (2007 සිට 2009 දක්වා) වශයෙන්ද සේවය කලේය.

හේරත් මහතා සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සහ සීමාසහිත ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා යන සමාගම් වල හිටපු සභාපති ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් ද කටයුතු කරයි.

2. අනිල් කොස්වත්ත මහතා
අධ්‍යක්ෂ

සීමාසහිත ලිට්රෝ ගෑස් ලංකා සහ සීමාසහිත ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා යන සමාගම් වල හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් (2020 ජනවාරි 26 වැනි දින සිට 2021 ජූලි 15 වැනි දින දක්වා) කටයුතු කල අනිල් කොස්වත්ත මහතා සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වේ.

සුප්‍රකට විකිණුම් සහ අලෙවි වෘත්තිකයකු වන කොස්වත්ත මහතා, ලකාර්කේඩ් පුද්ගලික සමාගමෙහි නිර්මාතෘ මෙන්ම එහි ප්‍රධාන විධායක සහ කළමනාකාර අධ්‍යක්ෂ යන ධූරයන් හොබවයි. ප්‍රමුඛ බහුජාතික සමාගමක් වන නෙස්ලේ ලංකා හි වසර 25 කට අධික අලෙවි සහ ක්‍රමෝපායික අත්දැකීම් ඒ මහතා සතු වේ. තවද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය ඇතුලු රාජ්‍ය අංශයේ ආයතන රැසක් තුළ වසර 15 ඉක්මවූ වෘත්තීය පළපුරුද්ද කොස්වත්ත මහතා සතු වේ. හෙතෙම මහාචාර්ය පී.එල්. පීරිස් - ආර්ථික සංවර්ධන, අපනයන සංවර්ධන සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ කැබිනට් ඇමතිවරුන් වෙත උපදේශකවරයකු වශයෙන් ද කටයුතු කොට ඇත.

ඒ මහතා වරලත් කළමනාකරණ ආයතනයෙහි සහ වරලත් අලෙවිකරණ ආයතනයෙහි අධිසාමාක සාමාජිතයකු වන අතර තරුණ ලාංකීය ව්‍යවසායකයින්ගේ ආයතනයෙහි (COYLE) පුරෝගාමී සාමාජිකයෙකි.

3. එම්.පී. අනිල් කුමාර මහතා
අධ්‍යක්ෂ

අනිල් මීගහගේ මහතා ඊඒපී හෝල්ඩින්ග්ස් හි විධායක උප සභාපති/ප්‍රධාන විධායක නිලධාරී සහ ඊබීසී ටීවී/රේඩියෝ/ඊඒපී ෆිල්ම්ස් යන සමාගම් වල අධ්‍යක්ෂ ධූරයන්හි කටයුතු කලේය. අනිල් මහතා ස්වර්ණවාහිනී සහ ඊටීවී ආයතනයන්හි අධ්‍යක්ෂවරයකු/ප්‍රධාන විධායක නිලධාරීවරයකු වේ. හෙතෙම ශ්‍රී ලංකාවේ සැම්සුන් මොබයිල් හි දේශීය කළමනාකාරවරයා විය. ඉහතදී, හේමාස් කන්සියුමර් ගුඩ්ස් හි ශ්‍රී ලාංකේය සහ ජාත්‍යන්තර ව්‍යාපාර කටයුතු පිළිබඳ විකිණුම් අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කලේය.

ඔහු විසින් සෘජුවම විකිණුම් මෙහෙයුම්, බෙදාහැරීම්, පාරිභෝගික අලෙවිකරණය, ජාත්‍යන්තර ව්‍යාපාර සහ විකිණුම් කළමනාකරණ කණ්ඩායම කළමනාකරණය කරන ලදී. විකිණුම් කළමනාකරණ ක්‍රියාවලිය යටතේ 265 ක සවිමත් විකිණුම් කණ්ඩායමක් සහ බෙදාහරින්නන් එකසිය අටක් ආවරණය වේ. එමෙන්ම ඔහු විසින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් ශාඛා ජාලය, විකිණුම් සහ අලෙවි, පුහුණු, විකිණුම් සහායක ඒකක සහ සාමාජිකයින් 5000 කින් සැදුම්ලත් අලෙවි කණ්ඩායම සහ 1200 ක කාර්යය මණ්ඩලය අධීක්ෂණය කරමින් මෙරට විශාලතම අලෙවි කණ්ඩායමක් වෙත නායකත්වය සපයන ලදී. යුනිලීවර් වසර විස්සකට අධික ආයතනික පළපුරුද්දක් අනිල් මහතා සතු වේ. 1988දී යුනිලීවර් සමග එක් වූ ඔහු අලෙවි විධායක, අලෙවි පරිපාලන කළමනාකරු, ප්‍රාදේශීය අලෙවි කළමනාකරු වසශයෙන් කටයුතු කරමින් ගෘහ සහ පෞද්ගලික සත්කාරක කාණ්ඩයේ වෙළඳ කාණ්ඩ කළමනාකරු වශයෙන් කටයුතු කළේය. වියෙට්නාම් යුනිලීවර් හි සේවය කිරීමෙන් අනතුරුව ඒ මහතා ගෘහ සහ පෞද්ගලික සත් සත්කාරක කාණ්ඩයේ චැනල සංවර්ධන සහ වෙළඳ අලෙවි කළමනාකරු බවට පත්වූ අතර යුනිලීවර් ශ්‍රී ලංකා හි ඖෂධ සහ රූප රූපලාවන්‍ය චැනලය භාරව කටයුතු කළේය.

මේ වන විට, හෙතෙම කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාග මෙහි සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි. වෘත්තීයමය වශයෙන්, මීගහගේ මහතා ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයකු වන අතර එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයෙහි අලෙවිකරණය සම්බන්ධ වෘත්තීය පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ඔහු සතු වේ. මේ වන විට ඒ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ සිය ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයන කටයුතු වල නිරත වේ. මීගහගේ මහතා සතුව වරලත් අලෙවිකරණ ආයතනයෙහි සහ වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයින්ගේ ආයතනයෙහි දේශකයකු වසර 18 කට අධික අත්දැකීම් පවතී.

4. ජේ. සුරේඛා අලස් මිය
අධ්‍යක්ෂ

රක්ෂණ ක්ෂේත්‍රයේ වසර තිස් පහකට අධික අත්දැකීම් සහිත සුරේඛා අලස් මහත්මිය ක්ෂේත්‍රය තුළ ජේෂ්ඨ තනතුරු රැසක් හොබවා ඇත. ජාතික රක්ෂණ සංස්ථාවෙන් සිය රක්ෂණ වෘත්තිය ජීවිතය ඇරඹූ ඇය යුනියන් ඇෂුවරන්ස් සමාගම ආරම්භයේ දී විධායක නිලධාරිනියක් ලෙස සේවයට එක් වෙමින් සාමාන්‍ය රක්ෂණ අංශයෙහි සහකාර සාමාන්‍යාධිකාරිනිය බවට පත්වූවාය. පසුව අලස් මහත්මිය සහකාර සාමාන්‍යාධිකාරිනිය වශයෙන් එම සමාගමේ ක්‍රමෝපායික කළමනාකරණ ඒකකයට නායකත්වය ලබා දුන්නාය.

වසර 2005 දී ඒ මහත්මිය සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් ප්‍රධානි වශයෙන් සීමාසහිත ඇලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම සමග එක්වූ අතර වසර 2005 දී එහි ප්‍රධාන විධායක නිලධාරිනිය වශයෙන්ද 2008 දී ඇලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරිනිය වශයෙන්ද පත් වූවාය. 2010 ජූනි මාසයේදී එතුමිය ඇලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා සමාගමෙහි සහ ඇලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කෙරුනු අතර 2017 දී එහි කළමනාකාර අධ්‍යක්ෂවරිය බවට පත් වූවාය.

වරලත් රක්ෂණ වෘත්තිකයකු වන සුරේඛා අලස් මහත්මිය ලන්ඩන්හි වරලත් රක්ෂණ ආයතනයෙහි අධිසාමාක සාමාජිකාවක වේ. ඇය ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත රක්ෂණ හා මූල්‍ය ආයතනයෙහි ජ්‍යෙෂ්ට සාමාජිකාවකි. බටහිර සිඩ්නි විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් එතුමිය සතු වේ. අලස් මහත්මිය විසින් 2019 දී 'Woman Super Achiever Award' ද 2018 දී 'Women Icon of the Year' සම්මානයද 2017 දී 'CEO of the Year' සම්මානය සහ 2016 දී 'Career Role Model of the Year' සම්මානයද ඇතුලු සම්මාන රැසක් දිනා ගන්නා ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය

5. එස්. ඒ. නිශාන්ත දයානන්ද මහතා
අධ්‍යක්ෂ

වසර 18 ක විශිෂ්ට නීතිඥ වෘත්තික ජීවිතයක් සහිත නිශාන්ත දයානන්ද මහතා කීර්තිමත් නීතිවේදියෙකි. මලියදේව විද්‍යාලයේ ආදි සිසුවකු වන ඒ මහතා වසර 1999 දී කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධිය හිමි කර ගත්තේය. 2001 දී ඒ මහතා ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිඥ වරම් ලැබීය.

අධ්‍යයන කටයුතු සම්බන්ධ විශිෂ්ටයකු වූ හෙතෙම මාවතගම මධ්‍ය මහා විද්‍යාලයෙන් 5 වසර ශිෂ්‍යත්වය සමත්ව කුරුණෑගල මලියදේව විදුහලට ඇතුළත් වී ඉන් අනතුරුව සරසවි වරම් ලැබීය. සිය චරිතය 'සමබර වූ ජීවිතය' යන සංකල්පය ඔස්සේ හැඩගස්වා ගත් ඒ මහතා විදුහලේ කැඩෙට් කණ්ඩායමට නායකත්වය ලබාදෙමින් හර්මන් ලූස් අභියෝගතා කුසලානය නියෝජනය කලේය.

තවද, ඔහු ජාතික මට්ටමේ කීර්තිමත් වොලිබෝල් ක්‍රීඩකයකු ද වේ. නීති පීඨයේ ගත කල කාලය තුළ දයානන්ද මහතා සිසුන්ගේ යහපැවැත්ම උදෙසා විවිධ ව්‍යාපෘතීන් දියත් කරමින් ශිෂ්‍ය සංගම් සාමාජිකයකු වශයෙන් සිසුනට මගපෙන්වීමද සිදු කලේය. ප්‍රකට නීතිවේදියකු වශයෙන් නායකත්ව ගුණාංග විදහා දැක්වූ හෙතෙම සිය නීති සංගම් ක්‍රිකට් කණ්ඩායෙමහි තුන් ඉරියව්වෙන්ම කැපී පෙනෙන ක්‍රීඩකයකු වශයෙක් දස්කම් දැක්වීය. ඒ මහතා 2017 -2018 කාලසීමාවේදී ගල්කිස්ස නීතිඥ සංගමයෙහි උප සභාපතිවරයා වශයෙන් කටයුතු කලේය. හෙතෙම කැනෝවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගමෙහි සභාපතිවරයා ද වේ.

6. ආර්. ඒ. ලක්මිණි උයද කුමාර මහතා
අධ්‍යක්ෂ

මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරන උයද කුමාර මහතා, ප්‍රධාන පෙලේ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ව්‍යවසායන් අධීක්ෂණය කරමින් මහා භාණ්ඩාරයේ වසර 12 කට අධික අත්දැකීම් සපුරා ඇත. ඒ මහතා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලය, පොල් පර්යේෂණායතනය, කුරුණෑගල වැවිලි සමාගම, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය ඇතුලුව විවිධ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ව්‍යවසායක්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් සේවය කොට ඇත. මේ වන විට ඒ මහතා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, බුද්ධශාසන අරමුදල සහ සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන් සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් සේවය කරයි.

මූල්‍ය කළමවනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජයවර්ධනපුර සරසවියෙන් ප්‍රථම උපාධිය ලද හෙතෙම මූල්‍යමය ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ විශේෂ උපාධිධරයෙකි. ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙම් අධිසාමාක සාමාජිකයෙකි. ඔහු කෙටි කාලීන උපදේශකවරයකු වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවෙහි සේවය කරමින් වොෂින්ටන් ඩීසී හි ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයේ ප්‍රාග්ධන වෙළඳපොල වැඩසටහනද සම්පූර්ණ කලේය. එයට අමතරව, හෙතෙම කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජ විෂය සම්බන්ධ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද හිමිකර ගෙන ඇත.

7. ඩබ්ලිව්. ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ

රාජ්‍ය අංශයේ වසර 28 කට අධික අත්දැකීම් සහිත සමන්ත උපනන්ද මහතා කීර්තිමත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වෘත්තිකයෙකි. වසර 1992 දී රජයේ ගණකාධිකාරී සේවයට එක් වූ හෙතෙම මහා භාණ්ඩාගාරය, ජනාධිපති ලේකම් කාර්යලය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඇතුලු විවිධ වූ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු විය. 2021 ජනවාරි 01 වැනි දින ඒ මහතා මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බවට පත් විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දෙවන පංතියේ විද්‍යාවේදී විශේෂ (ව්‍යාපාර පරිපාලන) උපාධිධරයකු වන උපනන්ද මහතා තොරතුරු තාක්ෂණය සම්බන්ධ විද්‍යාපති (MSc in IT) උපාධිධරයෙකි. ඒ මහතා කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව, E-Government ඩිප්ලෝමාව සහ පද්ධති සුරක්ෂිතතා පාලන සහ විගණන ඩිප්ලෝමාවද (DISSCA) සම්පූර්ණ කොට ඇත.

මෙයට අමතරව, සමන්ත උපනන්ද මහතා එක්සත් රාජධානියේ රාජ්‍ය මූල්‍ය සහ ගිණුම් ආයතනයෙහි වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයෙහි (CPFA) සාමාජිකත්වය හොබවයි. හෙතෙම ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙහි (FCMA) සහ රාජ්‍ය මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකාරී ආයතනයෙහි (FPFA) අධිසාමාක සාමාජිකයෙකි.

නියමු කණ්ඩායම

1. චන්දන එල්. අලුත්ගම මහතා
ප්‍රධාන විධායක නිලධාරී

අලුත්ගම මහතා වසර 2018 දී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන විධායක නිලධාරී ධූරයේ වැඩ භාර ගත්තේය. රක්ෂණ ක්ෂේත්‍රයේ විවිධ අංශයන්හි වසර 29 කට අත්දැකීම් ඒ මහතා සතු වේ. සිය වෘත්තීය ජීවිතය තුළ, හෙතෙම ඊගල් රක්ෂණ සමාගම සහ එච්එන්බී ඇෂුවරන්ස් සමාගම වැනි ආයතන රැසක ජ්‍යෙෂ්ට නිලයන් හොබවා ඇත.තවද, ඔහු විසින් සිය රක්ෂණ වෘත්තික ජීවිතයට අමතරව දෙස් විදෙස් සංගම් රැසක ද ධූරයන් දරන ලදී. අලුත්ගම මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් සේවය කොට ඇත. කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂවේදී උපාධිධරයකු සහ කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී උපාධිධරයකු වන ඒ මහතා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ අධිසාමාක සාමාජිකයෙකි. දේශීය හා විදේශීය සම්මන්ත්‍රණයන්හිදී රක්ෂණ සහ බෑන්ක් ඇෂුවරන්ස් සම්බන්ධයෙන් පර්යේෂණ නිබන්ධන ඉදිරිපත් කොට ඇති ඒ මහතා ඔස්ට්‍රියාවේ වියෙනාහි ජෙනරලි ඉන්ෂුවරන්ස් ඒපී සහ සිංප්පූරුවේ NUS ව්‍යාපාර විද්‍යාලය ඇතුලුව දෙස් විදෙස් පුහුණු වැඩසටහන් රැසකටද හෙතෙම සහභාගී විය. මෙම ධූරයට පත්වීමට පෙරාතුව අලුත්ගම මහතා එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ ප්‍රධාන නිලධාරීවරයා වශයෙන් කටයුතු කලේය.

2.ආලෝක ජයවර්ධන මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී

තොරතුරු තාක්ෂණය, ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය සහ ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධ වෘත්තීය විධායක නිලධාරියකු වන ආලෝක ජයවර්ධන මහතා සතුව විදුලි සංදේශ, නිෂ්පාදන, අලෙවි සහ බෙදාහැරීම්, මෘදුකාංග, ප්‍රාග්ධන වෙළඳපොල සහ රක්ෂණ ක්ෂේත්‍රයන්හි වසර 20 කට අධික අත්දැකීම් පවතින අතර වසර 2020 සිට හෙතෙම කළම්බු ඩොක්යාර්ඩ් සමාගමෙහි අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි.

ඒ මහතා අයර්ලන්තයේ ඩබ්ලින් විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ තොරතුරු පද්ධති සම්බන්ධ සිය විද්‍යාවේදී උපාධියද ඕස්ට්‍රේලියාවේ සදර්න් ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී උපාධියද හිමි කර ගත්තේය. තවද ඔහු විසින් ජාතික ව්‍යාපාර පරිපාලන ආයතනයෙන් පරිගනක අධ්‍යයනය සම්බන්ධ උසස් ඩිප්ලෝමාවද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙන් ව්‍යාපාර සම්බන්ධ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද හිමි කර ගන්නා ලදී.

හෙතෙම ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ PMP සහතික ලත් ව්‍යාපාර කළමනාකරුවකු වන අතර ඇමරිකා එක්සත් ජනපදයේ ISACA හි CISM සහතික ලත් තොරතුරු සුරක්ෂිතතා කළමනාකරුවෙකි. තවද, ඒ මහතා SAP සහතික ලත් අලෙවි සහ බෙදාහැරීමේ උපදේශකවරයෙකි. මේ වන විට ජයවර්ධන මහතා ශ්‍රී ලංකා SAP භාවිත කරන්නන්ගේ කණ්ඩායමෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් සිය දායකත්වය සපයයි. ඒ මහතා ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රය ආශ්‍රිත PMI Colombo Chapter හි සාමාජිකයකු වන අතර ඔහු තොරතුරු සුරක්ෂිතතාව ආශ්‍රිත ශ්‍රී ලංකා ISACA චැප්ටර් හිද සාමාජිකයකු වේ.

3. ප්‍රියන්ත පෙරේරා මහතා
ප්‍රධාන නිලධාරී - සාමාන්‍ය රක්ෂණ

ප්‍රියන්ත පෙරේරා මහතා 2021 සැප්තැම්බර් 01 වැනි දින සාමාන්‍ය රක්ෂණ ප්‍රධාන නිලධාරීවරයා වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමග සම්බන්ධ විය. ක්ෂේත්‍රයේ වසර 35 කට අධික සේවා අත්දැකීම් සහිත ඒ මහතා සාමාන්‍ය රක්ෂණ සම්බන්ධ පුලුල් පරිචයක් සහිත වෘත්තිකයෙකි.

1985 දී සීමාසහිත මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගමෙහි රක්ෂණ අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ඇරඹී හෙතෙම, ක්ෂේත්‍රයේ බහුවිධ සමාගම් වල වගකීම් සහගත තනතුරු රැසක් හොබවා ඇත. ස්වකීය විශිෂ්ට සේවා දිවිය තුළ ඒ මහතා ප්‍රාරක්ෂණය, හිමිකම්පෑම්, ප්‍රතිරක්ෂණ සහ සැලසුම් කළමනාකරණය සම්බන්ධ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව ධූරයන් රැසක් දරන ලද අතර ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමග සම්බන්ධ වීමට පෙරාතුව ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන තාක්ෂණික නිලධාරීවරයා වශයෙන් කටයුතු කලේය. වරලත් රක්ෂණ වෘත්තිකයකු වන හෙතෙම එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයෙහි සහයෝගීතා සාමාජිකත්වය උසුලයි.

4. දයාරත්න පෙරේරා මහතා
වැඩ බලන ප්‍රධාන නිලධාරී - ජීවිත රක්ෂණ

දයාරත්න පෙරේරා මහතා වසර 1998 දී කළමනාකරණ පුහුණු නිලධාරියකු වශයෙන් ජනශක්ති ඉන්ෂුවරන්ස් සමගින් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කලේය. කොළඹ විශ්ව විද්‍යාලයෙන් භෞතික විද්‍යාව සම්බන්ධ දෙවන පංතියේ (ඉහළ) විශේෂ විද්‍යාවේදී උපාධියක් ඔහු සතු වේ. උපාධිය ලබාගැනීමෙන් අනතුරුව හෙතෙම සහාය කථිකාචාර්යවරයකු වශයෙන් සේවයට එක්වූ අතර සිය අභිමතය පරිදි එම ධූරයෙන් ඉවත්ව ආයතනික ක්ෂේත්‍රය සමග සම්බන්ධ විය.

වරලත් රක්ෂණ වෘත්තිකයකු වන ඒ මහතා ලන්ඩන්හි වරලත් රක්ෂණ ආයතනයෙහි අධිසාමාක සාමාජිකයෙකි. හෙතෙම ඔස්ට්‍රේලියානු හා නවසීලන්ත රක්ෂණ ආයතනයෙහිද අධිසාමාක සාමාජිකයෙකි. ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් සිය ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හිමි කර ගත්තේය.

මේ වන විට හෙතෙම සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂවරයකු වශයෙන් ද සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි විශේෂිත නිලධාරී - ජීවිත රක්ෂණ වශයෙන් ද කටයුතු කරයි. ඒ මහතා ශ්‍රී ලංකා රක්ෂණ සංගමයෙහි ජීවිත රක්ෂණ සංසදයේ සභාපතිවරයා ද වේ.

5. මාලක බණ්ඩාර මහතා
වැඩ බලන ප්‍රධාන මූල්‍ය නිලධාරී

විගණන සහ මූල්‍ය ක්ෂේත්‍රයන්හි වසර 22 කට අධික අත්දැකීම් බණ්ඩාර මහතා සතු වේ. හෙතෙම වසර 2007 දී ගණකාධිකාරීවරයකු වශයෙන් සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමග සම්බන්ධ වූ අතර පිළිවෙලින් වසර 2012 දී සහ 2018 දී සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය යන නිලයන් වෙත උසස්වීම් ලබා ගත්තේය. ඒ මහතා 2021 නොවැම්බර් මස සිට වැඩ බලන ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා වශයෙන් කටයුතු කරයි.

2017 සිට 2019 දක්වා සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගමෙහි අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කල බණ්ඩාර මහතා 2020 සිට සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් සමාගමෙහි සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි.

ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ ගිණුම්කරණය සම්බන්ධ විද්‍යාවේදී උපාධිධරයකු වන බණ්ඩාර මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි. ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි අධිසාමාක සාමාජිකයකු වන ඒ මහතා කීර්තිමත් විගණන ආයතනයක් වන අර්න්ස්ට් ඇන්ඩ් යංග් මගින් සිය මූලික වෘත්තීය අත්දැකීම් ලබා ඇත.

නියමු කණ්ඩායම

1. සුරේෂ් පරණවිතාන මහතා
ප්‍රධාන නිලධාරී - ජීවිත රක්ෂණ
FCII, MBA, DipM, FCIM, MI Mgt, CMA (Aus)
(2021/05/11 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය)

2. රුවන්ති ගුණරත්න මිය
ප්‍රධාන නිලධාරිනී - සාමාන්‍ය රක්ෂණ
FCII (UK), වරලත් රක්ෂණ වෘත්තික
(2021/06/16 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය)

3. මාලනී තෙන්නකෝන් මිය
ප්‍රධාන මූල්‍ය නිලධාරිනී
MBA, FCA (SL), CPA (Aus), CIMA (UK)
(2021/11/24 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය)

4. රුක්මන් වීරරත්න මහතා
ප්‍රධාන නිලධාරී - ව්‍යාපාර සංවර්ධන
ACIM
(2021/09/01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්

1. තනූජා හිඟුලගේ මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - සාමාන්‍ය රක්ෂණ
BSc (Hons), FCII (UK),
වරලත් රක්ෂණ වෘත්තික, ANZIIF (Fellow) CIP
(2021/08/31 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් විය)

2. බී. ඒ. රුවනි ධර්මවර්ධන මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - අනුකූලතා සහ අවදානම්
LLB (Hons), Attorney-at-Law, MBA (UK), ACISI (UK)

3. වෛද්‍ය ෂෙරිකා ප්‍රනාන්දු මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - වෛද්‍යමය
MBBS (SL), MSc -Community Medicine (SL), ACII (UK), MRCGP (INT) (UK)

4. ලලිත් ද සිල්වා මහතා
බෙදාහැරීමේ ප්‍රධානි - සාමාන්‍ය රක්ෂණ
මූල්‍ය සහ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි

5. රෝහිත අමරපාල මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සහ සේවක සබඳතා
Chartered Fellow CIPM, FCMI (UK), MBA (University of Western Sydney, Australia)

6. නාමලී ඒ. සිල්වා මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - අලෙවි සහ බෙදාහැරීම් (ජීවිත රක්ෂණ)
MCIM (UK), Chartered Marketer, Prof Dip in Marketing – CIM, ACIB (UK), MBA

7. චමින්ද ගුණසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන
BB Mgt (Accountancy) Sp (Hons), FCA, ACMA, MBA – Finance, (Colombo)

8. සරත් ප්‍රනාන්දු මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෝටර්
BSc Eng (Mechanical) Sp, AMIE (SL)

නියමු කණ්ඩායම

සහකාර සාමාන්‍යාධිකාරීවරුන්

1. චමින්ද ආතාවුද මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ජීවිත රක්ෂණ (තාක්ෂණික)
BSc (Hons), FCII, AIII, ANZIIF (Fellow) CIP, MBA (Colombo), වරලත් රක්ෂණ වෘත්තික

2. රොෂාන් කොලාස් මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - බෑන්ක් ඇෂුවරන්ස්, විකල්ප බෙදාහැරීම් සහ ව්‍යාපාර රදවාගැනීම් (සාමාන්‍ය රක්ෂණ)
MBA, CMA (Aus), Dip in Marketing (SLIM), MSLIM, FCPM, MIM (SL)

3. මහේන්ද්‍ර සිල්වා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - පරිපාලන
Attorney-at-Law, LLB (SL), MBA in HRM (OUSL), PG. Dip in HRM, NDES, MIIE (SL), I ENG, AMCIPM (SL)

4. සුදත් නිශාන්ත මහතා*
සහකාර සාමාන්‍යාධිකාරී - ජාතික බෙදාහැරීම් (ජීවිත රක්ෂණ)
MLRHRM (UOC), Pg. Dip. in Labour Relations & HRM, BSc. (B/Admin.) (Sp.), LIMRA (USA), AMTC [USA], MIM (SL)

5. ප්‍රියවංශ දේශප්‍රිය මහතා
අභ්‍යන්තර විගණන ප්‍රධානි
FCA, BCom (Sp), FCMA

6. ජගත් වෙල්ගම මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - විකිණුම් සහායක සේවා සහ නියෝජිත ආයතන පරිපාලන
MBA, MABE (UK), GD in Mgt. (Aus), PG Dip. – Mkt Mgt (USJP), Ad. Dip in Mkt. Mgt. (USJP), Dip. in Mass Com. (USJP), Dip. in NIT, Licentiate – III, MSLIM

7. ජීවන්ත වැලිහිඳ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු සේවා
BSc (Eng)

8. සතික වික්‍රමසිංහ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණ
BSc (Hons) – MMU (UK), MBA (Cardiff), MBCS

*(නිශාන්ත මහතා 2022 දෙසැම්බර් 31 දින දක්වා බෙදාහැරීමේ ප්‍රධානි වශයෙන් කටයුතු කලේය).

සහකාර සාමාන්‍යාධිකාරීවරුන්

9. මධුභාෂිනී බක්මීදෙණිය මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති
Attorny-at-Law, MBA (PIM), (SJPJ), NDHRM (IPM)

10. නදීරා ගුණවර්ධන මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී - (මෝටර් නොවන රක්ෂණ)
BSc (Hons), MBS (Col), MBA (PIM/Uni of Canberra, Aus), FIII, Sp Dip in Marine (lll), ACII (UK), Chartered Insurer

11. ශෂික රණසිංහ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ආයෝජන
CFA (USA), FRM (USA), BSc (Hons) Engineering, ACMA (UK), AIB (SL)

12. මහේෂ් ගමගේ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - කාණ්ඩ අලෙවිකරණය (සාමාන්‍ය රක්ෂණ)
MBA (AUS), CMA (AUS), PG. Dip. M (SL), MSLIM, CPM (ASIA)

13. ජේ. ඒ. ඩී. කසුන් සමීර මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - කාණ්ඩ අලෙවිකරණය (ජීවිත රක්ෂණ)
Chartered Marketer, Pgd Dip in Marketing (CIM, UK), CPM (Asia Pacific), MCIM, Pgd Dip in Management (UoW UK), MBA (UWTSD, UK)

14. ඩබ්ලිව්. ශ්‍රියානි කුලසිංහ මිය
සහකාර සාමාන්‍යාධිකාරිනී - මූල්‍ය
FCA, ACMA, MBA-Finance (Colombo), B.Com (Hons.) Sp.
(Appointed w.e.f. 01/08/2021)

නියමු කණ්ඩායම

ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

1. ඩබ්ලිව්. ඩී. සී. විතානගේ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ප්‍රධාන කාර්යාලය
ව්‍යාපාර සංවර්ධන

2. එස්.පී.ඒ. රොඩ්‍රිගෝ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ආරක්ෂක සහ විමර්ශන

3. කේ.පී.ඩී.පී. කන්දෙගම මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - තොරතුරු තාක්ෂණ දත්ත මධ්‍යස්ථානය

4. ඩී.පී.ජේ.එස්. මෛත්‍රීරත්න මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - හදිසි අනතුරු

5. එන්.පී.කේ. බණ්ඩාර මහතා
ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය ඉංජිනේරු

6. ආර්.එම්.ඒ.කේ. රාජපක්ෂ මහතා
ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය ඉංජිනේරු

7. එම්.ඩී. චන්දිරම් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ආයතනික ව්‍යාපාර සංවර්ධන

8. එම්.පී.එන්. කුමාර
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ක්ලබ් සාමාජිකයින් විකිණුම් අංශය



9. ඩී.එන්.කේ. නාරංගම්මන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නියෝජිත ආයතන බඳවාගැනීම්

10. එල්.එච්.ඒ.එස්. සිරිමාන්න මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ව්‍යාපාර රදවාගැනීම්

11. ආර්.එන්. සේනාධීර මහතා
නියෝජ්‍ය ප්‍රධාන මෝටර් ඉංජිනේරු

12. එම්.ඩී. අත්තනායක මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරිනී - නීති

ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

13. පී.ඒ.එම්.පී.ඩබ්. ගුණතිලක මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - පරිගනක ජාල සහ සන්නිවේදන

14. එම්.ජේ.එස්. දබරේරා මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - බෑන්ක්ඇෂුවරන්ස් (ජීවිත රක්ෂණ)

15. ජී.කේ.එම්.එස්. නානායක්කාර මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරිනී - ජීවිත රක්ෂණ

16. පී.ඩබ්.ආර්.සී. ද සිල්වා මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ජීවිත රක්ෂණ

17. එන්.ඩී.කේ.එම්. ජයතිලක මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරිනී - නීති (නඩු කටයුතු)

18. ඩබ්.ඩී.ටී. ඩෙප් මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකරිනී– SHE & PA

19. ජේ.එස්. ජයවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ජීවිත රක්ෂණ

20. පී.එන්.ඒ. ධර්මසේන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ජීවිත රක්ෂණ

21. බී.එච්.එන්.කේ.කේ. පෙරේරා මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - ජීවිත රක්ෂණ

22. කේ.ඒ.එස්. රණතුංග මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ප්‍රතිරක්ෂණ

23. ඒ.යූ. රාජපක්ෂ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මූල්‍ය මෙහෙයුම්

24. බී.සී.එස්. පෙරේරා මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ගිනි සහ ඉංජිනේරු හිමිකම්පෑම්

නියමු කණ්ඩායම

ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

25. ආර්.සී.ටී. ද ලිවේරා මහතා
ජ්‍යෙෂ්ඨ අවදානම් ඉංජිනේරු

26. ජේ.එම්.කේ.සී.කේ.එල්. ජයසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මෝටර් හිමිකම්පෑම්

27. කේ.වී.එන්. නෝනිස් මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - මෝටර් ප්‍රාරක්ෂණ

28. ඒ.එච්.එස්. අබේගුණවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - විශේෂ ව්‍යාපෘති

29. කේ.කේ.ඒ.පී. මාපලගම මහතා
උපදේශක - විමර්ශන

30. එස්.ජේ.පී. හෙට්ටිආරච්චි මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - මෘදුකාංග සංවර්ධන (ජීවිත රක්ෂණ)

31. ඕ.එම්. ඉන්ද්‍රාණි මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී - මෘදුකාංග සංවර්ධන (සාමාන්‍ය රක්ෂණ)

32. ඩබ්.ඒ.ඩී. ගුණවර්ධන මහතා
ජ්‍යෙෂ්ඨ මෝටර් ඉංජිනේරු

33. ඩබ්.ඒ.ඩී.එම්. වීරක්කොඩි මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - බෙදාහැරීමේ මෙහෙයුම් (පුද්ගලික වැහුල - සාමාන්‍ය රක්ෂණ)

34. එම්.ආර්. ගුණසේකර මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නාවික
(2021/07/01 දින සිය බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

35. එල්.ඒ.පී. පීරිස් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - කොළඹ කවය ආයතනික ඒකකය
(2021/08/02 දින සිය බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

36. ඩී.එම්.ජේ.පී. අල්විස් මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - MSI (ICT)
(2021/11/01 දින සිය බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

37. වී.එස්.එල්. බුලත්සිංහල මහතා
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - සාමාන්‍ය රක්ෂණ
රක්ෂණ විකිණුම් පුහුණුව
(2021/12/01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

ප්‍රාදේශීය කළමනාකරුවන්

1. බණ්ඩාර වීරසූරිය මහතා
වයඹ 1

2. සනත් ප්‍රනාන්දු මහතා
බස්නාහිර ඉහළ

3. දීපාල් නවගමුව මහතා
බස්නාහිර 2

4. ටී.ඩී.පී. පීරිස් මහතා
දකුණ - 1

5. යූ.පී.යූ.ආර්. කුමාර මහතා
බස්නාහිර - 1

6. ඩබ්.එම්.ඒ.යූ. කුලසේන
රත්නපුර

7. ආර්. හේවාපතිරණගේ
බස්නාහිර - 3

8. එන්.කේ.එස්.එස්. කුමාර
දකුණ - 2

නියමු කණ්ඩායම

ප්‍රාදේශීය කළමනාකරුවන්

9. පී. සතියන් මහතා
උතුර

10. එච්.ජේ.එස් මෙන්ඩිස් මහතා
දකුණ - 1

11. කැලුම් ජයසිංහ මහතා
ඌව

12. සමන්ත පීරිස් මහතා
බස්නාහිර - 1

13. ඒ.එම්.එච්. අධිකාරි මහතා
මධ්‍යම - 1

14. ගාමිණී සරත්චන්ද්‍ර මහතා
මධ්‍යම - 2

15. ධම්මික බණ්ඩාර මහතා
ඌව

16. අජිත් තිලකරත්න මහතා
උතුරුමැද - 2

17. මහින්ද දිසානායක මහතා
වයඹ - 1

18. පී. පුවෙනේන්ද්‍රන් මහතා
නැගෙනහිර

19. නාමල් ලියනගේ මහතා
බස්නාහිර ඉහළ

20. ආර්. ලිංගේෂ්වරන් මහතා
නැගෙනහිර

ප්‍රාදේශීය කළමනාකරුවන්

21. ඩී.එම්.එස්. දිසානායක මහතා
රත්නපුර

22. එන්.එස්.එස්. ලක්ෂානා මිය
බස්නාහිර - 4
(2021/10/01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

23. ඩී.එම්.යූ.බී. දිසානායක මිය
දකුණ - 2
(2021/10/01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

24. බී.එම්.ඒ. බස්නායක මහතා
වයඹ 2
(2021/10/01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

25. ඊ.කේ.එස්. සේනාධීර මහතා
බස්නාහිර - 2
(2021/10/01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

26. පී.පී.පී.එස්. කුමාර මහතා
වයඹ - 2
(2021/10/01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

27. ඩබ්.එස්.අයි. වෙල්ගම මහතා
උතුරුමැද
(2022/04/15 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

28. එස්. කර්නන් මහතා
උතුර
(2022/05/02 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමූහ ව්‍යුහය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී

51.34%

කොටස් වලින් 51.34% ක් සමගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ලංකා හොස්පිට්ල්ස් හි විශාලතම කොටස් හිමිකරුවා වේ. ලංකා හොස්පිට්ල්ස් ජනතාව වෙත සෞඛ්‍ය සත්කාරක සේවාවන් ලබාදෙන මහජන ලැයිස්තුගත සමාගමකි.

ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම

99.94%

99.94% ක කොටස් හිමිකාරිත්වයක් සමගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමෙහි මූලික කොටස් හිමිකරුවා වේ. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රධාන එල්පී ගෑස් ආනයනකරු සහ බෙදාහරින්නා වේ.

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම

100%

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතයක් වන අතර එමගින් ගෘහ, වාණිජ සහ තොග පාරිභෝගිකයින් සඳහා එල්පී ගෑස් ගබඩා කිරීම සිදුකෙරේ.

ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් පුද්ගලික සමාගම

100%

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම

100%

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතයක් වන මෙම සමාගම මගින් දක්ෂිණ අධිවේගී මාර්ගයේ විවේක නැවතුම් පහසුකම් සපයමින් මගීන් වෙත විවිධ සේවාවන් ලබාදෙනු ලැබේ.

කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම

52.05%

හෝටල් ව්‍යාපෘතීන් කළමනාකරණ/ආයෝජන ව්‍යාපාරයෙහි නිරත කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි 52.05% ක කොටස් හිමිකාරිත්වයක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සතු වේ.

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ

100%

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතයක් වශයෙන් මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ ස්ථාපනය කරන ලද්දේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් වෙත වැටුප් ලැයිස්තු කළමනාකරණ සේවා ලබාදීම උදෙසා වන අතර එමගින් කිසිදු බාහිර වෙළඳපොලක් හෝ බාහිර පාරිභෝගිකයින් වෙත නිෂ්පාදන හෝ සේවාවන් සපයනු නොලැබේ.

සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

100%

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

100%

මූල්‍යමය විශේෂතා

	2021 රු. මිලියන	2020 රු. මිලියන
වසර සඳහා ප්‍රතිඵල		
මුළු ආදායම	64,062	52,614
දළ ලිඛිත වාරිකය	43,231	39,421
ශුද්ධ ඉපැයුම් වාරිකය	38,397	34,206
ආයෝජන සහ වෙනත් ආදායම	25,665	18,408
බදු වලට පෙර ලාභය	11,725	7,972
බදු වලට පසු ලාභය	10,041	5,789
ප්‍රතිලාභ/හිමිකම්පෑම්, මෙහෙයුම්, පරිපාලන සහ වෙනත් වියදම්	33,487	28,524
සාමාන්‍ය රක්ෂණ		
සාමාන්‍ය රක්ෂණ අරමුදල	20,880	18,866
ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය (%)	60	51
වියදම් අනුපාතය (%)	35	37
ජීවිත රක්ෂණ		
ජීවිත රක්ෂණ අරමුදල	152,585	134,014
වියදම් අනුපාතය (%)	34	37
ප්‍රකාශිත අගය බෝනස්	9,836	8,694

මුළු වත්කම්
රු. මිලි 268,436 (2021)
රු. මිලි 235,630 (2020)

පිච් ශ්‍රේණිගත කිරීම
AA(lka)

ප්‍රකාශිත බෝනස්
රු. මිලි 9,836 (2021)
රු. මිලි 8,694 (2020)

බදු පෙර ලාභය
රු. මිලි 11,725 (2021)
රු. මිලි 7,972 (2020)

ජීවිත රක්ෂණ අරමුදල
රු. මිලි 152,585 (2021)
රු. මිලි 134,014 (2020)

දළ ලිඛිත වාරිකය
රු. මිලි 43,231 (2021)
රු. මිලි 39,421 (2020)

මුළු ආදායම
රු. මිලි 64,062 (2021)
රු. මිලි 52,614 (2020)

මූල්‍යමය නොවන විශේෂතා - 2021

- සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ වෙළඳපොල ප්‍රමුඛයා බවට පත් විය.
- මෝටර් ප්ලස් - මෝටර් රක්ෂණ කාණ්ඩයේ වෙළඳපොල ප්‍රමුඛයා විය.
- ශ්‍රී ලංකාවේ සේවයේ යෙදීම සඳහා අනර්ඝතම සමාගමක් වශයෙන් ඇගයුමට ලක් විය.
- බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් මගින් අඛණ්ඩ 4 වැනි වරටත් වඩාත්ම ප්‍රිය කරන රක්ෂණ සන්නාමය වශයෙන් සම්මානයෙන් පුදන ලදී.
- බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් මගින් අඛණ්ඩ 4 වැනි වරටත් සාමාන්‍ය රක්ෂණ අංශය අනර්ඝතම සාමාන්‍ය රක්ෂණ සන්නාමය වශයෙන් සම්මානයෙන් පුදන ලදී.
- බ්‍රෑන්ඩ් ෆිනෑන්ස්හි අනර්ඝම සන්නාම ලැයිස්තුවේ ඉහළම සන්නාම වටිනාකම් වර්ධනය ජීවිත රක්ෂණ මගින් වාර්තා කරන ලදී.
- 5 COT සහ 1 TOT සාමාජිකයෙක් ඇතුලුව MDRT සාමාජිකයින් 187 ක් බිහි කරන ලද අතර එය එදා මෙදා තුර ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින් සිදුකරන ලද ඉහළම නියෝජනය වේ.
- ලංකා වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද 2021 ජාතික ව්‍යාපාරික විශිෂ්ටත්ව සම්මාන උළෙලේදී රක්ෂණ කාණ්ඩය යටතේ දෙවන ස්ථානය පිරිනැමුනි.
- දිගු කාලීන මූල්‍යමය ස්ථාවරත්වය උදෙසා AA (lka) ෆිච් ශ්‍රේණිගත කිරීම අඛණ්ඩව රදවාගත හැකි විය.
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අග්‍රගණ්‍ය ISO 9001:2015 කළමනාකරණ තත්ත්ව සහතිකයට අනුකූල බවට මෙසර්ස් එස්ජීඑස් ලංකා පුද්ගලික සමාගම මගින් සහතික කරන ලදී.
- 2021 සිට වෙන් කරන ලද විශේෂිත ක්‍රමෝපායික ව්‍යාපාර අවධානයක් සිදු කරන ලදී. (ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ)
- ආයතනික සැලසුම ඔස්සේ අගය එකතු කිරීම් සිදුකරන ලදී.
- ABDCs 38 ක් විවෘත කිරීම.

නායකත්ව සමාලෝචන

30 - සභාපතිවරයාගේ පණිවුඩය
33 - ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ පණිවුඩය

WITH/N

කණ්ඩායම තුළින්

කණ්ඩායම තුළ සාමූහිකත්වය සහ ධෛර්යය පෙරදැරි කොට ගෙන ප්‍රගතිශීලී වසරක් නිර්මාණය කිරීමට අපි කටයුතු කලෙමු

සභාපතිවරයාගේ පණිවුඩය

“බොහෝ සමාගම් සඳහා ඉතා අසීරු වූ කාලසමයක් තුළ, ඔබේ සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, 75.3% ක බදු වලට ලාභයක්ද 2020 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 21.7% ආදායම් වර්ධනයක්ද වාර්තා කරමින් විශිෂ්ට කාර්යසාධනයක් විදහා දැක්වීමට සමත් විය. මෙම සුබවාදී කාර්යසාධනය අඛණ්ඩව ඉදිරියට ගෙනයමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් රක්ෂණ ඔප්පු හිමියන් වෙත රු. බිලියන 9.8 ක බෝනස් මුදලක් ප්‍රකාශයට පත් කරන ලදී.’”

2020 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව බදු වලට පසු ලාභ වර්ධනය



2020 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව ආදායම් වර්ධනය



හිතවත් කොටස් හිමිකරුවනි,

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි. බොහෝ සමාගම් සඳහා ඉතා අසීරු වූ කාලසමයක් තුළ, ඔබේ සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, 73.5% ක බදු වලට ලාභයක්ද 2020 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 21.7% ආදායම් වර්ධනයක්ද වාර්තා කරමින් විශිෂ්ට කාර්යසාධනයක් විදහා දැක්වීමට සමත් විය. මෙම සුබවාදී කාර්යසාධනය අඛණ්ඩව ඉදිරියට ගෙනයමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් රක්ෂණ ඔප්පු හිමියන් වෙත රු. බිලියන 9.8 ක බෝනස් මුදලක් ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත, වසර 2020 අභියෝගාත්මක වූද අපේක්ෂා සහගත වූද වසරක් විය. මෙම වසර තුළ විවිධ වූ සේවාලාභී අපේක්ෂාවන් සහ වෙළඳපොල අවශ්‍යතා සපුරාලීම උදෙසා අපගේ ව්‍යාපාර කටයුතු සම්බන්ධ ක්‍රාමෝපායන් යළි සකසා ගැනීමේ ගලපා ගැනීමේ අවස්ථාව අප වෙත උදාවිය. නව සාමාන්‍ය වෙත අනුගත වෙමින් අනාගත අභියෝග වෙත මුහුණදීම සඳහා වන අපගේ නිරන්තර ප්‍රයත්නය සවිබල ගැම්වීම සඳහා කෝවිඩ් 19 වසංගතය සහ එමගින් ලද අත්දැකීම් මෙන්ම උගත් පාඩම් බෙහෙවින් ඉවහල් විය.

60 වසරක සේවා විශිෂ්ටත්වය සමරමින් පරිවර්තනීය යුගයක් වෙත පියනගන්නා වූ අවස්ථාවක, ජාතියේ විශ්වසනීය රක්ෂකයා වශයෙන් අප ගොඩනගා ගත් කීර්තිනාමය ඔප් නැංවීමට අපි අඛණ්ඩවම කටයුතු කරමු.

ජයග්‍රහන සහ කාර්යසාධනය

ජාතියේ ආරක්ෂකයා වශයෙන් තවදුරටත් අපගේ සේවාවන් ව්‍යාප්ත කරමින් අපගේ කාර්යභාරය සහ වගකීම ඉටු කිරීම සඳහා අභියෝග මෙන්ම අවස්ථාවන් රැසක් අප හට හිමි විය. ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ පුරෝගාමියා වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය වපසරිය මැනවින් සකස් කරමින් ජාතියේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට අපගේ අඛණ්ඩ දායකත්වය හිමි වනු ඇත. මෙරට විශාලතම සහ ප්‍රබලතම රක්ෂකයා වශයෙන් පරම්පරා ගණනාවක් තිස්සේ ජනතාව අප කෙරෙහි තබන ලද අචල විශ්වාසය යළි යළිත් තහවරු කරමින් වඩාත් ඉහළ මට්ටමේ ජයග්‍රහන අත්පත් කරගැනීම සඳහා නිරන්තරයෙන් පරිනාමය වෙමින් අපගේ සියලුම පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් සමුදායක් එක් කිරීමට අපි කැපවී ක්‍රියා කරමු.

දිවයින තුළ පැවති කටුක ආර්ථික සහ සමාජයීය තත්ත්වයන් හමුවේ වුවද, මෙරට විශාලතම සහ සවිමත්ම රක්ෂකයා වශයෙන් වන අපගේ ස්ථාවරය නැවත වරක් තහවුරු කරමින් වත්කම් පදනම රු.බිලියන 268 දක්වාද ජීවිත අරමුදල රු. බිලියන 152 දක්වාද වර්ධනය විය. දිවයිනේ දැනට පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් සෙසු දේශීය රක්ෂණ සමාගම් සමග ගත් කල සෘණාත්මක ස්වරූපයක් දක්නට ලැබුනද, දිගු කාලීන මූල්‍යමය ස්ථාවරත්වය උදෙසා AA (lka) ෆිච් ශ්‍රේණිගත කිරීම තවදුරටත් රදවාගැනීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත් විය. AA (lka) ශ්‍රේණිගත කිරීමේ සහතිකත්වය හිමිකර ගත් එකම රක්ෂකයා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, වසර ගණනාවක් තිස්සේ සමාගම මගින් අනුගමනය කරන ලද සේවාලාභී - කේන්ද්‍රීය එළඹුම නිසාවෙන්ම, බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් වෙතින් අඛණ්ඩව 4 වැනි වරටත් ‘වඩාත්ම ජනාදරයට පත් වූ රක්ෂණ සන්නාමය’ සහ ‘අනර්ඝතම සාමාන්‍ය රක්ෂණ සන්නාමය’ යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

වසර 2021 දී, සමාගම මගින් රු.බිලියන 19.3 සිට රු.බිලියන 21.9 දක්වා ජීවිත රක්ෂණ වාරිකයන්හි 14.1% ක වර්ධනයක් වාර්තා කරන ලදී. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙරට අංක 1 සාමාන්‍ය රක්ෂණ සේවා සම්පාදකයා වන අතර, සාමාන්‍ය රක්ෂණ කාණ්ඩය වසර තුළදී රු.බිලියන 21.2 දක්වා 5.4% ක වාරික වර්ධනයක් වාර්තා කලේය.

සභාපතිවරයාගේ පණිවුඩය

සුබවාදී කාර්යසාධනය අඛණ්ඩව පවත්වා ගෙන යමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ස්වකීය අතීත වාර්තාව අභිබවා යමින් රක්ෂණ ඔප්පු හිමියන් වෙත රු.9.8 ක බෝනස් මුදලක් ප්‍රකාශයට කලේය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අසමසම බෝනස් ගෙවීම තහවුරු කරමින්, පසුගිය වසර 10 තුළ රු. බිලියන 66 ක දැවැන්ත සමස්ත ජීවිත රක්ෂණ බෝනස් මුදල් ගෙවනු ලැබ ඇත.

සත්කාරය මුසු රැකවරනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් අඛණ්ඩවම රක්ෂණ සැලසුම් සහ වෙළඳපොල සංවර්ධන ව්‍යාපෘතීන් හා ප්‍රායෝගික මෙන්ම පහසුවෙන් ලබාගත හැකි රක්ෂණ විසඳුම් ඔස්සේ ප්‍රජාවන්, පුද්ගලයින්, වෘත්තිකයින් සහ කර්මාන්ත වෙත රැකවරනය සැලසීමේ නව මං පෙත් විවර කරන ලදී. 8000 ක් වූ සේවා ජාලය සමගින්, 201 ක් වූ අපගේ පුළුල් ව්‍යාප්තියක් සහිත ශාඛා ජාලය සහ සේවාලාභී සේවා ස්ථානනේහි සවිමත් බව හේතු කොට ගෙන හුදු රක්ෂණ සේවාවන්ගෙන් ඔබ්බට යමින් ජාතියේ පුරවැසියන් වෙත පරිපූර්ණ රැකවරනය සැලසීමේ අවස්ථාව අප හට උදා වී ඇත.

වසර තුළදී නම්‍යශීලීත්වය සහ අනුගතවීමේ හැකියාව වර්ධනය කිරීමේ ප්‍රයත්නයන් කෙරෙහි ප්‍රමුඛත්වය හිමි වූ අතර එහිදී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශ්‍රී ලාංකේය සේවාලාභීන්ගේ විවිධ වූ අවශ්‍යතා කෙරෙහි සිය අවධානය යොමු කරමින් පුළුල් පරාසයක පැතිරුනු රක්ෂණ සැලසුම් රැසක් නිර්මාණය කෙරිණි. ඒ අනුව, වෙනස් වන සේවාලාභී අවශ්‍යතා සම්බන්ධ ගැඹුරු අධ්‍යයනයක් සිදුකරමින් ක්‍රමෝපායික ප්‍රතිගලපා ගැනීම් අවශ්‍ය වන සැලසුම් කිහිපයක් අප විසින් හඳුනාගන්නා ලදී. මෙහිදී ජීවිත හා සාමාන්‍ය රක්ෂණ කාණ්ඩයන් ද්විත්වයෙහිම සැලසුම් රැසක් සම්බන්ධ ක්‍රමෝපාය වෙනසකට ලක් කිරීම සහ ඒවා නවීකරණය සිදු කෙරිණි. නව සැලසුම් හඳුන්වාදීමට අමතරව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධිය උදෙසාද ව්‍යාපෘතීන් දියත් කෙරිණි.

පූජ්‍ය පක්ෂය සඳහාම වෛද්‍යමය රක්ෂණාවරනයක් එළිදක්වන ලද අතර එය මේ ආකාරයේ පළමු රක්ෂණ සැලසුම ද වේ. එය ඕනෑම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛාවකින් සාමාන්‍ය ජනතාවට මිලදී ගෙන 'පිරිකර' වශයෙන් පූජා කල හැකි වේ. සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත සහාය දක්වමින් අඛණ්ඩව ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රගතිය කෙරෙහි අඛණ්ඩවම දායකත්වය දක්වන ලද අතර එයට දැනට පවතින රක්ෂණ සැලසුම් ප්‍රතිස්ථානගත කිරීම සහ සුලු මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මගින් භාවිත කරනු ලබන වාණිජ රථවාහන සඳහා මෝටර් රක්ෂණාවරනයක් හඳුන්වාදීමද ඇතුළත් විය.

ඩිජිටල් පහසුකම් භාවිතය වර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කඩිනම් එමෙන්ම හමුවීම් සහ කඩදාසි රහිත හිමිකම්පෑම් පියවීමේ සේවාවක් ලබාදීම උදෙසා මෝටර් හිමිකම්පෑම් පියවීමේ ක්‍රියාවලින් නැවත සකසන ලද අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සිය මෙහෙයුම් ව්‍යුහය සහ ඉදිරිපෙල සේවාලාභී කටයුතු පරිවර්තනීය වෙනසකට ලක් කිරීම සම්බන්ධයෙන් කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගත්තේය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින්, ව්‍යාපාරයේ සියලුම මට්ටම් වල කඩදාසි රහිත වටපිටාවක් නිර්මාණය කිරීම උදෙසා සිය ඩිජිටල් ක්‍රමෝපාය කඩිනම් කරමින් ක්‍රමිකව පද්ධතීන් හා ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණය සඳහාද පියවර ගැනුනි. මෙහිදී ''කාර්ය ප්‍රවාහ කළමනාකරණ පද්ධතිය'' මගින් සියලුම අභ්‍යන්තර අතින් සිදුකරනු ලබන සහ කඩදාසි ආශ්‍රිත මෙහෙයුම් ඩිජිටල් මාධ්‍යයයෙන් ක්‍රියාත්මක ක්‍රියාවලීන් බවට පරිවර්තනය කෙරේ. කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම මෙන්ම පිරිවැය පහත හෙළීමේ අරමුණින් යුතුව ගෙවීම් ක්‍රියාවලීන්ද වඩාත් ඩිජිටල්කරණයට ලක් කෙරෙමින් පවතී.

ප්‍රණාමය

අපගේ සාර්ථකත්වය සහ වර්ධනය කෙරෙහි ප්‍රධාන හේතුව වූයේ ක්ෂේත්‍රය තුළ, කාර්යාලය සහ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ දරන ලද සාමූහික ප්‍රයත්නයයි. ඒ වෙනුවෙන් අපගේ සේවකයින්, අධ්‍යක්ෂ මණ්ඩලය සහ නියෝජිතයින් ඇතුලු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කණ්ඩායම විසින් දරන ලද ප්‍රශංසනීය ප්‍රයත්නය උදෙසා ඔවුන් වෙත මාගේ ප්‍රණමෙය පුද කෙරේ. අඛණ්ඩවම අපගේ සේවා ලබාගැනීම වෙනුවෙන් අපගේ ගරු කටයුතු සේවාලාභීන් වෙත මාගේ විශේෂ ස්තුතිය හිමි වන අතර ඔබගේ විශ්වසනීය රක්ෂණ සහකරු වශයෙන් අනාගතයේදීද කටයුතු කිරීම අපගේ අපේක්ෂාවයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත අදාළ ප්‍රතිපත්ති හා පරිපාලන කරුණු සම්බන්ධයෙන් සිදු කරන ලද මගපෙන්වීම පිළිබඳව මුදල් අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව ඇතුලු සියලු රජයේ ආයතයන් වෙත මාගේ ගෞරවනීය ප්‍රණාමය පුද කෙරේ.

ඉංජිනේරු විජිත හේරත්
සභාපති

2022 මැයි 24 වැනි දින

''වසර 2021 දී, සමාගම මගින් රු.බිලියන 19.3 සිට රු.බිලියන 21.9 දක්වා ජීවිත රක්ෂණ වාරිකයන්හි 14.1% ක වර්ධනයක් වාර්තා කරන ලදී. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙරටඅංක 1 සාමාන්‍ය රක්ෂණ සේවා සම්පාදකයා වන අතර, සාමාන්‍ය රක්ෂණ කාණ්ඩය වසර තුළදී රු.බිලියන 21.2 දක්වා 5.4% ක වාරික වර්ධනයක් වාර්තා කලේය''

ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

“ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකය 14.1% කින් වර්ධනය වූ අතර, එමගින් රු.බිලියන 152.5 ක් වූ සමස්ත ජීවිත අරමුදල වෙත රු.මිලියන 21,976 ක දායකත්වයක් සපයන ලදී.”

2020 ට සාපේක්ෂව වර්ධනය
(බදු වලට පසු ලාභය)

වසර 2021 දී අපි අපගේ නියමු ස්ථාවරය තවදුරටත් සවිමත් කලෙමු. අපගේ විචක්ෂණශීලී වසංගත ප්‍රතිචාරය, සේවාලාභී කේන්ද්‍රීය ව්‍යුහාත්මක හා තාක්ෂණික වැඩිදියුණු කිරීම්, අවධානාත්මක ආයෝජනයන් සහ පිරිවැය පිරිමැසුම් ක්‍රියාකාරකම් වෙළඳපොල යථා තත්ත්වයට පත්වීමේ පූර්ණ ප්‍රතිලාභ අත්පත් කරගැනීමෙහිලා අවශ්‍ය ස්ථාවරය නිර්මාණය කලේය. මෙම ගිණුම් වර්ෂයේදී උගත් වැදගත්ම කරුණ වූයේ අනපේක්ෂිත අභියෝගයන් සඳහා වන පෙර සූදානමෙහි වැදගත්කමයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි අපි, වසංගතයෙහි බලපෑම සහ මෙරට සාර්ව ආර්ථික තත්ත්වයන් මගින් ඇති කරන ලද අභියෝග හමුවේ නොසැලී නැගී සිටිමින් අති විශිෂ්ට ප්‍රතිඵල අත් කර ගැනීමට සමත් වීමු. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සෑම නව අභියෝගයකම හමුවේ නව්‍යතාවය උපයෝගී කරගනිමින් සේවාලාභී අවශ්‍යතා සපුරාලන බවටත් ව්‍යාපාර කාර්යසාධනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොවන බවටත් තහවුරු කිරීමට සමත් විය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, අපගේ එක් එක් ව්‍යාපාර කාණ්ඩයන් ක්‍රමානුකූලව වැඩිදියුණු කරමින්ද, එක් එක් විශේෂිත වෙළඳපොල අනුව ඒවා සකසා ගනිමින්ද සිය වර්ධන මාවතෙහි ඉදිරියටම ගමන් කලේය. අප විසින් අනුගමනය කරන ලද පුලුල් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අතිශය ප්‍රයෝජනවත් පියවරක් බවට සනාථ වූ අතර, එමගින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරය පුරා වඩාත් පුලුල් වූ කළමනාකරණ අධීක්ෂණයක් සිදුකිරීමට අප හට හැකි විය.

වසර තුළදී කාර්යසාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රු.මිලියන 10,041 ක බදු වලට පසු ලාභයක් වාර්තා කල අතර එය 2020 වසරට සාපේක්ෂය 73.5% ක වර්ධනයකි. ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ කාණ්ඩයන් ද්විත්වයෙහිම විශිෂ්ට කාර්යසාධනය මෙයට ඉවහල් වූ අතර එය අත්පත් කරගනු ලැබුවේ කෝවිඩ් 19 රට වසා දැමීම් සහ සේවාලාභීන් සහ වාණිජ ව්‍යාවසායන් මුහුණදෙන ලද බොහොමයක් ආර්ථික අභියෝග මධ්‍යයේ වීම විශේෂත්වයකි. බදු වලට පෙර ලාභය රු.මිලියන 11,725 ක් වූ අතර එය 2020 දී වාර්තා වූ රු.මිලියන 7,972 සමග සැසඳීමේදී 47% ක වර්ධනයකි.

2021 දී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ඒකාබද්ධ දළ ලිඛිත වාරිකය රු.බිලියන 43.23 ක් වශයෙන් දැක්වුනු අතර එහි වර්ධන අනුපාතය 9.7% කි. පසුගිය වසර 5 ක කාලය පුරා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් අඛණ්ඩව ඒකාබද්ධ දළ ලිඛිත වාරිකයෙහි 8.3% ක සමුච්චිත සාමාන්‍යය වර්ධන අනුපාතයක් (CAGR) වාර්තා කරන ලදී. දළ ලිඛිත වාරිකයෙන් 51% ක් සඳහා ජීවිත රක්ෂණ ව්‍යාපාරයද සෙසු 49% සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයද දායක විය. ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකය 14.1% කින් වර්ධනය වූ අතර, එමගින් රු.බිලියන 152.5 ක් වූ සමස්ත ජීවිත අරමුදල වෙත රු.මිලියන 21,976 ක දායකත්වයක් සපයන ලදී. 2021 දී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සාමාන්‍ය රක්ෂණ වාරිකයන් 5.4% ක වර්ධනයක් සහ රු.මිලියනන 21,255 ක සමස්ත වාරික වටිනාකමක් වාර්තා කරන ලදී.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ආදායම සඳහා ප්‍රධාන වශයෙන් දායකත්වය දක්වනු ලබන මෝටර් රක්ෂණ කාණ්ඩය රථවාහන ආනයන තහනම, එථවාහන වල අධික මිල ඉහළ යාම සහ දැඩි උද්ධමනකාරී වටපිටාවක් තුළ රථවාහන නඩත්තු වියදම යන සාධකයන්හි ප්‍රබල බලපෑමකට ලක් විය.

තාක්ෂණ භාවිතය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ඩිජිටල් පරිවර්තනය ස්වකීය ඉදිරි ගමන් මග වශයෙන් සළකයි. අප විසින් ක්ෂේත්‍රයේ කඩඉම් ඉහළ නංවමින්, රක්ෂණය ආශ්‍රිත ක්‍රියාවලීන් කාර්යක්ෂමව සිදුකිරීමට සහ සේවාලාභී සේවා මෙවලමක් වශයෙන් නවීන තාක්ෂණය භාවිත කරන ලදී. රට වසා දැමීම් වලදී සේවාලාභීන් වෙත සේවා සැලසීමේදී ඩිජිටල් ඇප් සහ සෙසු ඩිජිටල් පදනම් මගින් ප්‍රධාන භූමිකාවක් නිරූපනය කරන ලදී. ඩිජිටල් ශබ්‍යතාවන් සවිමත් කිරීමේ

වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් නව ඩිජිටල් සේවාවන් තවදුරටත් වැඩිදියුණු කිරීමටත් නව සේවාවන් හඳුන්වාදීමටත් කටයුතු කරන ලදී. වසර තුළදී, මෝටර් හිමිකම්පෑම් සඳහා විශේෂිත සේවා පදනමක් සකසන ලද අතර සේවාලාභී ප්‍රතිචාරය අනුව සේවාලාභී ඇප් වැඩිදියුණු කරන ලදී.

අපගේ අභ්‍යන්තර ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණ හඳුන්වාදීම් සිදු කරන ලදී. මෙහිදී කාර්ය ප්‍රවාහ කළමනාකරණය, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ අලෙවි පසුවිපරම් කෙරෙහි අවධානය යොමු කෙරුනු අතර, ව්‍යාපාරික විශ්ලේෂණයන් භාවිත කරමින් වඩාත් දැනුවත් තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම උදෙසා ඩෑෂ්බෝර්ඩ්ස් හඳුන්වාදෙන ලදී.

අපගේ සැලසුම් කළඹ වැඩිදියුණු කිරීම

දීර්ඝතම කලක් සේවා සම්පාදනය කරන ලද රක්ෂණ සමාගම වශයෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දශක හයකට අධික කාලයක් තිස්සේ, පුලුල් පරාසයක පැතිරුනු රක්ෂණ සැලසුම් රැසක් හඳුන්වාදීමට කටයුතු කොට ඇත. අපගේ බහුවිධ සැලසුම් කළඹ අපගේ ප්‍රධාන ශක්තිය වන අතර එමගින් අප සෙසු තරගකරුවන්ට ඉහළින් ඔසවා තැබේ. වෙළඳපොල ප්‍රවණතාවයන්ට සහ සේවාලාභී අවශ්‍යතාවයන්ට සමගාමීව අප විසින් අඛණ්ඩවය දැනට පවතින සැලසුම් කළඹ වෙත නව හඳුන්වාදීම් සිදුකරමින් ඒ පිළිබඳව නැවත සිතා බැලීමක් සිදුකෙරේ. වසර තුළදී, අප විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ වෙළඳපොල වෙත නව රක්ෂණ සැලසුම් හඳුන්වාදෙන ලදී.

නිරන්තයෙන් පරිණාමය වන සේවාලාභී අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාලීම උදෙසා අප විසින් ක්‍රමෝපායික ප්‍රතිගැලපුම් සිදුකිරීම අවශ්‍ය වන දැනට පවතින සැලසුම් හඳුනාගැනීමේ අරමුණින් ඒවා පිළිබඳ අඛණ්ඩ ඇගයීම් සිදුකරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපගේ සැලසුම් රැසක් ප්‍රතිනිර්මාණය කරන ලද අතර ඇතම් සැලසුම් ඒකාබද්ධ කිරීම සහ අනුකූලනය සිදු කෙරිණි.

කඩිනම් ආයෝජන සැලසුමක් වශයෙන් 'ප්‍රගුණ' රක්ෂණ සැලසුම ප්‍රතිස්ථානගත කෙරුනු අතර 'යස ඉසුරු' රක්ෂණ සැලසුම නැවත හඳුන්වාදෙන ලදී. 'සුබපැතුම්' ශිෂ්‍යත්ව සැලසුම සමගින් තරුණ සේවාලාභීන්ගේ සියලුම අධ්‍යාපන අවශ්‍යතා උදෙසා 'මිණි මුතු' රක්ෂණ සැලසුම හඳුන්වාදෙන ලදී. 'දේශාරක්ෂකයා' වශයෙන් ස්වකීය කාර්යභාරය ඉටු කරමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් වසර 2021 සඳහා රු.බිලියන 9.8 ක බෝනස් ප්‍රකාශයට පත් කරමින් ඉහළ බෝනස් මුදල පිරිනැමීමේ සම්ප්‍රදාය අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී.

හඳුන්වාදෙන ලද නව රක්ෂණාවරයන් අතර 'නාගරාජ' රක්ෂණ සැලසුම විශේෂයෙන් එළිදක්වන ලද්දේ පූජ්‍ය පක්ෂය සහ ඔවුන්ගේ පවුල් වලට රැකවරනය සැලසීමේ අරමුණිනි. එයට අමතරව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සියලුම පාසැල් දරුවන් වෙත නොමිලේ පිරිනමනු ලබන ජාතික ළමා සෞඛ්‍ය රක්ෂණ සැලසුම වන 'සුරක්ෂා' හි රක්ෂණ සහකරු වශයෙන් තවදුරටත් සිය දායකත්වය සපයනු ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත අංග සම්පූර්ණ ව්‍යාපාරික රක්ෂණයක් ලබාදීම උදෙසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සිය බිස්නස් ක්ලබ් රක්ෂණ සැලසුම ප්‍රතිස්ථානගත කරන ලදී.

අපගේ හර පද්ධතීන් තුළ ජීවත්වීම

අපගේ සේවාලාභීන් සහ සේවකයින් වෙත අගය එකතු කිරීම සෑමවිටම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි ආචාරධර්ම අතර වැදගත් ස්ථානයක් උසුලයි. සේවක සුරක්ෂිතතාව සිත්හි රඳවා ගනිමින් අප සෑමවිටම ක්‍රියාත්මක වූ අතර අපගේ විශේෂ කාර්ය බලකාය මගින් කෝවිඩ් 19 ආරක්ෂණ රියවර ක්‍රියාවට නැංවීම සහ ඒවාට අනුගතවීම අධීක්ෂණය කරමින් දිවයින පුරා විසිරුනු අපගේ සේවකයින් සහ නියෝජිත බලකායෙහි සුරක්ෂිතතාව තහවුරු කරන ලදී. රට වසා දැමූ අවස්ථාවේදී සහ ඉන් අනතුරුව එළඹුනු අභියෝගාත්මක කාල සමයන්හිදී දිරිගැන්වීමක් වශයෙන් අප විසින් අපගේ සේවකයින් හට දිගින් දිගටම වැටුප් ගෙවීම සිදු කෙරිණි. රට වසා දමන ලද අවස්ථාවේදී සිය අලාභයන් අවම කරගැනීමේ අවස්ථාව උදා කරමින් අප විසින් අපගේ නියෝජිත බලකාය වෙත අවශ්‍ය සහන සළසන ලදී.

වසර තුළදී, අප විසින් නව සාමාන්‍ය තුළ සිදුවන වෙනස්වීම් වෙත අනුගතවීම සහ ඒවාට මුහුණදීම සඳහා ජනතාව දැනුවත් කරමින් අනුරාධපුර, කලුතර, මාතර, ගිරිඋල්ල, දඹුල්ල, නුවරඑළිය සහ බිබිල යන ප්‍රදේශයන්හි වැඩසටහන් මාලාවක් සංවිධානය කෙරිණි.

කෝවිඩ් 19 ප්‍රභේදයන් සහ ඒවා පැතිරීමෙහි බලපෑමට ලක් වූ වසරක් තුළ අත්‍යාවශ්‍ය අයිතමයක් වූ, රු. මිලියන 5 වටිනාකමින් යුතු පීසීආර් යන්ත්‍රයක් රත්නපුර ශික්ෂණ රෝහල වෙත පරිත්‍යාග කිරීම උදෙසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි කාර්ය මණ්ඩලය සිය දිනක වැටුප පිරිනමන ලද බව මෙහිදී සඳහන් කරනුයේ ඉමහත් වූ අභිමානයෙනි.

අප විසින් එක්සත් ජාතීන්ගේ ලෝක මාර්ග ආරක්ෂණ සතියට සමගාමීව 'මෝටර් ප්ලස් රෝඩ් සේෆ්ටි හීරෝස්' සහ 'ලයිෆ් සේවින්ග් 30' වැනි ව්‍යාපෘතීන්ද දියත් කරන ලදී.

"එළඹෙන වසරේදී, දිවයිනේ දුරබැහැර ප්‍රදේශයන්හි අපගේ ව්‍යාප්තිය වර්ධනය කරමින් විවිධ ප්‍රජාවන්ටම සරිලන රක්ෂණ සැලසුම් ලබාදීමේ අරමුණින් යුතුව අදාළ ප්‍රජාවන්ගේ රක්ෂණ අවශ්‍යතා හඳුනාගැනීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත."

ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය

අනාගත ස්වරූපය

වසංගතයේ බලපෑම මගින් අප හට උගත හැකි වූ කරුණු රැසක් පැවති අතර එහිදී ඔරොත්තු දීමේ හැකියාව, අනුගතවීම සහ අභියෝගාත්මක වටිපිටාවක් තුළ ඉදිරියට ඇදිය යුතු ආකාරය ආදිය ඒ අතර අතිශය වැදගත් විය. වසර තුළ උද්ගත වූ අභියෝගයන් තුළින් අවබෝධයන් ලබාගනිමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් අනාගතයට මුහුණදීම සඳහා වඩාත් සවිමත් වූද අනුගතවිය හැකි වූද ක්‍රමෝපායන් සකසන ලදී. තවද, අප විසින් අපගේ සුවපහසු කළාපයෙන් ඔබ්බට යමින් උද්ගත විය හැකි නව අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහාද ව්‍යාපෘතීන් සකසනු ලැබ ඇත.

එළඹෙන වසරේදී, දිවයිනේ දුරබැහැර ප්‍රදේශයන්හි අපගේ ව්‍යාප්තිය වර්ධනය කරමින් විවිධ ප්‍රජාවන්ටම සරිලන රක්ෂණ සැලසුම් ලබාදීමේ අරමුණින් යුතුව අදාළ ප්‍රජාවන්ගේ රක්ෂණ අවශ්‍යතා හඳුනාගැනීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත. ඒ අතරම, වෙනස් වෙමින් පවතින සේවාලාභී අවශ්‍යතා වලට ගැළපෙන පරිදි අපගේ සැලසුම් කළඹ සකසමින් එය ව්‍යාප්ත කරන අතර නව්‍ය සැලසුම් හඳුන්වාදීම ඔස්සේ අපගේ ආකර්ශිත වෙළඳපොල සවිමත් කිරීමටද කටයුතු කෙරෙනු ඇත. තරගකාරී රක්ෂණ වෙළඳපොල තුළ අපගේ ව්‍යාප්තීකරණ සැලසුම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණය කෙරෙහි අපගේ ආයෝජන ඉහළ නැංවීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින අතර, එමගින් අභ්‍යන්තර ශක්‍යතාවයන් සහ සේවාවන් ඉහළ නැංවීම අපගේ සැළසුම වේ.

ප්‍රණාමය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සුබවාදී කාර්යසාධනය අපගේ කාර්ය මණ්ඩලයේ නොපසුබට කැපවීම පිළිබඳව සාක්ෂි දරයි. මෙම අභියෝගාත්මක වසර තුළදී විදහා දක්වන ලද ස්වකීය වෘත්තීයමයභාවය සහ වගකීම් ඉටුකිරීමේ විශිෂ්ටත්වය උදෙසා අපගේ සමස්ත කාර්ය මණ්ඩලය වෙත මාගේ ප්‍රණාමය හිමි වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සිය ප්‍රියතම රක්ෂණ සහකරු වශයෙන් තෝරාගැනීම පිළිබඳව අපගේ ගෞරවනීයය සේවාලාභීන් වෙත මාගේ ප්‍රණාමය පුද කරන අතර ඉදිරියේදීද ඔවන් වෙත සත්කාරය සපිරි රැකවරනය සැලසීමට කැප වන බවට මම අවධාරණය කරමි. වසර තුළදී අප වෙත පිරිනමන ලද ප්‍රශංසනීය සහයෝගය වෙනුවෙන් අපගේ අලෙවි නියෝජිතයින්, රක්ෂණ තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂණ සහකරුවන් සහ ආශ්‍රිත පාර්ශ්වකරුවන් මාගේ ඇගයුමට පාත්‍ර වේ.

වසර පුරා දක්වන ලද නොමසුරු සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත මාගේ ස්තුතිය පිරිනැමේ.

අවසන් කිරීමට පෙරාතුව, තවත් සාර්ථක වසරක නිමාව දැකීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත ලබාදෙන ලද අවබෝධාත්මක මාර්ගෝපදේශ සහ තිරසාර නායකත්වය උදෙසා සභාපතිවරයා සහ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත මාගේ අවංක ස්තුතිය මෙසේ පුද කෙරේ.

චන්දන එල්. අළුත්ගම
ප්‍රධාන විධායක නිලධාරී

2022 මැයි 24 වැනි දින

STRENGTH

සවිබලය

අපගේ සවිබලය රඳාපවතින්නේ අපගේම නොසැලෙන හර පද්ධතිය සහ සුපිළිපන් බව මතයි.

වාර්තාවේ ස්වභාවය

සමෝධානික වාර්තාකරණ ආකෘතියෙහි (IIRC) ප්‍රමුඛ මාර්ගෝපදේශයන්ට අනුකූලව සම්පාදනය කරන ලද ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි 4 වැනි වාර්ෂික වාර්තාව මෙසේ ඔබ වෙත පිළිගන්වමු. සමෝධානික මූලධර්ම වලට අනුකූලව, මෙම වාර්තාව මගින් ශ්‍රී ලංකාවේ සේවාලාභීන්, සේවකයින්, ආයෝජකයින්, රජය සහ නියාමන අධිකාරීන් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සම්බන්ධ අභිමතයක් සහිත සහ තිරසාර වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරන්නා වූ සෙසු කවර හෝ පාර්ශ්වකරුවන් අන්තර්ග්‍රහනය කොට ගත් පාඨක පිරිසක් ආවරනය කෙරේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් යනු ශ්‍රී ලංකාවේ විශාලතම රජයේ හිමිකාරිත්වය සහිත රක්ෂණ සමාගම වන අතර එමගින් ස්වකීය දීප ව්‍යාප්ත ශාඛා ජාලය හා සේවා ස්ථානයන් ඔස්සේ එහි සේවාලාභීන් වෙත නව්‍ය රක්ෂණ සේවාවන් සපයනු ලැබේ. මෙයට ඉහත සමෝධානික වාර්ෂික වාර්තාව 2020 දී ප්‍රකාශයට පත් කරන ලද අතර අපගේ සියලු වාර්ෂික වාර්තා අපගේ ආයතනික වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබා ගත හැක.
වෙබ් අඩවිය - www.srilankainsurance.com

විෂයපථය සහ සීමාව

මෙම වාර්තාව මගින් 2021 ජනවාරි 01 වැනි දින සිට 2021 දෙසැම්බර් 31 වැනි දින දක්වා වන කාලපරිච්ඡේදය ආවරනය කෙරෙන අතර එමගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ව්‍යාපාරික ක්‍රියාකාරකම්, මූල්‍යමය සහ මෙහෙයුම් කාර්යසාධනය, පුරෝකථනයන්, පාලනය හා මෙහෙයුම් වටපිටාවට සාපේක්ෂව අවදානම් කළමනාකරණය යන කරුණු ආවරනය කරමින් 2021 මූල්‍ය වර්ෂය තුළ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කාර්යසාධනය සම්බන්ධ පූර්ණ විග්‍රහයක් පාර්ශ්වකරුවන් වෙත සපයනු ලැබේ. මෙම වාර්තාව සමෝධානික වාර්තාකරණ ආකෘතියෙහි සමස්ත ප්‍රාග්ධනයන් 6 ආවරනය කෙරෙන්නා වූ ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත වලින් සමන්විත වේ.

වාර්තාකරණ ආකෘතිය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙම වාර්තාව සම්පාදනය කිරීමේදී පහත දැක්වෙන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීම සැළකිල්ලට ගෙන ඇත;

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්
- IIRC (ජාත්‍යන්තර සමෝධානික වාර්තාකරණ කවුන්සිලය) ආකෘතිය
- ආයතනික පාලන සංග්‍රහය - 2017, රජයේ හිමිකාරිත්වය සහිත රක්ෂණ සමාගම් වලට අදාළ නෛතික ආකෘතික රාමුව
- GRI සම්මතයන්
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG's)

මෙම වාර්තාවේ විෂයපථය සහ සීමාවන් පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදයට අදාළ වාර්තාවේ විෂයපථය සහ සීමාවන්ගෙන් කිසිදු සැළකිය යුතු වෙනස්වීම් නොමැති බවත්, පෙර වාර්තාකරණ වසරේ නිකුත් කරන ලද වාර්ෂික වාර්තාව සමග සැසැඳීමේදී කිසිදු ප්‍රතිප්‍රකාශයක් මෙම වාර්තාවේ ඇතුළත් නොවන බවත් සැළකිය යුතු වේ.

ප්‍රාමාණිකත්වය

ප්‍රමාණිකත්ව මූලධර්මය - මෙම වාර්තාවේ මූල්‍යමය නොවන අන්තර්ගතය නිර්ණය කිරීම සඳහා කෙටි, මධ්‍ය හා දිගු කාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය කිරීම සඳහා සමාගමෙහි හැකියාව කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරන්නා වූ ආර්ථික, පාරිසරික සහ සමාජයීය සාධක භාවිත කෙරිණි. මෙම සංකල්පය පාර්ශ්වකරුවන් වෙත අදාළ විය හැකි තිරසාරත්ව තොරතුරු (මූල්‍යමය නොවන අන්තර්ගතය) ඉදිරිපත් කිරීම සඳහා ලෝක වාර්තාකරණ ව්‍යාපෘතිය (GRI) මගින් ප්‍රවර්ධනය කරන ලද්දකි. ඒ අනුව, අප විසින් කෙටි, මධ්‍ය හා දිගු කාලීන වශයෙන් වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වන අපගේ හැකියාව කෙරෙහි බලපෑ හෝ බලපෑ හැකි වෙතැයි අදහස් කරන ලද ප්‍රමාණිකත්ව කරුණු පදනම් කරගනිමින් මෙහි අන්තර්ගතය සම්පාදනය කරනු ලැබ ඇත. මෙම වාර්තාව මගින්, අපගේ ක්‍රමෝපායන් වැඩිදියුණු කරමින් සහ අපගේ ප්‍රාග්ධනයන් හය ඔස්සේ සම්පත් ප්‍රතිසැකසුම මගින් සමාගම වෙත වටිනාකම් නිර්මාණය සහ අපගේ පාර්ශ්වකරුවන් වෙත ධනාත්මක ප්‍රතිඵල ලබාදීම උදෙසා මෙකී ප්‍රමාණාත්මක කරුණු සම්බන්ධයෙන් කටයුතු කෙරෙන ආකාරය සාකච්ඡාවට භාජන කෙරේ.

අප විසින් ප්‍රාමාණික ගැටලු නිරාකරණය සඳහා අපගේ ප්‍රාග්ධනයන් ඔස්සේ සම්පත් වෙන් කල ආකාරය

ප්‍රාමාණික ගැටලු	මූල්‍ය	නිෂ්පාදිත	බුද්ධිමය	මානව	සමාජයීය	ස්වභාවික
ආර්ථික කාර්යසාධනය	✓	✓	✓			
වෙළඳපොල නියෝජනය	✓	✓		✓	✓	
දූෂණ විරෝධී			✓		✓	
ප්‍රති තරගකාරී චර්යාව			✓		✓	
සේවා නියුක්තිය	✓			✓		
වෘත්තීයමය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව	✓			✓		
පුහුණුව හා සංවර්ධනය	✓			✓		
විවිධත්ව අන්තර්ග්‍රහනය			✓	✓		
වෙනස් කොට නොසැළකීම			✓	✓		
එක්රැස්වීමේ සහ සාමූහික කේවල්කරණ නිදහස				✓		
දේශීය ප්‍රජාවන්	✓				✓	✓
සේවාලාභී සෞඛ්‍ය හා සුරක්ෂිතතාව					✓	
අලෙවිකරණය සහ ලේබල්කරණය					✓	
සමාජ ආර්ථික අනුකූලතාව					✓	✓

ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශ

මෙම වාර්තාවෙහි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි මූල්‍යමය තත්ත්වය සහ මෙහෙයුම් වල ප්‍රතිඵල සම්බන්ධ ඇතැම් 'ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශයන්' ඇතුළත් වන අතර, එසේ වනුයේ ඒවා සිදුවීම් වලට සම්බන්ධ වන සහ අනාගතයේදී සිදුවිය හැකි හෝ නොහැකි තත්ත්වයන් මත රදාපවතින බැවින් ඒවා ස්වභාවයෙන්ම, අවදානමට සහ අවිනිශ්චිතාවන්ට ලක් වන නිසාවෙනි. ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශයන්හි ඇතුළත් ප්‍රතිඵල වලින් සැබෑ ප්‍රතිඵල වෙනස් විය හැකි ආකාරයේ සාධක අතරට ජාතික ආර්ථික තත්ත්වයන්, රක්ෂණ රෙගුලාසි, සහ තරගකාරීත්ව හා නියාමන සාධකයන් ඇතුළත් වේ. එනයින් බලන කල, වාර්තාවේ සඳහන් ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශයන් ඒවා සිදු කරන ලද දිනට පමණක් අදාළ වන බවට උපකල්පනය කෙරෙන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් නව තොරතුරු, අනාගත සිදුවීමේ හෝ වෙනත් අයුරකින් කිසිදු ඉදිරි දැක්ම පිළිබඳ ප්‍රකාශයක් යාවත්කාලීන කිරීමේ හෝ සංශෝධනය කිරීමේ කිසිදු වගකීමක් භාර නොගැනේ.

ප්‍රතිචාර

අපගේ වාර්ෂික වාර්තාවේ තත්ත්වය උසස් කරගැනීම සඳහා ඔබගේ ගැටලු සහ යෝජනා ඉතසිතින් පිළිගනු ලබන අතර ඔබගේ සියලු ප්‍රතිචාරයන් පහත ලිපිනය වෙත යොමු කරන්න.

බී.ඒ. රුවනි ධර්මවර්ධන
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - අනුකූලතා සහ අවදානම්
සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සංස්ථාව.
"රක්ෂණ මන්දිරය",
අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
දුරකථන: +94 11 235 7741

ක්‍රමෝපාය සහ අවධානය

40 - ව්‍යාපාර ආකෘතිය
42 - ප්‍රාමාණික ගැටලු
43 - පාර්ශ්වකාරුවන්ගේ සම්බන්ධතාවය
45 - ක්‍රමෝපායික ප්‍රමුඛතා

TRANSFOR-MATION

පරිවර්තනීය වෙනස

අපගේ පරිවර්තනීය වෙනස නිසැකවම අතිශය ආදර්ශවත් වූවක් වන අතර එහි විශිෂ්ටතම ප්‍රතිඵල අනාගතයේදී දැකගත හැකි වනු ඇත

ව්‍යාපාර ආකෘතිය

ආදායයන් සපයනු ලබන පාර්ශ්වකරුවන්

කොටස් හිමිකරුවන්:
99.97%
භාණ්ඩාගාර ලේකම්

රක්ෂණ ඔප්පු හිමියන්:
1,025,621
ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්
1,259,483
සාමාන්‍ය රක්ෂණ ඔප්පු හිමියන්

සේවකයින්:
46% ස්ත්‍රී
54% පුරුෂ
2,767 එකතුව

ව්‍යාපාරික සහකරුවන්:
ප්‍රතිරක්ෂකයින්
නියෝජිතයින්
තැරැව්කරුවන්
බැංකු

නියාමන ආයතනයන්:
IRCSL
DROC
FIU – CBSL
සැපයුම්කරුවන්

ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ

දැක්ම

මෙහෙවර

කුබුන්වත් ඔබ සහ ප්‍රාග්ධන කළමනාකරණය

ආදායයන්

- කොටස් හිමිකරුවන්ගේ අරමුදල්
- ආයෝජන
- ජීවිත අරමුදල
- සාමාන්‍ය අරමුදල
- දේපළ,පිරියත සහ උපකරණ
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ආයතනගත දැනුම
- යහ ක්‍රියාකාරකම්
- දත්ත විශ්ලේෂණ
- සේවා සහ සැපයුම්
- සබඳතා
- හවුල්කාරිත්වයන් සහ සන්ධානයන්
- සමීක්ෂණ වාර්තා
- තහවුරු කිරීමේ සේවා
- උපයුක්තතා

ක්‍රියාකාරකම්
- ප්‍රාරක්ෂණය
- සේවාකරණය සහ රක්ෂණ ඔප්පු පරිපාලනය
- හිමිකම්පෑම් කළමනාකරණය
- අලෙවි, විකිණුම් හා බෙදාහැරීම්

පාලන ආකෘතික රාමුව

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම සහ නියාමන අධිකාරීන්

මෙහෙයුම් වටපිටාව



ව්‍යාපාර ආකෘති වගුව මගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ඇතුළත ක්‍රියාකාරකම් ප්‍රවාහය පිළිබඳව සාරාංශගත විග්‍රහයක් සපයනු ලබන අතර එහිදී අප විසින් මෙහෙයුම් සිදුකරන්නා වූ වටපිටාව පමණක් නොව අපගේ දර්ශනය සහ මෙහෙවරද ඒවාට බලපාන ආකාරය නිරූපනය කෙරේ. අප විසින් නීතිරීති හා කොන්දේසි: අපගේ දැක්ම, මෙහෙවර ඇතුළත් කටයුතු කරනු ලබන අතර අපගේ වටිනාකම් මගින් අප විසින් අත්පත් කරගැනීමට අපේක්ෂිත අරමුණ සහ අදාළ අරමුණු ඉටු කරගැනීම සඳහා අප විසින් අපගේ ක්‍රමෝපාය සකසනු ලබන ආකාරය නිර්වචනය කෙරේ. ඒ හා සමානවම, මෙකී බාහිර සහ අභ්‍යන්තර ආභාසයන් අපගේ අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ඇතුලත සිදුකෙරෙන්නා වූ සෑම ක්‍රියාකාරකම කෙරෙහිම බලපෑම් ඇති කරයි. එහිදී, අපගේ අරමුණුද අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාකාරකම් අනුව හැඩගැන්වෙන අතර මෙම චක්‍රය අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දිගින් දිගටම ස්වයං සැකසුමක් ඔස්සේ අදාළ තත්ත්වයන්ට අනුගත වෙමින් ඉදිරිය කරා ගමන් කරන බවට තහවුරු කෙරේ.

ප්‍රාමාණික ගැටලු

ප්‍රාමාණිකත්වය

ප්‍රාමාණිකත්වය යන සංකල්පය ලෝක වාර්තාකරණ සම්මතයන්ගෙන් (GRI) උකහා ගන්නා ලද්දකි. මෙමගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මූල්‍යමය නොවන සාධකයන් පාර්ශ්වකරුවන් වෙත හිතකර අයුරින් බලපාන ආකාරය සහ සමාගම වෙත ඒවායේ වැදගත්කම නිරූපනය කෙරේ. මෙම වාර්තාව ඔස්සේ, අපගේ ක්‍රමෝපාය හා සම්පත් පිරිපහදු කරමින් ප්‍රාමාණික ගැටලු නිරාකරණය කොට ගත් ආකාරය ඉදිරිපත් කෙරේ.

ප්‍රාමාණිකත්ව ගැටලු

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පාර්ශ්වකාර වටිනාකම් නිර්මාණය මෙන්ම සමාගමෙහි වර්ධනය පිළිබඳවද අවධානය යොමු කරයි. ආර්ථික, සමාජයීය සහ පාරිසරික වටිනාකම් නිර්මාණය කිරීම උදෙසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විවිධ අයුරින් ඵලදායී ලෙස පාර්ශ්වකරුවන් සමග කටයුතු කරයි.

අංකය	අංක තේමාව	ශ්‍රී.ලං.ඉ වෙත වැදගත්කම	පාර්ශ්වකරුවා වෙත වැදගත්කම
1	ආර්ථික කාර්යසාධනය	ඉතා ඉහළ	ඉතා ඉහළ
2	වෙළඳපොල නියෝජනය	ඉතා ඉහළ	ඉතා ඉහළ
3	දූෂණ විරෝධී	ඉහළ	ඉහළ
4	ප්‍රති තරගකාරී චර්යාව	ඉහළ	ඉහළ
5	සේවා නියුක්තිය	ඉතා ඉහළ	ඉතා ඉහළ
6	වෘත්තීයමය සෞඛ්‍ය හා සුරක්ෂිතතාව	ඉහළ	ඉහළ
7	පුහුණුව හා සංවර්ධනය	ඉතා ඉහළ	ඉතා ඉහළ
8	විවිධත්වය සහ සම අවස්ථා	ඉතා ඉහළ	ඉතා ඉහළ
9	වෙනස් කොට නොසැළකීම	ඉහළ	ඉහළ
10	එක්රැස්වීමේ සහ සාමූහික කේවල්කරණ නිදහස	ඉහළ	ඉහළ
11	දේශීය ප්‍රජාවන්	ඉහළ	මධ්‍යම
12	සේවාලාභී සෞඛ්‍ය හා සුරක්ෂිතතාව	ඉහළ	ඉහළ
13	අලෙවිකරණය සහ ලේබල්කරණය	ඉහළ	මධ්‍යම
14	සමාජ ආර්ථික අනුකූලතාව	ඉහළ	ඉහළ



පාර්ශ්වකාරුවන්ගේ සම්බන්ධතාවය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රක්ෂකයා සහ ශ්‍රී ලාංකිකයින්ගේ වඩාත් විශ්වාසය දිනූ රක්ෂණ සමාගම වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීමේ අපගේ ප්‍රයත්නය තුළ, අප විසින් දිගු කාලීනව අපගේ පාර්ශ්වකරුවන් සමග සබඳතා තවදුරටත් සවිමත් කරගැනීමට කටයුතු කරනු ලැබේ.

අපගේ බහුවිධ පාර්ශ්වකාර කණ්ඩායම් අපගේ ව්‍යාපාරය වෙත බලපෑම් ඇති කරනු ලබන කරුණු පිළිබඳව විවිධ මත දරන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි දිගු කාලීන සාර්ථකත්වය හා තිරසරත්වය උදෙසා වන අවබෝධයන් සහ වටිනාකම් වර්ධනය කරගැනීමේදී මෙම අදහස් වලට සවන්දීම අතිශය වැදගත් වන බව අපගේ විශ්වාසයයි. අතිශයින්ම අනුකූලනය කරන ලද පාර්ශ්වකාර හඳුනාගැනීමේ ක්‍රියාවලියකින් අරඹමින්, පාර්ශ්වකාර සහභාගීත්වය උදෙසා වන ක්‍රමානුකූල එළඹුමක් අප විසින් අනුගමනය කරනු ලැබේ.

පාර්ශ්වකාරුවන් හඳුනාගැනීම

පාර්ශ්වකරුවන් යනු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත බලාපාන සහ/හෝ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ක්‍රියාකාරකම්, සැලසුම් හෝ සේවාවන් සහ ආයතනික කාර්යසාධනයෙහි බලපෑමට ලක්වන්නා වූ පුද්ගලයින්, පුද්ගල කණ්ඩායම් හෝ ආයතනයන් වේ. මේ අයුරින් හඳුනාගනු ලබන පාර්ශ්වකරුවන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මත වන ඔවුන්ගේ බලපෑම් මට්ටම අනුව ප්‍රමුඛතාගත කෙරේ.

සහභාගීත්ව ක්‍රමවේදයන් සහ සහභාගීත්ව ප්‍රතිපත්ති

විවිධ වූ පාර්ශ්වකරුවන් උදෙසා අප විසින් එකිනෙකට වෙනස් සහභාගීත්ව ක්‍රමවේදයන් යොදාගනු ලැබේ. සාමාන්‍යයෙන් සහභාගීත්ව මාධ්‍යයන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත අදාළ පාර්ශ්වකරුවන්ගේ ආභාසය/බලපෑම මත නිර්ණ කෙරෙන අතර, පහත දැක්වෙන ප්‍රතිපත්ති සියලුම සහභාගීත්ව මාධ්‍යයන් වෙත අදාළ වේ:

- උපදේශාත්මක සංවාදයක් නිර්මාණය කිරීම උදෙසා වන විවෘතභාවය සහ විනිවිදභාවය
- තොරතුරු වල කාලීන බව සහ අදාළත්වය
- ප්‍රතිචාර දැක්වීම වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩ සහ නිරන්තර සමාලෝචනය

හිමිකාරීත්වය සහ වගවීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි පාර්ශ්වකාර සහභාගීත්වය විමධ්‍යගත කොට ඇති අතර පාර්ශ්වකරවන්ගේ සියලු සබඳතා හෝ ඔවුන්ගේ ප්‍රතිචාරයන් කළමනාකරණය කිරීම සඳහා තනි කණ්ඩායමක් යොදා නොගැනේ. ස්වකීය වගකීම් පරාසයන් තුළ සබඳතා කළමනාකරණය හා බාහිර සහ අභ්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ අභිමතයන් සපුරාලීම සම්බන්ධයෙන් සියලුම සේවකයින් වගවීමෙන් බැඳේ.

ආයතනය තුළ පරම පාලන අධිකාරිය වශයෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන්ම පාර්ශ්වකාර සබඳතා වල තත්ත්වය ඔවුන්ගේ අවශ්‍යතා, අභිමතයන් හා අපේක්ෂාවන් සම්බන්ධ දැනුවත් කෙරෙන අතර එය සැලසුම්කරණය හා තීරණ ගැනීම කෙරෙහි ක්‍රමෝපායික ආදානයක් සපයයි.



පාර්ශ්වකාරුවන්ගේ සම්බන්ධතාවය

පාර්ශ්වකරුවා වෙත අදාළ ප්‍රාමාණික කරුණු	ශ්‍රී.ලං.ඉ වෙත බලපෑම	සහභාගීත්වය	සහභාගීත්ව සංඛ්‍යාතය
ශ්‍රී ලංකා රජය ආයෝජනය, ව්‍යාපාර සංවර්ධනය, නව්‍යතාවය සහ ක්ෂේත්‍ර වර්ධනය, අනුකූලතා	ඉහළ	වාර්ෂික වාර්තාව	වාර්ෂික
		මාධ්‍ය නිවේදන	අවශ්‍යතාවය මත පදනම්ව
		අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමග රැස්වීම් සහ සාකච්ඡා	අවශ්‍යතාවය මත පදනම්ව
සෙසු නියාමකයින් නීතිරීති හා රෙගුලාසි වෙත අවශ්‍යතා මත පදනම් වූ අනුකූලතාවය, මනා සාංගමික පාලනය, සදාචාර සම්පන්න චර්යාව	ඉහළ	නියාමන අධිකාරීන් සමග රැස්වීම්	අවශ්‍යතාවය මත පදනම්ව
		වාර්ෂික වාර්තාව	වාර්ෂික
		ක්ෂේත්‍රයේ සංසද	අවශ්‍යතාවය මත පදනම්ව
		ව්‍යවස්ථාපිත ලැබීම් සහ තත්ත්ව වාර්තා	කාර්තුමය,වාර්ෂික
		මාධ්‍ය නිවේදන	අවශ්‍යතාවය මත පදනම්ව
සේවාලාභීන් සේවාලාභී සබඳතාවය, රඳවාගැනීම, අදාළ සැලසුම්, සැලසුම් තොරතුරු, රක්ෂණ ඔප්පු බෝනස්, රක්ෂණ ඔප්පු හිමිකම්පෑම්, සෙසු නියාමකයින්	ඉහළ	ඇමතුම් මධ්‍යස්ථානය	නිත්‍ය
		සේවාලාභී තෘප්තිය සම්බන්ධ සමීක්ෂණ	අවශ්‍යතාවය මත පදනම්ව
		මුහුණට මුහුණ අන්තර් ක්‍රියාකාරකම්	නිත්‍ය
		වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය	නිත්‍ය
		සේවාලාභී ප්‍රතිචාරය	නිත්‍ය
ව්‍යාපාරික සහකරුවන්	මධ්‍යම	රැස්වීම්	අවශ්‍යතාවය මත පදනම්ව
වර්ධන අවස්ථා, නිසි කලට ගෙවීම්		ඊ මේල් සහ දුරකථනය ආදිය ඔස්සේ සන්නිවේදනය	අවශ්‍යතාවය මත පදනම්ව
සේවකයින් සේවක සුබසාධනය, තෘප්තිය, රඳවාගැනීම, පුහුණුව හා සංවර්ධනය, ඇගයුම් හා ත්‍යාග, වෘත්තීය ප්‍රගතිය, රැකියා සුරක්ෂිතතාව	ඉහළ	රැස්වීම්	නිත්‍ය
		ඊ මේල් සහ දුරකථනය ආදිය ඔස්සේ සන්නිවේදනය	අවශ්‍යතාවය මත පදනම්ව
		අනුප්‍රාප්තික සැලසුම්කරණය	වාර්ෂික/ අවශ්‍යතාවය මත පදනම්ව
		පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම්	අවශ්‍යතාවය මත පදනම්ව
		සම්මාන උළෙල	වාර්ෂික
		ප්‍රජා ව්‍යාපෘතීන් සඳහා සහභාගීත්වය	අවශ්‍යතාවය මත පදනම්ව
		දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම	ද්වි වාර්ෂික
		අන්තර්ජාලය, බී කනෙක්ට් ඇප් ඔස්සේ තොරතුරු හුවමාරුව	නිත්‍ය
		අරමුණු/ප්‍රමුඛ කාර්යසාධන දර්ශක සැකසීම	වාර්ෂික
		කාර්යසාධනය ඇගයීම	ද්වි වාර්ෂික
ප්‍රජාව හා වටපිටාව ප්‍රජා ආයෝජනය, ප්‍රජා සත්කාරයන්	මධ්‍යම	ප්‍රජා ව්‍යාපෘති	නිත්‍ය
		මාධ්‍ය නිවේදන	අවශ්‍යතාවය මත පදනම්ව
		වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය	නිත්‍ය
		අවස්ථා	අවශ්‍යතාවය මත පදනම්ව
		ප්‍රජා සත්කාරක ව්‍යාපෘති	නිත්‍ය
		තිරසාරත්ව ව්‍යාපෘති	නිත්‍ය

ක්‍රමෝපායික ප්‍රමුඛතා

ක්‍රමෝපායික ප්‍රමුඛතා

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් 2021 මූල්‍ය වර්ෂයේදී අතිශය ක්‍රියාශීලී සහ වෙනස්වීම් වලට භාජනය වූ වටපිටාවක් තුළ සිය මෙහෙයුම් සිදු කලේය. අනපේක්ෂිත බාහිර සාධක හේතුකොට ගෙන ඇතැම් ක්‍රමෝපායින් ප්‍රමුඛතාවන් ක්‍රියාවට නැංවීමේදී විවිධ අභියෝගයන්ට මුහුණදීමට අප හට සිදු විය.

ක්‍රමෝපායික ප්‍රමුඛතා හඳුනාගැනීමේදී, අප විසින් අපගේ සේවාලාභී පදනම වෙත බලපාන සාර්ව ආර්ථික සාධක, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ශක්තීන් මෙන්ම තරගකරුවන්ගේ සැලසුම් වලට සාපේක්ෂව අපගේ සැලසුම් ස්වභාවය පිළිබඳව සැළකිල්ලට ගැනුනි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

	විකිණුම්	අලෙවි	කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
ක්‍රියාවට නැංවිය හැකි ව්‍යාපෘති	• මනා සේ කැප වූ සේවා බලකායක් නිර්මාණය කිරීම • 'අප විසින් සිදුකරනු ලබන සෑම කටයුත්තකදීම සේවාලාභියා වෙත ප්‍රමුඛස්ථානය ලබාදීම' යන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ගුණාත්මක ප්‍රතිපත්තිය මත පිහිටා විකිණුම් සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම • චැනල වෙත අවධානය යොමු කෙරෙන විකිණුම් ව්‍යුහයක් සැකසීම හා පවත්වාගෙන යාම • සෑම දෙනා වෙතම රක්ෂණය ප්‍රවර්ධනය කිරීම • කෝවිඩ් 19 සමයේදී දෛනික මෙහෙයුම්: අන්තර්ජාලගත පුහුණුව සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය සහාය විය • විකිණුම් කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ජංගම විසඳුම් නිර්මාණය සහ පවත්වාගෙන යාම	• සේවාලාභී කේන්ද්‍රීය සැලසුම් විවිධාංගීකරණය ඔස්සේ සන්නාම කාර්යසාධනය ඉහළ නැංවීම සහ මෝටර් ප්ලස් සන්නාමය හා මෝටර් උප සන්නාමයන් ස්ථානගත කිරීම • සහයෝගීතාවයන් ඔස්සේ මහා පරිමාණ රක්ෂණ ව්‍යාපෘතීන් හඳුන්වාදීම • ව්‍යාපාර සංවර්ධනය උදෙසා ඵලදායී පාර්ශ්වකාර සහභාගීත්ව යාන්ත්‍රණයන් සැකසීම • භාවිත කරන්නන් හට වඩාත් යහපත් අත්දැකීමක් ලබාදීම සඳහා මෝටර් නොවන සැලසුම් කාණ්ඩයන් ආවරනය කරමින් • ඵලදායී අයුරින් ඔවුන්ගේ අපේක්ෂිත ව්‍යාපාරික ඉලක්ක සපුරාගැනීම සඳහා පෞද්ගලික ධාරාවන් සහ ආයතනික බෙදාහැරීමේ චැනල වෙත පහසුකම් සැලසීම	• සේවාලාභීන් වෙත වඩාත් කඩිනමින් සේවා සැලසීම සඳහා අපගේ දීප ව්‍යාප්ත ආවරනය සවිමත් කිරීම • සමස්ත ව්‍යාපාරික මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම: ගෙවීමේ ක්‍රම, ස්වයං සේවා, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තොරතුරු වෙත පිවිසුම පහසුව ආදිය • ඉහළ නංවන ලද සේවාලාභී සහභාගීත්වය
2021 ප්‍රගතිය	• අපගේ ශ්‍රම බලකායෙහි ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා රු.මිලියන 2.4 ක ආයෝජනයක් සිදුකෙරිණි • සියලුම සේවකයින් හට අන්තර්ජාලගත පුහුණුව ලබාදීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය ඉවහල් විය.	• වාණිජ රථවාහන හිමිකරුවන්ගේ කාණ්ඩයෙහි අවශ්‍යතා සපුරාලීම සඳහා අමතර ප්‍රතිලාභ සහිතව වාණිජ රථවාහන භාවිත කරන්නන් වෙත 'මෝටර් ප්ලස් කොමර්ෂල්' සැලසුම හඳුන්වාදීම • සේවාලාභී අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාලීම සඳහා දැනට 'බිස්නස් ක්ලබ්' සැලසුම යටතේ පිරිනැමෙන ප්‍රතිලාභ ඉහළ නැංවීම • කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් අපගේ සේවාලාභීන් අලුතින් උද්ගත වූ අවශ්‍යතා සපුරාගැනීම සඳහා ශල්‍ය හා රෝහල්ගතවීමේ සැලසුම යටතේ වන ප්‍රතිලාභ ඉහළ නැංවීම • බෞද්ධ භික්ෂූන් සහ ඔවුන්ගේ පවුල් සඳහා වන විශේෂ ශල්‍ය හා රෝහල්ගතවීමේ සැලසුම 'නාගරාජ' හඳුන්වාදීම • විකිණුම් බලකායෙහි ධෛර්‍යය ඉහළ නැංවීම සඳහා විකිණුම් තරගාවලි පැවැත්වීම • මෝටර් නොවන ව්‍යාපාර සඳහා හරස් විකිණුම් ව්‍යාපෘතීන් ඇරඹීම • විකිණුම් බලකාය සහ විකිණුම් කළමනාකාරිත්වය වෙත ක්ෂණිකව සියළු සම්බන්ධ කිරීම මගින් සමාජ ජාල ඔස්සේ අන්තර්ජාලගත සැලසුම් ප්‍රවර්ධන සහ ලීඩ් උත්පාදන ව්‍යාපෘතීන් දියත් කිරීම	• පොදු සේවා කොමිසමෙහි 16 ශාඛා පාලන ව්‍යුහය ප්‍රති ආකෘතිගත කිරීම 2021 මූල්‍ය වර්ෂයේදී සිදු කෙරිණි. • ව්‍යාපාර මෙහෙයුම් සම්බන්ධ කාර්යක්ෂඹතා වර්ධනය සඳහා පියවර ගන්නා ලදී. • අපගේ ව්‍යාපාරයේ සෑම අංශයකම අවම මෙහෙයුම් තත්ත්ව සම්මතයන් පවත්වා ගැනීම: හිමිකම්පෑම් පියවීම සහ අනුශාංගික සේවා • මෝටර් හිමිකම්පෑම් ක්‍රියාවලිය ඩිජිටල්කරණය
2022 සඳහා ඉලක්ක	• නිසි පරිදි සේවාවන් සිදු නොකෙරෙන ප්‍රදේශයන් වෙත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම • අඩු පිරිවැය ශාඛා ආකෘතියක් වෙත ගමන් කිරීම • අපගේ පාර්ශ්වකරුවන් වෙත විවිධ වටිනාකම් එක් කරනු ලබන අතරතුර සන්නාම කීර්තිනාමය පවත්වාගෙන යාම		

ක්‍රමෝපායික ප්‍රමුඛතා

LIFE BUSINESS

	විකිණුම්	අලෙවි	කාර්යක්ෂමතාව ඉහළ නැංවීම
ක්‍රියාවට නැංවිය හැකි ව්‍යාපෘති	• පොදු පිවිසුමක් භාවිත කරමින් අපගේ විකිණුම් බලකායට ඕනෑම ස්ථානයක සිට ඕනෑම මොහොතකදී සම්බන්ධ වීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායෙහි සහාය • වැඩි විකිණුම් වර්ධනයක් අත්කර ගැනීම සඳහා නියෝජිත සහභාගීත්වය ඉහළ නැංවීම	• ජීවිත රක්ෂණ පොදු සන්නාමය සහ සැලසුම් සන්නාමයන් සවිබල ගැන්වීම • ජීවිත රක්ෂණ සැලසුම් සමූහය සමාලෝචනයට ලක් කරමින් නූතන සේවාලාභී අවශ්‍යතා සහ කාණ්ඩයන්ට ගැළපෙන පරිදි නැවත සැකසීම • බෙදාහැරීමේ චැනලය වෙත සහාය දක්වමින් ඩිජිටල් චැනල විවෘත කිරීම	• අපගේ සේවා තත්ත්වය ඉහළ නැංවීම සඳහා සේවා ස්ථාන ඩිජිටල්කරණය සහ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය • විකිණුම් ආශ්‍රිත ගැටලු නිරාකරණය සඳහා අපගේ ශ්‍රම බලකායෙහි සේවා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම උදෙසා ආයෝජනය • ඩිජිටල් ජීවිත රක්ෂණ යෝජනා පත්‍රය හඳුන්වාදීම • ප්‍රාරක්ෂණ ක්‍රියාවලිය නැවත සැකසීම • හිමිකම්පෑම් ක්‍රියාවලිය නැවත සැකසීම
2021 ප්‍රගතිය	• වඩාත් කඩිනම් වර්ධනයක් තහවුරු කිරීම සඳහා අපේක්ෂිත පළමු වාරිකය සහ පළමු වසර වාරිකය උත්පාදනය කිරීම • මසකට 3 ක අවම ඵලදායීතාවයක් පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකාරකම් ඔස්සේ ඉලක්කගත පළමු වාරිකය සහ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව අත්පත් කරගැනීම • විකිණුම් බලකාය දිරිගැන්වීම සඳහා නියෝජිත සහභාගීත්වය ඉහළ නැංවීම	• අර්ලි කෑෂ් සහ ස්පීඩ් සැලසුම් ප්‍රති සන්නාමගත කිරීම සහ නැවත හඳුන්වාදීම ප්‍රමුඛ වෙළඳපොල කාණ්ඩයන් සමග ගැලපීම සහ අවශ්‍යතාවය මත පදනම් වූ විකිණුම් සඳහා පහසුකම් සැලසීම උදෙසා ප්‍රගුණ සහ යස ඉසුරු වශයෙන් පෙර හඳුන්වාදෙන ලද සැලසුම් සඳහා ආයෝජනය • කෙටි කාලීන ආයෝජන අවශ්‍යතා හඳුනාගනිමින් යසස් - වසර 2 රක්ෂණ සැලසුම හඳුන්වාදීම සහ ක්‍රියාකාරීව අලෙවිකරණය • සේවාලාභීන් සහ උපදේශකයින්ගේ පහසුව තකා ප්‍රධාන සැලසුම් අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීමේ හැකියාව ලබාදෙමින් ඩිජිටල් යෝජනාපත්‍ර ක්‍රමය එළිදැක්වීම	• ප්‍රාරක්ෂණය, සේවාකරණය සහ හිමිකම්පෑම් සඳහා අන්තර්ජාලගත ක්‍රියාවලි අත්පොත සැකසීම • සේවාලාභී ඇප් එක ඔස්සේ ජීවිත රක්ෂණ බෝනස් සහතිකය බාගත කිරීමේ පහසුකම් සැලසීම • ජීවිත රක්ෂණ යෝජනා පත්‍ර ඩිජිටල් මාධ්‍යයෙන් භාරදීම • ප්‍රාරක්ෂණය, සේවාකරණය සහ හිමිකම්පෑම් සම්බන්ධ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් • ප්‍රාරක්ෂණය, සේවාකරණය සහ හිමිකම්පෑම් සඳහා වැඩිදියුණු කරන ලද සේවා මට්ටම් හඳුන්වාදීම
2022 සඳහා ඉලක්ක	• අපගේ ව්‍යාපාරයේ ඵලදායීතාවය සහ ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා නව ඩිජිටල් විසඳුම් හඳුන්වාදෙමින් කඩිනම් ඩිජිටල් සේවාවන් පවත්වාගෙන යාම • ලාභාංශ මත පදනම් වූ ජීවිත රක්ෂණ සැලසුමක් සැකසීම • ප්‍රතිරක්ෂණ මෙහෙයුම සමාලෝචනය කිරීම • ඩිජිටල් යෝජනා පත්‍රය භාවිතය ඉහළ නැංවීම • ඩිජිටල් මාධ්‍යයෙන් (e-policy) රක්ෂණ ඔප්පුව යැවීම • ඩිජිටල් මාධ්‍ය ඔස්සේ සේවාලාභී දැන්වීම් යැවීම • සේවාලාභී ඇප් එකෙහි විශේෂාංග වැඩිදියුණු කිරීම		

කළමනාකාරීත්වයේ විග්‍රහය

48 - මෙහෙයුම් වටපිටාව
49 - මූල්‍ය ප්‍රාග්ධනය
54 - නිෂ්පාදිත ප්‍රාග්ධනය
58 - බුද්ධිමය ප්‍රාග්ධනය
62 - මානව ප්‍රාග්ධනය
70 - සමාජ හා සබඳතා ප්‍රාග්ධනය
85 - ස්වභාවික ප්‍රාග්ධනය

WIN

ජයග්‍රහනයන්

අප නිරන්තරයෙන් අපගේ ජයග්‍රහනයන් අභිමානයෙන් සමරන අතර, එහිදී අපගේ සාමූහික වර්ධනය සඳහා අතිශය වැදගත් වූ මෙහෙවරක් ඉටු කල කාර්ය මණ්ඩලය ප්‍රශංසනීය ඇගයුමකට ලක් වේ

මෙහෙයුම් වටපිටාව

ශ්‍රී ලංකා ආර්ථිකය

වසංගතය හේතුවෙන් ඉකුත් වසරෙහි ආර්ථික සංකෝචනයට සාපේක්ෂව මෙම වසරේ පළමු අර්ධයේදී ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රබල අයුරින් යථා තත්ත්වයට පත් විය. ප්‍රමුඛ ආර්ථික ක්ෂේත්‍රයන්හි මහා පරිමාණ වර්ධනය, වසංගතයේ බලපෑමට ලක් වූවන් හට රජය සහ මහ බැංකුව විසින් පිරිනමන ලද මූල්‍ය හා ප්‍රතිපත්ති උත්තේජණ, සහ දීප ව්‍යාප්ත ප්‍රතිශක්තිකරණ ව්‍යාපෘතිය ඔස්සේ 'නව සාමාන්‍ය' වෙත සමස්ත වශයෙන් අනුගත වීම හේතුවෙන් පළමු අර්ධයේදී තථ්‍ය ආර්ථිකය වසරින් වසර පදනමක් මත 8.0% කින් වර්ධනය විය.

වසරේ දෙවන අර්ධයේදී කෝවිඩ් 19 යළි හිස එසවීමත් සමග මෙම වර්ධනීය වේගය මන්දගාමී වූයේ ප්‍රබල ආකාරයෙන් බලපෑම් ඇති කල වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා රට වසා දැමීම් සිදුකිරීම සහ සංචරන සීමාවන් පැනවීම හේතුවෙනි. නැවත වරක් ජනතාවගේ දෛනික ජීවිතය සහ ව්‍යාපාරික කටයුතු අහිතකර බලපෑම් ලක් වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වසංගතයේ පළමු රැල්ල හේතුවෙන් දුර්වලත්වයට පත් ආර්ථිකය තවදුරටත් සෘණාත්මක දිශාවට ගමන් කලේ වෙළඳ හිගය ඉහළයාම, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ශීඝ්‍රයෙන් අවප්‍රමාණය වීම, සංචාරක කර්මාන්තය සහ විදේශ ශ්‍රමික ප්‍රේශන බිඳවැටීම නිසාවෙන් විදේශ විනිමය ඉපැයුම් පහළයාම වැනි අව සාධක රැසක් සමගිනි. බාහිර ක්ෂේත්‍රයෙහි මෙකී ඉහළ ගිය අවදානම් හේතුවෙන් මූල්‍ය පද්ධතිය කෙරෙහි දැඩි පීඩනයක් ඇති විය. දේශීය අන්තයෙන්, ආහාර උද්ධමනය කරණ කොට ගෙන දිගින් දිගටම උද්ධමනය ඉහළ ගිය අතර ශ්‍රමික වෙළඳපොල අවිනිශ්චිතතා හේතුවෙන් විරැකියා මට්ටම සාමාන්‍යයට වඩා ඉහළ අගයක පැවතිනි.

ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුවේ තාවකාලික ජාතික ගිණුම් ඇස්තමේන්තු අනුව, ශ්‍රී ලංකා ආර්ථිකව 2020 පැවති සියයට 3.6 ක සංකෝචනයට සාපේක්ෂව 2021 දී තථ්‍ය සාධක අනුව සියයට 3.7 ක වර්ධනයක් වාර්තා කලේය. කෘෂි, කර්මාන්ත, සේවා, වන වගා සහ ධීවර ඇතුලු සියලුම ප්‍රමුඛ ක්ෂේත්‍රයන් මෙම වර්ධනය කෙරෙහි දායක විය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

රක්ෂණ ක්ෂේත්‍රය

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය සමාගම් 27 කින් සමන්විත වන අතර, එයට දිගු කාලීන රක්ෂණ සමාගම් 13 ක්, සාමාන්‍ය රක්ෂණ සමාගම් 12 ක් සහ දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ සේවාවන් ද්විත්වයම සපයන්නා වූ සමාගම් 2 ක් ඇතුළත් වේ. වසර 2021 දී ක්ෂේත්‍රයේ වත්කම් පදනමෙහි වර්ධනය සාමාන්‍ය මට්ටමක පැවති අතර වසරින් වසර පදනමක් මත එය වසර අවසානය වන විට රු.බිලියන 879.8 දක්වා සියයට 11.4 ක වර්ධනයක් වාර්තා කලේය. එයට අමතරව, විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ දළ ලිඛිත වාරිකය රු.බිලියන 208.2 සිට රු.බිලියන 233.8 දක්වා සියයට 12.2 ක වර්ධනයක් වාර්තා කලේය. මෙම කාලපරිච්ඡේදය තුළ, දිගු කාලීන රක්ෂණ උප ක්ෂේත්‍රයෙහි සහ සාමාන්‍ය රක්ෂණ උප ක්ෂේත්‍රයෙහි දළ ලිඛිත වාරිකය පිළිවෙලින් සියයට 21.1 කින් සහ සියයට 3.6 කින් ඉහළ ගියේය.

කෙසේ වුවද බදු පෙර ලාභය 4.9 ක ප්‍රතිශතයක් සහිතව වසර තුළදී ක්ෂේත්‍රයෙහි ලාභදායීත්වය පහළ යන ලදි. මෙහිදී දිගු කාලීන රක්ෂණ උප ක්ෂේත්‍රයෙහි බදු වලට පෙර ලාභය සියයට 16.1 කින් ඉහළ ගිය අතර සාමාන්‍ය රක්ෂණ උප ක්ෂේත්‍රයෙහි එය සියයට 20.7 ක පහළ යාමක් වාර්තා කලේය.

වසර 2020 සමග සැසඳීමේදී, විමර්ශනයට ලක් වන වසර තුළදී දිගු කාලීන රක්ෂණ උප ක්ෂේත්‍රයෙහි වත්කම් මත ආදායම සහ ස්කන්ධ මත ආදායම ඉහළ ගිය අතර, සාමාන්‍ය රක්ෂණ උප ක්ෂේත්‍රයෙහි එම අගයන් පහත වැටිනි.

දිගු කාලීන රක්ෂණ ක්ෂේත්‍රයෙහි සමස්ත වත්කම් වලට ප්‍රාග්ධනය වසර 2021 අවසානයේදී සියයට 20.9 කින් පහත වැටුනු අතර 2020 අවසානයේදී එම අගය සියයට 22.1 ක් විය. සාමාන්‍ය රක්ෂණ උප ක්ෂේත්‍රයෙහි සමස්ත වත්කම් වලට ප්‍රාග්ධනය 2020 අවසානයේදී වාර්තා වූ සියයට 48.3 ට සාපේක්ෂව 2021 දී සියයට 50.4 කින් වර්ධනය විය.

රක්ෂණ ක්ෂේත්‍රය මගින් සිදු කරන ලද ආයෝජනයන්හිදී රජයේ සුරැකුම් කෙරෙහි දැඩි අවධානයක් යොමු විය. වසර 2020 සමග සැසඳීමේදී දිගු කාලීන රක්ෂණ උප ක්ෂේත්‍ර වත්කම් මගින් රජයේ සුරැකුම් වල සිදු කරන ලද ආයෝජන සියයට 46.1 දක්වා පහත වැටුනු අතර සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එම අගය සියයට 45.7 ක් දක්වා ඉහළ යාමක් වශයෙන් වාර්තා විය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

මූල්‍ය ප්‍රාග්ධනය



තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සඳහා දායකත්වය

8 DECENT WORK AND ECONOMIC GROWTH

- ආදායම 21.8% කින් වර්ධනය විය
- දළ ලිඛිත වාරිකය 9.7% කින් වර්ධනය විය
- මූල්‍ය ආයෝජන ආදායම 41.7% කින් වර්ධනය විය
- රජයේ බදු සඳහා දායකත්වය 61% කින් වර්ධනය විය

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

- රු. මිලියන 9,836 ක දේශීය රක්ෂණ ක්ෂේත්‍රයෙහි විශාලතම බෝනස් නිකුතුව
- සමාගමෙහි සමස්ත වත්කම් 14% කින් වර්ධනය විය

11 SUSTAINABLE CITIES AND COMMUNITIES

- සුරක්ෂා ළමා රක්ෂණ ඔප්පු සඳහා පහසුකම් සම්පාදකයා වශයෙන් කටයුතු කිරීම
- මෝටර් රක්ෂණ ක්ෂේත්‍රයෙහි වෙළඳපොල ප්‍රමුඛයා වීම
- පූජ්‍ය පක්ෂය සඳහා නාගරාජ විශේෂ සෞඛ්‍ය රක්ෂණ ඔප්පු

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මූල්‍ය ප්‍රාග්ධනය මගින් විමර්ශනයට ලක් වන වසර තුළ සමාගමෙහි කාර්යසාධනය සහ මූල්‍යමය ස්ථාවරය විදහා දැක්වේ. මුදල් අමාත්‍යාංශයේ නියාමනයට ලක් වන සමාගමක් වශයෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් රජය සහ නියාමන අධිකාරීන් විසින් පනවන ලද වගවීමේ සහ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව සිය මෙහෙයුම් සිදු කරයි. එයට අමතරව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් මූල්‍යමය අවදානම්, මූල්‍යමය වාර්තාකරණය සහ මූල්‍ය වගකීම උදෙසා මූල්‍ය පාලනය හා අභ්‍යන්තර පාලනයන් ආශ්‍රිත විධිමත් ක්‍රමවේදයක් පවත්වාගෙන යනු ලබයි.

ප්‍රධාන සංඛ්‍යාලේඛණමය විශේෂතා

	2021	2020	Change %
දළ ලිඛිත වාරිකය (රු.)	43,231	39,421	9.7
බදු වලට පසු ලාභය (රු.)	10,041	5,788	73.5

මූල්‍ය ප්‍රාග්ධනය

විග්‍රහය

ප්‍රාග්ධනය මත ආකර්ශනීය ආදායමක් ලබාගත හැකි වන පරිදි විචක්ෂණශීලීව සමාගමෙහි මූල්‍ය ප්‍රාග්ධන සංචිතය කළමනාකරණය කරමින් අපගේ ප්‍රධාන කොටස් හිමිකරු සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිමතයන් සපුරාලීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත් විය. සමාගමෙහි පරම අභිමතයන් සපුරාලමින් ව්‍යාපාර කටයුතු වර්ධනය කරන අතර පාර්ශ්වකරුවන්ගේ දායකත්වය සදාචාර සම්පන්න හා විචක්ෂණශීලී අයුරකින් සුරැකීම උදෙසා මූල්‍ය ප්‍රාග්ධන සංචිතයෙහි තිරසාර වර්ධනය අතිශය වැදගත් සාධකයක් වේ.

මූල්‍යමය ප්‍රතිඵල - ඒකාබද්ධ ව්‍යාපාරික කාර්යසාධනය

පිළිවෙලින් රු.මිලියන 64,062 (2020 රු.මිලියන 52,614) ක සහ රු.මිලියන 43,231 (2020 රු.මිලියන 39,421) ක ආදායමක් සහ දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් විශිෂ්ට ප්‍රතිඵල අත්කර ගැනීමට, 2021 වසරේදී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත් විය. එය 2020 ට සාපේක්ෂව වසරින් වසර පදනමක් මත පිළිවෙලින් 21.8% ක සහ 9.7% ක වර්ධනයකි. 2021 මූල්‍ය වර්ෂයේදී මූල්‍යමය ආයෝජනයන්ගෙන් ආයෝජන ආදායම වසරින් වසර පදනමක් මත රු.මිලියන 23ක් දක්වා 41.7% කින් (2020 - රු. මිලියන 16,511) වර්ධනය විය. 2021 දෙසැම්බර් 31 දිනට සමාගමෙහි සමස්ත වත්කම් වසරින් වසර පදනමක් මත රු.මිලියන 268,436 කරා ළඟාවෙමින් (2020 - රු.මිලියන 235,630) 13.9% ක වර්ධනයක් වාර්තා කලේය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් 2021 වසර සඳහා රු.මිලියන 11,725 ක බදු වලට පෙර ලාභයක් වාර්තා කල අතර වසර 2020 දී වාර්තා වූ රු. මිලියන 7,972 ට සාපේක්ෂව එය 47.1% ක වසරින් වසර වර්ධනයකි. 2021 මූල්‍ය වර්ෂයේ බදු වලට පසු ලාභය රු.මිලියන 10,041 ක් (2020 - රු.මිලියන 5,788) වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 73.5% ක වර්ධනයකි. පෙර වසරෙහි වාර්තා වූ 9.2% ට සාපේක්ෂව ස්කන්ධ මත ආදායම 2021 දී 13.4% ක් වශයෙන් වාර්තා විය. බදු වශයෙන් ශ්‍රී ලංකා රජය වෙත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි දායකත්වය වසර 2021 සඳහා රු.මිලියන 3,846 (2020 - රු.මිලියන 2,388) ක් විය.

බදු වලට පසු ලාභය

රු. මිලි



මූල්‍යමය ආයෝජනයන්ගෙන් ආයෝජන ආදායම

රු. මිලි



ඒකාබද්ධ දළ ලිඛිත වාරිකය

රු. මිලි



සමස්ත වත්කම්

රු. මිලි



ජීවිත රක්ෂණ ව්‍යාපාරය

මෙරට අවගමනකාරී ආර්ථික ක්‍රියාකාරීත්වය ඇතුලුව කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් උද්ගත වූ අහිතකර ආර්ථික බලපෑම මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මේ වන විට දේශීය රක්ෂණ ක්ෂේත්‍රය තුළ එදා මෙදා තුර පිරිනමන ලද විශාලතම බෝනස් මුදල ප්‍රකාශයට පත් කරමින් ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමට සමත් විය. 2021 මූල්‍ය වර්ෂයේදී ජීවිත සහභාගීත්ව රක්ෂණ ඔප්පු හිමියන් වෙත පිරිනමන ලද බෝනස් මුදල රු.මිලියන 9,836 ක් වූ අතර එය පෙර වසරෙහි රු.මිලියන 8,694 ක් පිරිනමමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් විසින්ම තබන ලද වාර්තාව අභිබවා යාමකි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ජීවිත රක්ෂණ ව්‍යාපාරය 2021 මූල්‍ය වර්ෂය සඳහා රු.මිලියන 21,976 ක දළ ලිඛිත වාරිකයක් (2020 - රු.මිලියන 19,257) වාර්තා කලේය. එය 14.1% ක වසරින් වසර වර්ධනයක් වූ අතර 15.1% ක වසර 5 ක සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතය හා සමගාමීව මූල්‍යමය ආයෝජනයන්ගෙන් ආයෝජන ආදායම 2020 දී වාර්තා වූ රු.මිලියන 13,910 ට සාපේක්ෂව 2021 මූල්‍ය වර්ෂයේදී රු.මිලියන 19,988 ක් වශයෙන් දැක්වුනු අතර එය 43.7% ක වසරින් වසර වර්ධනයකි. විමර්ශනයට ලක් වන වසර තුළදී ජීවිත අරමුදල රු.මිලියන 18,572 කින් වර්ධනය වූ අතර එය 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 152,585 ක් (2020 - රු.මිලියන 134,014) වශයෙන් දැක්වුනි. එහි වසරින් වසර වර්ධනය 13.9% ක් විය. 2021 මූල්‍ය වර්ෂයේදී ජීවිත රක්ෂණ ව්‍යාපාරය රු.මිලියන 23,833 ක (ජීවිත අරමුදල වෙත මාරු කිරීමට පෙර) බදු වලට පසු ලාභයක් (2020 - රු.මිලියන 18,264) වාර්තා කල අතර එය වසරින් වසර 30.5% ක ප්‍රශංසනීය වර්ධනයකි.

දළ ලිඛිත වාරිකය - ජීවිත රක්ෂණ

රු. මිලි



බදු වලට පසු ලාභය (ජීවිත අරමුදල වෙත මාරු කිරීමට පෙර)

රු. මිලි



මූල්‍යමය ආයෝජනයන්ගෙන් ආයෝජන ආදායම - ජීවිත රක්ෂණ

රු. මිලි



මූල්‍ය ප්‍රාග්ධනය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

අන්තයන් බොහොමයකින් ශ්‍රී ලංකාවේ විශාලතම රක්ෂණ සේවා සම්පාදකයා වශයෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් නැවත වරක් 'සුරක්ෂා' ළමා රක්ෂණ ඔප්පු සඳහා පහසුකම් සපයන්නා බවට පත් වෙමින්, සියලුම පාසැල් සිසුන් හට නොමිලේ අදාළ රක්ෂණ ඔප්පු අඛණ්ඩව පිරිනැමීමට කටයුතු කලේය.

වසංගතයේ අහිතකර බලපෑම හේතුවෙන්, 2021 මූල්‍ය වර්ෂයේදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කලේය. දළ ලිඛිත වාරිකය 2020 දී පැවති රු.මිලියන 20,163 සිට 2021 දී රු.මිලියන 21,255 දක්වා ළඟා වූ අතර එය 5.4% ක වසරින් වසර වර්ධනයකි. පසුගිය වසර 5 කාලය පුරා (2017 - 2021), සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය දළ ලිඛිත වාරිකය 2.9% ක සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතයක් පවත්වාගෙන යාමට සමත් විය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි මූල්‍යමය ආයෝජන වලින් ආයෝජන ආදායම රු.මිලියන 3,404 ක් (2020 - රු.මිලියන 2,601) වශයෙන් දැක්වුනු අතර එය 30.9% ක වසරින් වසර වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි බදු වලට පසු ලාභය වසර 2021 දී රු.මිලියන 5,057 ක් වූ අතර 2020 දී වාර්තා වූ රු.මිලියන 3,643 ට සාපේක්ෂව එය 38.8% ක වසරින් වසර ඉහළ යාමකි.

වසර කිහිපයක් මෝටර් රක්ෂණ ක්ෂේත්‍රයෙහි වෙළඳපොල ප්‍රමුඛයා වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්: පෙර වසරෙහි වාර්තා වූ රු.මිලියන 11,806 ට මෝටර් රක්ෂණ දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව 2021 මූල්‍ය වර්ෂයේදී රු.මිලියන 11,673 ක් වාර්තා කල අතර එය 1.1% ක වසරින් වසර පහළ යාමකි. ඒ සඳහා වසංගතය හේතුවෙන් ව්‍යාපාරික කටයුතු අඩාල වීම බෙහෙවින් හේතු විය.

දළ ලිඛිත වාරිකය - සාමාන්‍ය රක්ෂණ

රු. මිලි



බදු වලට පසු ලාභය - සාමාන්‍ය රක්ෂණ

රු. මිලි



මූල්‍යමය ආයෝජනයන්ගෙන් ආයෝජන ආදායම - සාමාන්‍ය රක්ෂණ

රු. මිලි



ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි ස්ථාවරත්වය

රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනතෙහි වගන්ති 26 (1) ප්‍රකාරව, රක්ෂකයින් විසින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ද්විත්වය සඳහාම ප්‍රබල නුබුන්වත්භාව/අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන අනුපාතයන් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

වසර කිහිපයක් තිස්සේ අඛණ්ඩවම සිය අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන අනුපාතය අවශ්‍ය මට්ටමට බොහෝ ඉහළින් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත් විය. 2021 දී අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන අනුපාතය 501% ක් වූ අතර 2020 දී එය 459% ක් විය. 2021 මූල්‍ය වර්ෂයේදී, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන අනුපාතය 2020 මූල්‍ය වර්ෂයේදී වාර්තා වූ 223%ට සාපේක්ෂව 244% ක් විය.

නිෂ්පාදිත ප්‍රාග්ධනය

CONTRIBUTION TO SDG'S

- ප්‍රතිස්ථාපනය කරන ලද ශාඛා - සංඛ්‍යාව 04
- අලුත්වැඩියා කරන ලද ශාඛා - සංඛ්‍යාව 05

- සවිමත් ශාඛා ජාලය - දීප ව්‍යාප්ත ආවරණය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි නිෂ්පාදිත ප්‍රාග්ධනය නිර්මාණය කරන්නා වූ ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් අපගේ කාර්යාල සහ ශාඛාවන්, ඩිජිටල් මාධ්‍යයන් සහ දිවයින පුරා විසිරුනු සේවාලාභීන් හට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සැලසුම් හා සේවාවන් වෙත පිවිසුමක් සපයනු ලබන සෙසු සේවා ජාලයන්ගෙන් සමන්විත වේ.

ප්‍රධාන සංඛ්‍යාලේඛණමය විශේෂතා

ස්ථාවර වත්කම් සඳහා ආයෝජනය (රු.000)	මූ.ව. 2021	මූ.ව.2020	වෙනස
ස්ථාවර වත්කම් වෙත එකතු කිරීම්	256,145	231,437	11%
ස්ථාවර වත්කම් වල ශුද්ධ පොත් අගය	12,737,635	10,867,358	17%

අපගේ නිෂ්පාදිත වත්කම් සහ වටිනාකම් නිර්මාණය

ශාඛා 143	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් දිවයින පුරා සවිමත් සේවා ව්‍යාප්තියක් ස්ථාපනය කොට ඇත.
නියෝජිත ව්‍යාපාර 55 සංවර්ධන මධ්‍යස්ථාන (ABDCs) /සේවාලාභී සේවා මධ්‍යස්ථාන 2	දිවයින පුරා ප්‍රබල සේවා ව්‍යාප්තියක් අප සතුව පවතී.
ලංකා හොස්පිට්ල්ස් හි කවුලු 1	අප විසින් සේවා වෙත පිවිසුම තවදුරටත් සවිමත් කරනු ලැබ ඇත.
ඇමතුම් මධ්‍යස්ථාන 1	රක්ෂණ සම්බන්ධ කරුණු වලදී සේවාලාභීන් හට සහාය දැක්වීමේදී අප හා සම්බන්ධ වීම සඳහා විශේෂිත අංකයක් පැවතීම අතිශය වැදගත් වේ.
www.srilankainsurance.com	අපගේ ආයතනික වෙබ් අඩවිය විවිධ වූ සැලසුම් හා සේවාවන් වෙත පිවිසීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වේ.
හයිබ්‍රිඩ් චැනල	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සමස්ත වෙළඳපොල ව්‍යාප්තිය සඳහා හයිබ්‍රිඩ් චැනල උපකාරී වේ.
ජංගම ගෙවීමේ පහසුකම්	අපගේ සහකාර සේවා ජාලයන් මගින් පහසු ජංගම ගෙවීමේ පහසුකම් රැසක් ලබාදීමේ අවස්ථාව අප වෙත උදා කරමින් අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය සවිමත් කරයි.
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාලාභී ඇප්	ස්වාලාභී ඇප් එක මගින් පැය 24 පුරා අපගේ සැලසුම් හා සේවාවන් වෙත පිවිසුමක් ලබාදෙයි.

අපගේ ශාඛා ජාලය

2017 ට පෙර ශාඛා	123
2017 දී නව ශාඛා	7
2018 දී නව ශාඛා	5
2019 දී නව ශාඛා	6
2021 දී නව ශාඛා	1
2021 දී නව සංවර්ධන මධ්‍යස්ථාන (ABDCs)	38
2022 දී නව සංවර්ධන මධ්‍යස්ථාන (ABDCs)	1
නව ශාකා 2022 වසරේදී	1
2022 වසරේ සංවර්ධන මධ්‍යස්ථාන බවට පත් වූ සේවා ලාභී මධ්‍යස්ථාන	16
සේවාලාභී සේවා මධ්‍යස්ථාන	2
කවුලු	1
එකතුව	**201**

නිෂ්පාදිත ප්‍රාග්ධනය



පළාත	ශාඛා සංඛ්‍යාව	ශාඛා
උතුරු මැද	14	අනුරාධපුර, හොරොව්පතාන, පදවිය, කැකිරාව, හිඟුරක්ගොඩ, දෙහිඅත්තකණ්ඩිය, කදුරුවෙල, අරලගන්විල, බකමූණ, මැදවච්චිය
		ABDC - මැදිරිගිරිය, නොච්චියාගම, හබරන, මහඔය
ඌව	12	බදුල්ල, වැලිමඩ, බණ්ඩාරවෙල, මහියංගනය, නුවරඑළිය, හැටන්, වැල්ලවාය, මොණරාගල, අම්පාර, බිබිල
		ABDC - පස්සර, සියඹලාණ්ඩුව
නැගෙනහිර	7	මඩකළපුව, කල්මුණේ, ත්‍රිකුණාමළය, අක්කරෙයිපත්තු, කන්තලේ
		ABDC - පොතුවිල්, කලවංචිකුඩි
දකුණු 1	19	ගාල්ල, අම්බලන්ගොඩ, ඇල්පිටිය, තල්ගස්වල, උඩුගම, බද්දේගම, කලුතර, හොරණ, මතුගම, බණ්ඩාරගම, පානදුර. අලුත්ගම
		ABDC - තනිපොල්ගහ, හබරාදූව. හික්කඩුව, කරාපිටිය, පිටිගල, ඌරගහ, බදුරලිය
දකුණු 2	21	හම්බන්තොට, බෙලිඅත්ත, අම්බලන්තොට, තිස්සමහාරාම, තංගල්ල. මාතර, අකුරැස්ස, දික්වැල්ල, වැලිගම, දෙනියාය, හක්මන, නෙලුව
		ABDC - ඉමදූව, මිද්දෙණිය, ඌරුබොක්ක, කඹුරුපිටිය, කැකණදුර. දෙයියන්දර, සූරියවැව, වළස්මුල්ල, මොරවක
රත්නපුර	12	රත්නපුර, අවිස්සාවේල්ල - ජීවිත රක්ෂණ, අවිස්සාවේල්ල - සාමාන්‍ය රක්ෂණ, බලංගොඩ, කහවත්ත, ඇඹිලිපිය, කළවාන, ඇහැළියගොඩ, පල්ලෙබැද්ද, රුවන්වැල්ල
		ABDC - දැරණියගල, හංවැල්ල
වයඹ 1	16	කුරුණෑගල, කුරුණෑගල නගර, මැල්සිරිපුර, නාරම්මල, රිදීගම, රඹුක්කන, වරකාපොල, ගිරිඋල්ල, පොල්ගහවෙල, කුලියාපිටිය
		ABDC - අලව්ව, පන්නල, ඉබ්බාගමුව, පොල්පිතිගම, කටුපොල, හෙට්ටිපොල
වයඹ 2	11	හලාවත, පුත්තලම, නිකවැරටිය, මහව, දඹුල්ල, ගලේවෙල, ගල්ගමුව, වාරියපොල, තඹුත්තේගම, ආණමඩුව
		ABDC - හිරිපිටිය
බස්නාහිර 1	9	පිටකෝට්ටේ, බත්තරමුල්ල, නුගේගොඩ, කිරුළපන, නගර කාර්යාලය, රත්මලාන, දෙහිවල, මොරටුව
		ABDC - මොරටුමුල්ල
බස්නාහිර 2	12	කඩවත, කිරිබත්ගොඩ, කොළඹ මෙට්‍රො - 1, 2, 3, 4, 6, 7, 10, 11
		ABDC - කැළණිය, දෙල්ගොඩ
බස්නාහිර 3	9	හෝමාගම, කොට්ටාව, මාලඹේ, පිළියන්දල, අතුරුගිරිය, කඩුවෙල, මහරගම, ඉංගිරිය
		ABDC - පාදුක්ක
බස්නාහිර 4	8	බොරැල්ල, පිටකොටුව, කොටහේන, බම්බලපිටිය, වත්තල, රාගම, කොට්කාවත්ත
		ABDC - වැල්ලවත්ත
ඉහළ බස්නාහිර	22	ගම්පහ, වේයන්ගොඩ, මිනුවන්ගොඩ, හිට්ටඹුව, යක්කල, මීගමුව, කදාන, වෙන්නප්පුව, පාඇල, කොච්චිකඩේ, මාරවිල
		ABDC - දිවුලපිටිය, පූගොඩ, ගණේමුල්ල, කිරිදිවැල, මීරිගම, මහබාගෙ, දංකොටුව, වැලිවේරිය, උඩුගම්පොල, ඌරපොල, කිරිල්ලවල
මධ්‍යම	16	මහනුවර, දිගන, මහනුවර නගර, මාතලේ, ගම්පොල, කටුගස්තොට, මාවතගම, කෑගල්ල, පිළිමතලාව, රිකිල්ලගස්කඩ, මාවනැල්ල, නාවලපිටිය
		ABCD - ගලගෙදර, බුලත්කොහුපිටිය, අරණායක, පේරාදෙණිය
උතුරු	10	යාපනය, කිලිනොච්චිය, නෙල්ලිඅඩි, මුලතිව්, මන්නාරම, චන්කනෙයි, වව්නියාව, චාවකච්චේරිය
		ABDC - මල්ලාව්, චුන්නාකම්

ප්‍රාග්ධන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතීන්

ශාඛා ව්‍යාප්තිය සහ ප්‍රතිස්ථානගත කිරීම

මේ වන විට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රධාන නගරයකම පාහේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි නියෝජනය පවතින පසුබිමක, අප විසින් ශීඝ්‍රයෙන් නාගරීකරණය වෙමින් පවතින නගර වෙත අපගේ ශාඛා ව්‍යාප්ති ක්‍රමෝපාය දියත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ නව ශාඛා/ සේවා ස්ථාන සම්බන්ධ තීරණ අදාළ ප්‍රදේශයේ ජන ඝනත්වය මත පදනම්ව සුදුසු ශාඛා ව්‍යාප්තියක් සිදු වන අයුරින් සැකසෙනු ඇත. මෙම එළඹුමෙහි සාර්ථකත්වය පාදක කර ගනිමින්, ශාඛා ප්‍රතිස්ථාපනය නිර්ණය කිරීමටද සමාගම සමාන ආකාරයේ ක්‍රියාපටිපාටියක් අනුගමනය කරනු ඇත.

නව ශාඛා - 2021

ශාඛා	ලිපිනය
අවිස්සාවේල්ල - ජීවිත රක්ෂණ	අංක 31, කුඩාගම පාර, අවිස්සාවේල්ල.

නව ශාඛා - 2022

ශාඛා	ලිපිනය
මැදවච්චිය	රෝහල ඉදිරිපිට, මැදවච්චිය

ශාඛා ප්‍රතිස්ථාපන - 2021

ශාඛා	ලිපිනය
දෙනියාය	අංක 06, පළමු මහල, දෙනියාය
කලුතර	අංක 326/2, ෆොටෝෆයින් ගොඩනැගිල්ල, කලුතර
බලංගොඩ	අංක 115/ඒ, බාන්ස් රත්වත්තේ මාවත, බලංගොඩ
බණ්ඩාරවෙල	අංක 393 - 2/1 අයිකොනික් ලෑන්ඩ්මාර්ක් ගොඩනැගිල්ල, බදුල්ල පාර, බණ්ඩාරවෙල

ශාඛා මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් අපගේ දැනට පවතින ශාඛා ජාලයෙහි කාර්යක්ෂමතාවය සහ ස්වරූපය ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරී පියවර රැසක් ගනු ලැබේ. අපගේ ශාඛා 'නැවුම්කරණ' වැඩසටහන ශාඛා ජාලයෙහි භෞතික යටිතල පහසුකම් පවත්වාගෙන යාමේ ප්‍රගතිශීලී ක්‍රියාකාරකමකි.

අලුත්වැඩියා කිරීම් - 2021

මාතලේ
මාවතගම
මොණරාගල
කුරුණෑගල
රිකිල්ලගස්කඩ

අපගේ ඩිජිටල් නියෝජනය ඉහළ නැංවීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාලාභී පෝටලය සහ 2019 දී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මොබයිල් ඇප් හඳුන්වාදීමත් සමග සමාගම සිය ඩිජිටල් නියෝජනය ප්‍රබල අයුරින් ව්‍යාප්ත කිරීමට කටයුතු කලේය. ඒවායේ සමස්ත ප්‍රයෝජනවත්භාවය ඉහළ නැංවීම සඳහා අදාළ යෙදවුම් නිරන්තරයෙන් අධිශ්‍රේණිගත කෙරෙන අතර, අප විසින් අපගේ ඩිජිටල් ව්‍යාප්තිය පුලුල් කිරීමේ වෙනත් මාර්ග කෙරෙහිද අවධානය යොමු කෙරේ. පුලුල් පරාසයක පැතිරුනු ගෙවීමේ ක්‍රම සහ වෙනත් හයිබ්‍රිඩ් පදනම් ඔස්සේ සාර්ථකව ඉදිරියට යාමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත් වූ අතර, එහිදී ප්‍රමුඛ පෙලේ බැංකු සහ විදුලි සංදේශ ආයතන සමග අගය එකතු කල ක්‍රමෝපායික සහයෝගීතාවයන්ට එළඹීම සිදුවිය.

තවද, සේවාලාභීන් වෙත අති විශිෂ්ට සේවාවක් ලබාදීම උදෙසා සියලු ඩිජිටල් පහසුකම් වලින් සමන්විත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ප්‍රීමියර් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමටද යෝජනා කොට ඇත.

අනාගත සැලසුම

- පහළ සේවා සම්පාදනයක් සහිත ප්‍රදේශයන්හි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම සඳහා ආයෝජනය කිරීම
- අඩු පිරිවැය ශාඛා ආකෘතියක් වෙත ගමන් කිරීම : අප විසින් සේවාලාභී සේවා ස්ථාන 16 ක් සාර්ථකව ප්‍රති ආකෘතිගත කරන ලදී, සේවාලාභී සේවා ස්ථාන නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන (ABDCs) බවට පරිවර්තනය කරන ලද අතර, නුදුරු අනාගතයේදී සෙසු සේවාලාභී සේවා ස්ථානයන්ද එසේ පරිවර්තනය කිරීම අපගේ අරමුණ වේ.
- ABDC සංඛ්‍යාව ඉහළ නැංවීම : ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දිවයින පුරා ව්‍යාප්තිය ඉහළ නැංවීම උදෙසා, විශේෂිත ක්‍රමවේදයක් යොදා ගනිමින් හදුනාගත් ප්‍රදේශයන්හි නව නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම මගින් අපගේ ශාඛා ජාලය පුලුල් කිරීම අපගේ සැලසුම වේ.
- කඩිනම් ඩිජිටල් සේවාවන් ක්‍රියාවට නැංවීම : අඩු පිරිවැයක් යටතේ කඩිනම්ව හා කාර්යක්ෂමව ක්‍රියාවට නැංවිය හැකි ඩිජිටල් සේවාවන් හදුනාගනිමින්. අපගේ ව්‍යාපාරයෙහි ඵලදායීතාවය සහ කාර්යසාධනය වර්ධනය කිරීම අපගේ අරමුණ වේ.

බුද්ධිමය ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE

- 2020 සමග සැසඳීමේදී 2021 දී තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීම උදෙසා වන ආයෝජන 21% කින් ඉහළ නැංවුනි.

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

- අනර්ඝතම සාමාන්‍ය රක්ෂණ සන්නාමය
- වඩාත්ම ප්‍රිය කරන රක්ෂණ සන්නාමය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි බුද්ධිමය ප්‍රාග්ධනය දශක ගණනාවක් තිස්සේ රැස් කර ගත් අත්දැකීම් හා දැනුම් සම්භාරයකින් සමන්විත වේ. එයට අමතරව, අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය තාක්ෂණය, සැලසුම්, ක්‍රමවේදයන් හා ක්‍රියාවලීන්, සන්නාම ස්කන්ධය දැනුම මත පදනම් වූ සම්පත් වැනි අස්පෘශ්‍ය වත්කම් ආශ්‍රයෙන් නිර්මාණය වන අතර එමගින් සෙසු සමාගම් අතර තරගකාරී වාසිය නිතැතින්ම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත හිමි වේ.

ප්‍රධාන සංඛ්‍යාලේඛණමය විශේෂතා

ආයෝජන	2021	2020	වෙනස
තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය	142.5 මිලියන	116.9 මිලියන	21.8%
දැනුම් පදනම ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන්	9.7 මිලියන	2.4 මිලියන	292%

අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය



සවිමත් සන්නාම ස්කන්ධය

1962 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, ශ්‍රී ලංකාවේ විශාලතම රජයේ හිමිකාරීත්වය සහිත රක්ෂණ සමාගම වේ. එහි කළමනාකරණය කරන ලද වත්කම් පදනම රු.බිලියන 235 කට අධික වන අතර දේශීය රක්ෂණ ක්ෂේත්‍රයේ විශාලතම ජීවිත අරමුදල ද සමාගම සතු වේ. ස්වකීය 201ක ශාඛා සහ නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන ජාලය ඔස්සේ, නව්‍ය රක්ෂණ සේවාවන් සේවාලාභීන් වෙත පිරිනමමින් සේවාලාභීන් කෙරෙහිම අවධානය යොමු කරන්නා වූ සමාගමක් බවට පත්වීමේ ක්‍රියාන්විතයක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් දියත් කෙරේ.

සන්නාම ජයග්‍රහන

- අබණ්ඩ සිව් වන වරටත්, බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් මගින් ශ්‍රී ලංකාවේ 'අනර්ඝතම සාමාන්‍ය රක්ෂණ සන්නාමය' වශයෙන් නම් කිරීම.
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් දැවැන්ත සිල්ලර සේවා සමාගම් සමග තරග වදිමින් 'වඩාත්ම ප්‍රිය කරන රක්ෂණ සන්නාමය' වශයෙන් ශ්‍රේණිගත විය.
- ග්‍රේට් ප්ලේස් ටු වර්ක් ආයතනය මගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකාව තුළ 'සේවයේ නියුතු වීම සඳහා විශිෂ්ටතම ආයතනයක්' වශයෙන් ඇගයුමට ලක් කෙරිණි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, ස්වකීය විශ්වසනීය සේවා අතීතය සහ සවිමත් සන්නාමය හේතුවෙන් සියලුම පාර්ශ්වකරුවන් වෙත අපගේ සන්නාම ප්‍රතිඥාව ඉටු කිරීම සඳහා ප්‍රබල ස්ථානයක පසු වේ. අපගේ දැවැන්තභාවය දේශීය වෙළඳපොල පිළිබඳ අවබෝධය සමග එක් වූ කල, සුවිශේෂී සැලසුම් කළඹකින් සමන්විත විවිධාංගීකරණය කරන ලද වටිනාකම් සමුදායක් සහ විශිෂ්ට ගණයේ සේවාවක් අපගේ සේවාලාභීන් වෙත පිරිනැමීමට අප සමත්ව ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ගුණාත්මක ප්‍රතිපත්තියෙහි පදනම වන, ISO 9001: 2015 තත්ත්ව කළමනාකරණ පද්ධතියේ මාර්ගෝපදේශයන් අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සිය ප්‍රධාන කාර්යාලය සහ 201 ක් වූ ශාඛා සහ නියෝජිත ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථාන ජාලය ඔස්සේ, ජීවිත සහ ජීවිත නොවන ප්‍රාරක්ෂණ, හිමිකම්පෑම්, පියවීම්, සහ සහායක සේවා වැනි සෑම ව්‍යාපාරික පැතිකඩ ආශ්‍රිතවම අවම මෙහෙයුම් තත්ත්වයන් ක්‍රියාවට නංවන ලදී.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ගුණාත්මක ප්‍රතිපත්තිය මගින් 'අප විසින් සිදුකරනු ලබන සෑම කටයුත්තකදීම සේවාලාභියා පළමු කොට සැළකීම' සමාගමෙහි අභිලාෂය යළි යළිත් අවධාරනය කෙරේ. එමනිසා, සෑම කණ්ඩයමක් විසින්ම මෙම ගුණාත්මක ප්‍රතිපත්තිය සිය මූලික මෙහෙයුම් දර්ශනය වශයෙන් අභ්‍යන්තරීකරණය සහ ක්‍රියාවට නැංවීම සිදු කොට ඇත.

කාර්යක්ෂමව නවතම තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාලාභී අපේක්ෂාවන් සපුරාලන සහ ව්‍යාපාර කටයුතු වන නිරත වන ආකාරය විවිධාගීකරණය ඔස්සේ අපගේ තරගකාරීත්වය ඉහළ නැංවීම අපගේ තාක්ෂණ ආයෝජන ක්‍රමෝපායෙහි අරමුණ වේ. මනා ලෙස ස්ථාපනය කරන ලද ක්‍රියාකාරී සහ අවධානාත්මක තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායෙහි සහාය සහිතව සමාගම කෝවිඩ් වසංගත සමයේදී සේවාලාභී සහ සමාගම් අවශ්‍යතා සපුරාලීමට සමත් විය. දෛනික මෙහෙයුම් සහ අනාගත වර්ධනට සඳහා උපකාරී වන ප්‍රබල තොරතුරු තාක්ෂණ ආකෘතියක අවශ්‍යතාවය හඳුනාගනිමින්, මෙකී බහුවිධ තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා නිසි ක්‍රමෝපායක් ස්ථාපනය කොට ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය ප්‍රමුඛ අවධානාත්මක අංශ හතරක් වටා කේන්ද්‍රගත වේ:

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය

ඩිජිටල්කරණය	ජංගම ක්‍රමෝපාය ව්‍යාපාර ක්‍රියාවලිය - ස්වයංක්‍රියකරණය විකුණුම් බලකාය - ස්වයංක්‍රියකරණය ව්‍යාපාර විශ්ලේෂණ
සේවාලාභී අත්දැකීම්	පහසු ගෙවීමේ ක්‍රමවේදයන් ස්වයං සේවා ඩිජිටල් අත්දැකීම
යටිතල පහසුකම්	නවීන දෘඩාංග/මෘදුකාංග විසඳුම් උපයෝජනා/තිබෙන බව සුරක්ෂිතතාව
මූලික ව්‍යාපාර පද්ධති	මූලික රක්ෂණ විසඳුම් SAP ERP පදනම ව්‍යාපාර විශ්ලේෂණය

බුද්ධිමය ප්‍රාග්ධනය

තොරතුරු තාක්ෂණ වර්ධනයන් සහ කාර්යසාධනය

- **ජීවිත රක්ෂණ යෝජනා පත්‍ර සැකසුම් පද්ධතිය ඩිජිටල්කරණය**

  කාර්යක්ෂමතාවය, සේවා තත්ත්වයන් ඉහළ නැංවීම සහ සාමූහික කාර්ය වටිපිටාවක් නිර්මාණ කිරීමේ අරමුණින් යුතුව ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කෙරෙහි අවධානය යොමු කරමින්, විමර්ශනයට ලක් වන වසර තුළදී අප විසින් අපගේ ඩිජිටල් ක්‍රමෝපාය කඩිනම් කෙරිණි.

  සේවාලාභී පහසුව ඉහළ නැංවීම උදෙසා, සමාගම මගින් දැනට පවතින පත්‍රිකා ආශ්‍රයෙන් සිදු කෙරෙන යෝජනා පත්‍ර සැකසුම් ක්‍රමවේදයට අමතරව ඩිජිටල් යෝජනා පත්‍රයක් හඳුන්වාදෙන ලදී. එහිදී සේවාලාභීන් හට සිය ජීවිත රක්ෂණ සඳහා විස්තර අන්තර්ජාලය ඔස්සේ භාරදිය හැකි වේ.

- **අන්තර්ජාලගත පුහුණු පද්ධතිය**

  නව අන්තර්ජාලගත පුහුණු පද්ධතිය හේතුවෙන් සමාගමට වසංගත සමයේදී පවා දැඩි අසීරුතාවයකින් තොරව සිය සැලසුම්ගත පුහුණු වැඩසටහන් පැවැත්වීමේ අවස්ථාව උදා විය. මෙම පද්ධතිය මගින්, අන්තර්ජාලය යොදා ගනිමින් දිවයින පුරා විවිධ ස්ථානයන්හි සමගාමීව පුහුණු සැසි පැවැත්වීමට අප හට හැකි වූ අතර එමගින් සමාගමෙහි පුහුණු පිරිවැය බෙහෙවින් පහත හෙළීමටද හැකි විය.

  වසර තුළදී සකසන ලද මෙම පද්ධතිය හේතුවෙන් සමාගමෙහි දෛනික මෙහෙයුම් වෙත අවම බලපෑමක් සිදුකරමින් නිවසේ සිට වැඩ කිරීම ඔස්සේ මෙහෙයුම් කටයුතු රැසක් සිදුකිරීමේ අවස්ථාව අප වෙත උදා විය.

2021 තුළ ප්‍රධාන ප්‍රමුඛතා



තොරතුරු සුරක්ෂිතතාව ආශ්‍රිත යහ ක්‍රියාකාරකම්

දත්ත සුරක්ෂිතතාවය සහ පාලනය සේවාලාභී විශ්වාසය පවත්වාගෙන යාම සඳහා අතිශය වැදගත් සාධක වේ. මිලියන 2.2 කට අධික සේවාලාභී ගිණුම් සමගින්. දත්ත සුරක්ෂිතතාව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ප්‍රධාන ප්‍රමුඛතාවක් වේ. සේවාලාභී දත්ත වල රහස්‍යභාවය සුරකිමින් පෞද්ගලික තොරතුරු සඳහා ඉහළම මට්ටමේ ආරක්ෂාවක් ලබාදීමට අප විසින් කැප වී කටයුතු කරනු ලැබේ. අප විසින් දත්ත සම්බන්ධ නෛතික අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් සේවාලාභී තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා තාක්ෂණික හා මෙහෙයුම් සුරැකුම් රැසක් ස්ථාපනය කරනු ලැබ ඇත. සිදුවිය හැකි සයිබර් අවදානම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා අප විසින් සේවක පුහුණු සහ සේවාලාභී දැනුවත් කිරීම් ද අප විසින් සිදුකරනු ලැබේ.

විශේෂඥ දැනුම සහ පළපුරුද්ද

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතු තරගකාරී වාසි වලින් එකක් වනුයේ අපගේ මානව සම්පතයි. වසර 10 කට වැඩි සේවා කාලයක් සහිත සේවකියින් 59% කින් සමන්විත අපගේ 2,767 ක් වූ කාර්ය මණ්ඩලය සමාගමට ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත්වීමට බෙහෙවින් ඉවහල් විය. රක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධ ඔවුන්ගේ දැනුම් සම්භාරය අපගේ සවිබලය වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සිය ප්‍රාග්ධනය වෙනුවෙන් අඛණ්ඩවම ආයෝජනයන සිදුකරනු ලබන අතර, එහිදී සමාගමෙහි අරමුණු මෙන්ම ඔවුන්ගේ පෞද්ගලික ඉලක්කයන් සපුරාගැනීම සඳහා ඔවුන් සවිබල ගැන්වේ. අපගේ මානව සම්පත් ක්‍රමෝපාය පහත දැක්වෙන කරුණු ආශ්‍රිතව සමාගමෙහි සහ සේවකයින්ගේ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් නිර්මාණය කොට ඇත:

- ක්‍රමෝපායික බදවාගැනීම
- කාර්යසාධන කළමනාකරණය
- අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ කුසලතා සංචිත කළමනාකරණය
- පුහුණුව හා සංවර්ධනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ නායනක්වය සමාගමෙහි දැනුම් හා අත්දැකීම් පදනමෙහි වැදගත් කොටසකි. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා විසින් ක්‍රමෝපායික දර්ශනය සහ තීරණ ගැනීම කෙරෙහි ස්වකීය සුවිශේෂී නිපුණතා සහ දැනුම ඔස්සේ ප්‍රශංසනීය දායකත්වයක් සපයනු ලබයි.

මානව ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය

3 GOOD HEALTH AND WELL-BEING

- සේවක ශාරීරික සෞඛ්‍ය - විශේෂ සෞඛ්‍ය හා සුරක්ෂිතතා ප්‍රතිපත්තිය
- සේවක මානසික සෞඛ්‍ය - විශේෂ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය

10 REDUCED INEQUALITIES

- සේවක වයස් විවිධත්වය පවත්වාගෙන යාම
- සේවා බලකාය තුළ ප්‍රබල ප්‍රාදේශීය නියෝජනයක් පවත්වාගෙන යාම
- බඳවාගැනීමේදී විනිවිදභාවය සහ නිර්පක්ෂපාතීත්වය

සිය ජයග්‍රහන සහ සාර්ථකත්වය ලබාගැනීම සඳහා බෙහෙවින්ම ඉවහල් වන මානව ප්‍රාග්ධනය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වඩාත්ම වටිනා සම්පත වේ. සමාගමක් සඳහා ශක්තිමත් එමෙන්ම කැප වූ සේවා කණ්ඩායමක් යනු මිල කල නොහැකි වත්කමකි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සේවක මණ්ඩලයේ උනන්දුව සහ දරාගැනීමේ ශක්තිය අපගේ සැලසුම් හා සේවාවන් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය පිටුබලය සපයයි.

4 QUALITY EDUCATION

- සේවක පුහුණු වැඩසටහන් පැවැත්වීම

5 GENDER EQUALITY

- ස්ත්‍රී පුරුෂ සමතුලනය 54% - 46% (පුරුෂ-ස්ත්‍රී)

8 DECENT WORK AND ECONOMIC GROWTH

- විවිධත්වයෙන් යුතු පරිපූර්ණ සේවා ස්ථානය

ප්‍රධාන සංඛ්‍යාලේඛණාත්මක විශේෂතා

පුහුණු වැඩසටහන්	2021	2020
වැඩසටහන් සංඛ්‍යාව	70	85
පැය ගණන	625	680

සේවා ගිවිසුම් වර්ගය අනුව සේවකයින්	2021	2020
ස්ථිර සේවකයින්	2,535	2,517
කොන්ත්‍රාත් සේවකයින්	232	109
එකතුව	2,767	2,626

වයස් කාණ්ඩ විශ්ලේෂණය

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	%
18-24	47	35	3.0%
25-29	186	214	14.5%
30-34	231	235	16.8%
35-39	269	141	14.8%
40-44	262	61	11.7%
45-49	218	178	14.3%
50-54	193	247	15.9%
55 සහ ඉහළ	91	159	9.0%
එකතුව	1497	1270	2767

සේවා විශ්ලේෂණය

ශ්‍රී ලං ඉ තුළ සේවය කල වර්ෂ සංඛ්‍යාව	පුරුෂ	ස්ත්‍රී	%
0-5	504	355	33%
6-10	235	128	14%
11-15	388	196	22%
16-20	123	37	6%
21 සහ ඉහළ	247	554	31%

ශ්‍රේණිය සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවා නියුක්තිය

	සංඛ්‍යාව			සංයුතිය %	
ශ්‍රේණිය	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී
ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය	74	18	92	80%	20%
කළමනාකාරීත්වය	251	101	352	71%	29%
සහකාර කළමනාකාර	105	46	151	70%	30%
විධායක	273	524	797	34%	66%
ලිපිකරු	426	540	966	44%	56%
තාක්ෂණික	188	0	188	100%	0%
ලිපිකාර නොවන	108	15	123	88%	12%
සුලු	72	26	98	73%	27%
එකතුව	1497	1270	2767	54%	46%

මානව ප්‍රාග්ධනය

මානව සම්පත් සම්බන්ධ යහ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින්, මානව අයිතිවාසිකම් සම්බන්ධ විශ්ව ප්‍රකාශනය මත පදනම් වූ මූලික ප්‍රතිපත්ති සහ සේවා නියුක්තියේදී අයිතීන් ආශ්‍රිත ජාත්‍යන්තර කම්කරු සංවිධාන ප්‍රකාශනය සහ එක්සත් ජාතීන්ගේ ලෝක සම්මුතියට අනුකූලව සාධාරණ සේවා නියුක්ති ක්‍රියාකාරකම් ඔස්සේ ස්වකීය සේවකයින් හට ප්‍රසන්න සේවා වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා වන කැපවීම අවධාරනය කරනු ලැබේ.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, අපගේ මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතීන් පහත දැක්වෙන ප්‍රතිපත්ති මත පදනම් වේ:

ප්‍රතිපත්තිය	ක්‍රියාවට නැංවීම
වෙනස් කොට නොසැළකීමේ සහ සමාන අවස්ථාමය සේවා නියුක්තිය	බදවාගැනීමේ සිට විශ්‍රාම ලැබීම දක්වා, අප විසින් වෙනස් කොට නොසැළකීමේ ආකල්පය දරනු ලබන අතර, සේවා ජීවන චක්‍රයෙහි සියලු මට්ටම් වලදී සමාන අවස්ථා ලබාදීමට කටයුතු කෙරේ.
සේවා ස්ථානය තුළ විවිධත්වය සහ අන්තර්ග්‍රහනය ප්‍රවර්ධනය	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සියලුම සේවකයින් හට විනීතව සහ ගෞරවනීයව සළකනු ලබන විවිධත්වයෙන් යුතු පරිපූර්ණ සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට කැප වී කටයුතු කරයි.
	ස්වකීය ජාතිය,ආගම,ස්ත්‍රී පුරුෂභාවය, වයස, විවාහක අවිවාහක බව, හෝ අන් කවර හෝ නෛතිකව සුරක්ෂිත කරන ලද තත්ත්වයකට එරෙහිව සේවකයින් වෙනස් කොට නොසැළකීම සඳහා සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ.
	මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා අප විසින් හැකි සෑමකල්හිම වෙනස් හැකියාවන් සහිත පුද්ගලයින් සඳහා වෘත්තීය අවස්ථා ලබාදීමට කටයුතු කෙරේ.
ළමා මෙහෙකාර සේවය ඉවත් කිරීම සහ බලහත්කාරී සහ අනිවාර්ය ශ්‍රමය තුරන් කිරීම සඳහා සහාය දැක්වීම	වගකීම් සහගත ආයතනික පුරවැසියකු වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතුව ළමා ශ්‍රමය, බලහත්කාරී ශ්‍රමය සහ අනිවාර්ය ශ්‍රමයට එරෙහි දැඩි ප්‍රතිපත්තියක් පවතී.
සේවකයින්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය සඳහා ප්‍රමුඛත්වය ලබාදීම	සේවා ක්ෂේත්‍රයක් තුළ සේවයේ නියුක්ත වන බැවින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවකයින් කිසිදු සැළකිය යුතු වෘත්තීයමය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවදානමකට නිරාවරනය නොවේ. කෙසේවුවද, අපගේ සේවකයින් සුරක්ෂිත වටපිටාවක් තුළ මෙහෙයුම් සිදු කරන බවට අප විසින් දැඩි පියවර ගනිමින් තහුවරු කොට ඇත.
	තවද, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් නිරන්තර පදනමක් මත සෞඛ්‍ය සහ සුරක්ෂිතතා අවදානම් ඇගයුමට ලක් කරමින් අවශ්‍ය වැළැක්වීමේ සහ නිවැරදි කිරීමේ පියවර ගනු ලබන අතර, සෙසු අංශයන් සහ අදාළ අධිකාරීන්ගේ සහාය සහිතව මානව සම්පත් අංශය මගින් සේවකයින් අතර සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.
	සේවා ස්ථාන සෞඛ්‍ය හා සුරක්ෂිතතාව පරිපාලනය කිරීම සඳහා විධිමත් ආකෘතික රාමුවක් ස්ථාපනය කිරීමේ අරමුණින් යුතුව අප විසින් පරිපූර්ණ සෞඛ්‍ය හා සුරක්ෂිතතා ප්‍රතිපත්තියක් සකසා නිම කොට ඇත.
ආචාරධර්ම සහ සුපිළිපන්බව ප්‍රවර්ධනය කිරීම	අපගේ සේවකයින් සේවාලාභීන්, වෙළඳුන්, සහ සෙසු බාහිර පාර්ශ්වකරුවන් මෙන්ම ඔවුන්ගේ සේවා සගයින්, ඉහළ සහ පහළ නිලයන් සමග සිදු කරනු ලබන අන්තර් ක්‍රියාකාරකම් වලදී පරම සුපිළිපන්බව, ආචාරධර්ම සහ වෘත්තීයමයභාවයෙන් යුතුව කටයුතු කිරීම අපගේ අවශ්‍යතාවයක් වේ.
	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආචාරධර්ම සංග්‍රහය කිසිදු බැහැර කිරීමකින් තොරව සියලුම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවකයින් විසින් දැනගැනීම, අවබෝධ කරගැනීම සහ අනුගමනය කිරීම අනිවාර්ය වේ. කිසියම් සේවකකයකු ඉහත ආචාරධර්ම සංග්‍රහයට අනුගත නොවුනහොත්, අදාළ උල්ලංඝනය කිරීමේ බරපතලබව අනුව ඔහුට හෝ ඇයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.
	තවද, සියලුම සේවකයින් කිසිදු අපොහොසත් වීමකින් තොරව පත්වීමේ ලිපියෙහි සඳහන් නීතිරීති හා කොන්දේසි අනුගමනය කල යුතු වේ.
සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පැහැදිලි ක්‍රියාපටිපාටියක්	සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පැහැදිලි ක්‍රියාපටිපාටියක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතු වන අතර, එහිදී අර්බුධකාරී තත්ත්වයන් වළකාගනිමින්, චිත්ත ධෛර්‍යය, සේවා තෘප්තිමත්බව සහ කැපවීම වර්ධනය කරන අතරතුර වඩාත් යහපත් අවබෝධයන් ඔස්සේ සේව්‍ය සේවක සබඳතා තහවුරු කරමින් අදාළ ප්‍රශ්න සහගත මූලයට ආසන්නතම අවස්ථාවේදී ගැටලුව විසඳීම සිදු කෙරේ.
	ඕනෑම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවකයකු හට කවර හෝ සේවා සම්බන්ධ පැමිණිල්ලක් වාර්තා කළ හැකි විස්තරාත්මක දුක්ගැනවිලි කළමනාකරණ යාන්ත්‍රණයක් සමාගම සතු වේ.

ප්‍රතිපත්තිය	ක්‍රියාවට නැංවීම
සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පැහැදිලි ක්‍රියාපටිපාටියක්	මෙම ප්‍රතිපත්තිය, අදාළ සේවකයාගේ කාර්යසාධනය හෝ චර්යාව කෙරෙහි සෘජුව හෝ වක්‍රව බලපෑ හැකි, නිල හෝ පෞද්ගලික දුක්ගැනවිලි සම්බන්ධ තොරතුරු සහ දුක්ගැනවිල්ලක් සමබන්ධයෙන් පැමිණිලි කල යුතු ආකාරය සම්බන්ධ නිශ්චිත තොරතුරු වලින් සමන්විත වේ. අදාළ ප්‍රතිපත්තිය මගින්, දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කමිටුවෙහි ක්‍රියාකාරීත්වය, මානව සම්පත් අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවෙහි භූමිකාව මෙන්ම දුක්ගැනවිලි නිරාකරණය කිරීමේ කාල රාමු පිළිබඳවද විස්තර කෙරේ. ඒකපුද්ගල හෝ සමූහ ගැටලු සම්බන්ධ අප විසින් මෙම සම්මත ක්‍රියාපටිපාටිය අනුගමනය කෙර්.
	දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටිය නිසි පරිදි ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීමේ වගකීම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මානව සම්පත් අංශය මගින් දරනු ලබයි.

බඳවාගැනීම සහ රඳවාගැනීම

බඳවාගැනීමේ ක්‍රමෝපාය	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රතිපත්තිය මගින් අවශ්‍ය සුදුසුකම්, අදාළ දැනුම සහ පළපුරුද්ද, ප්‍රමාණවත් හැකියාවන් සහ නිසි ආකල්ප වලින් සමන්විත අයැදුම්කරුවන් බඳවාගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.
	විවෘත සේවා නිලයන් උද්ගත වන අවස්ථාවන්හිදී අභ්‍යන්තර අයැදුම්කරුවන් වෙත ප්‍රමුඛත්වය හිමි වන අතර ඇතුළතින් සුදුසු අයැදුම්කරුවකු නොමැති අවස්ථාවකදී පමණක් බාහිර බඳවාගැනීම් පිළිබඳ අවධානය යොමු කෙරේ.
	අලුතින් බඳවාගන්නා ලද සේවකයින් දැඩි තෝරාගැනීමේ ක්‍රියාවලියකට භාජනය කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සියලුම අලුතින් බඳවාගනු ලබන සේවකයින් සමාගම සමග සම්බන්ධ වීමට සුදුසුද යන්න නිර්ණය කිරීම සඳහා නිපුණතා පරීක්ෂණ රැසකට මුහුණ දිය යුතු වේ.
	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිලය සහ/හෝ අවශ්‍යතාව මත වෙනස් විය හැකි නමුත්, සියලු මණ්ඩල සාමාජිකයින් අදාළ විෂය සම්බන්ධ ප්‍රාමාණිකයන් හා සමාගමෙහි ජ්‍යෙෂ්ට නායකත්ව කණ්ඩායමෙහි සාමාජිකයින් වේ.
	බඳවාගැනීමේ ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහ නිර්පක්ෂපාතීත්වය තහවුරු කිරීම පිණිස, සියලුම සම්මුඛ පරීක්ෂණ වලදී මානව සම්පත් අංශයේ නියෝජිතයකු සහභාගීවීම අපගේ බඳවාගැනීමේ ප්‍රතිපත්තියෙමහි අවශ්‍යතාවයක් වේ. එයට අමතරව, සියලුම සම්මුඛ පරීක්ෂණ පෙර සකසන ලද ඇගයම් සම්මතයන් අනුගමනය කරයි.
	සමාගම පිළිබඳව දැනුවත්වීම සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවා වටපිටාවට අනුගතවීම සඳහා සියලුම අලුතින් බඳවාගන්නා ලද සේවකයින් හඳුන්වාදීමේ සහ දිශානති වැඩසටහනකට සහභාගී විය යුතු වේ.
රඳවාගැනීමේ ක්‍රමෝපාය	දිනෙන් දිනම ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය වඩාත් තරගකාරී බවට පත් වන වටපිටාවක් තුළ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි තරගකාරී තීරුව සහ සන්නාම කීර්තිනාමය පවත්වාගෙන යාම සඳහා හැකියාවන්ගෙන් පරිපූර්ණ පුද්ගලයින් සේවයේ රඳවාගැනීම අතිශය වැදගත් වේ.
	කුසලතා පූර්ණ පුද්ගලයින් රඳවාගැනීමේ අපගේ ක්‍රමෝපාය හදුනාගත් වෘත්තිකයින් සමාගමෙහි අනාගත නායකයින් බවට පත් කිරීම අරමුණු කරගත් ක්‍රමවේදී අනුප්‍රාප්තික සැලසුමක් මත පදනම් වේ.
	අපගේ කාර්යසාධන ඇගයුම් පද්ධතියෙහි (PAS) ප්‍රතිඵල මත පදනම්ව, විශිෂ්ට කාර්යසාධනයක් සහිත වෘත්තිකයින් 'ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කුසලතා සංචිතය' සඳහා තෝරා ගැනේ.
	'ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කුසලතා සංචිතයෙහි' ඉලක්කය වනුයේ ව්‍යාපාරය තුළ පරිපූර්ණ අනුප්‍රාප්තික සැලසුමක් නිර්මාණය කරමින්, වැදගත් අවස්ථාවකදී ඕනෑම පුරප්පාඩුවක් පිරවීම සඳහා නිසි සුදුසුකම් ලත් වෘත්තිකයින් නිරන්තරයෙන් පවත්වාගෙන යාමයි.
	'ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කුසලතා සංචිතයෙහි' අයැදුම්කරුවන් හට ඔවුන්ගේ මෘදු හා තාක්ෂණික නිපුණතා ඔප් නංවා ගනිමින්, ස්වකීය නායකත්ව හා කළමනාකාරීත්ව හැකියාවන් වර්ධනය කරගැනීම සඳහා විවිධ වූ වෘත්තීය සංවර්ධන වැඩසටහන් වලට සහභාගී විය හැකි වේ.

මානව ප්‍රාග්ධනය

සේවක වෘත්තීය තෘප්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිලාභ

සාධාරණ පාරිශ්‍රමික

ඉහළ වෙළඳපොල තරගකාරී ප්‍රතිලාභ ව්‍යුහයක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සමස්ත මානව ප්‍රාග්ධන සංවර්ධන ක්‍රමෝපායෙහි වැදගත් කොටසක් වේ. වෙළඳපොල තත්ත්වයන් සහ අපගේ ක්ෂේත්‍රයට අදාළ නියාමනමය අවශ්‍යතාවයන්ට අනුකූලව සේවකයින් වෙත සාධාරණ හා අපක්ෂපාතී අන්දමින් ගෙවීම් සිදු කරනු ලැබේ.

ප්‍රතිලාභ සැලසුම්

තවද, අප විසින් 'තෘප්තිමත් සේවකයින් උසස් තත්ත්වයේ නිෂ්පාදන හා සේවාවන් සපයයි' යන මූලධර්මය පදනම් කරගනිමින්, අපගේ සියලුම සේවකයින් හට පහත දැක්වෙන වරප්‍රසාද භුක්ති විඳිමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමේ අවස්ථාව සළසනු ලැබ ඇත.

සේවා නියුක්තියේදී ප්‍රතිලාභ	
නම්‍යශීලී සේවා කටයුතු	විශේෂයෙන්ම මේ වන විට රට මුහුණ පා ඇති බලශක්ති අර්බුධය හමුවේ, අප විසින් මෑතකදී නම්‍යශීලී සේවා මුරයන් හඳුන්වාදෙන ලදී.
පවුලේ නිවාඩු	**ප්‍රසූත නිවාඩු** ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සියලුම කම්කරු නීති දැඩි ලෙස අනුගමනය කරනු ලබන අතර සිය සේවකයින්ගේ සුරක්ෂිතතාව සහ යහ පැවැත්ම උදෙසා අදාළ නීතිමය අවශ්‍යතා වලින් ඔබ්බට ගොස් පවා කටයුතු කරනු ලැබේ. මේ සම්බන්ධයෙන්, අපගේ සියලුම ස්ත්‍රී සේවිකාවන් ප්‍රසූත ප්‍රතිලාභ ආඥාපනත යටතේ ප්‍රසූත නිවාඩු සඳහා සුදුසුකම් ලබන අතර, සමාගම මගින් අදාළ ආඥාපනතේ නීතිරීති හා කොන්දේසි වලට අමතරව අමතර වැටුප් නොගෙවන මාස දෙකක නිවාඩුවක්ද ඔවුන් වෙත පිරිනමනු ලැබේ.
	පීතෘත්ව නිවාඩු නිවාඩු හිමිකම භාවිත කොට අවසන් වී ඇති නම්, පීතෘත්ව නිවාඩු සම්බන්ධයෙන්ද යහපත් අයුරින් සළකා බලනු ලැබේ.
ආහාරපාන	සහන මිලට ආහාරපාන අලෙවි කෙරෙන සියලු පහසුකම් වලින් සමන්විත ආපනශාලාවක් සමාගම මගින් පවත්වාගෙන යනු ලැබේ.
සුබසාධනය	සෙසු සුබසාධන කටයුතු සමගින් අඩු මිලට විවිධ භාණ්ඩ අලෙවි කරනු ලබන සුබසාධන වෙළඳසැලක් පවත්වාගෙන යනු ලැබේ.

සෞඛ්‍ය සඳහා ප්‍රතිලාභ	
ශරීර සුවතාවය	සේවකයින්ගේ ශාරීරික යෝග්‍යතාවය පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් ලත් උපදේශකවරයකු සමගින් සියලු උපකරණ වලින් සමන්විත ව්‍යායාම මධ්‍යස්ථානයක් ඇතුලු පහසුකම් රාශියක් සපයනු ලැබ ඇත.
	සිය මානසික හා ආධ්‍යාත්මික යහ පැවැත්ම පිළිබඳ උනන්දුවක් දක්වන සේවකයින් සඳහා සතිපතා යෝග අභ්‍යාස පංති පැවැත්වේ.
සෞඛ්‍ය සත්කාරය	උද්යෝගීමත් සේවා වටපිටාවක් සහ සෞඛ්‍ය අධ්‍යාපනය සපයනු ලබන සෞඛ්‍ය හා ශරීර සුවතා වැඩසටහන් පවත්වනු ලැබේ.

මූල්‍යමය සුරක්ෂිතතාව සඳහා ප්‍රතිලාභ	
වෛද්‍යමය ආවරනය	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් වෙත සෞඛ්‍ය රක්ෂණාවරනය පිරිනැමේ.
අධ්‍යාපනික දීමනා	මානව සම්පත් ප්‍රතිපත්තීන්ට අනුකූලව විභාග ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

ජීවන රටාව සම්බන්ධ ප්‍රතිලාභ	
සේවා - ජීවන සමතුලනය	රක්ෂණ, කළමනාකරණ, මූල්‍ය, අලෙවිකරණ සහ විකිණුම් ආදී විෂයන් ආවරනය කෙරෙන අධ්‍යාපනික ග්‍රන්ථ සහ ප්‍රබන්ධ 1,800 කට අධික සංඛ්‍යාවක් සහිත පුස්තකාලක් සමාගම මගින් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රමාණවත් නිවාඩු ලබාදීම් සහ වාර්ෂික සුහද හමු.
සංචාරක සහ නවාතැන්	සියලුම සේවකයින් හට නවීන පහසුකම් සහ පුහුණු භාරකරුවන් සහිත නිවාඩු නිකේතනයන් නුවරඑළිය, අනුරාධපුර සහ කතරගම පිහිටුවා ඇත.
	දිගු සංචාරයන් සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවකයින් සහ ඔවුන්ගේ පවුල් හට සමාගමෙහි ප්‍රවාහන සේවාවන් භාවිත කල හැකි වේ.
සේවකයින්ගේ පවුලේ සාමාජිකයින් වෙත වරප්‍රසාද	සේවකයින්ගේ දරුවන් හට අධ්‍යාපනික සහාය හිමි වේ. අප විසින් 5 වසර ශිෂ්‍යත්වය සඳහා සම්මන්ත්‍රණ පවත්වනු ලබන අතර ඉන් සමත් වන දරුවන් හට මුදල් තිළිණ පිරිනැමේ.
	සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් මරණ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. 'පියකු මෙන් මවක මෙන්' යන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තේමා පාඨය අනුව යමින්, අප විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී සේවකයින් සහ පවුලේ සාමාජිකයින් වෙත භාවාත්මක සහ මනෝ විද්‍යාත්මක සහායද පිරිනමනු ලැබේ.

සේවා බලකායෙහි ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම්

අපගේ පුහුණු හා සංවර්ධන ක්‍රමෝපායෙහි අරමුණ වනුයේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ව්‍යාප්ති අභිප්‍රායන් වෙත සහාය දැක්විය හැකි අයුරින් සේවක නිපුණතා සහ හැකියාවන් වර්ධනය කිරීමයි. කාර්යසාධන ඇගයුම් පද්ධතිය මගින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා ප්‍රමුඛතාකරණය සඳහා, අප විසින් මනා සේ ව්‍යුහගත කරන ලද පුහුණු හා සංවර්ධන ආකෘතියක් ක්‍රියාවට නංවනු ලැබ ඇත. අදාළ සේවා රික්තකයන් සම්පූර්ණ කිරීම සඳහා පුහුණු අවස්ථා පිරිනමනු ලබන අතර පුහුණු ආයෝජනය මගින් අවශ්‍ය නිපුණතා සහ හැකියාවන් වර්ධනය සම්බන්ධයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාදෙන්නේද යන්න තහවුරු කිරීම උදෙසා අප විසින් සහභාගීත්වය සහ ප්‍රගතිය ඇගයුමට ලක් කෙරේ.

පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය

පුහුණුව හා සංවර්ධනය සඳහා ආයෝජනය කාණ්ඩය	2021 (රු.)	2020 (රු.)
අභ්‍යන්තර පුහුණුව	477,840	302,824
බාහිර පුහුණුව	2,769,290	556,229
සම්මන්ත්‍රණ	365,000	25,500
රක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය	4,182,678	27,134
වෘත්තීය සාමාජිකත්වයන්	1,981,787	1,583,682

අපගේ අනුප්‍රාප්තික සැලසුමෙහි සහ කුසලතා සංචිත කළමනාකරණ සැලසුමෙහි කොටසක් වශයෙන්, එක් එක් අංශයෙන් අනාගත නායකයින්ගේ නායකත්ව කුසලතා වර්ධනය කිරීම උදෙසා අප සතුව මේ වන විට විශේෂිත පුහුණු මොඩියුලයක් පවතී. මෙය සමාගමෙහි ක්‍රමෝපායික ව්‍යාපාරික අරමුණු වෙත දායකත්වය සපයනු ලබන තවත් ව්‍යාපෘතියකි.

අඛණ්ඩ අධ්‍යයනශීලී වටපිටාවක් නිර්මාණය කරමින් සේවකයින් නිරන්තරයෙන්ම ස්වකීය නිපුණතා යාවත්කාලීන කර ගැනීම සඳහා දිරිගැන්වීමේ ප්‍රයත්නයක් වශයෙන්, ඔවුන්ගේ අදාළ සේවා අංශ වෙත වටිනාකම් එක් කිරීම සඳහා සිය වැඩිදුර අධ්‍යාපන කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන සේවකයින් උදෙසා, අප විසින් වෘත්තීය සංවර්ධන ප්‍රතිපූර්ණ සැලසුමක් ඔස්සේ අවශ්‍ය මූල්‍යමය සහාය ලබාදීමට කටයුතු යොදා ඇත. අඛණ්ඩ වෘත්තීය වර්ධනය දිරිගැන්වීම උදෙසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් වෘත්තීය අධ්‍යාපන ආයතන සාමාජිකත්ව වියදම් ද ප්‍රතිපූර්ණය කෙරේ.

මානව ප්‍රාග්ධනය

විභාග වියදම් ප්‍රතිපූර්ණය

	2021 (රු.)	2020 (රු.)
සේවකයින් සඳහා සමස්ත ආයෝජනය	3,247,130	3,050,559

2021 මූල්‍ය වර්ෂයේදී පවත්වන ලද ප්‍රධාන පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන්	2021	2020
වැඩසටහන් සංඛ්‍යාව	70	85
පැය ගණන	625	680

ඇගයුම් සහ ප්‍රතිලාභ

කාර්යසාධනය ඉලක්ක කොට ගත් සමාගමක් වශයෙන්, සේවක සංවර්ධනය ප්‍රවර්ධනය කරනු ලබන අතරතුර ආයතනික ක්‍රමෝපායක අරමුණු සාක්ෂාත් කරගැනීමේදී සාර්ථක කාර්යසාධන ඇගයුම් පද්ධතියක් (PAS) මගින් අවශ්‍ය පදනම සකසනු ලබන බව අපගේ විශ්වාසයයි.

''අති විශිෂ්ටත්වය උදෙසා කැපවීමෙන් කටයුතු කිරීම'' යන දර්ශනය මත පදනම් වූ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කාර්යසාධන ඇගයුම් පද්ධතිය මගින්, සාධාරණ, විනිවිදභාවයෙන් යුත් සහ විශ්වසනීය ආකාරයකින් අපගේ සේවක කාර්යසාධනය තක්සේරු කරනු ලැබේ.

මෙම ක්‍රියාවලියෙහි කොටසක් වශයෙන් මූල්‍ය වර්ෂය ආරම්භයේදී සකසනු ලබන පෙර එකගත්වයට පත් ප්‍රමුඛ කාර්යසාධන දර්ශක වලට සාපේක්ෂව ඔවුන්ගේම කාර්යසාධනය ශ්‍රේණිගත කිරීම සඳහා සියලුම ස්ථිර සේවකයින් ද්වි වාර්ෂික ස්වයං තක්සේරුවක් සිදුකිරීමේ වගකීමෙන් බැඳේ. මින් අනතුරුව කාර්යසාධන ඇගයුම් හමුවක් පැවැත්වෙන අතර, එහිදී සිය රේඛීය කළමනාකරු සමග ඔවුන්ගේ කාර්යසාධනය, පුහුණු අවශ්‍යතා, සහ දිගු කාලීන වෘත්තීය අභිලාෂයන් පිළිබඳව සාකච්ඡා කිරීමේ අවස්ථාව සේවකයින් වෙත උදා වේ.

ලකුණු 2 ට අඩුවෙන් ලබාගත් සේවකයින් හට, සිය අධීක්ෂකයින් සමග එක්ව මානව සම්පත් අංශය මගින් සකසන ලද විශේෂිත ඒකපුද්ගල සංවර්ධන සැලසුම් ඔස්සේ තවදුරටත් සහාය පිරිනැමේ.

කාර්යසාධන ඇගයුම් පද්ධතිය සෘජුවම මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) සමග සම්බන්ධ කරනු ලැබ ඇති අතර, වසර පුරා සේවකයින් හට ඔවුන්ගේ ප්‍රගතිය පරීක්ෂා කිරීමටත් රේඛීය කළමනාකරුවන් හට ඔවුන්ගේ කණ්ඩායම් වල කාර්යසාධනය ඇගයීමටත් අවස්ථාව උදා වේ.

වෙනත් සැළකිය යුතු ප්‍රධාන සංඛ්‍යාලේඛණ

ප්‍රාදේශීය වශයෙන් සේවකයින්

ප්‍රදේශිකය	සංඛ්‍යාව
මධ්‍යම	175
නැගෙනහිර	48
උතරු මැද	78
උතුරු	55
රත්නපුර	96
දකුණු 1	159
දකුණු 2	121
ඉහළ බස්නාහිර	160
ඌව	97
වයඹ 1	111
වයඹ 2	77
බස්නාහිර 1	109
බස්නාහිර 2	60
බස්නාහිර 3	85
බස්නාහිර 4	62
ප්‍රධාන කාර්යාලය	1274
එකතුව	**2767**

සේවක බඳවාගැනීම

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	එකතුව	%
18-24	36	13	49	19%
25-29	46	12	58	23%
30-34	43	1	44	17%
35-39	54	2	56	22%
40-44	30	4	34	13%
45-49	12	0	12	5%
50-54	1	0	1	0%
55 සහ ඉහළ	1	0	1	0%
එකතුව	**223**	**32**	**255**	**100%**

සේවක පිරිවැටුම

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	එකතුව	%
18-24	8	3	11	11%
25-29	8	3	11	11%
30-34	7	5	12	12%
35-39	9	1	10	10%
40-44	10	0	10	10%
45-49	1	2	3	3%
50-54	1		1	1%
55 සහ ඉහළ	20	22	42	42%
එකතුව	**64**	**36**	**100**	**100%**

සේවක රඳවාගැනීමේ අනුපාතය

	2021	2020
සේවක සංඛ්‍යාව	2,767	2,626
සේවක රඳවාගැනීමේ අනුපාතය	96.20%	98.0%

අනාගත අපේක්ෂාවන්

- **කාර්සාධනය ඉලක්ක කොට ගත් සේවා වටපිටාව-**

අපගේ අරමුණ වනුයේ සමාගම ධෛර්යය පෙරදැරි කරගෙන කටයුතු කරමින් සාංගමික ප්‍රතිඵල අත්පත් කරගන්නා වූ කාර්යසාධනය ඉලක්ක කොටගත් සේවා වටපිටාවක් පූර්ණ වශයෙන් නිර්මාණය කිරීමයි.

- **අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම-**

සමාගම තුළ අතිශය වැදගත් ධූරයන් හදුනාගනිමින් විශ්‍රාම ලබන හෝ ඉවත් වන සේවකයින්ගේ පුරප්පාඩු පිරවීම සඳහා කුසලතා සංචිතය සංවර්ධනය කරමින් තවදුරටත් අදාළ වැඩිදියුණු කිරීම් සිදුකිරීම අපගේ අපේක්ෂාව වේ.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය

1 NO POVERTY
- විවිධාංගීකරණය කරන ලද අවදානම් ආරක්ෂණ සහ ජීවිත ආයෝජන සැලසුම් සමූහයක්

10 REDUCED INEQUALITIES
- මිල පහසු සහ පරිපූර්ණ ''සැමට රක්ෂණ සේවා'' සංකල්පය

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
- ශ්‍රී ලංකාව පුරා මිලියන 2 කට අධික සේවාලාභීන්
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් - අංක 1 රථවාහන රක්ෂණය
- විශේෂ සේවාලාභී පැමිණිලි කළමනාකරණ පද්ධතිය

17 PARTNERSHIPS FOR THE GOALS
- ගෙවීම් ක්‍රම ප්‍රවර්ධනය කිරීම සඳහා මහජන බැංකුව, ලංකා බැංකුව සහ මොබිටෙල් සමග සහයෝගීතා
- ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය සහ PIMA ආයතනය සමග ක්‍රමෝපායික සහයෝගීතා
- මෝටර් ප්ලස් රක්ෂණ ඔප්පු හිමියන් වෙත ප්‍රතිලාභ පිරිනැමීම සඳහා ප්‍රමුඛ වෙළඳ සහකරුවන් සමග හවුල්කාරිත්වයන්

3 GOOD HEALTH AND WELL-BEING
- සෞඛ්‍ය අවශ්‍යතා සඳහා පරිපූර්ණ ආවරනය

11 SUSTAINABLE CITIES AND COMMUNITIES
- ''මෝටර් ප්ලස් රෝඩ් සේෆ්ටි හීරෝස්''
- දරුවන් සඳහා ''මිණිමුතුලන්තය''
- ''රයිසින් ටු නිව් නෝර්ම් (Rising to New Norm) '' දැනුවත් කිරීමේ වැඩසටහන

4 QUALITY EDUCATION
- නියෝජිතවරුන්ගේ වෘත්තීය ගමන්මග

8 DECENT WORK AND ECONOMIC GROWTH
- නියෝජිත සංවර්ධන ආකෘතිය ක්‍රමානුකූලව මෙහෙයවීම

9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
- නවතාවයෙන් යුත් විශේෂිතව සකසන ලද රක්ෂණ සැලසුම්
- ජංගම සහ වෙනත් ගෙවීමේ ක්‍රම
- හයිබ්‍රිඩ් චැනල

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය මගින් අපගේ පාර්ශ්වකරුවන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෙරෙහි තබන ලද විශ්වාසය සඳහා පදනම සකසනු ලැබේ. මෙම ප්‍රාග්ධනය මගින් සහකරුවන්, සේවාලාභීන්, සැපයුම්කරුවන්, ක්ෂේත්‍රයේ නියාමකයින් ආදී බහුවිධ පාර්ශ්වකරුවන් සමග වන අපගේ සහභාගීත්වයන් සහ සබඳතාවයන් හඳුනාගනු ලබන අතර: පාර්ශ්වකරුවන් වෙත මෙන්ම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත මෙකී සබඳතාවයන් විසින් නිර්මාණය කරනු ලබන වටිනාකම ඇගයුමට ලක් කෙරේ. දෙපාර්ශවය අතරම විශ්වාසය මත පදනම් වූ සබඳතාවයන් නිර්මාණය කිරීම උදෙසා අදාළ පාර්ශ්වකරුවන් සමග සබඳතාවයන් සවිමත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ක්‍රියාකාරී එළඹුමක් අනුගමනය කරයි.

ප්‍රධාන සංඛ්‍යාලේඛණමය විශේෂතා

වෙළඳපොල කොටස	2021	2020	වෙනස
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වෙළඳපොල කොටස (ජීවිත රක්ෂණ ව්‍යාපාරය)	17.62 %	18.69 %	-1.07 %
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වෙළඳපොල කොටස (සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය)	20.77%	20.26 %	0.51 %

අපගේ සමාජ හා සබඳතා ප්‍රාග්ධනය



සේවාලාභී ප්‍රාග්ධනය වෙත වටිනාකම් නිර්මාණය

සේවාලාභී ප්‍රාග්ධනය වටිනාකම නිර්මාණය කෙරෙහි යොමු කිරීම

සැබැවින්ම සාර්ථකවීමට නම්, අප විසින් පළමුව අපගේ සේවාලාභීන් හදුනාගනිමින්, ඉන් අනතුරුව ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දක්වමින්, අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ අන් කවර හෝ රක්ෂණ සේවා සම්පාදයකු ලබාදෙනු ලබන අත්දැකීමෙන් ඔබ්බට ගිය පරිපූර්ණ සේවා අත්දැකීමක් ඔවුන් වෙත ලබාදිය යුතු බව අපගේ විශ්වාසයයි. අපගේ සියලුම ක්‍රමෝපායික ව්‍යාපෘතීන් කෙරෙහි මෙම එළඹුම පාදක වන අතර, එහිදී දැනට සිටින සේවාලාභීන් රදවාගනිමින්, නව සේවාලාභීන් ආකර්ශනය කරගනිමින් එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයෙදී සහ අනාගතයේදී ආදායම ඉහළ නැංවීම අපගේ අභිලාෂයයි. පහත දැක්වෙන මාර්ගෝපදේශයන් වෙත අනුගතවීම ඔස්සේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාලාභීන් කෙරෙහි වන ස්වකීය කැපවීම යළිත් අවධාරනය කරයි.

විවිධ වූ සහ අනන්‍ය වූ සැලසුම් කළඹ

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් ''මවක මෙන් පියකු මෙන්'' යන ස්වකීය තේමාපාඨය අනුව යමින්, තනිපුද්ගලයින්ගේ සිට සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින්ගේ සිට ප්‍රධාන පෙලේ සමාගම් දක්වා, සියලුම සේවාලාභීන් වෙත බහුවිධ වූ අවදානම් ආරක්ෂණ සහ ආයෝජන සැලසුම් රැසක් ඉදිරිපත් කෙරේ. අපගේ සැලසුම් සුවිශේෂී වන අතර, ඒ එක් එක් සැලසුම තුළ අපගේ සහතික කරන ලද වටිනාකම් සමුදාය ගැබ්ව පවතිනුයේ සෑම ශ්‍රී ලාංකිකයකු වෙතම මිල පහසු සහ පරිපූර්ණ රක්ෂණ සේවාවන් ලබාදෙමින් මෙරට ප්‍රමුඛතම රක්ෂණ සේවා සම්පාදකයා බවට පත්වීමේ අරමුණ පෙරදැරි කරගනිමිනි.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

SLIC Sri Lanka Insurance LIFE
Like a father - Like a mother

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් - ජීවිත රක්ෂණ

රැකවරන සැලසුම්

- Sri Lanka Insurance Janadiri – Two year relief plan
- Sri Lanka Insurance Divi Thilina – Protection Plan

ආයෝජන සැලසුම්

- Sri Lanka Insurance Early Cash
- Sri Lanka Insurance Wealth Plus – Limited Premium Plan
- Sri Lanka Insurance SPEED INVESTMENT
- Sri Lanka Insurance YASAS – FULL AMOUNT - BENEFITS - PROTECTION

ළමා රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance Mini Muthu – Children's Plan
- Sri Lanka Insurance Mini Muthu – Dayada
- Sri Lanka Insurance Mini Muthu – Parithyaga
- Sri Lanka Insurance Early Cash

විශ්‍රාම රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance Freedom – RETIREMENT PLAN
- Sri Lanka Insurance Freedom LIFESTYLE PLUS – RETIREMENT PLAN

සෞඛ්‍ය රක්ෂණ සැලසුම්

- SLIC Comprehensive Health Plus
- Sri Lanka Insurance Comprehensive – The Health and Life Insurance Cover for Diabetics

ජීවිත රක්ෂණ කළඹ

සැලසුම් කාණ්ඩය	ඉලක්ක සේවාලාභීන්	සැලසුම්	විස්තරය
රැකවරනය/ ආයෝජනය	රැකවරන හා ආයෝජන ප්‍රතිලාභ ද්විත්වයම අපේක්ෂා කරන සේවාලාභීන්	දිවි තිළිණ රැකවරන සැලසුම	මෙම සැලසුම් මගින් රැකවරනය සහ මනා ආදායම් ප්‍රතිලාභ යන දෙකම පිරිනැමේ
		දිරිසවි රැකවරන සැලසුම	
		ස්පීඩ් ආයෝජන සැලසුම	
		අර්ලි කෑෂ් අත්තිකාරම් ප්‍රතිලාභ සැලසුම	
		ස්වර්ණ ධජ	
		ජන දිරි - වසර දෙකක සහන සැලසුම	
		ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙල්ත් ප්ලස්	
විශ්‍රාම	රැකවරන හා ආයෝජන ප්‍රතිලාභ ද්විත්වයම අපේක්ෂා කරන සේවාලාභීන්	ෆ්‍රීඩම් විශ්‍රාම සැලසුම	මෙම සැලසුම් මගින් නිශ්චිත කාලපරච්ඡේදයක් සඳහා සහතික කල මාසික ආදායමක් පිරිනැමේ
		ෆ්‍රීඩම් සිංගල් ප්‍රමියම් සැලසුම	
		ෆ්‍රීඩම් ලයිෆ්ස්ටයිල් ප්ලස්	
ළමා සැලසුම	වයස අවුරුදු 15 ට අඩු දරුවන්	මිණිමුතු දායාද	මෙම සැලසුම් මගින් කල්පිරීමේදී දරුවා වෙත අරමුදලක් සහතික කෙරෙන අතර දෙමව්පියන් වෙත රැකවරනය පිරිනැමේ
		මිණිමුතු ළමා සැලසුම	
		මිණිමුතු පරිත්‍යාග	
උකස් සුරක්ෂිතතාව	බැංකු/මූල්‍ය ආයතන වෙතින් ණය ලබාගන්නා ගනුදෙනුකරුවන්	මෝර්ගේජ් ප්‍රොටෙක්ෂන් සැලසුම	මෙම සැලසුම නිර්මාණය කරන ලද්දේ, රක්ෂණ ඔප්පු කාලසීමාව තුළදී ණය ලබාගත් පුද්ගලයාගේ මරණය හෝ පූර්ණ සහ සදාකාලික අකර්මාන්‍යතාවයකදී නිවාස ණය හෝ වෙනත් ණයක් සඳහා ඇපයට තබන උකස සුරක්ෂිත කිරීම උදෙසාය
සෞඛ්‍ය	පොදු ජනතාව	ස්පිකල් සැලසුම	මෙමගින් පූර්ව නිශ්චිත උපරිම සීමාවක් දක්වා ශල්‍ය කර්ම පිරිවැය ආවරනය කරමින් ඔබ වෙත පරිපූර්ණ රැකවරනය සළසයි
	පොදු ජනතාව	කම්ප්‍රිහෙන්සිව් හෙල්ත් ප්ලස්	ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හිදී ශල්‍ය, වෛද්‍යමය, සහ රෝහල්ගතවීමේ වියදම් ආවරනය කෙරේ
	දියවැඩියා රෝග යෙන් පෙළෙන්නන්	කම්ප්‍රිහෙන්සිව් ඩී+ සැලසුම	දියවැඩියාව සඳහා විශිෂ්ටතම ආරෝග්‍යශාලා සහ වෛද්‍ය ප්‍රතිකාර සඳහා මූල්‍යමය සහාය ලබාදෙමින් රක්ෂණ ඔප්පු හිමියා වෙත හිතේ නිදහස උදා කරයි
පෞද්ගලික	පොදු ජනතාව	හොස්පිට්ල් කෑෂ් සැලසුම	සැබෑ බිල්පත් හෝ හෝ වියදම් පිළිබඳව සළකාබැලීමින් තොරව, ඔබ රෝහල්ගතව සිටින එක් එක් දිනයක් සඳහා නිශ්චිත ආවරන ප්‍රමාණයක් පිරිනැමේ
	ජ්‍යෙෂ්ට පුරවැසියන් (වයස අවුරුදු 60 සිට 70 දක්වා)	මෙඩි 60	මෙඩි 60 යනු පුලුල් පරාසයක් පැතිරුනු ජ්‍යෙෂ්ට පුරවැසි සෞඛ්‍ය රක්ෂණ අවශ්‍යතා ආවරනය කරමින්, ඔවුන්ගේ මූල්‍ය ආයෝජනය මත පදනම් වූ පැකේජ තුනක් අතුරින් විශිෂ්ටතම වෛද්‍යමය සැලසුම තෝරාගැනීමේ වඅස්ථාව ඔවුන් වෙත උදා කරන සැලසුමකි.
	වයස අවුරුදු 18 සිට 59 දක්වා ශ්‍රී ලාංකික පුරවැසියන්	ඇනුවල් මෙඩිකල් සැලසුම	රෝහල්ගතවීමේ සෞඛ්‍ය රක්ෂණ ආපාදාවන් රැසක් ආවරනය කරන පුද්ගල සෞඛ්‍ය රක්ෂණ සැලසුමකි. සැලසුම වාර්ෂිකව නැවත අලුත් කල හැකි අතර හිමිකම් නොපෑමේ වසරක් පාසා රක්ෂිත මුදල ඉහළ නංවන්නා වූ විශේෂ නෝ ක්ලේම් බෝනස් මුදලක් පිරිනැමේ.
සේවා නියුක්තික ආශ්‍රිත	සමාගමෙහි කාර්ය මණ්ඩලය	ප්‍රොටෙක්ට් - ගෘප් ටර්ම් රක්ෂණ ඔප්පු	මෙමගින් සමාගම තුළ වඩාත් සුරක්ෂිත හැඟීමක් සහ බැඳීමක් ඇති කරමින් එක් රක්ෂණයක් මගින් ඔබේ සියලුම සේවකයින් ආවරනය කෙරේ.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

SLIC GENERAL
Sri Lanka Insurance
Like a father - Like a mother

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් - සාමාන්‍ය රක්ෂණ

සෞඛ්‍ය රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance MEDI 60 – Senior Citizen Health Insurance Plan
- Sri Lanka Insurance MEDI PLUS – Health Insurance Plan
- Sri Lanka Insurance HEALTH PLUS
- ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් නාගරාජ – ගෘහස්ථ පුත්‍ර, ඥාති වෛද්‍ය රක්ෂණාවරණය

ව්‍යාපාර රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance Business Club – TRADE INSURANCE POLICY
- Sri Lanka Insurance MARINE CARGO
- Sri Lanka Insurance HULL INSURANCE
- Sri Lanka Insurance WORKMEN'S COMPENSATION INSURANCE
- Sri Lanka Insurance TEA FACTORY INSURANCE

මෝටර් රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance MOTOR PLUS – The Best Option
- MOTOR PLUS PINNACLE
- Sri Lanka Insurance MOTOR PLUS Ladies Only
- Sri Lanka Insurance MOTOR PLUS COMMERCIAL
- Sri Lanka Insurance MOTOR PLUS TUK
- Sri Lanka Insurance MOTOR PLUS RIDER

ගෘහ හිමියන්ගේ රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance HOME PROTECT
- Sri Lanka Insurance HOME PROTECT LITE
- Sri Lanka Insurance FIRE INSURANCE

ගමනාගමන රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance TRAVEL PROTECT

පුද්ගල රක්ෂණ සැලසුම්

- Sri Lanka Insurance PERSONAL ACCIDENT COVER
- Sri Lanka Insurance Jana Rekuma – Individual Personal Accident Cover

සාමාන්‍ය රක්ෂණ කළඹ

සැලසුම් කාණ්ඩය	ඉලක්ක සේවාලාභීන්	සැලසුම්	විස්තරය
මෝටර්	පුද්ගලික මෝටර් රථ සහ පුද්ගලික ද්විත්ව කාර්ය රථ හිමි කාන්තාවන්	මෝටර් ප්ලස් ලේඩීස් ඔන්ලි	මෝටර් රථ සහ ද්විත්ව කාර්ය රථ පදවන කාන්තා සේවාලාභී කාණ්ඩයේ විශේෂිත අවශ්‍යතා සපුරාලන විශේෂාංග වලින් සමන්විත වේ.
	ත්‍රිරෝද රථ රියැදුරන්	මෝටර් ප්ලස් ටුක්	සුවිශේෂී අගය එකතු කිරීම් මෙන්ම සියලුම සැලසුම් විශේෂාංග වලින් සමන්විත වේ.
	යතුරු පැදි ධාවකයින්	මෝටර් ප්ලස් රයිඩර්	යතුරු පැදි ධාවකයින් වෙත විශේෂ රක්ෂණ සැලසුමකි.
	වාණිජ මෝටර් රථ හිමිකරුවන්	මෝටර් ප්ලස් කොමර්ෂල්	අර්ථිකය වෙත දායකත්වයක් සපයනු ලබන ඔබගේ වාණිජ මෝටර් රථ සඳහා විශේෂිත මෝටර් රථ ආවරනයක් සපයනු ලැබේ. (කුලී රථ, ද්විත්ව කාර්ය රථ, පුද්ගලික සහ කුලී ලොරි රථ)
ගෘහ හිමියන්	නිවාස හිමිකරුවන්	සොරබිය රක්ෂණය	ගෙවල් බිඳීම් හේතුවෙන් සිදුවන දේපළ අලාභහානි වලින් ඔබ සහ ඔබේ පවුල රැක ගනී.
		පදිංචි නිවාස සඳහා ගිනි රක්ෂණය	ඔබේ නිවස නිම කරන ලද, පදිංචි හෝ ඉදිවෙමින් පැවතියද ගිනි සහ ගිනි ආශ්‍රිත ආපදාවන් සඳහා රැකවරනය සළසයි
		හෝම් ප්‍රොටෙක්ට් ඉන්ෂුවරන්ස්	ආපදාවකදී ඔබේ නිවස, ඔබේ පවුල, ඔබේ වටිනා දේ සහ මෙහෙකරුවන් වෙත ආවරනය ලබාදෙයි.
		හෝම් ප්‍රොටෙක්ට් ලයිට්	ගිනි හා සොරබිය රක්ෂණ ඔප්පු ද්විත්වයෙහිම සංකලනයකි.
ගමනාගමන	සියලුම මගීන් සඳහා	ට්‍රැවල් ප්‍රොටෙක්ට්	සෞඛ්‍ය ප්‍රතිලාභ, හදිසි අනතුරු ප්‍රතිලාභ, පුද්ගලික දේපළ ආවරනය, ගමනාගමන අවහිරතා ආවරනය ආදී සියල්ල මෙම රක්ෂණ ඔප්පු තුල පවතී. ලබාගත හැකි අමතර ප්‍රතලාභ වනුයේ පෞද්ගලික වගකීම, ගුවන්යානා පැහැරගැනීමේ ආවරන සහ නිවාස ආරක්ෂණ ආවරනය වේ.
පුද්ගල හදිසි අනුතුරු	ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය	ජන රැකුම	ඕනෑම ස්ථානයක් ඕනෑම වේලාවකදී සිදුවිය හැකි හදිසි අනතුරු සඳහා පරිපූර්ණ ආවරනය ලබා දෙයි.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

සැලසුම් කාණ්ඩය	ඉලක්ක සේවාලාභීන්	සැලසුම්	විස්තරය
ව්‍යාපාර			
දේපළ	ව්‍යාපාර හිමිකරුවන්	ව්‍යාපාර ස්ථාන සඳහා රක්ෂණය	ඔබේ කර්මාන්ත හෝ වාණිජ දේපල වෙත සිදුවන හානි සඳහා ආවරනය සපයනු ලැබේ
	සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් බිස්නස් ක්ලබ් ට්‍රේඩර්ස් කම්බයින්ඩ් රක්ෂණ ඔප්පුව	ගිනි හා ආශ්‍රිත ආපදා, වීදරු, මුදල්, විදුලි උපකරණ, සහ තොග හානි වීමේ රක්ෂණය ඇතුලුව ඔවුන් වෙත එකම රක්ෂණ ඔප්පුවකින් පරිපූර්ණ රැකවරනය සැලසේ.
	ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය	ශ්‍රී ලංකා ටී ෆැක්ටරි ඉන්ෂුවරන්ස්	මෙයට යන්ත්‍ර, ආකෘතීන් සහ සිදුකෙරෙමින් පවතින කාර්යයන් වෙත සිදුවන අවදානම් ඇතුලුව තේ වතු, තේ කර්මාන්තශාලා සහ ගබඩා ඇතුළත් වේ.
	ශ්‍රී ලංකාවේ හෝටල්කරුවන්	හොටෙලියර්ස් කම්ප්‍රිහෙන්සිව් ඉන්ෂුවරන්ස්	කාලයත් සමග සංචාරක වයාපාරය විශේෂිත බාධාවන්ට මුහුණදෙන පසුබිමක් තුළ ශ්‍රී ලංකාවේ හෝටල්කරුවන් හට පරිපූර්ණ රක්ෂණාවරණයකි
	සිවිල් ඉංජිනේරුමය ව්‍යාපෘතීන් සිදුකරන කොන්ත්‍රාත්කරුවන්	කන්ට්‍රැක්ටර්ස් ඕල් රිස්ක්ස් ඉන්ෂුවරන්ස්	වර්තමාන අති ධාවනකාරී ඉදිකිරීම් ව්‍යාපාරය තුළ උද්ගත වන විවිධ අවදානම් ආවරනය කෙරෙන රක්ෂණාවරණයකි
	ඉදිකිරීම් ව්‍යාපෘති	ඉරෙක්ෂන් ඕල් රිස්ක්ස් ඉන්ෂුවරන්ස්	යන්ත්‍රෝපකරණ සහ උපකරණ සවිකිරීම් ආවරනය කෙරේ
	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	ඉලෙක්ට්‍රොනික් ඉක්විප්මන්ට් ඉන්ෂුවරන්ස්	ඔබේ ඉලෙක්ට්‍රොනික සහ විදුලි උපකරණ හා මෙවලම් හානිවීමේ අවදානම ආවරණය කරයි
	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	මැෂිනරි බ්රේක්ඩවුන් ඉන්ෂුවවරන්ස්	රක්ෂිත අයිතම වෙත හදිසි අනපේක්ෂිත හා ආවරනය කරමින්, අලුත්වැඩියාව/හෝ ප්‍රතිස්ථාපනය සඳහා කටයුතු කෙරේ.
	ඉදිකිරීම් ව්‍යාපෘති	කන්ට්‍රැක්ටර්ස් ප්ලාන්ට් ඇන්ඩ් මැෂිනරි ඉන්ෂුවරන්ස්	කාර්ය පරිශ්‍රයේ සිදුවිය හැකි සියලුම ආකාරයේ අවදානම් වලින් කොන්ත්‍රාත්කරුවන්ගේ පිරියත සහ යන්ත්‍ර ආවරනය කරයි
	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	ඩිටිරියෝරේෂන් ඔෆ් ස්ටොක් ඉන්ෂුවරන්ස්	ආහාර, ඖෂධ සහ මල් ඇතුලු ශීතාගාර වන හානි විය හැකි භාණ්ඩ ආශ්‍රිත අවදානම ආවරනය කරයි.
	ව්‍යාපාර පරිශ්‍ර සහ කර්මාන්තශාලා	මැෂිනරි ලොස් ඔෆ් ප්‍රොෆිට්ස් ඉන්ෂුවරන්ස්	බාධාවන් (කවර හෝ නිෂ්පාදන යන්ත්‍රයක් දෝෂ සහිත වීමෙන් මෙහෙයුම් හා ආදායමට වන බලපෑම) හේතුවෙන් දළ ලාභයෙහි තථ්‍ය අලාභය ආවරනය කෙරේ
මුහුදු	ධීවර බෝට්ටු හිමිකරුවන් සහ යාත්‍රා හිමිකරුවන්	මැරයින් හල් ඇන්ඩ් මැෂිනරි ඉන්ෂුවරන්ස්	මුහුදු යන සහ ජලයේ මෙහෙයුම් සිදුකරන සෙසු බෝට්ටු වෙත ඇති වන අවදානම ආවරනය කෙරේ
	ආනයනකරුවන් සහ අපනයනකරුවන්	මැරයින් කාර්ගෝ ඉන්ෂුවරන්ස්	ආනයනකරුවන් සහ අපනයනකරුවන්ගේ නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කොට ඇත.

සැලසුම් කාණ්ඩය	ඉලක්ක සේවාලාභීන්	සැලසුම්	විස්තරය
සේවක ආශ්‍රිත			
	කර්මාන්තශාලා, නිෂ්පාදන සමාගම් සහ කාර්යාල	වර්ක්මෙන්ස් කම්පන්සේෂන් ඉන්ෂුවරන්ස්	රැකියාවේ නියුතු වීමේදී අනතුරට පත් සේවකයින් වෙත වන්දි ලබාදෙන මෑතකදී යාවත්කාලීන කරන ලද 2005 අංක 10 දරණ සේවක වන්දි පනතෙහි සේව්‍ය වගකීම් විශේෂ කොට දැක්වේ
	කර්මාන්තශාලා, නිෂ්පාදන සමාගම් සහ කාර්යාල	පර්සනල් ඇක්සිඩන්ට් කවර්	පහරදීම, හදිසි අනතුරු සහ සෙසු බාහිර සහ නිරීක්ෂණය කල හැකි ක්‍රම වලින් සිදුවන මරණය සහ ශාරීරික හානි සඳහා වන්දි ලබාදෙමින් එබඳු අනපේක්ෂිත සිදුවීමකදී රක්ෂණ ඔප්පු හිමියා ආවරනය කරයි
විශේෂ මෝටර් කාණ්ඩයන්	මෝටර් රථ සමූහයක් සහිත සමාගම්/පුද්ගලයින්	මෝටර් ෆ්ලීට් සොලියුෂන්ස්	ආයතනික හිමිකාරිත්වය සහිත මෝටර් රථ වෙත හදිසි අනතුරු අවදානම් සහ හානි ආවරනය
	කෘෂිකාර්මික හෝ විශේෂ කාණ්ඩයන්හි මෝටර් රථ සහිත සමාගම්/පුද්ගලයින්	ඇග්‍රිකල්චරල් වෙහිකල්ස් ඇන්ඩ් ස්පෙෂල් වෙහිකල්ස්	මෙම සැලසුම නිර්මාණය කොට ඇත්තේ රථයේ භාවිතය සහ රථයේ වර්ගය සැළකිල්ලට ගනිමින් අදාළ කාණ්ඩයේ විශේෂිත අවශ්‍යතා සපුරාලීම සඳහා වේ.

වෙනත් රක්ෂණ ඔප්පු

- බෑන්කර්ස් ඉන්ඩෙම්නිටි
- රබර් ෆැක්ටර්
- ප්‍රොෆෙෂනල් ඉන්ඩෙම්නිටි
- එයාර්ක්‍රාෆ්ට් ඉන්ෂුවරන්ස්
- පබ්ලික් ලයබිලිටි
- ප්‍රොඩක්ට්ස් ලයබිලිටි

2021 දී වෙළඳපොල වෙත හඳුන්වාදෙන ලද නව සැලසුම්

විමර්ශනයට ලක් වන වසර තුළදී පහත දැක්වෙන සැලසුම් වෙළඳපොල වෙත හඳුන්වාදෙන:

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
නාගරාජ්
ශාක්‍ය පුත්‍ර, ඥාතී වෛද්‍ය රක්ෂණාවරණය

'නාගරාජ' - බෞද්ධ භික්ෂූන් වෙත විශේෂිත සෞඛ්‍ය රක්ෂණයකි.

'නාගරාජ' යනු බෞද්ධ භික්ෂූන් සහ ඔවුන්ගේ පවුල් වෙත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් පිරිනමනු ලබන විශේෂිත සෞඛ්‍ය රක්ෂණයකි.

මේ ආකාරයේ එකම වැඩසටහන වන මෙහිදී, දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛාවන්ගෙන් 'නාගරාජ' සැලසුම මිලට ගෙන පිරිකර වශයෙන් පූජා කල හැකි වේ. 'නාගරාජ' රක්ෂණ සැලසුම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සැමට රක්ෂණය යන සංකල්පයේ කොටසකි.

මෙම රක්ෂණ සැලසුම යටතේ බෞද්ධ භික්ෂූන් හට රජයේ හෝ පෞද්ගලික රෝහලක රෝහල්ගත වීමේදී දිනකට රු. 1000 බැගින් (දින 15 ක් දක්වා) රෝහල්ගත වීමේ ප්‍රතිලාභයක් පිරිනැමෙන අතර, රජයේ හෝ පෞද්ගලික රෝහලක රෝහල්ගත වීමේදී ඖෂධ, පරීක්ෂණ, ස්කෑන් සහ එක්ස් කිරණ සඳහා වන වියදම් වෙනුවෙන් රු.25,000 ක් පිරිනැමේ.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

සමාගම මගින් ජීවිත රක්ෂණ සැලසුම් දෙකක් ප්‍රතිසන්නාමගත කිරීමද සිදුකරන ලද අතර ඒවා නම් වශයෙන් අර්ලි කෑෂ් සහ ස්පීඩ් ඉන්වෙස්ට්මන්ට් වේ.

අර්ලි කෑෂ්	ස්පීඩ් ඉන්වෙස්ට්මන්ට්
'අර්ලි කෑෂ්' ජීවිත රක්ෂණ සැලසුම මගින් සේවාලාභීන් පරිපූර්ණ රැකවරනය සලසන අතරතුර කල්තබා ප්‍රතිලාභ පිරිනමනු ලැබේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි 'අර්ලි කෑෂ්' දිගු කාලීන සැලසුමක් වන අතර එමගින් රක්ෂණ ඔප්පු වටිනාකමින් 50% ක් දක්වා අත්තිකාරම් ගෙවීම් දෙකක් වශයෙන් රක්ෂණ ඔප්පු කාලසීමාව අවසන් වීමට පෙර ගෙවනු ලැබේ. (10 අවුරුදු සැලසුමක් සඳහා, 50%: 15/20 අවුරුදු සැලසුමක් සඳහා, 40%) එයට අමතරව, අත්තිකාරම් ගෙවීම් සිදුකලද, සමස්ත රක්ෂණ ඔප්පු වටිනාකම මත පදනම්ව රක්ෂණ ඔප්පු හිමියන් වෙත බෝනස් මුදලක් හිමිවීම මෙහි විශේෂත්වයකි.	වර්තමාන තරගකාරී වෙළඳපොලෙහි වෙනස් වෙමින් පවතින අවශ්‍යතා හඳුනාගනිමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් රක්ෂණ ඔප්පු හිමියන් වෙත රැකවරනය සලසනු ලබන අතරම ඔවුන්ගේ දිගු කාලීන ආයෝජන අවශ්‍යතා සපුරාලීම උදෙසා නව රක්ෂණ සැලසුමක් එළිදක්වන ලදී. 'ස්පීඩ් ඉන්වෙස්ට්මන්ට්' යනු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජීවිත රක්ෂණ සැලසුම් කළඹ අතරට එක්වූ නවතම සැලසුම වන අතර එමගින් රක්ෂණ ඔප්පු හිමියන් වෙත ඉහළ ප්‍රතිලාභ පිරිනැමේ. නව 'ස්පීඩ් ඉන්වෙස්ට්මන්ට්' රක්ෂණ සැලසුම දිගු කාලීන සැලසුමක වන අතර එහිදී වාර්ෂිකව නොවෙනස්ව පවතිද්දී රක්ෂිත මුදල වාර්ෂිකව 5% බැගින් ඉහළ යයි. මෙහිදදී වසර 20 කට පසු රක්ෂණ ඔප්පු හිමියන් වෙත බෝනස් මුදලක් ද සමගින් දෙගුණ වූ මූලික රක්ෂිත මුදලක් හිමිවන අතර ඒ නිසාවෙන්ම මෙය රක්ෂණ වෙළඳපොල තුළ අසමසම රක්ෂණ සැලසුමක් වශයෙන් සැළකේ.

ප්‍රාරක්ෂණ සහ හිමිකම්පෑම් පියවීමේ විශිෂ්ටත්වය

වගකීම් සහගත ආයතනික සමාගමක් වශයෙන් අපි ප්‍රති-තරග කාරී ක්‍රියාකාරකම් වල නිරත නොවෙමු. අපගේ විධිමත් මිලකරණ ප්‍රතිපත්තිය මගින් අපගේ ප්‍රාරක්ෂණ සැලසුම් මිළකරණයේදී වෙත ක්‍රමවත්, සංගත සහ මධ්‍යස්ථ එළඹුමක් සඳහා පදනම සකසනු ලැබේ. අපගේ අරමුණ වනුයේ වාර්ෂික මිලකරණය සහ හිමිකම්පෑම් පියවීම අතර සමතුලනයක් පවත්වාගෙන යාම වන අතර එහිදී සේවාලාභීන් හට සාධාරණ වෙළඳපොල මිල ගණන් යටතේ විශිෂ්ට තත්ත්වයේ ප්‍රාරක්ෂණ සේවාවන්හි ප්‍රතිලාභ අත්විදිය හැකි වේ.

මේ අතර, සෑම කල්හිම අපගේ හිමිකම්පෑම් කළමනාකරණ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව පවත්වාගෙන යාම සඳහා, අප විසින් පහත දැක්වෙන ප්‍රතිපත්තීන් මත පදනම්ව සේවාලාභී අභිමතයන් කෙරෙහි ප්‍රමුඛතාවය හිමිවන අයුරින් පැහැදිලි සම්මතයන් සහ කාර්යභාරයන් නිර්මාණය කරනු ලැබ ඇත.

- හිමිකම්පෑම් සම්බන්ධයෙන් සමාන ආකාරයෙන් සහ කඩිනම්ව කටයුතු කල යුතු වේ.
- හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලිය පූර්ණ විනිවිදභාවයෙන් යුතු වන අතර, සිය හිමිකම්පෑමෙහි තත්ත්වය පිළිබඳව සෑම කල්හිම හිමිකම්පාන්නා දැනුවත් කෙරේ.
- කිසියම් හිමිකම්පෑමක් අර්ධ වශයෙන් නිරාකරණය කරන ලද හෝ ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවකදී, හිමිකම්පාන්නා වෙත ලිඛිත පැහැදිලි කිරීමක් හිමි වනු ඇත.

සියලුම හිමිකම්පෑම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මධ්‍යම හිමිකම්පෑම් සැකසුම් ඒකකය කටයුතු කරන අතර, ගැටලු සහගත සහ ඉහළ අගයක් සහිත හිමිකම්පෑම් විශේෂ හිමිකම්පෑම් මණ්ඩලයක් යටතට ගැනේ. දිවයිනේ රක්ෂණ නෛතික ආකෘතික රාමුව අනුව නිරාකරණය නොකරන ලද හිමිකම්පෑම් විකල්ප යෝජනා ක්‍රියාපටිපාටියක් වෙත යොමු කෙරේ.

ඉහළින් අගය කෙරෙන ප්‍රශස්ත සේවාලාභී පහසුව

ස්මාර්ට් ජංගම මෙවලම් සහ සමාජ ජාල භාවිතයට ශීඝ්‍රයෙන් යොමුවීමත් සමග සේවාලාභී චර්යාවන් කඩිනමින් වෙනස් වන පසුබිමක් තුළ තරගකාරීත්වය හමුවේ ඉදිරියෙන් රැඳීමට නම් නව හඳුන්වාදීම් සිදු කිරීම අවශ්‍ය වන බව අපගේ අවබෝධයයි. මෙකී වටපිටාව තුළ, අපගේ සේවාලාභීන් වෙත උපරිම පහසුවක් සලසන්නා වූ විශේෂිත අගය එකතු කල සේවාවන් ලබාදෙමින් සෙසු සමාගම් අතර අනන්‍ය වූ ආකාරයකින් ඉදිරියට යාම අපගේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාලාභී ඇප්		රක්ෂණ ඔප්පු සහ සැලසුම් විස්තර නැරඹීමට
		ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ඔප්පු ද්විත්වය සඳහාම වාරික ගෙවීමට
		සිය සාමාන්‍ය රක්ෂණ ඔප්පු අන්තර්ජාලය ඔස්සේ නැවත අලුත් කිරීමට
		මෝටර් රක්ෂණ හිමිකම්පෑම් ආරම්භ කිරීමට
		ගූගල් සිතියම් ආධාරයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛාවන් හඳුනාගැනීමට
		24/7 මාර්ගස්ථ සහ හදිසි අනතුරු සහාය ලබාගැනීමට
		මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් සහකරු සොයාගැනීමට සහ ප්‍රතිලාභ අත්විදීමට
අපගේ ආයතනික වෙබ් අඩවිය (www.srilankainsurance.com)		විවිධ සැලසුම් සහ සේවාවන් වෙත පිවිසීමට
ජංගම සහ වෙනත් ගෙවීමේ ක්‍රම	**මොබිටෙල් සමග සහයෝගීතාවය**	එම් කෑෂ් භාවිත කරමින් බාධාවකින් තොරව වාරික ගෙවීමේ ක්‍රමයක් සේවාලාභීන් වෙත ලබාදීමට
	මහජන බැංකුව සමග සහයෝගීතාවය	දිවයින පුරා පිහිටි මහජන බැංකු ටෙලර් යන්ත්‍ර ජාලය සහ ස්වයං බැංකුකරණ ඒකක වාරික ගෙවීමේ පහසු සැලසීමට
	ලංකා බැංකුව සමග සහයෝගීතාවය	බීඕසී ස්මාර්ට් පේ යොදාගනිමින් QR මත පදනම් වූ ජීවිත රක්ෂණ වාරික ගෙවීමේ පහසුකම් සැලසීමට
	ලංකා හොස්පිටල්ස් හි අපගේ සේවා කවුලුව	රක්ෂණ ඔප්පු ලබාගැනීම, රක්ෂණ සැලසුම් සම්බන්ධ තොරතුරු ලබාගැනීම සහ වාරික ගෙවීම සඳහා පහසුකම් සැලසීමට

වගකීම් සහගත සහ විනිවිදභාවයෙන් යුතු සන්නිවේදනය

අපගේ සන්නිවේදන ක්‍රමෝපායෙහි අරමුණ වනුයේ සේවාලාභීන් වෙත පැහැදිලි හා සෘජු තොරතුරු ලබාදීමයි. මේ සම්බන්ධයෙන්. ප්‍රවර්ධන සහ අලෙවිකරණ මාධ්‍යයන් නිර්මාණය කිරීමේදී, අපි සියලුම නියාමනමය අනාවරන වගකීම් වෙත අනුගත වන්නෙමු. අප විසින් අපගේ සේවාලාභීන් වෙත අවශ්‍ය හා අදාළ තොරතුරු ලබාදෙමින් ක්ෂේත්‍රයේ සම්මතයන් ස්ථාපනය කිරීමට ප්‍රයත්න දරනු ලබන අතර, එහිදී ඔවුන් හට අප සමග ගනුදෙනු කිරීමේදී දැනුවත්භාවයෙන් යුතුව අදාළ තීරණ වලට එළඹිය හැකි වේ.

අපගේ සේවාලාභීන් වෙත, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඇතුලු මාධ්‍යයන් රැසක් ඔස්සේ අපගේ සැලසුම් හා සේවාවන් පිළිබඳව තොරතුරු දැනගත හැකි වේ. තවද, සියලුම ශාඛා සේවකයින් වෘත්තීයමය අයුරින් සියලු තොරතුරු ලබාදීම, අපගේ සැලසුම් හා සේවාවන් ආශ්‍රිත අවදානම් පිළිබඳ පැහැදිලි කිරීම සහ සුදුසු විසඳුම් සම්බන්ධයෙන් සේවාලාභීන් වෙත උපදෙස් දීම සම්බන්ධයෙන් පුහුණු කරනු ලැබ ඇත.

නිසි සහ බලාත්මක සේවාලාභී පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සේවාලාභී ප්‍රතිචාරය අගය කොට සළකනු ලබන අතර එහි දී සමාගම සමග සෘජුව සන්නිවේදනයේ යෙදිය හැකි මාර්ග රැසක් විවෘත කොට ඇත. මෙයට පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය, අපගේ ආයතනික වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල ඇතුළත් වේ.

අපගේ සේවා තත්ත්වය පිළිබඳ සියලුම සේවාලාභී ගැටලු, අපගේ සේවා වැඩිදියුණු කරගනිමින් පහසු, විශ්වසනීය හා තෘප්තිමත් සේවාවක් ලබාදීම සඳහා වන අවස්ථාවක් වශයෙන් අප විසින් සළකනු ලැබේ. අපගේ මනා පුහුණුවක් සහිත සම්පත් දායක කාර්ය මණ්ඩලය විසින් අදාළ පැමිණිලි සටහන් කොට, විමර්ශනය කරමින් නිසි පරිදි විසඳාලනු ලැබේ. සේවාලාභියකු විසින් පැමිණිල්ලක් සිදුකල තැන් පටන් එය විසඳාලන තෙක් නිසි ක්‍රියාවලියක් සහිත සේවාලාභී පැමිණිලි කළමනාකරණ පද්ධතියක් අප සතු වන අතර අදාළ ක්‍රියාපටිපාටිය සමාගමෙහි වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කෙරේ.

මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සිය හිතෛෂීභාවය වෙනුවෙන් සේවාලාභීන් වෙත ප්‍රතිලාභ පිරිනැමේ. මෙහිදී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් සේවාලාභීන් වෙත විවිධ වූ තිළිණ හා වරප්‍රසාද රැසක් පිරිනැමේ. 2021 දී පුලුල් කරන ලද මෝටර් ප්ලස් ලෝයල්ටි රිවෝර්ඩ්ස් වැඩසටහන යටතේ රක්ෂණ ඔප්පු හිමියන් හට විවිධ සමාගම් සමග ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සහයෝගීතාවයන් යටතේ විශේෂ වට්ටම් රැ සක් හිමි වේ.

ව්‍යාපාර සහකාර ප්‍රාග්ධනය වෙත අගය එකතු කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි තරගකාරී වාසිය පවත්වාගෙන යමින් සමාගමෙහි දිගු කාලීන පැවැත්ම තහවුරු කරගැනීම සඳහා අපගේ ව්‍යාපාර සහකරුවන් අතිශය වැදගත් වේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී රක්ෂණ නියෝජිතයින්, තැරැව්කරුවන්, ප්‍රතිරක්ෂකයින්. වැනල සහකරුවන්, පොදු සැපයුම්කරුවන් සහ සෙසු සේවා සම්පාදකයින් වැනි බහුවිධ සහකරුවන් සමූහයක් සමග වන සහයෝගීතාවයන් අවශ්‍ය වේ. මෙහිදී අපගේ සාර්ථකත්වය සඳහා මෙකී පාර්ශ්වකරුවන්ගේ වැදගත්කම සැළකිල්ලට ගනිමින් අප විසින් බෙදාහදා ගත් වටිනාකම් සංකල්පය මත පදනම්ව නිවැරදි සහයෝගීතාවයන් ගොඩනංවා ගැනීම උදෙසා සැළකිය යුතු ආයෝජනයක් සිදුකරනු ලැබේ.

විශ්වාසය සහ දිගු කාලීන සබඳතා ගොඩනංවා ගැනීම උදෙසා, අප විසින් අපගේ ව්‍යාපාර සහකාර ප්‍රාග්ධනය කළමනාකරණයේදී අතිශයින් අනුකූලනය කරන ලද එළඹුමක් යොදා ගැනේ.

රක්ෂණ නියෝජිතයින්

අපගේ රක්ෂණ නියෝජිතයින් තුළින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ඉහළ මට්ටමේ ආචාරධර්ම හා සුපිළිපන් බව පිළිබිඹු විය යුතු බවට අප විසින් තහවුරු කරනු ලබන්නේ ඔවුන් සමාගමෙහි වඩාත් දෘෂ්‍යමාන සන්නාම තානාපතිවරුන් වන බැවිනි.

සියලුම නියෝජියින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි විකිණුම් ගිවිසුම යටතේ බඳවාගනු ලබන අතර, ඔවුන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අලෙවි නියෝජිතයන් වශයෙන් කටයුතු කරන කාලසීමාව තුළ අනුගමනය කළ යුතු නීතිරීති හා කොන්දේසි එහි දැක්වේ.

තවද, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් නියෝජිත ආයතන වෘත්තීය ගමන් මග ඔස්සේ, අප විසින් සියලුම නියෝජිතයින් වෙත සමාගම සමග ඉදිරියට යාම සඳහා අමතර වර්ධන අවස්ථා සපයනු ලැබේ. මෙහිදී නියෝජිත ආයතන වෘත්තීය ගමන් මග වැඩසටහන ඔස්සේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අභ්‍යන්තර ඇගයුම් පදනම් හරහා විශිෂ්ටයින් ඇගයුමට ලක් කෙරේ.

මෙයට අමතරව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ඩිජිටල්කරණ ව්‍යාපෘතීන් මගින් නියෝජියින් වෙත අඛණ්ඩවම ප්‍රතිලාභ සැලසේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් නියෝජිත ගිවිසුම් සහිත විකිණුම් සේවකයින් හට මෙහෙයුම් ව්‍යුහයක් මෙන්ම ඵලදායී සංවර්ධන ආකෘතියක් වශයෙන් නියෝජිත ආයතන සංවර්ධන ආකෘතිය (ADM) ක්‍රියාවට නැංවේ.

ආයුගණන උපදේශකයින්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි ආයුගණන උපදේශකවරුන් වනුයේ මෙසර්ස් විල්ස් ටවර්ස් ඉන්ඩියා පුද්ගලික සමාගම සහ මෙසර්ස් එන්එම්පී ෆයිනෑන්ෂියල් සර්විසස් කන්සල්ටින්ග් සමාගම වේ.

ප්‍රතිරක්ෂකයින්

ඉහළ අගයකින් යුතු සිදු විය හැකි අවදානම් දරාගැනීම සඳහා අවශ්‍ය අමතර සුරක්ෂිතතාව ලබාදෙමින් ප්‍රතිරක්ෂයින් විසින් අපගේ ව්‍යාපාරය වෙත වැදගත් සහයෝගයක් ලබාදෙයි.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

ඔවුන්ගේ භාරකාරී වගකීම හේතුවෙන් ප්‍රතිරක්ෂකයින් සමග ගිවිසුම් වලට එළඹීමේදී අප විසින් වරණාත්මක එළඹුමක් පවත්වා ගැනේ. රක්ෂණ අවදානම් ව්‍යාප්ත කෙරෙන බවට තහවුරු කිරීම උදෙසා අප විසින් ශ්‍රේණිගත ප්‍රතිරක්ෂකයින් 103 ක් සමග ගිවිසුම් පවත්වාගෙන යනු ලැබේ.

ප්‍රතිරක්ෂණයේ සෘජු ප්‍රතිලාභ වලට අමතරව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත, අපගේ නව්‍යතා ක්‍රමෝපායන් බලගැන්වීම සඳහා ප්‍රමුඛ ශ්‍රේණිගත ජාත්‍යන්තර ප්‍රතිරක්ෂකයින් සමග වන දිගු කාලීන සබඳතාවයන් ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධ දැනුම, ප්‍රාරක්ෂණය සඳහා වන විනයානුකූල එළඹුම් සහ නවතම ලෝක ප්‍රවණතා පිළිබඳ අවබෝධයන් තුළින් ද අමතර ප්‍රතිලාභ සැලසේ.

චැනල සහකරුවන්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි වටිනාකම් දාමය, අපගේ දීප ව්‍යාප්ත රක්ෂණ තැරැව්කාර ජාලය, බැංකු සහකරුවන්, සෞඛ්‍ය සත්කාරක සහකරුවන්, රථවාහන නියෝජිතයින්. සේවා හල්, සහ ගෙවීමේ පහසුකම් සලසන්නන් වැනි චැනල සහකරුවන් රැසකින් සමන්විත වේ.

අප විසින් මෙකී එකගතාවයන් අවබෝධතා ගිවිසුමක් ඔස්සේ නිර්මාණය කරනු ලබන අතර එය අදාළ සහකරුවන් හට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මෙහෙයුම් සම්මතයන් සහ ආචාරධර්ම වලට අනුගත වීම සඳහා උපකාරී වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දිගු කාලීන, දෙපාර්ශවයටම ප්‍රතිලාභ සැලසෙන සහයෝගීතාවයකට පදනම සකසමින් මෙකී අවබෝධතා ගිවිසුම මගින් ව්‍යාපාර සහකරුවන් වෙත සාධාරණව හා සමානව සළකනු ලබන බවට තහවුරු කෙරේ.

සෙසු වෙළඳුන් සහ සේවා සම්පාදකයින්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සෙසු වෙළඳුන් සහ සේවා සම්පාදකයින් වෙතින් සේවා ලබාගැනෙන අතර, එහිදී සාධාරණ හා සමාන වෙළඳ සහ සේවා සම්පාදක තෝරාගැනීමක් හා ලැයිස්තුගත කිරීමක් සිදු කෙරේ.

සාධාරණ හා සදාචාර සම්පන්න ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි සහයෝගය දක්වමින් අප විසින් වෙළඳුන් හා සේවා සම්පාදකයින් හට ඔවුන්ගේ ගැටලු සහ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පැහැදිලි ක්‍රමවේදයක් සකසනු ලැබ ඇත. මේ ආකාරයෙන් ලැබෙන සියලුම පැමිණිලි හා අදහස් අපගේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටීන්ට අනුකූලව විමර්ශය කොට විසඳාලනු ලැබේ.

නියෝජිත ආයතන සේවා බලකාය

2017 සිට 2021 දක්වා MDRT සාමාජිකයින්

සංඛ්‍යා අත්පත් කොට ගත් වසර	2021	2020	2019	2018	2017	2016
සාමාජිකත්ව වසර	2022	2021	2020	2019	2018	2017
මුලු සාමාජිකයින්	187	93	64	63	52	60

අලෙවිකරණ ව්‍යාපෘති

1. බෝනස් ප්‍රකාශයට පත් කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් වසර 2020 දී සිය ජීවිත රක්ෂණ ඔප්පු හිමියන් වෙත එදා මෙදා තුර විශාලතම බෝනස් මුදල වන රු.බිලියන 9.8 ක දැවැන්ත බෝනස් මුදල ප්‍රකාශයට පත් කරන ලදී. එය ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද විශාලතම ජීවිත රක්ෂණ බෝනස් මුදල වේ. 2005 සිය වර්තමානය දක්වා රක්ෂණ ඔප්පු හිමියන් වෙත ප්‍රකාශයට පත් කරන ලද මුලු බෝනස් මුදල රු. බිලියන 73.2 කි.

මෙහිදී රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රථම වරට ඊ-බෝනස් (e-bonus) සහතික වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මොබයින් ඇප් එක් ඔස්සේ බාගත කරගැනීම සඳහා අවස්ථාව සලසන ලදී.

2. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් මගින් ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමය වෙත පරිපූර්ණ රැකවරනය සලසයි

විශේෂ මෝටර් රක්ෂණ පැකේජයක් සමගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් මගින් ශ්‍රී ලංකාවේ සියලුම දිසා විනිසුරුවරුන් සහ මහේස්ත්‍රාත් විනිසුරුවරුන්ගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමය වෙත රැකවරනය සලසන ලදී.

මෙහිදී ඔවුන්ගේ මෝටර් රථ ආශ්‍රිත ආපදාවන් සහ හදිසි අනතුරු හානි ඇතුලු තෙවන පාර්ශ්වීය හානි ආවරනය කෙරේ.

3. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය සමග ක්‍රමෝපායික සහයෝගීතාවයකට එළඹේ

සෞඛ්‍ය සත්කාරක දැනුම වර්ධනය කරගැනීම, සුරක්ෂිතතාව ඉහළ නැංවීම සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සත්කාරක වෘත්තිකයින් වෙත විශිෂ්ට රක්ෂණ විසඳුමක් ලබාදීම උදෙසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය සමග අවබෝධතා ගිවිසුමකට එළඹිනි.

මෙම අවබෝධතා ගිවිසුම මගින් ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයෙහි ලියාපදිංචි සෑම සාමාජිකයකු වෙතම විශේෂිත රක්ෂණ සැලසුමක් ලබාදීම සඳහා වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සාමූහික සහ ඒකපුද්ගල කැපවීම විදහා දැක්වේ. මෙහිදී පරිපූර්ණ මෝටර් රක්ෂණ සැලසුමක් සමගින් සෞඛ්‍ය සත්කාරක වෘත්තිකයින් වෙත විශේෂ ප්‍රතිලාභ රැසක් පිරිනැමේ.

සමස්ත ශ්‍රී ලාංකිකයින් වෙත සුරක්ෂිත වටපිටාවක් තහවුරු කිරීම උදෙසා, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය එක්ව මාර්ගස්ථ ආරක්ෂාව සම්බන්ධයෙන් අධ්‍යාපනික වැඩසටහන්, මාධ්‍ය සම්මන්ත්‍රණ සහ සමාජ මාධ්‍ය වැඩසටහන් සංවිධානය කෙරිණි.

4. ලෝක ළමා දිනය නිමිත්තෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් මිණිමුතුලන්තය සංවිධානය කෙරේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් 2021 ලෝක ළමා දිනයේදී දරුවන් සහ ඔවුන්ගේ දෙමව්පියන් වෙත තොරතුරු සම්පාදන සහ විනෝදාශ්වාද සැසි රැසකින් සමන්විත ''මිණිමුතුලන්තය''වැඩසටහන සංවිධානය කෙරිණි. මෙය 2021 ඔක්තෝබර් 01 සිට 03 දක්වා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් නිල වෙබ් පිටුව ආශ්‍රයෙන් පවත්වන ලද අතර ඒ සඳහා දිවයින පුරා දරුවන් 10,000 අධික පිරිසකගේ ප්‍රතිචාර හිමි විය.

මෙම සැසි මාලාවේ පළමුවැන්න වූයේ ළමා අධ්‍යාපනය, මානසික සෞඛ්‍ය සහ පෝෂණය ආශ්‍රිත ''සුපර් පේරන්ට්ස්'' වූ අතර විශාල ප්‍රතිචාර මධ්‍යයේ දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය සහ යහ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නෝත්තර සැසියක්ද එයට අනතුරුව පැවැත්විනි.

මිණිමුතුලන්තය යටතේ පැවති සෙසු සැසි ඔස්සේද දරුවන් හා ඔවුන්ගේ දෙමව්පියන් හට ගුණාත්මක කාලසීමාවක් ගත කිරීමේ අවස්ථාව උදා කරමින් අධ්‍යාපනික හා විනෝදාශ්වාද වැඩසටහන් රැසක් ඉදිරිපත් කෙරිණි. මෙහිදී දරුවන් හට ඔවුන්ගේ කුසලතා එළිදැක්වීම සඳහා ආර්ටිස්ට් සැසිය, එන්ටර්ටේනර් සැසිය, මාස්ටර්මයින්ඩ් සැසිය සහ කම්පියුටර් විසාර්ඩ් සැසිය පවත්වන ලද අතර ඔවුන් වෙත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තිළිණ ප්‍රදානය කෙරිණි.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

5. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජීවිත රක්ෂණ සේවාලාභීන් වෙත QR ගෙවීමේ ක්‍රමය පිරිනැමීම සඳහා ලංකා බැංකුව සමග එක් වේ

දිවයිනේ වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද සේවාලාභීන් වෙත අඛණ්ඩ සේවාවක් සැලසීමේ වැදගතක්ම සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින්, බීඕසී ස්මාර්ට් පේ - මුදල් රහිත QR ගෙවීමේ ක්‍රමය ඔස්සේ ලංකා බැංකුව හරහා සිය ජීවිත රක්ෂණ වාරික ගෙවීමේ පහසුකම සේවාලාභීන් වෙත පිරිනමන ලදී.

ලංකා බැංකු QR ගෙවීමේ ක්‍රමය මගින් රක්ෂණ ඔප්පු හිමියන් හට ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් වඩාත් කඩිනමින් සහ සුරක්ෂිතව සිය ගෙවීම් සිදුකිරීමේ අවස්ථාව උදා වේ.

නව්‍ය තාක්ෂණික සේවාවන් ඔස්සේ සේවාලාභීන් වෙත වැඩිදියුණු කරන ලද සේවා අත්දැකීමක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කැපවී කටයුතු කරන අතර, එම ප්‍රයත්නය තවදුරටත් ඉදිරියට ගෙන යමින් සමාගම මගින් පහසු සේවා පිවිසුමක් වෙත ඉඩකඩ සලසමින් බහුවිධ ඩිජිටල් චැනල රැසක් ඉදිරිපත් කොට ඇත.

6. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් මගින් මාර්ගස්ථ ධාවන අවසරපත් හිමියන් හට සුවිශේෂී මෝටර් රක්ෂණ පැකේජයක්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් ජාතික ගමනාගමන කොමිසම සමග එක්ව සහන කාලසීමාවක් තුළ සිය රථවාහන රක්ෂණ වාරික ගෙවීමේ අවස්ථාව සලසමින් මාර්ගස්ථ ධාවන අවසරපත් හිමියන් හට සුවිශේෂී මෝටර් රක්ෂණ පැකේජයක් පිරිනමන ලදී.

වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දැමීම සහ පොදු ප්‍රවාහනය වළකාලමින් පනවන ලද සංචරණ සීමාවන් හේතුවෙන් ජනප්‍රිය ප්‍රවාහන මාධ්‍යයක් වූ බස් රථ ධාවනය කෙරෙහි බාධා ඇති විය. වසංගතයේ බලපෑම හේතුවෙන් බස් රථ හිමියන්ගේ ආදායම ශීඝ්‍රයෙන් පහත වැටිනි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ජාතික ගමනාගමන කොමිසම සමග එක්ව මාර්ගස්ථ ධාවන අවසරපත් හිමියන් හට මෙසේ සහන කාලසීමාවක් ලබාදෙන ලද්දේ ඔවුන්ගේ දෛනික ගමනාගමන මෙහෙයුම් යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණිනි.

7. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කළමනාකරණ උපාධිධාරීන්ගේ පශ්චාත් උපාධි ආයතනය (PIMA) සමග සහයෝගිතාවයකට එළඹෙමින් එහි සාමාජිකයින් වෙත විශේෂිත රථවාහන රක්ෂණ සැලසුමක් පිරිනමයි

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් එහි සාමාජිකයින් හට විශේෂිත රථවාහන රක්ෂණ පැකේජයක් පිරිනැමීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වෘත්තීය ආයතනයක් වන කළමනාකරණ උපාධිධාරීන්ගේ පශ්චාත් උපාධි ආයතනය (PIMA) සමග සහයෝගීතාවයකට එළඹිනි.

සමාගම් දෙක අතර වන මෙම ක්‍රමෝපායික සහයෝගීතාවය ඔස්සේ 3,000 කට අධික කළමනාකරණ උපාධිධාරීන්ගේ පශ්චාත් උපාධි ආයතන (PIMA) සාමාජිකයින් වෙත විශේෂිත පරිපූර්ණ මෝටර් රක්ෂණ සැලසුමක් පිරිනැමේ.

සමාගම් දෙකක අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමෙහි කොටසක් වශයෙන්, කළමනාකරණ උපාධිධාරීන්ගේ පශ්චාත් උපාධි ආයතනය (PIMA) සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශ්‍රී ලංකාවේ පුරෝගාමී වෘත්තීය ආයතනයක් වශයෙන් මගින් කළමනාකරණ උපාධිධාරීන්ගේ පශ්චාත් උපාධි ආයතනය (PIMA) මගින් නායයකත්වය ලබාදෙනු ලබන විවිධ ක්ෂේත්‍ර ව්‍යාපෘතීන් වලදී එක්ව කටයුතු කරනු ඇත.

සමාජයීය ව්‍යාපෘති

1. නාගරාජ රක්ෂණය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් පූජ්‍ය පක්ෂය සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් වෙත රැකවරනය සැලසීමේ අරමුණින් විශේෂිත වෛද්‍යමය රක්ෂණාවරනයක් වශයෙන් 'නාගාරාජ' හඳුන්වාදෙන ලදී.

මෙම විශේෂිත 'නාගාරාජ' සැලසුම දිවයින පුරා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ශාඛාවන්ගෙන් ලබා ගත හැක අතර මහජනතාවට එය පිරිකර වශයෙන් පූජ්‍ය පක්ෂය වෙත පිරිනැමිය හැකි වේ. 'නාගාරාජ' සැලසුම ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියකු හටම රැකවරනය සැලසීමේ 'සැමට රක්ෂණය' යන සමාගමෙහි සංකල්පය යටතේ දියත් කෙරිණි.

2. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සුරක්ෂා ළමා රක්ෂණ ඔප්පු සදහා පහසුකම් සම්පාදනය කරයි

සියලු පාසැල් දරුවන් හට අධ්‍යාපනය අමාත්‍යාංශය මගින් නොමිලේ පිරිනමනු ලබන 'සුරක්ෂා' ළමා රක්ෂණ ඔප්පු සේවා සම්පාදකත්වය නැවත වරක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත පිරිනමන ලදී.

පාසැල තුළ සහ ඉන් පිටතදී සිදුවිය හැකි රෝගාබාධ, හදිසි අනතුරු සහ අකර්මන්‍යතා වලදී මූල්‍යමය සහාය ලබාදෙමින් දරුවන්ගේ ශාරීරික සහ මානසික සෞඛ්‍ය සුරැකීම සුරක්ෂා රක්ෂණ ඔප්පු මගින් සිදුකෙරේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සහයෝගීතාවයෙන් යුතුව මෙම විශේෂිත රක්ෂණ ඔප්පු වසර 2017 දී හඳුන්වාදෙන ලදී. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සිය 158 කින් යුතු ශාඛා ජාලය ඔස්සේ සියලුම රජයේ, පෞද්ගලික හා ජාත්‍යන්තර පාසැල් දරුවන් මෙන්ම පිරිවෙන් අධ්‍යාපනය ලබන පූජ්‍ය පක්ෂය වෙනුවෙන්ද මේ සදහා පහසුකම් සම්පාදනය කරනු ලැබේ.

3. රයිසින්ග් ටු ද නිව් නෝර්මල්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් අදාළ ප්‍රදේශයන්හි සෞඛ්‍ය අධිකාරීන් සමග එක්ව නව සාමාන්‍ය තත්ත්වය යටතේ කෝවිඩ් 19 වසංගතයට එරෙහිව නැගී සිටීමේදී, යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම වැදගත්කම මහජනතාව වෙත අවධාරනය කරමින් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී,

මෙහිදී අනුරාධපුර, කෑගල්ල, කලුතර, මාතර, ගිරිඋල්ල, දඹුල්ල, නුවරඑළිය සහ බිබිල ප්‍රදේශයන්හි වැඩසටහන් මාලාවක් පවත්වන ලදී,

සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ ආරක්ෂක ක්ෂේත්‍රය නියෝජනය කරමින් ප්‍රධාන පෙලේ වෘත්තිකයින් සහභාගී වූ මෙම වැඩසටහන් වලදී සෞඛ්‍ය හා සුරක්ෂිතතා පියවරයන්ට අනුගත වෙමින් දෛනික ජීවිතය පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කෙරිණි. මෙම සැසි වලින් අමතරව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාජ මාධ්‍ය පිටු ආශ්‍රයෙන් ප්‍රශ්නෝත්තර සැසි පවත්වන ලද අතර එයට විශාල ජනතා ප්‍රතිචාරයක් හිමි විය.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය

4. මෝටර් ප්ලස් රෝඩ් සේෆ්ටි හීරෝස්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් මෝටර් ප්ලස් මගින් එක්සත් ජාතීන්ගේ ලෝක මාර්ගස්ථ ආරක්ෂණ සතියට සමගාමීව මෝටර් ප්ලස් රෝඩ් සේෆ්ටි හීරෝස් වැඩසටහන සංවිධානය කරමින් ශ්‍රී ලංකාව තුළ දිනෙන් දින ඉහළ යන මාර්ග අනතුරු සංඛ්‍යාව සැලකිල්ලට ගමින් මාර්ගස්ථ ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම් සිදුකරන ලදී.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් මගින් එක්සත් ජාතීන්ගේ ලෝක මාර්ගස්ථ ආරක්ෂණ සතියට සමගාමීව වීථි වලදී ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා ''ලයිෆ් සේවිං 30'' ව්‍යාපෘතිය දියත් කෙරිණි. ''ලයිෆ් සේවිං 30'' ව්‍යාපෘතිය සමගින්, නාගරික සහ නේවාසික ප්‍රදේශයන්හිදී වේග සීමාව පැයට කිලෝමීටර 30 ට අඩුවෙන් පවත්වා ගැනීම සඳහා රියැදුරන් දිරිගන්වන ලදී. මෙම ව්‍යාපෘතියේදී රියැදුරන්ට සහ පදිකයින්ට පිළිපැදිය හැකි අතිශය වැදගත් මාර්ග ආරක්ෂණ නීතිරීති කෙරෙහිද අවධානය යොමු කෙරිණි.

තවද, මෝටර් ප්ලස් රෝඩ් සේෆ්ටි හීරෝස් ස්වේච්ඡා ප්‍රජා සමූහය සමාජ මාධ්‍ය ජාලයන්හි එළිදක්වන ලද අතර එයට ඉහළ ප්‍රතිචාරයක් හිමි විය.

ප්‍රජා සත්කාරක ව්‍යාපෘති

පීසීආර් යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කාර්ය මණ්ඩලය එක්ව කටයුතු කරමින් රත්නපුර ශික්ෂණ රෝහල වෙත පීසීආර් යන්ත්‍රයක් පරිත්‍යාග කලේය.

රත්නපුර ශික්ෂණ රෝහල සබරගමුව පළාතේ විශාලතම තෘතීයික සත්කාරක රෝහල වන අතර එහි පරිපාලනය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ සිදු කෙරේ. එමගින් රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි වර්ග කිලෝමීටර 4,968 ක වෙසෙන 2,009,000 ක ප්‍රජාවක් වෙත විශේෂිත සෞඛ්‍ය සත්කාරක සේවාවන් සපයනු ලැබේ. මෙම රෝහල වෙත විශේෂිත ප්‍රතිකාර සඳහා ඌව, දකුණ සහ නැගෙනහිර පළාත් වල ජනතාවද පැමිණෙති.

රෝහලෙහි පීසීආර් පරීක්ෂණ සිදු කිරීම සඳහා පීසීආර් යන්ත්‍රයක අවශ්‍යතාවය සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කාර්ය මණ්ඩලය දළ වශයෙන් රු.5,000,000 ක වටිනාකමකින් යුතු මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා සිය දිනක වැටුප පරිත්‍යාග කලේය.

අනාගත අවධානයන්

- **2022 සඳහා නව රක්ෂණ සැලසුම් සම්පන්ධයෙන් සැලසුම් කිරීම**

අපගේ සැලසුම් කළඹෙහි විවිධත්වය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් සමාගම මගින් 2022 දී ලාභාංශ මත පදනම් වූ රක්ෂණ ඔප්පුවක් සැකසීම සඳහා සැලසුම් කෙරේ.

සමාජ හා සබඳතා ප්‍රාග්ධනය වර්ධනය කිරීමේ අනාගත සැලසුම් – GI

- සේවාලාභී කාණ්ඩයන්හි විවිධ ස්ථර ඔස්සේ මාර්ගස්ථ ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම් සඳහා සක්‍රීයව දායකවීම
- දිගු කාලීන සහයෝගීතාවයන් ඔස්සේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සේවාලාභී කාණ්ඩයේ අගය එකතු කිරීම් ඉහළ නැංවීම
- සේවාලාභීන් වෙත අඛණ්ඩවම අගය එකතු කිරීම් සිදු කිරීම
- ව්‍යාපාරයෙහි සියලුම සම්බන්ධිත පාර්ශ්වකරුවන් අතර සහභාගීත්වය සහ අන්තර්ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම

ස්වභාවික ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධන ඉලක්ක වෙත දායකත්වය

12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION

- ගෘහයන් ඔස්සේ
- පුද්ගලික අංශය ඔස්සේ
- රාජ්‍ය අංශය ඔස්සේ

13 CLIMATE ACTION

- ජාතික පාරිසරික ප්‍රතිපත්තිය කෙරෙහි අනුකූලතාවය

ප්‍රධාන සංඛ්‍යාලේඛණමය විශේෂතා

ආයෝජන	2021	2020	වෙනස %
විදුලි පරිභෝජනය (ඒකක/කිලෝවොට් පැය)	5,045,349	4,817,121	4.74%
ජල පරිභෝජනය (ඒකක/ඝන මීටර)	55,325	52,047	6.30%
කඩදාසි භාවිතය (ඒකක/කිලෝග්‍රෑම් 1000)	85	39	117.95%

රක්ෂණ සේවා සම්පාදකයකු වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, අපගේ දෛනික මෙහෙයුම් සිදුකිරීම හැරුනු විට ස්වභාවික සම්පත් මත රදාපැවත්ම අවම මට්ටමක පවතී. කෙසේවුවද, අපගේ ගොඩනැගිලි බලගැන්වීම සඳහා විදුලි උත්පාදනයේදී ස්වභාවික සම්පත් යොදාගැනීම, අපගේ සේවකයින් විසින් සිදු කෙරෙන ජල භාවිතය සහ දෛනික මෙහෙයුම් වලදී බැහැර කෙරෙන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ආදිය හේතුවෙන් අපගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වලින් පරිසරය වෙත වක්‍ර බලපෑමක් සිදුවන බව අපි පිළිගනිමු.

අපගේ ව්‍යාපාරික මෙහෙයුම් පරිසර හිතකාමී අයුරින් සිදුකෙරෙන බවට තහවුරු කිරීම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වැදගත් කොට සළකයි. අපගේ කාබන් පියසටහන අවම කිරීම උදෙසා දිගින් දිගටම ආයෝජනයන් සිදුකරමින් අපගේ ව්‍යාපාරය තුළින් පරිසරයට සිදු වන බලපෑම අවම කිරීමට අප කටයුතු කොට ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ස්වභාවික ප්‍රාග්ධනය සුරැකීමේ ප්‍රයත්නයන් සඳහා අපගේ ඩිජිටල් ක්‍රමෝපායෙහි දායකත්වය හිමි වේ. අපගේ ව්‍යාපාරයෙහි ක්‍රමවේදයන් සහ ක්‍රියාවලීන් පරිගනකගත කිරීම සහ ව්‍යාපාරය තුළ කඩදාසි රහිත වටපිටාවක් නිර්මාණය කිරීමේ අරමුණින් ස්වයංක්‍රීය පහසුකම් ඉහළ නැංවීම ඔස්සේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අපගේ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවය වර්ධනය කරමින් අපද්‍රව්‍ය බැහැර කිරීම පහත හෙළීමට කටයුතු යොදා ඇත.

ස්වභාවික ප්‍රාග්ධනය

පරිසර කෙරෙහි සීමිත බලපෑමක් සිදුකිරීම මධ්‍යයේ වුවද, අපගේ ව්‍යාපාරය වර්ධනය වන්ම විදුලි භාවිතය සහ ජල භාවිතය මෙන්ම අපද්‍රව්‍ය බැහැර කිරීම ඉහළ යන බව අපගේ අවබෝධයයි.

පහත දැක්වෙන එළඹුම් ඔස්සේ අපගේ ස්වභාවික ප්‍රාග්ධනය ඉහළ නැංවීමට අප විසින් ප්‍රයත්න දරනු ලැබේ:

1) **පරිසරය කෙරෙහි අනුකූල වීම**
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කිසිදු සෘජු පාරිසරික රෙගුලාසියකට යටත් නොවුවද, අපගේ මෙහෙයුම් ජාතික පාරිසරික ප්‍රතිපත්තියට අනුකූලව සිදුකෙරෙන බවට අප විසින් තහවුරු කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම විසින් පාරිසරික නීති උල්ලංඝය කිරීම සම්බන්ධ කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

2) **පරිභෝජන ලුහුබැඳීම සහ අධීක්ෂණය**
අප විසින් අපගේ විදුලි හා ජල පරිභෝජනය සහ උත්පාදිත කඩදාසි අපද්‍රව්‍ය ප්‍රමාණය නිරීක්ෂණය සහ අධීක්ෂණය කරමින් ව්‍යාපාරය පුරා සම්පත් ප්‍රශස්ත ආකාරයෙන් භාවිත කිරීම සඳහා ප්‍රයත්න දරනු ලැබේ. මෙම ක්‍රියාවලිය අපගේ කාබන් පියසටහන සහ ස්වභාවික සම්පත් භාවිතය පහත හෙළීමට සමාගමට උපකාරී විය.

3) **කඩදාසි රහිත මෙහෙයුම්**
සමාගමෙහි සියලුම මට්ටම් වල කඩදාසි රහිත වටපිටාවක් නිර්මාණය කිරීමේ අරමුණින් යුතුව අප විසින් ක්‍රමානුකූලව ක්‍රමවේදයන් සහ ක්‍රියාපටිපාටීන් ස්වයංක්‍රීය තත්ත්වයට පත් කරමින් අපගේ ඩිජිටල් ක්‍රමෝපාය ක්‍රියාවට නංවනු ලැබ ඇත. එහිදී අපගේ සේවාස්ථාන වටපිටාව අවම කඩදාසි භාවිතයක් සහිතව ඩිජිටල් ලියකියවිලි හුවමාරු කරගැනීම මත පවත්වාගෙන යනු ලැබේ. මෙමගින් පසුගිය වසර වලදී කඩදාසි භාවිතය සැලකිය යුතු අයුරින් පහත හෙළීමට අප හට හැකි විය. එහිදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීම් සඳහා කඩදාසි රහිත රැස්වීම් වටපිටාවක් හඳුන්වාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩල ස්වයංක්‍රීයකරණ තාක්ෂණය හඳුන්වාදෙන ලදී.

අනාගත අවධානයන්

- **සියලුම ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලීන් ඩිජිටල්කරණය**

අප විසින් දැනටමත් විකිණුම් බලකා මෙහෙයුම් ස්වයංක්‍රීයකරණය, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සේවාලාභී ඇප් එක වැඩිදියුණු කිරීම, කළමනාකරණ ඩෑෂ්බෝර්ඩ් හඳුන්වාදීම, අභ්‍යන්තර ක්‍රියාවලි ස්වයංක්‍රීය කරණය සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම උදෙසා කාර්ය ප්‍රවාහ කළමනාකරණය ඇරඹීම, ජීවිත රක්ෂණ ඩිජිටල් යෝජනාපත්‍රය, ඵලදායී ව්‍යාපාර/තීරණ ගැනීම සඳහා දැනුවත්භාවයෙන් යුතු ව්‍යාපාරික විශ්ලේෂණ ආදිය සිදු කරනු ලැබ ඇති අතර අනාගතයේදී මෝටර් හිමිකම්පෑම් ඩිජිටල් පදනම හඳුන්වාදීම, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල නව සැලසුම් නිර්මාණය සිදුකරමින් කඩදාසි රහිත වටපිටාවක් නිර්මාණය කිරීමට සහ වගකීම් සහගතව සම්පත් භාවිතය සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- **පුනර්ජනනීය නොවන බලශක්ති මූලයන් මත රදාපැවතීම පහත හෙළමින් පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි ආයෝජන සිදුකිරීම**

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පුනර්ජනනීය බලශක්ති භාවිතය වෙත ගමන් කරමින් සිය පුනර්ජනනීය නොවන බලශක්ති භාවිතය අවම කිරීමට කටයුතු යොදා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාගමෙහි කාබන් පියසටහන පහත වැටෙනු ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි හරිතාගාර විමෝචන තක්සේරුව පළමු වරට සිදුකෙරුනු අතර සමාගමෙහි කටයුතු හේතුවෙන් සිදුවන හරිතාගාර වායු විමෝචනය පහත හෙළීමේ ව්‍යාපෘතීන් ඔස්සේ කාලගුණ විපර්යාස වළකාගනිමින් අනාගතයේදී කාබන් මධ්‍යස්ථභාවය අත්පත් කරගැනීම සමාගමෙහි අපේක්ෂාව වේ. ඒ අනුව, අනාගතයේදී ක්‍රියාවට නැංවීම සඳහා පහත දැක්වෙන කරුණු ඉහළ කළමනාකාරීත්වය වෙත හඳුන්වාදීමට නියමිත වේ.

සිය හරිතාගාර වායු විමෝචනය තවදුරටත් පහත හෙළිය හැකි අවස්ථාවන් සොයාබැලීම සඳහා ආවර්තිතව බලශක්ති තක්සේරු සිදු කිරීම. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සමස්ත හරිතාගාර වායු විමෝචනය කෙරෙහි ඉහළම බලපෑම සිදු කරන විදුලි භාවිතය කාර්යක්ෂමව සිදුකරමින් එමගින් ඇති වන කාබන් විමෝචන පහත හෙළීමට සමාගම කටයුතු කරයි.

තවද, මෙම විෂය පිළිබඳව සේවකයින් දැනුවත් කරමින්, හරිතාගාර වායු විමෝචනය අවම කරමින් අනාගතයේදී කාබන් මධ්‍යස්ථභාවය අත්කර ගැනීම සඳහා ඔවුන්ගේ උපරිම සහයෝගය ලබාගැනීමට සමාගම කටයුතු කරයි.

තවද, ඉහළ කලමනාකාරීත්වය වෙත කාබන් විමෝචනය පහත දැක්වෙන වැඩසටහන් හඳුන්වාදෙනු ලැබේ,

- සූර්ය කෝෂ පද්ධති සවිකිරීම
- රුක් රෝපණ වැඩසටහන්
- කාබන් ක්‍රෙඩිට්

පාලන සහ අවදානම් විමර්ශනය

88 - ආයතනික පාලන වාර්තාව
92 - විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව
94 - ආයෝජන කමිටු වාර්තාව 2021
96 - අවදානම් කළමනාකරණ වාර්තාව
107 - අනුකූලතා වාර්තාව
114 - අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

SOLIDITY

ස්ථාවර සවිබලය

ස්ථාවර සවිබලය අපගේ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය මත ගොඩනැංවුනු ශක්තිමත් පදනම වශයෙන් දකින්නෙමු.

සාංගමික පාලන වාර්තාව

සභාපතිවරයාගේ හැඳින්වීම

රාජ්‍ය හිමිකාරිත්වය සහිත ව්‍යවසායක් වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, වගවීම, විනිවිදභාවය, සදාචාර සම්පන්න කළමනාකරණය සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරන අතර කඩිනම් හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව නිර්මාණය කිරීම එහි අරමුණයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ම විශේෂයෙන්ම රජයේ හිමිකාරිත්වය සහිත සමාගමක් වශයෙන් ශ්‍රී ලංකා රජය, නියාමනයන්, මූල්‍ය ආයතන, සේවකයින්, සේවාලාභීන්, සැපයුම්කරුවන්, වැනි පුලුල් පරාසයක පැතිරුනු පාර්ශ්වකරුවන් බොහොමයක් කෙරෙහි වගවීමෙන් බැඳෙන බවට සළකනු ලබන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි සමස්ත අරමුණ වශයෙන් ජාතික ආර්ථික හා ක්‍රමෝපායික අභිමතාර්ථයන් සහ වටපිටාව වෙත සහාය දැක්වීම සැළකේ.

වගකීම් සහගත බව, වගවීම, විනිවිදභාවය සහ සාධාරණත්වය යන අපගේ සාංගමික පාලනයේ සිව් ස්ථම්භයන් මත සමාගම මෙහෙයුම් සිදුකරන ආකාරය වෙත මග පෙන්වමින් අධ්‍යක්ෂ මණ්ඩලව විසින් අවශ්‍ය දිශානතිය සහ සාමූහික වටිනාකම් සපයනු ලබයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම මගින් නිකුත් කරන ලද, නියෝග අංක 17 ප්‍රකාරව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ''සාංගමික පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහය - 2017'' හි විධිවිධානයන්ට අපි අනුගත වන්නෙමු. එයට අමතරව, 2021.11.17. සිට බලපැවැත්වන පරිදි මුදල් අමාත්‍යාංශය මගින් ''රජයේ හිමිකාරිත්වය සහිත ව්‍යවසායන් සඳහා වන සාංගමික පාලන සහ මෙහෙයුම් අත්පොත සම්බන්ධ මාර්ගෝපදේශ'' නිකුත් කරන ලද අතර, අප විසින් දැනටමත් ඉහත සඳහන් සංග්‍රහයෙහි මූලිකාංග අනුගමනය කරනු ලබන අතර ඉහත සඳහාන් සංග්‍රහයට අනුකූලව තවදුරටත් අපගේ පාලන ආකෘතිය සවිබල ගැන්වීම සඳහා කටයුතු කරනු ලැබේ.

සංරාංශයක් වශයෙන්, සාංගමික පාලනය කෙරෙහි වන අපගේ එළඹුම මෙහි දක්වා ඇත: අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සතුව විවිධ නිපුණතා, අත්දැකීම් සහ දැනුම සම්බන්ධ සංකලනයක් පවතින අතර, සමාගමෙහි සාංගමික පාලන ක්‍රියාකාරකම් වෙත දිශානතිය සැකසීමේදී එය අතිශය වැදගත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් පමණ නිරන්තරයෙන් හමුවන අතර විධායක කළමනාකාරිත්වයේ කාර්යසාධනය අධීක්ෂණයට ලක් කරයි. විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් අභිවෘද්ධිමය අභියෝග ලබාදෙමින් විශේෂඥ උපදෙස් සපයනු ලබයි.

සමාගම කාර්යක්ෂමව මෙහෙයවීමේදී සවිමත් පාලනයන් අප විසින් පූර්ණ වශයෙන් අගය කොට සළකනු ලබන අතර පහත දැක්වෙන වාර්තාවන් මගින් එය සිදුකෙරෙන ආකාරය විස්තර කෙරේ.

ඉංජිනේරු විජිත හේරත්
සභාපති
2022 මැයි 24 වැනි දින

ආකෘතිය

සමාගම, සිය අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු ඔස්සේ නිල වශයෙන් ක්‍රියාවට නැංවෙන ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, මාර්ගෝපදේශයන් සහ අදාළ කළමනාකරණ වාර්තාකරණ ධාරාවන් ඇතුළත්ව එහි මෙහෙයුම් වල සියලුම අංශයන් තුළ පාලන ආකෘතියක් පවත්වාගෙන යයි.



අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ වගකීම

වාර්තාකරණ දිනට, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් සත් දෙනෙකුගෙන් සමන්විත විය. විධායක නොවන අධ්‍යක්ෂවරුන් ස්වකීය ක්ෂේත්‍රයන්හි ප්‍රාමාණික වෘත්තිකයින් වූහ. ඒකපුද්ගල වශයෙන් අධ්‍යක්ෂවරුන් විසින් බහුවිධ පරාසයක පැතිරුණ නිපුණතා, දැනුම සහ පළපුරුද්ද සපයනු ලබන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමෙහි බලාත්මක මෙහෙයුම් අධීක්ෂණය සඳහා අවශ්‍ය පරිණත ව්‍යාපාරික පළපුරුද්ද සහිත වූවන් බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ. රාජ්‍ය හිමිකාරීත්වය සහිත ව්‍යවසායක් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කොටස් හිමිකරු වශයෙන් ශ්‍රී ලංකා රජය සහ සමාගම හා එහි කළමනාකාරීත්වය අතර අන්තර්මධ්‍ය භූමිකාවක් නිරූපනය කරයි. සමස්ත නියමුත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳෙන අතර එමගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ඔස්සේ සෘජුව හා වක්‍රව, පාර්ශ්වකරුවන් වෙත දිගු කාලීන වටිනාකම් නිර්මාණය කිරීමෙහිලා අවශ්‍ය නායකත්වය සපයනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රමුඛ කාර්යභාරය වනුයේ අධීක්ෂණය සහ සැලසුම්කරණයයි. සමාගමෙහි මූල්‍යමය සහ වාණිජමය කාර්යසාධනය නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇගයුමට ලක් වේ. එයට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම නිරාවරනය විය හැකි අවදානම් පිළිබඳව කළමනාකරණය කරගැනීමේ ප්‍රමාණවත්භාවය සමාලෝචනයට ලක් කිරීම සහ තක්සේරුකරණය සිදු කෙරේ.

සමාගම් ලේකම්

පාලන ආකෘතිය සම්බන්ධයෙන් සමාගම් ලේකම්වරයා වගකීමෙන් බැඳේ. සමාගම් ලේකම්වරයාගේ බැඳීම් හා වගකීම් සමාගම් පනතෙහි සහ පාලන සංග්‍රහයෙහි දක්වා ඇති අතර, ඔහු විසින් සමාගමෙහි යහ පාලනය සම්බන්ධ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම අවශ්‍ය වේ. සියලුම අධ්‍යක්ෂවරුන් හට සමාගම් ලේකම්වරයාගේ උපදෙස් සහ සේවාවන් ලබාගත හැකි වන අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන්ට අනුකූලව අදාළ කටයුතු සිදුකෙරෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කමිටු කටයුතු

අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ස්ථාපනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂමතාවය සඳහා අතිශයින් වැදගත් වන අතර එමගින් විගණන, අනුකූලතා, ආයෝජන, මානව සම්පත් සහ අවදානම් කළමනාකරණ ආදී ක්ෂේත්‍රයන් තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අගය එකතු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ, සැලසුම්කරණ සහ තීරණ ගැනීමේ ක්‍රියාකාරකම් වලට සහාය දැක්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකමිටු පහක් ස්ථාපනය කරනු ලැබ ඇත. ඒවා නම් විගණන සහ අනුකූලතා, අවදානම් කළමනාකරණ, ආයෝජන, ක්‍රමෝපායික සහ මානව සම්පත් අනුකමිටු වේ. මෙම කමිටු අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රඥප්තීන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් මගින් පාලනය වන අතර, ආවර්තිත රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

2021 දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් සංඛ්‍යාව සහ මෙකී රැස්වීම් වෙත එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පහත දැක්වේ:

2021 - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සිය කාර්යභාරයන් සියල්ල බලාත්මක අයුරින් ඉටු කෙරෙන බවට තහවුරු කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් අයුරින් නිරන්තරව රැස්වේ. නොවැළැක්විය හැකි හේතූන් මත, කිසියම් අධ්‍යක්ෂවරයකු අදාළ රැස්වීම් වලට සහභාගී වීමට අපොහොසත් වන්නේ නම්, අදාළ අධ්‍යක්ෂවරයා විසින් රැස්වීමට පෙරාතුව න්‍යායපත්‍රයෙහි අතුළත් කරුණු සම්බන්ධයෙන් සභාපති, ප්‍රධාන විධායක නිලධාරී හෝ සමාගම් ලේකම් සමග සිය අදහස් හුවමාරු කරගත යුතු වේ.

වසර 2021 දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දාහතක් පැවැත්විනි. මින් අධ්‍යක්ෂ මණ්ඩල දහයක සභාපතිත්වය 2021 අගෝස්තු 3 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ධූර කාලය අවසන් කරන ලද ජගත් වැල්ලවත්ත මහතා විසින් දරන ලද අතර රැස්වීම් හතක සභාපතිත්වය 2021 අගෝස්තු 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලද ඉංජිනේරු විපිත හේරත් විසින් දරන ලදී.

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
ඉංජිනේරු විපිත හේරත් *(2021 අගෝස්තු 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)*	07
ජගත් වැල්ලවත්ත මහතා *(2021 අගෝස්තු 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරය අවසන් කරන ලදී)*	10
කේ. ඒ. විමලේන්තිරරාජා මහතා *(2022 මාර්තු 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරය අවසන් කරන ලදී)*	17
අනිල් මීගහගෙදර මහතා	17
අනිල් කොස්වත්ත මහතා	17
නිශාන්ත දයානන්ද මහතා	17
සුරේබා අලස් මිය	17
ඩබ්. ඒ. සමන්ත උපනන්ද මහතා *(2021 පෙබරවාරි 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී)*	16

සාංගමික පාලන වාර්තාව

විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම් - 2021

වසර 2021 දී විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම් හතරක් පැවැත්විනි. 2021 අගෝස්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි විගණන සහ අනුකූලතා කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වූ විධායක නොවන අධ්‍යක්ෂ, කේ.ඒ. විමලේන්තිරරාජා මහතා විසින් රැස්වීම් දෙකක සභාපතිත්වය දරන ලදී. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 අගෝස්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන සමන්ත උපනන්ද මහතා විගණන සහ අනුකූලතා කමිටුවෙහි සභාපතිවරයා වශයෙන් පත් කරන ලදී.

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
ඩබ්.ඒ. සමන්ත උපනන්ද මහතා *(කමිටු සභාපති - විධායක නොවන අධ්‍යක්ෂ)* *(2021 අගෝස්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කමිටු සභාපතිවරයා වශයෙන් පත් කෙරිණි)*	02
කේ.ඒ. විමලේන්තිරරාජා මහතා *(2021 අගෝස්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කමිටු සභාපති ධූරයෙන් ඉල්ලා අස්විය)*	02
අනිල් මීගහගෙදර මහතා	04
නිශාන්ත දයානන්ද මහතා	04

2021 - ආයෝජන කමිටු රැස්වීම්

2021 දී ආයෝජන කමිටු රැස්වීම් 18 ක් පැවැත්විනි. අදාළ රැස්වීම් වල සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂවරයකු විසින් දරන ලදී.

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
කේ.ඒ. විමලේන්තිරරාජා මහතා *(කමිටු සභාපති - විධායක නොවන අධ්‍යක්ෂ)*	18
ඉංජිනේරු විජිත හේරත් *(2021 අගෝස්තු 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි)*	06
ජගත් වැල්ලවත්ත මහතා *(2021 අගෝස්තු 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරය අවසන් කරන ලදී)*	09
අනිල් මීගහගෙදර මහතා	17
සුරේඛා අලස් මිය	18

2021 - අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්

2021 දී අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්විනි. කමිටුව මූල්‍ය, ආයෝජන, ආයුගණන, ප්‍රතිරක්ෂණ, අනුකූලතා, අභ්‍යන්තර විගණන, මානව සම්පත් කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ යන එකිනෙකට වෙනස් වූ අංශ නියෝජනය කරන්නා වූ පුලුල් සාමජිකත්වයකින් සමන්විත වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
සුරේඛා අලස් මිය *(කමිටු සභාපති - විධායක නොවන අධ්‍යක්ෂිකා)*	03
අනිල් මීගහගෙදර මහතා	03

2021 - මානව සම්පත් කමිටු රැස්වීම්

2021 දී මානව සම්පත් කමිටු රැස්වීම් නවයක් පැවැත්විනි. අදාළ රැස්වීම් වල සභාපතිත්වය විධායක නොවන අධ්‍යක්ෂවරයකු විසින් දරන ලදී.

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
නිශාන්ත දයානන්ද මහතා *(කමිටු සභාපති - විධායක නොවන අධ්‍යක්ෂ)*	09
ජගත් වැල්ලවත්ත මහතා *(2021 අගෝස්තු 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ ධූරය අවසන් කරන ලදී)*	05
අනිල් කොස්වත්ත මහතා	09
ඉංජිනේරු විජිත හේරත් *(2021 අගෝස්තු 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි)*	03

සෙසු මෙහෙයුම් කමිටු

ඉහත සඳහන් කරන ලද අධයක්ෂ මණ්ඩල අනුකමිටු වලට අමතරව, ප්‍රධාන විධායක නිලධාරීවරයා වෙත සහාය දැක්වීම සඳහා, විධායක කමිටුව (EXCO), ප්‍රතිරක්ෂණ කමිටුව. විගණන පසුවිපරම් කමිටුව, ශාඛා කළමනාකරණ ඉදිරිදැක්ම කමිටුව, නෛතික කමිටුව සහ විකිණුම් හා අලෙවි සමාලෝචන කමිටුව ඇතුලු සෙසු මෙහෙයුම් කමිටු ස්ථාපනය කරනු ලැබ ඇති අතර, ඒවා පාලන ව්‍යුහය තුළ අත්‍යාවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. ස්වකීය අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥභාවය අනුව මෙම කමිටු සාමාජිකයින් සමාගම තුළින්ම අනුයුක්ත කරනු ලැබේ. ක්‍රමෝපාය, මෙහෙයුම් සැලසුම්, ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටීන් සහ අයවැය ආදිය සැකසීම සහ ක්‍රියාවට නැංවීම මගින් විධායක කමිටුව මගින් ව්‍යාපාරයෙහි දෛනික ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ලැබේ. ආයතනික ක්‍රමෝපාය සැකසීම සහ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් විධායක කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය එක්ව කටයුතු කරයි. මෙම කමිටු මසකට වරක් හෝ අවශ්‍යතාවය අනුව රැස්වේ. එහි විමසුම් කොන්දේසි යටතට ගැනෙන කවර හෝ කරුණක් සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවකදී, කමිටු සභාපතිවරයා වන ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් රැස්වීම් කැඳවනු ලැබේ.

තොරතුරු ප්‍රවාහය

සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් වලට පෙරාතුව අධ්‍යක්ෂවරුන් වෙත විස්තරාත්මක පත්‍රිකා සපයනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම් වලදී දැනුවත්භාවයකින් යුතුව අදාළ තීරණ වලට එළඹීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම එහි අරමුණ වේ. රැස්වීම් වලදී සුදුසු පරිදි විධායක කළමනාකාරීත්වයේ සාමාජිකයින් සහ ප්‍රධාන පෙලේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සිය සහභාගීත්වය දක්වති. අධ්‍යක්ෂවරුන් වශයෙන් සිය කාර්යභාරයන් ඉටු කිරීමේදී සමාගමෙහි වියදමින් ස්වධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමේ අධිකාරීත්වය අධ්‍යක්ෂවරුන් සතු වේ. එයට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටීන් නිරීක්ෂණය කිරීමේ වගකීම සහිත සහ සාංගමික පාලන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් ලබාදීමේ වගකීම දරන සමාගම් ලේකම්වරයාගේ සේවය ලබාගැනීමට අධ්‍යක්ෂවරුන් හට හැකි වේ. සියලුම අධ්‍යක්ෂවරුන් හට ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩල සහ අදාළ අනුකමිටු රැස්වීම් පත්‍රිකා ලබාගත හැකි වන අතර එමගින් නිසි කලට සහ සුරක්ෂිතව අදාළ තොරතුරු අධ්‍යක්ෂවරුන් වෙත ලැබෙන බවට තහවුරු කෙරේ. එහිදී අධ්‍යක්ෂ මණ්ඩල සහ අදාළ අනුකමිටු රැස්වීම් වල පාරිසරික බලපෑමද අවම කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල සහ අදාළ අනුකමිටු රැස්වීම්වල වාර්තා ආවර්තිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය

අදාළ නීතිරීති හා කොන්දේසි වලට අනුකූලව සමෝධානික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ.

අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලනයන්

මෙම මූල්‍ය ප්‍රකාශයන් මගින් ආවරනය වූ සහ මෙම වාර්තාවේ දිනට මෙහෙයවන ලද අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතීන් වල බලාත්මකභාවය පිළිබඳව ඔවුන් විසින් සමාලෝචනය කරන ලද බව අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කෙරේ. සමාගමෙහි අභ්‍යන්තර පාලන ආකෘතිය ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටීන්, ක්‍රියාවලීන්, කාර්යභාරයන් සහ චර්යාවන්ගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල සභාපතිවරයා සහ විගණන සහ අනුකූලතා කමිටු සභාපතිවරයා වෙත වාර්තා කරනු ලබන අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් සමාගම සතු වේ. විගණන සහ අනුකූලතා කමිටුව එක් එක් කමිටු රැස්වීම් වලදී මෙම ක්‍රියාකාරකම ඔස්සේ වාර්තා ලබාගනී. එයට අමතරව, ''GRC - පාලන' අවදානම් සහ අනුකූලතා'' ආකෘතිය යටතේ, ක්‍රමෝපායික, මූල්‍යමය, (වෙළඳපොල අවදානමද ඇතුළත්ව), මෙහෙයුම්, (කීර්තිනාම අවදානමද ඇතුළත්ව) සහ ආපදා යන ප්‍රධාන අවදානම් හතර ආශ්‍රිතව ව්‍යවසාය අවදානම් කළමනාකරණය සම්බන්ධ සාකල්‍ය දර්ශනයක් සමාගම මගින් ආදේශ කර ගනු ලැබේ.

පාලන ආකෘතිය මත කෝවිඩ් 19 වසංගතයේ බලපෑම

ජනතා සෞඛ්‍ය අර්බුදයක් වශයෙන් ඇරඹී කෝවිඩ් 19 වසංගතය පසුව මූල්‍ය සහ ආර්ථික අර්බුදයක් බවට පත් විය. කෝවිඩ් 19 හි දිනෙන් දින උග්‍ර වෙමින් පැවති බලපෑම හේතුවෙන් උද්ගත වූ මූල්‍ය හා ආර්ථික ආර්ථික අර්බුදය හමුවේ මතු වූ නව ගැටලු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සළකාබැලීම් සහ දෘෂ්ටිකෝණයන් සසඳමින් සාකච්ඡා සිදු කලේය.

කෝවිඩ් 19 මගින් ආර්ථික අවගමනයක් ඇති කරමින් අර්බුදයේ සංකීර්ණත්වය සහ කාලසීමාව සම්බන්ධ අවිනිශ්චිතතාවයක් මතු වූ පසුබිමක් තුළ, තීරණ ගැනීමේ ක්‍රියාවලිය විවිධ සාධක සළකාබලමින් සහ සමතුලනය කරමින් සිදුකල යුතු සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත් විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධායක කමිටුව හරහා, කෝවිඩ් 19 මගින් උද්ගත වූ ව්‍යාපාරික අවදානම් හා සේවා ස්ථානීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා ගැටලු පිළිබඳ අඛණ්ඩ වූ විවෘත සංවාදයක් සිදුකරන ලදී. පැවති වසංගත තත්ත්වය හේතුවෙන් සිදුකරන ලද රට වසා දැමීම් සහ සංචරන සීමාවන් හමුවේ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හට අධ්‍යක්ෂ මණ්ඩල හා අනුකමිටු රැස්වීමේ වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය ඔස්සේ පැවැත්වීම සඳහා සමාගමෙහි ඩිජිටල් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පදනම උපකාරී විය. ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය සාමාජිකත්වය දරන ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සභාපතිත්වයෙන් යුතු ව්‍යාපාර අඛණ්ඩත්ව නියමු කමිටුව (BCSC) මගින් ව්‍යාපාර අඛණ්ඩත්වය තහවුරු කරනු ලබන අතර, එමගින් සේවකයින් සහ පාර්ශ්වකරුවන් සුරක්ෂිත කරමින් අර්බුදය ජයගනිමින් ව්‍යාපාරයෙහි ආරක්ෂාව තහවුරු කෙරේ.

විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

විගණන සහ අනුකූලතා කමිටුව යනු අවශ්‍යයෙන්ම මූල්‍ය ප්‍රකාශයන් මගින් සමාගමෙහි කටයුතු වල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් පිළිබිඹු කෙරෙන බවටත්, අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් සමාගම සතුව දැඩි හා බලාත්මක ක්‍රියාවලියක් පවතින බවටත් තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වන්නා වූ කමිටුවකි. මෙම කමිටුවෙහි සභාපතිත්වය භාණ්ඩාගාර නියෝජිතයකුද වන විධායක නොවන අධ්‍යක්ෂවරයකු විසින් දරනු ලබන අතර එය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් පමණක් සැදුම්ලත් වේ. සමාගම් ලේකම්වරයා රැස්වීම් වලදී ලේකම් වශයෙන් කටයුතු කලේය. අනුකූලතා සහ විගණන ක්‍රියාකාරකම් ද්විත්වයම විගණන සහ අනුකූලතා කමිටුව වෙත වාර්තා කළද, මෙහෙයුම් අනුව අදාළ ක්‍රියාකාරකම් දෙක වෙන් කිරීම මගින් ඒවායේ ක්‍රියාකාරී ස්වාධීනත්වය තහවුරු කෙරේ.

ජ්‍යෙෂ්ට සහායක කාර්ය මණ්ඩලයේ අනගි සේවාවක් සමගින්, විගණන සහ අනුකූලතා කමිටු කාර්යභාරයන් බලාත්මක ආකාරයෙන් ඉටු කිරීමේ මූල්‍ය, විගණන සහ රක්ෂණ විශේෂඥභාවය කමිටුව සතු වේ.

විගණන සහ අනුකූලතා කමිටුවෙහි යොමු කිරීමේ අනුදේශ

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි විගණන සහ අනුකූලතා කමිටුවෙහි යොමු කිරීමේ අනුදේශ විගණන සහ අනුකූලතා කමිටු ප්‍රඥප්තියෙහි පැහැදිලිව නිර්වචනය කොට ඇති අතර, ඒවා 2017 දී ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිසම (“SEC”) සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් එක්ව නිකුත් කරන ලද ''සාංගමික පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහය'' ඇතුලුව විගණන කමිටු ආශ්‍රිත උපදේශන මූලධර්ම හා යහ ක්‍රියාකාරකම් මත පදනම් වේ. ප්‍රඥප්තියේ විෂයපථය සමාගමෙහි හෙළිදරව් කිරීමේ ක්‍රමවේදය, මූල්‍ය සම්බන්ධ පාලන අභ්‍යන්තර පාලන ක්‍රමවේදය, ගිණුම්කරණය, ප්‍රසම්පාදනය, නෛතික අනුකූලතාවය පිළිබඳ ඉහළ නංවන ලද අධීක්ධණයෙන් සහ කළමනාකාරීත්වය විසින් ස්ථාපනය කරන ලද ආචාරධර්ම මෙන්ම ව්‍යාපාරික අවදානම් කළමනාකරණය ආදී කරුණු වලින් සමන්විත වේ. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකිව යුතු වන අතර සිය ක්‍රියාකාරකම් නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි.

කමිටු රැස්වීම්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ, කමිටුවෙහි රැස්වීම් හතරක් පැවැත්විනි. කමිටු රැස්වීම් වල කටයුතු ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තාගත අතර නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වාර්තා කෙරේ. රැස්වීම් වෙත ආරාධනා මත විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් සහභාගී විය.

2021 දී කමිටු රැස්වීම් සඳහා සහභාගීත්වය පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව
ඩබ්.ඒ. සමන්ත උපනන්ද මහතා *(කමිටු සභාපති - විධායක නොවන අධ්‍යක්ෂ) (2021 අගෝස්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කමිටු සභාපතිවරයා වශයෙන් පත් කෙරිණි)*	02
කේ.ඒ. විමලේන්තිරරාජා මහතා *(2021 අගෝස්තු 05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය)*	02
අනිල් මීගහගෙදර මහතා	04
නිශාන්ත දයානන්ද මහතා	04

අභ්‍යන්තර විගණනය

ස්වකීය අභ්‍යන්තර විගණන අංශයක් සමාගම සතු වේ. අභ්‍යන්තර විගණන අංශයෙහි ප්‍රධානත්වය සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරීවරයකු විසින් දරනු ලබයි. අභ්‍යන්තර විගණන වැඩසටහන විගණන සහ අනුකූලතා කමිටුව මගින් ඉදිරිපත් කොට අනුමත කරන ලද අතර කමිටුව මගින් නිරන්තරයෙන් අභ්‍යන්තර විගණන සහ පරීක්ෂා ක්‍රියාවලිය සමාලෝචනයට ලක් කෙරේ. අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය එමගින් විගණනයට ලක් කෙරෙන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන බවටත් සිය කාර්යභාරයන් ඉටු කිරීමේදී නිසි වෘත්තීයමයභාවය පවත්වාගෙන යන බවටත් කමිටුව තහවුරු කරයි. සිය කාර්යභාරයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය අධිකාරීත්වය පවතින බවටත් ප්‍රමාණවත් සම්පත් පවතින බවටත් කමිටුව සෑහීමකට පත් වේ. කමිටුව මගින් ස්වකීය ආවර්තිත රැස්වීම් වලදී අභ්‍යන්තර විගණන ප්‍රධානි විසින් සම්පාදිත වාර්තා සමාලෝචනයට ලක් කරන ලද අතර එමගින් අභ්‍යන්තර විගණන සැලසුමෙහි සහ ප්‍රධාන සොයාගැනීම් වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට කමිටුවට හැකි විය.

බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ වගන්ති 154 (1) ප්‍රකාරව බාහිර විගණකවරයා වශයෙන් විගණකාධිපතිවරයා පත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ වගන්ති 154 (4) ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින්, මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ වාර්ෂික විගණනයේදී විගණකාධිපතිවරයා වෙත සහාය වීම සඳහා සුදුසුකම් ලත් විගණකවරයකු වශයෙන් මෙසර්ස් බීඩීඕ පාර්ට්නර්ස් පත් කරන ලදී. එමෙන්ම, කමිටුව මගින් කළමනාකාරීත්ව ලිපිය සහ බාහිර විගණකවරයාගේ අනාවරනයන් සහ නිර්දේශයන් සම්බන්ධ කළමනාකාරීත්වයේ ප්‍රතිචාරයද සමාලෝචනය කරන ලදී.

විගණන කමිටුව වෙත තොරතුරු ප්‍රවාහයන්

විගණන සහ අනුකූලතා කමිටුව මගින් ස්වකීය වගකීම් ඉටු කිරීම උදෙසා කළමනාකාරීත්වය සහ බාහිර විගණකවරුන්ගෙන් ප්‍රමාණවත්, විශ්වසනීය සහ කාලෝචිත තොරතුරු ලැබුනු බවට තහවුරු කෙරේ.

වත්කම් සහ වගකීම් තක්සේරුකරණය සහ අපහායනය

සාධාරණ අගය ගිණුම්කරණයෙහි ඉහළ ගිය භාවිතය සහ අනිවාර්ය වැදගත්කම සැළකිල්ලට ගනිමින් විගණන කමිටුව මගින් සාධාරණ අගයන් ලබාගැනීමේදී භාවිත කරන ලද උපකල්පනයන් හෙළිදරව් කොට, විශ්ලේෂණය කොට සුදුසු අවස්ථාවන්හිදී අභියෝගයට පවා ලක් කරන ලද බවට තහවුරු කෙරේ. අපහායනය සඳහා වන ක්‍රියාවලිය ප්‍රමාණවත් බව කමිටුවෙහි මතය වේ.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ සම්මතයන් (IFRS) ආදේශ කරගැනීම

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ සම්මතයන් (IFRS) ආදේශ කරගැනීම සම්බන්ධයෙන් කමිටුව මගින් අධීක්ෂණය කරමින් ආවර්තිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඒවා ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලැබේ.

ස්වාධීන බාහිර උපදේශනය

අවශ්‍ය අවස්ථාවන්හිදී ස්වාධීන බාහිර උපදෙස් ලබාගැනීමේ අවසරය විගණන කමිටු ප්‍රඥප්තිය මගින් පිරිනැමේ.

අභ්‍යන්තර විගණන ප්‍රධානියාගේ සහ අනුකූලතා හා අවදානම් ප්‍රධානියාගේ විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම් වලට සහභාගීවීමේ හැකියාව

අභ්‍යන්තර විගණන ප්‍රධානි සහ අනුකූලතා හා අවදානම් ප්‍රදානි හට සෘජුව විගණන සහ අනුකූලතා කමිටු රැස්වීම් වලට සහභාගීවීමේ හැකියාව පවතින අතර ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුව වගවීමෙන් බැඳේ.

විගණන නොවන සේවාවන්

විමර්ශනයට ලක් වන වසර තුළ බාහිර විගණකවරුන් විසින් කිසිදු විගණන නොවන සේවාව සපයා නොමැත.

අනුකූලතා ක්‍රියාවලිය

අනුකූලතා වැඩසටහන් මෙහෙයුම් සහ අනුශාංගික ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ආයතනික අනුකූලතා ක්‍රියාවලයට අයත් වේ. එක් එක් අංශයෙහි සම්බන්ධීකාරකවරුන්ගේ සහයෝගය සහිතව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතා හා අවදානම් සහ සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය විසින් සමාගමෙහි අනුකූලතා වැඩසටහන ක්‍රියාවට නැංවේ. අනුකූලතා නිලධාරී සහ විගණන හා අනුකූලතා කමිටුව අතර වාර්තාකරණ කෙටුම්පත මගින් වසර තුළ සිදුවිය හැකි විශේෂිත ගැටලු සහ අවදානම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. ඔවුන් වෙත පවරන ලද විශේෂිත බැඳීම් සමගින් වගකීම් සහගත නිලධාරීන් වශයෙන් පත් කරන ලද මෙහෙයුම් අංශ ප්‍රධානීන් විසින් මෙහෙයුම් අංශ ආශ්‍රිත අනුකූලතා වගකීම් ඉටු කරනු ලැබේ. ප්‍රති-මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය අභ්‍යන්තර විගණන අංශය මගින් වාර්ෂිකව විගණනයටය ලක් කෙරේ. මෙම ක්‍රියාවලියෙහි පිරිවැය ඉහළ නංවා නොගනිමින් සමාගම පුරා අනුකූලතා වටපිටාව ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරේ.

ප්‍රධාන පාලන ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමුකරමින්, අනුකූලතා ක්‍රියාවලියෙහි ඉහළ යන සංකීර්ණත්වය හා සංගතව, සමාගම මගින් අනුකූලතාවය සඳහා 'අපක්ෂපාතී' ආකෘතියක් ආදේශ කොට ගෙන ඇත. ඵලදායී ව්‍යාපාරික සහභාගීත්වය තහවුරු කිරීම උදෙසා එක් එක් අංශය සඳහා අනුකූලතා සම්බන්ධීකාරකවරුන් පත් කිරීම මගින් පිරිවැය බලාත්මක අයුරින් කළමනාකරනය කරනු ලබන අතරතුර මෙමගින් අනුකූලතා ක්‍රියාවලියෙහි ස්වාධීනත්වය තහවුරු කෙරේ. ප්‍රධාන මෙහෙයුම් අංශයන්ට අදාළ යහ ක්‍රියාකාරකම් ආදේශනය තහවුරු කිරීම උදෙසා විමර්ශනයට ලක් වන වසර තුළ අනුකූලතා ක්‍රියාවලිය තවදුරටත් සවිබල ගන්වන ලදී.

ආචාරධර්ම සංග්‍රහය, විස්ල්බ්ලෝවින්ග් (Whistleblowing) ප්‍රතිපත්තිය සහ වංචා කළමනාකරණ ප්‍රතිපත්තිය

සියලුම සේවකයින් අදාළ වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ආචාරධර්ම සංග්‍රහයක්, විස්ල්බ්ලෝවින්ග් ප්‍රතිපත්තියක් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමත වංචා කළමනාකරණ ප්‍රතිපත්තියක් සමාගම සතු වේ. මෙහිදී සමාගම තුළ කිසියම් අනිසි හෝ නීති විරෝධී හෝ සදාචාර විරෝධී ක්‍රියාකාරකමක් නිරීක්ෂණය කරනු ලබන සේවකයකු හට, එය සමාගමෙහි විස්ල්බ්ලෝවින්ග් නිලධාරියා වෙත වාර්තා කල හැකි වන අතර අදාළ නිලධාරියා විසින් විස්ල්බ්ලෝවින්ග් ප්‍රතිපත්තියට අනුකූලව ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ලැබේ. තවද, වංචා කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම ඔස්සේ, සමාගමට එරෙහි සියලුම වංචා සහගත ක්‍රියාකාරකම් වළකාලීම, හඳුනාගැනීම සහ නිරාකරණය කිරීමට අප ඇප කැප වේ.

අවදානම් කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ අධිකාරීත්වය පවරන ලද 'අවදානම් කළමනකරණ කමිටුව' නමැති වෙනම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් පවතී. අභ්‍යන්තර විගණන ප්‍රධානියා ද අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයකු වේ. ව්‍යවසාය අවදානම් කළමනාකරණ අංශය මගින්, අභ්‍යන්තර පාලන පද්ධතීන් බාසල් ආකෘතියෙහි මූලධර්ම වලට අනුකූලව අවදානම් කළමනාකරණ ආකෘතිය අනුව පවතින්නේද යන්න තහවුරු කිරීම සඳහා, 1998 සැප්තැම්බර් 21 වැනි දින නිකුත් කරන ලද ''බැංකු සමාගම් වල අභ්‍යන්තර පාලන පද්ධතීන් සඳහා වන ආකෘතිකරාමුව'' ට අනුකූලව සමාග මෙහි අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව ව්‍යවසාය අවදානම් කළමනාකරණ අංශය මගින් සමාලෝචනය කෙරේ. මෙයට කළමනාකාරීත්වයේ අධීක්ෂනය සහ පාලන වටපිටාව, අවදානම් හඳුනාගැනීම සහ තක්සේරුව, පාලන ක්‍රියාකාරකම් සහ කාර්යභාරයන් බෙදා වෙන්කිරීම, තොරතුරු හා සන්නිවේදනය, නිරීක්ෂණ හා ඌණතා නිවැරදි කිරීමේ ක්‍රියාකාරකම්, සහ අධීක්ෂණ අධිකාරීන් විසින් අභ්‍යන්තර පාලන පද්ධතීන් ඇගයුමට ලක් කිරීම ඇතුළත් වේ. අදාළ සමාලෝචනයන් ආවර්තිතව අවදානම් කළමනාකරණ කමිටුව වෙත භාර දෙනු ලැබේ. තවද, බලාත්මක අභ්‍යන්තර පාලනයන් තහවුරු කිරීම උදෙසා යෝග්‍ය වූ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කොට ඇත.

නිගමනය

වසර පුරා බාහිර විගණකවරුන් බලාත්මක හා ස්වාධීන අයුරින් කටයුතු කොට ඇති බවට කමිටුව සෑහීමකට පත් වේ. එයට අමතරව, ගිණුම්කරණ ප්‍රමිතීන් යොදාගැනීමේ යෝග්‍යතාවය පිළිබඳවද කමිටුව සෑහීමකට පත් වන අතර එමනිසා සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් විශ්වාස කටයුතු බවට සාධාරණ සහතිකයක් එමගින් සැපයෙන් බව කමිටුවෙහි මතය වේ. තවද, සමාගමෙහි අනුකූලතා ආකෘතිය මගින් විමර්ශනයට ලක් වන වසර තුළදී සමාගම සියලුම අදාළ නීතිරීති හා කොන්දේසි වලට අනුගතවන බවටත් වාර්තාගත අනනුකූලතා සම්බන්ධයෙන් නිසි වළකාලීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති බවටත් කමිටුව සෑහීමකට පත් වේ.

මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 මැයි 24 වැනි දින අනුමත කරන ලදී.

ඩබ්. ඒ. සමන්ත උපනන්ද
සභාපති - විගණන සහ අනුකූලතා කමිටුය

2022 මැයි 24

2021 ආයෝජන කමිටු වාර්තාව

මා විසින් 2022 මාර්තු 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ආයෝජන කමිටු සභාපතිවරයා වශයෙන් වැඩ භාරගන්නා ලදී: කෙසේවුවද, 2021 ආයෝජන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් සහිත ආයෝජන කමිටු වාර්තාව මෙසේ ඉදිරිපත් කරනු ලැබේ.

ආයෝජන කමිටුවෙහි අරමුණු

ආයෝජන කමිටුවෙහි අභිප්‍රාය වනුයේ, නියාමක විසින් සපයනු ලැබ ඇති ආකෘතීන් සහ සමාගමෙහි අවදානම් දරාගැනීමේ සහ භාරගැනීමේ සූදානම ඇතුළත ආයෝජන ක්‍රියාකරකම් වලින් ප්‍රශස්ත ආදායම් අත්පත් කරගැනීමයි. එළඹි තීරණ කාර්යක්ෂම අයුරින් ක්‍රියාවේ යොදවන බවටත්, ආචාරධර්ම හා නියාමන අනුකූලතාවයන් ආශ්‍රිතව ආයෝජන ක්‍රියාවලිය ක්ෂේත්‍රයේ යහ ක්‍රියාකාරකම් වලට අනුගතව සිදුකෙරෙන බවටත් ආයෝජන කමිටුව මගින් තහවුරු කෙරේ.

ආයෝජන ක්‍රමෝපාය

වසර තුළදී කෝවිඩ් 19 වසංගතය අඛණ්ඩවම පැතිර යාමත් සමග, 2021 දී ආයෝජන වටපිටාව වෙත සැළකිය යුතු තර්ජනයක් එල්ල විය. කෝවිඩ් වසංගතයට පෙර ආකර්ශනීය ස්ථාවර ආදායම් අනුපාතයන් සහ අභ්‍යන්තර අනුපාත ආදායම් අවහිර කරමින් පහළ ප්‍රතිආයෝජන අනුපාතයන් හමුවේ නුදුරු අනාගතයේදී තිරසාර ප්‍රතිඵල පවත්වාගෙන යාම වළකාලන තත්ත්වයක් උද්ගත විය. වසර තුළදී පොලී අනුපාත පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකා ඉන්ෂ්වරන්ස් කෙටි කාලීන ස්ථාවර ආදායම් ආයෝජනයන් කෙරෙහි අවධානය යොමු කලේය. කෙසේවුවද, කොටස් වෙළදාම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කෙරුනු අතර, වසර තුළදී ශ්‍රී ලංකාවේ කොටස් මගින් ඉහළ ආදායම් සපයන ලද බැවින් සැළකිය යුතු ප්‍රතිලාභ අත් කර ගැනීමට සමාගමට හැකි විය.

වසංගතය හමුවේ මෙහෙයුම් වටපිටාව අතිශයින් උච්ඡාවනය වන පසුබිමක් තුළ, ද්‍රවශීලතාවය, පොලී අනුපාත සහ ණය අවදානම කෙරෙහි ආයෝජන කමිටුවෙහි දැඩි අවධානය යොමු විය. සියලු ආයෝජනයන් සිදුකිරීමට පෙරාතුව ඒ පිළිබඳ දැඩි විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී.

පැවති පහළ පොලී අනුපාතය ආකර්ශනීය කොටස් ආයෝජන සඳහා මග පෑදූ අතර ආයෝජන කමිටුව ප්‍රධාන වශයෙන් වෙළදාම් ලාභ අත්පත් කරගැනීම සඳහා කොටස් වෙළදපොල තුළ උද්ගත වූ අවස්ථාවන් භාවිත කිරීම කෙරෙහි අවධානය යොමු කලේය. ආයෝජන කමිටුව මගින් දැඩි ආයෝජන තේරීම් ක්‍රියාවලියකින් අනතුරුව කඩිනම් තීරණ ගැනීම සහ ඒවා නිසි පරිදි ක්‍රියාවේ යෙදවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් කැපී පෙනෙන කොටස් වෙළදාම් ලාභ ප්‍රමාණයක් යථාකරණය කොට ගත හැකි විය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ආයෝජන කමිටුව විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රාමාණික වෘත්තිකයින්ගෙන් සමන්විත වන අතර, ඔවුහු ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ සිය විශේෂඥභාවය මැනවින් භාවිත කරති. ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළදී හරස් අලෙවිය ඔස්සේ ආයෝජන හවුල්කාරිත්වයන් වර්ධනය කරගැනීම කෙරෙහි නිසි සැළකිල්ලක් දක්වන ලදී.

අධීක්ෂණය සහ පාලනය

ආයෝජන කාර්යසාධනය නිරන්තරයෙන් අධීක්ෂණයට ලක් කෙරෙන අතර, කමිටුව ආයෝජන ඉලක්ක අත්පත් කරගැනීම පිළිබඳව අවධානයෙන් පසුවේ. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආයෝජනයන් සුරක්ෂිත හා සමාන ආකාරයකින් පවත්වාගෙන යාම සඳහා ආයෝජන ඉදිරිපෙල කාර්යාලය, මැදපෙල කාර්යාලය සහ පසුපෙල කාර්යාලය මගින් විචක්ෂණශීලී සහ දැඩි පරීක්ෂාවන් සිදු කරනු ලැබේ.

විමර්ශනයට ලක් වන වසර - ආයෝජන ක්‍රියාකාරකම් වල සාරාංශය

2021 වසර අවසානය වන විට දිගු කාලීන රක්ෂණ අරමුදල් වත්කම්රු.බිලියන 177.0 ක් වශයෙන්ද, සාමාන්‍ය රක්ෂණ අරමුදල් වත්කම් රු.බිලියන 57 ක් වශයෙන්ද පැවතිනි.

ආයෝජන වල සුරක්ෂිතභාවය සහ ස්ථාවරභාවය

ආයෝජන කමිටුව මගින් වත්කම් කාණ්ඩයන් අතර ප්‍රමාණවත් විවිධාංගීකරණයක් ඇති කරමින් ආයෝජන සම්බන්ධ අක්‍රමවත් අවදානම් අවම කරගැනේ. ආයෝජනයන් සවිමත් ණය ශ්‍රේණිගත කිරීම් සහිත ද්‍රවශීල ආයෝජනයන්ට දැඩි ලෙස සීමා කෙරේ. පහත වගුව මගින් 2021 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ අරමුදල් වත්කම්, සාමාන්‍ය රක්ෂණ අරමුදල් වත්කම් සහ සමස්ත කළඹෙහි ආයෝජන වත්කම් වෙන්කිරීම නිරූපනය කෙරේ. (වටිනාකම් වෙළදපොල වටිනාකම් මත පදනම් වේ)

දිගු කාලීන රක්ෂණ අරමුදල් වත්කම්

%



රජයේ සුරැකුම්	44.8%
ස්කන්ධ	17.5%
කාලසීමා තැන්පතු	4.5%
ආයතනික ණය	31.6%
ඒකක භාර	1.6%

සාමාන්‍ය රක්ෂණ අරමුදල් වත්කම්

%



රජයේ සුරැකුම්	23.9%
ස්කන්ධ	55.3%
කාලසීමා තැන්පතු	6.4%
ආයතනික ණය	9.8%
ඒකක භාර	4.6%

ආයෝජන ආදායම

වසර සඳහා සමස්ත ආයෝජන ආදායම වාර්තාගත ඉහළ අගයක ජීවිත රක්ෂණ සඳහා වන ආයෝජන ආදායම රු.බිලියන 19.9 ක් වශයෙන් පැවති අතර සාමාන්‍ය රක්ෂණ සඳහා එය රු.බිලියන 3.2 ක් විය. වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ, සමාගමෙහි සමස්ත ආදායමෙන් සියයට 35 ක් ආයෝජන ආදායමෙන් සැදුම්ලත් විය. ජීවිත රක්ෂණ සමස්ත ආදායමෙන් සියයට 47.6 ක් ද සාමාන්‍ය රක්ෂණ සමස්ත ආදායමෙන් සියයයට 13.4 ක් ද ආයෝජන මගින් උත්පාදනය කෙරිණි.

සමස්ත ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ආයෝජන ආදායම

%



වත්කම් වගකීම් කළමනාකරණ ප්‍රතිශ්ඨාවන් සහ සැලසුම් සැකසීම

වසර තුළදී වත්කම් වගකීම් කළමනාකරණය කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු විය. වසර තුළදී පොලී අනුපාතයන් පහළ මට්ටමක පැවති බැවින් ආයෝජන කමිටුව කෙටි කාලීන වත්කම් වල ආයෝජනය කිරීමට තීරණය කලේය. පසුගිය වසර තුළ ඉහළ ආදායමක් හිමිවන ස්ථාවර ආදායම් සාධන පත්‍රයන්හි සිදුකරන ආයෝජන හේතුවෙන් 2021 දී ස්ථාවර ආදායම් තත්ත්වය තිරසාර අයුරින් පවත්වා ගත හැකි විය. ඉදිරියට යාමේදී අප විසින් ඉහළ යන පොලිය සහ ඉහළ උද්ධමනය මගින් අභියෝග එල්ල වනු ඇතැයි අප විසින් පුරෝකතනය කරනු ලැබේ. කෙසේවුවද, එම තත්ත්වයන් වෙනස් වන සුලු වේ. කොටස් වෙළඳපොල තුළ අවස්ථා රැසක් උද්ගත වනු ඇති බවත් එමගින් උද්ධමනය සීමා වනු ඇති බවත් අපගේ හැඟීමයි.

ඒකල වාරික ආයෝජන සැලසුම වන, යසස් සඳහා වන ඉල්ලුම වෙළඳපොල පොලී අනුපාතය පහළ මට්ටමක පැවතුනද සවිමත්ව පැවති අතර, එයට පහළ අවදානම් මට්ටම් යටතේ විශිෂ්ට ප්‍රතිඵල අත්කර දුන් වත්කම් වල ආධාරයෙනි.

2021 දී වාර්තාගත ආයෝජන අරමුදලක් සමගින් සිය කාර්යසාධනය පිළිබඳව ආයෝජන කමිටුව සෑහීමකට පත් වන අතර, 2022 කාර්යසාධනය වර්ධනය කරගැනීමට කැප වී කටයුතු කරනු ඇත.

ආර්.ඒ. ලක්මිණි උදයකුමාර
සභාපති - ආයෝජන කමිටුව

2022 මැයි 24 වැනි දින

අවදානම් කළමනාකරණ වාර්තාව

හැඳින්වීම

සරල මූල්‍යමය පාලනයෙන් ඔබ්බට යමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සුරක්ෂිතතාව, තොරතුරු තාක්ෂණය, තෙවන පාර්ශ්වීය සබඳතා, අවදානම් පාලනය සහ අනුකූලතාවය සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ ආකෘතිකරාමුවක් ආදේශනය කොට ගෙන ඇති අතර, ක්‍රමෝපායික ව්‍යාපාරික හා මෙහෙයුම් අරමුණු සාක්ෂාත් කරගැනීමේදි සහ සැබෑ ව්‍යාපාර වටිනාකම් නිර්මාණය කිරීමේදී අවදානම් කළමනාකරණය වැදගත් අංගයක් වශයෙන් සළකනු ලබයි.

ව්‍යවසාය අවදානම් කළමනාකරණය ක්‍රියාවට නැංවීමේ සිය ප්‍රයත්නය අනුව යමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් ප්‍රමුඛ ව්‍යාපාරික සහ ක්‍රමෝපායික අවදානම් හදුනාගැනීම, තක්සේරුව සහ පහත හෙළීම සදහා, ISO 31000 අවදානම් ආකෘතිකරාමුවට අනුකූලව ප්‍රබල අවදානම් කළමනාකරණ ආකෘතියක් සකසනු ලැබ ඇත. එම ආකෘතිය පහත වගුවෙහි ඉදිරිපත් කෙරේ:



තක්සේරුකරණ පියවර අවදානම් ඇතිවීමේ සම්භාවිතාව/සිදුවීමේ හැකියාව සහ එහි ප්‍රතිවිපාක/බලපෑමෙන් සමන්විත වේ. ඉහත දක්වන ලද සම්භාවිතාව/සිදුවීමේ හැකියාව සහ ප්‍රතිවිපාක/බලපෑම ශ්‍රේණිගත කිරීම මත පදනම්ව, සමස්ත අවදානම් කාණ්ඩය තීරණය කල හැකි වන අතර එය සිදු කරනු ලබන ආකාරය අවදානම් අනුකෘතියක ආකාරයෙන් නිරූපනය කළ හැකි වේ.

අවදානම් පාලනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවදානම නිරීක්ෂණය සදහා අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ අනුකමිටුවෙහි සහයෝගය හිමි යේ. අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබන අවදානම් කළමනාකරණ කමිටුව සමාගමෙහි ක්‍රමෝපාය තුළ වැදගත් කොටසක් වේ. මේ සම්බන්ධයෙන්, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සමාගමෙහි ක්‍රමෝපාය සහ අවදානම් භාරගැනීමේ සූදානම සමග ගැළපෙන බවට තහවුරු කිරීම අවදානම් කළමනාකරණ කමිටුවෙහි වගකීම වේ.

ප්‍රධාන වශයෙන් විගණන හා අනුකූලතා සහ ආයෝජන වැනි විශේෂිත ක්ෂේත්‍රයන් ආශ්‍රිතව සමාගම මගින් අවදානම් කළමනාකරණ අනුකමිටුවට අමතරව තවත් අනුකමිටු කිහිපයක් පත් කරනු ලැබ ඇත.

නිරීක්ෂණ ව්‍යුහය

පහත දැක්වෙන පරිදි, පැහැදිලිව හඳුනාගත් ධාරාවන් හතරක් පවතින විට අවදානම් කළමනාකරණය ප්‍රබලතම අයුරින් ක්‍රියාත්මක වේ:

අ) 1 වැනි ආරක්ෂණ ධාරාව වශයෙන් ''තථ්‍ය අවදානම් හිමිකරුවන් වෙතින් මෙහෙයුම් කළමනාකරණය'' (අවදානම හිමිකරගැනීම සහ කළමනාකරණය)

ආ) 2 වැනි ආරක්ෂණ ධාරාව වශයෙන් ''මූල්‍ය පාලනයන්, අවදානම් පාලනය සහ අනුකූලතාවය'' (අවදානම නිරීක්ෂණය)

ඇ) 3 වැනි ආරක්ෂණ ධාරාව වශයෙන් ''අභ්‍යන්තර විගණනය'' (ස්වාධීන සහතිකත්වය)

ඈ) 4 වැනි ආරක්ෂණ ධාරාව වශයෙන් ''බාහිර විගණකවරුන් සහ නියාමනයන්'' (නිසි සන්නිවේදනය)

4 වැනි ආරක්ෂණ ධාරා ක්‍රියාවලියේදී අභ්‍යන්තර විගණකවරුන්, බාහිර විගණකවරුන් සහ අධීක්ෂකයින් අතර සමීප අන්තර් ක්‍රියාකාරකම් සිදුවේ. රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන නියාමන ආයතනය වනුයේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම වේ.

විගණන කමිටුව වෙත වාර්තා කිරීමෙන් ස්වාධීනත්වය තහවුරු වන අතර අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම මගින් අවදානම් න්‍යායපත්‍රය විගණන න්‍යායපත්‍රයට ද්විතීයික නොවන බවට තහවුරු වේ.



අවදානම් කළමනාකරණ වාර්තාව

අභ්‍යන්තර පාලන ආකෘතිය සම්බන්ධ අවදානම් තක්සේරුකරණය

ප්‍රබල අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් දිරිගැන්වීමේ අපගේ අඛණ්ඩ ප්‍රයත්නයෙහි කොටසක් වශයෙන්, අප විසින් 1998 සැප්තැම්බර් 21 වැනි දින නිකුත් කරන ලද බැංකු සමාගම් වල අභ්‍යන්තර පාලන පද්ධතීන් සඳහා වන ආකෘතියෙහි මූලධර්ම දහතුන ආශ්‍රිතව අපගේ අභ්‍යන්තර පාලන ආකෘතිය හඳුන්වාදෙන ලදී.

නුබුන්වත්භාව ස්ථාවරය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි හි අවදානම් කළමනාකරණ පද්ධතිය මගින් අවදානම් කළමනාකරණය ආශ්‍රිත සවිමත් පදනමක් සකසනු ලැබේ. 2021 දී සමාගම මගින් සිය ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය අවශ්‍ය අනුපාතයට බෙහෙවින් ඉහළින් පවත්වා ගැනිනි. 2020 වාර්තා වූ 459% ට සාපේක්ෂව 2021 දී ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය 501% ක් විය. 2020 වාර්තා වූ 223% ට සාපේක්ෂව 2021 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය 244% ක් විය.

කෝවිඩ් 19 බලපෑම

2021 දී, ඔමික්‍රෝන් හි කෙටි හා තියුණු බලපෑමෙන් අනතුරුව, වෙනත් දරුණු ප්‍රභේදයක් උද්ගත වුයේ නම් හැර, බොහෝ ප්‍රදේශයන්හි කෝවිඩ් 19 වසංගත සමය යථා තත්වයට පත්වෙන අයුරු දක්නට ලැබිණි. කෙසේවුවද, කෝවිඩ් 19 හි අඛණ්ඩ බලපෑමට මුහුණදීම පිණිස අප විසින්, ව්‍යාපාර අඛණ්ඩත්වය තහවුරු කරමින් ඒ ඔස්සේ සේවකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ සුරක්ෂිතතාව තහවුරු කරමින් ව්‍යාපාරය ආරක්ෂා කරගැනීම උදෙසා, ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාමාජිකයින්ගෙන් සැදුම්ලත් ව්‍යාපාර අඛණ්ඩත්වය නියමු කමිටුවක් පිහිටුවමින් අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාවට නංවන ලදී.

ප්‍රධාන ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්

1. වත්කම් - වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය
2. වර්තමාන වසරේ අවදානම් භාරගැනීමේ සූදානම සහ දරාගැනීමේ ප්‍රකාශය සැකසීම සහ පෙර වසරේ අදාළ ප්‍රකාශය සමාලෝචනය
3. මූල්‍යමය සහ මූල්‍යමය නොවන සාධකයන්හි අවදානම් විශ්ලේෂණය සහ එහි බලපෑම
4. සේවාලාභී තෘප්තිය අනුව කීර්තිනාම අවදානම් විශ්ලේෂණය
5. අභ්‍යන්තර පාලනයන් අවදානම් කළමනාකරණ ආකෘතියට අනුකූල වන බවට තහවුරු කිරීම
6. ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම වෙත තොරතුරු තාක්ෂණ/ඩිජිටල් අවදානම් ඒකාබද්ධ කොට සයිබර් ආරක්ෂණ ක්‍රමෝපායක් නිර්මාණය
7. දත්ත සුරක්ෂිතතාව සම්බන්ධ ව්‍යවස්ථාව ඇතුලුව නව නෛතික අවදානම් සඳහා සූදානම

වර්තමාන ආර්ථික සංරචකයන්හි බලපෑම

පහත දැක්වෙන මෑත කාලීන ආර්ථික ලක්ෂණයන් රක්ෂණ ක්ෂේත්‍රය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කලේය. ඉහළ ගිය උද්ධමනය, ඉහළ ගිය විරැකියාව, ඉහළ යන වෙළඳපොල පොලී අනුපාත සහ රජයේ සුරැකුම් වල ආදායම, පුලුල් වන රාජ්‍ය මූල්‍ය හිඟය, පුලුල් වන රජයේ ණය සහ ණය සේවා කිරීමේ ගෙවීම්, ප්‍රධාන මුදල් ඒකකයන්ට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම, වර්ධනය වන අපනයන ආදායම් හමුවේ වුවද පුලුල් වන ගෙවුම් ශේෂය, දළ නිල සංචියන් හි දැඩි පහළයාම, පහළ යන සංචාරක ඉපැයුම් හා විදේශ විනිමය සහ ණය අවශ්‍රේණිගත කිරීම් ආදිය ඒ අතර ප්‍රධාන තැනක් ගනී. අවදානම් කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් බලන කල, අප විසින් අදාළ අවදානම් සංරචකයන් නිරාකරණය කරගැනීම සඳහා මූල්‍ය, ආයෝජන, ජීවිත, ජීවිත නොවන සහ සෙසු ප්‍රධාන අංශ සමග සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරන ලදී.

ජීවිත රක්ෂණ අවදානම

ජීවිත රක්ෂණය සමග බොහෝ අවදානම් සම්බන්ධ වේ, ඒවා පහත දැක්වෙන පරිදි වේ:

අවදානම් කාණ්ඩය	විස්තරය	අවදානම් භාරගැනීමේ සූදානම
මර්ත්‍යතාව	ජීවිත රක්ෂණ සම්බන්ධ රක්ෂණ ඔප්පු හිමියාගේ මරණය සම්බන්ධ අත්දැකීම් අවදානම අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළ විය	පහළ අවදානම
කල්පැවැත්ම	රක්ෂිතයින් අපේක්ෂිත කාලයට වඩා වැඩි කලක් ජීවත්වීමේ අවදානම	පහළ අවදානම
රෝගාබාධ අවදානම	සැබෑ රක්ෂණ ඔප්පු හිමි සෞඛ්‍ය/හදිසි අනතුරු ආශ්‍රිත හිමිකම්පෑම් අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළයාමේ අවදානම	පහළ අවදානම
රක්ෂණ ඔප්පු හිමි චර්යාමය අවදානම	රක්ෂණ ඔප්පු හිමියන් විසින් දායකත්වයන් නවතාලීම අඩු කිරීම හෝ ගිවිසුම කල්පිරීමට පෙර ප්‍රතිලාභ ආපසු ලබාගැනීම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අයහපත් වීම	පහළ අවදානම
වියදම් අවදානම	රක්ෂණ ඔප්පු අත්පත් කරගැනීමේදී සහ පරිපාලනයේදී දරන ලද වියදම් අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළයාම	පහළ අවදානම

නිසි පරිදි කළමනාකරණය නොකළහොත් සිය මෙහෙයුම් කෙරෙහි බලපෑ හැකි ඉහත දක්වන ලද අවදානම් තක්සේරු කිරීම සඳහා සමාගම මගින් ක්‍රියාපටිපාටීන් සහ ක්‍රියාවලීන ස්ථාපනය කරනු ලැබ ඇත. ඒවා මගින් සැලසුම් සැකසීමේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා සියලුම වැදගත් අදියර ආවරනය කෙරේ.

එයට අමතරව, සියලුම ජීවිත රක්ෂණ මූල්‍යමය ධාරාවන් සම්බන්ධයෙන් ආකෘතිගත කොට ආයුගණක විසින් ලාභ පරීක්ෂාව සපයනු ලබන අතර එමනිසා සැලසුම් නිර්මිති සහ මිළකරණ අවදානම පහත වැටේ. එමෙන්ම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් නිශ්චිත වගකීම් සඳහා ඇප වශයෙන් ගැලපුම් සාධනපත්‍ර භාවිත කෙරේ.

අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (RBC) යටතේ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් 'දළ වාරික තක්සේරුකරණ' යාන්ත්‍රණය (GPV) ආදේශ කොට ඇත. මෙය වගකීම් තක්සේරු කටයුතු සඳහා අවශ්‍ය වන අතර එහිදී වෙළඳපොල සංගත ආකාරකින් වගකිම් ගණනය කෙරේ. මෙහි අර්ථය වනුයේ 'දළ වාරික තක්සේරුකරණ' යාන්ත්‍රණය (GPV) මර්ත්‍යතාව, රෝගාබාධ, වියදම්, හිගයන් සම්බන්ධ පැහැදිලි ඇස්තමේන්තු මත පදනම් වන බව වන අතර පොලී අනුපාත ව්‍යුහය වට්ටම්ගත කිරීම සඳහා භාවිත කෙරේ. වගකීම සමස්ත ප්‍රතිලාභ වගකීම (TBL) නම් වන, අනාගත අපේක්ෂිත බෝනස් මට්ටම් සඳහා පැහැදිලි තීරුවක්ද දරන ලදී. එමනිසා අනාගත බෝනස් මුදල් ප්‍රශස්ත ඇස්තමේන්තු උපකල්පන යටතේ සුරක්ෂිත කෙරේ. ආවර්තිතව සිදුකරනු ලබන අභ්‍යන්තර අත්දැකීම් අධ්‍යයනයන් මත පදනම්ව සමාගම මගින් වගකීම සම්බන්ධ ප්‍රශස්ත ඇස්තමේන්තු උපකල්පන සකස් කරනු ලැබේ. මේ නිසා වසර ගණනාවක් තිස්සේ රක්ෂණඔප්පුහිමි වගකීම් සංගත ආකාරයකින් කළමනාකරණය කිරීමට සමාගම සමත් විය.

මෙයට අමතරව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි මාර්ගෝපදේශයන් අනුව සමස්ත ප්‍රතිලාභ වගකීම (TBL) ගණනය කිරීම සඳහා යොදාගත් ප්‍රශස්ත ඇස්තමේන්තුගත පරාමිතීන් අවදානම් තීරුව (RM) යොදාගනිමින් තවදුරටත් ආතතිගත කෙරෙන අතර එහි ප්‍රශස්ත ඇස්තමේන්තු ආශ්‍රයෙන් අහිතකර වෙනස්වීම් සඳහා තීරුවක් සමගින් සමස්ත ප්‍රතිලාභ වගකීම (TBL) ගණනය කෙරේ. අවදානම් තීරුව (RM) භාවිතය හේතුවෙන් රක්ෂණ ඔප්පු වගකීම් සම්බන්ධ සංඛ්‍යාලේඛණමය විශ්වාසය ඉහළ නැංවෙන අතර එමනිසා රක්ෂණ ඔප්පු හිමියා වෙත පිරිනැමෙන රැකවරනය වර්ධනය වත්ම රක්ෂණඔප්පු වගකීම් ඉහළ යයි. සමාගම මගින් අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (RBC) ආකෘතිය තුළ නිර්වචනය කරන ලද සාධක සමග සංගතව අවදානම් තීරුව (RM) භාවිත කෙරෙන අතර එමගින් වගකීම් ගණනය කිරීමේදී සිදුවිය හැකි ප්‍රතිඵල වල පාදක වන සම්භාවිතා බෙදීයාම සම්බන්ධ 75% ක විශ්වාසනීය අන්තරයක් නියෝජනය කෙරේ.

ඒ අයුරින්, ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම නිර්ණය කිරීමේදී භාවිත කෙරන ප්‍රධාන උපකල්පන පහත වගුගත කෙරේ:

උපකල්පනය	විස්තරය
මර්ත්‍යතාව	- ප්‍රශස්ත ඇස්තමේන්තු අත්දැකීම් අනුපාතයක් ලබාගැනීම සඳහා වාර්ෂික නොවන ව්‍යාපාර සඳහා A 67/70 සාධනය කරන ලදී - දළ වශයෙන් වාර්ෂිකයන්ගේ 1% මර්ත්‍යතා ඉහළ නැංවීමක් සඳහා එක් අවුරුදු වයස් පසුගමනයක් සමගින් (90) m සහ (90)f සාමාන්‍යයක් බර තබන ලදී
ආයෝජන ආදායම	2021.12.31. දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම මගින් උපදෙස් දෙන ලද අවදානම් රහිත අනුපාත ව්‍යුහය

අවදානම් රහිත අනුපාතය



අවදානම් කළමනාකරණ වාර්තාව

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් 2021 වසර පුරා සිය ජීවිත රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ස්ථාවර හා සවිමත් නුබුන්වත්භාව අනුපාතයක් පවත්වා ගෙන යන ලද අතර 2021.12.31. දිනට අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය (CAR) 2020.12.31. වාර්තා වූ 459% ට සාපේක්ෂව 501% ක් විය. එය අවම නියාමන අවශ්‍යතාවය වන 120% ට සාපේක්ෂව බෙහෙවින් ඉහළ අගයකි.

ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය



අරමුණු

- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි මාර්ගෝපදේශ සපුරාලීම
- ශ්‍රේණිගත කිරීමේ කඩඉම් සපුරාලීම
- රක්ෂණ ඔප්පු හිමියන්ගේ සාධාරණ අපේක්ෂාවන් සපුරාලීම

අත්පත් කරගැනීම්

- CAR 501%
- ෆිච් ශ්‍රේණිගත කිරීම: AA (lka)
- ජීවිත රක්ෂණ බෝනස් : රු.බිලියන 9.8

ජීවිත රක්ෂණ අවදානම සඳහා සංවේදීතා විශ්ලේෂණය

උපකල්පනය	උපකල්පන වෙනස	ප්‍රශස්ත ඇස්තමේන්තුගත වගකීම කෙරෙහි බලපෑම (රු.)
මර්තයතාව	+10%	මිලියන 845
	-10%	මිලියන (848)
වට්ටම් අනුපාතය	RBC යටතේ ඉහළ කම්පන තත්ත්වය	මිලියන (16,434)
	RBC යටතේ පහළ කම්පන තත්ත්වය	මිලියන 23,010

සැලසුම් කාණ්ඩය යටතේ රක්ෂණ වගකීම වෙන්කිරීම

2021 දෙසැම්බර් 31 වැනි දින රු. '000	රක්ෂණ වගකීම් (ලාභ සහිතව)	රක්ෂණ වගකීම් (ලාභ රහිතව)	මුලු ප්‍රතිලාභ වගකීම්
සම්පූර්ණ ජීවිත	18,698	4,052	22,750
ප්‍රදාන රක්ෂණය	60,885,389	4,297,782	65,183,170
කාලසීමා රක්ෂණය	0	3,905,620	3,905,620
වාර්ෂික (Annuity)	10,868,079	4,340,973	15,209,052
රයිඩර් ප්‍රතිලාභ	93,286	3,381,027	3,474,313
එකතුව	71,865,452	15,929,454	87,794,905

පහත වගුව මගින් සමාගමෙහි සහභාගීත්ව සහ සහභාගීත්ව නොවන අරමුදල් ස්ථාවරය නිරූපනය කෙරේ.

	සහභාගීත්ව	සහභාගීත්ව නොවන	එකතුව
	Rs. '000	Rs. '000	Rs. '000
2021	136,647,210	15,937,849	152,585,059
ප්‍රතිශතය	89.55%	10.45%	

සාමාන්‍ය රක්ෂණ අවදානම

2016.01.01. සිට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි අනිවාර්ය අවශ්‍යතාවය පරිදි, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (RBC) යටතේ අවශ්‍ය වූ අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන (RBC) ද්‍රවශීලතා ආකෘතිය ක්‍රියාවට නංවන ලදී.

මේ යටතේ, හිමිකම්පෑමේ වගකීම අදාළ හිමිකම්පෑමේ මධ්‍ය ඇස්තමේන්තුව සහ අවදානම් තීරුවෙහි සංයෝජනයක් වශයෙන් නිර්වචනය කෙරේ. වාරික අවදානම අවදානම් තීරු සමගින් කල් ඉකුත් නොවූ අවදානම් සංචිතයෙහි මධ්‍ය ඇස්තමේන්තුව වශයෙන් නිර්වචනය කෙරේ.

සංචිත සැකසීමේදී විචක්ෂණශීලීභාවය

වාරික වගකීම සහ හිමිකම්පෑමේ වගකීම යනුවෙන් ප්‍රධාන සංරචක දෙකක් සාමාන්‍ය ආයුගණන සංචිතයන්හි පවතී. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් හිමිකම්පෑමේ වගකීම (හිඟ හිමිකම්පෑම් සංචිතය සහ දරන ලද නමුත් ප්‍රමාණවත්ව වාර්තා නොවූ හිමිකම්පෑම් (IBN(E)R)) 75% විශ්වසනීය මට්ටමක සකසා ඇති අතර එයට හිමිකම්පෑමේ වගකීමෙහි මධ්‍ය ඇස්තමේන්තුව (CECL), අනාගත හිමිකම්පෑම් පියවීම සඳහා වන ආශ්‍රිත හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වියදම් (CHE) සහ මධ්‍ය ඇස්තමේන්තු වගකීමෙහි සහ හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වියදම් (CHE) ආශ්‍රිත සෘණාත්මක වෙනස්වීම් සඳහා වන ප්‍රතිපාදන ඇතුළත් වේ. වාරික වගකීමද 75% ක විශ්වසනීය මට්ටමක සකසන ලද අතර එය පසුගිය හදිසි අනතුරු වසර දෙක හෝ තුන සඳහා වන මධ්‍ය ඇස්තමේන්තු පරම අලාභ අනුපාතයෙහි සාමාන්‍යය ආශ්‍රයෙන් නිර්ණය කෙරෙන මධ්‍ය ඇස්තමේන්තු කල් ඉකුත් නොවූ සංචිත අනුපාතය මත පදනම්ව ගණනය කෙරෙන අතර එහිදී නිරාවරනය තවමත් සිදුවී නොමැති බැවින් අමතර උච්ඡාවචනය පිළිබිඹු කිරීම සඳහා සෘණාත්මක වෙනස්වීම ආශ්‍රිත ප්‍රතිපාදන යොදාගැනේ.



අවදානම් කළමනාකරණ වාර්තාව

හිමිකම්පෑම් සැකසීමේ තොරතුරු

පහත දැක්වෙන වගුව මගින් ප්‍රතිරක්ෂණයෙන් ශුද්ධව, ඓතිහාසික ජීවිත නොවන සංචිතයන්හි වෙනස්වීම් ඉදිරිපත් කෙරේ. වගුවෙහි ඉහළම තීරුවෙන් නොගෙවන ලද අලාභයන් සඳහා ඇස්තමේන්තුගත දළ සංචිත සහ එක් එක් ශේෂපත්‍ර දිනයේදී අලාභ ගැලපුම් වියදම් නිරූපනය කෙරෙන අතර එමගින් එම වසරේදී සහ පෙර වසර වලදී දරන ලද අලාභ සඳහා වන අනාගත ගෙවීම් උදෙසා ඇස්තමේන්තුගත මුදල නියෝජනය කෙරේ. වගුවෙහි සමුච්චිත ගෙවන ලද කොටසින් එක් එක් වසර අවසානයේදී ස්ථාපනය කරන ලද සංචිත ආශ්‍රිතව එක් එක් එළඹෙන වසරේදී ගෙවන ලද සමුච්චිත මුදල් ප්‍රමාණයන් දැක්වේ. සමාන ආකාරයෙන්ම, සමුච්චිත වාර්තාගත අලාභ කොටසින් ඉහත ත්‍රිකෝණයෙහි දැක්වෙන සමුච්චිත ගෙවන ලද මුදල් ප්‍රමාණය සහ මූල්‍ය වර්ෂය අවසානයේදී ශුද්ධ හිඟ තත්ත්වය දැක්වේ.

	2016	2017	2018	2019	2020	2021
අලාභ සහ අලාභ ගැළපුම් වියදම් සඳහා දළ සංචිත	8,664	8,549	8,776	7,311	7,862	9,549
පියවාගත හැකි ප්‍රතිරක්ෂණ	(1,434)	(1,451)	(1,590)	(1,061)	(1,395)	(1,888)
අලාභ සහ අලාභ ගැළපුම් වියදම් සඳහා ශුද්ධ සංචිත	7,230	7,098	7,186	6,250	6,466	7,661
දෙසැම්බර් 31 දිනට සමුච්චිත ගෙවීම්:						
වසරකට පසු	6,637	6,849	7,590	7,723	5,371	6,995
වසර දෙකකට පසු	8,392	9,004	9,632	9,451	7,043	
වසර තුනකට පසු	8,539	9,185	9,772	9,589		
වසර හතරකට පසු	8,722	9,242	9,996			
වසර පහකට පසු	8,801	9,315				
වසර හයකට පසු	8,830					
දෙසැම්බර් 31 දිනට වාර්තාගත සමුච්චිත මුදල:						
වසරකට පසු	7,913	8,297	9,467	9,153	6,493	8,980
වසර දෙකකට පසු	8,531	9,184	9,907	9,718	7,255	
වසර තුනකට පසු	8,717	9,414	10,288	9,852		
වසර හතරකට පසු	8,883	9,526	10,200			
වසර පහකට පසු	8,943	9,479				
වසර හයකට පසු	8,927					

* රු. මිලියන

සාමාන්‍ය රක්ෂණ අවදානම සම්බන්ධ සංවේදීතා විශ්ලේෂණය

පහත වගුව මගින්, එක් ප්‍රතිශත ලකුණකින් හිඟ වාර්තාගත හිමිකම්පෑම් තුළ ඇති වූ ඍණාත්මක තත්ත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඇති වූ බදු වලට පෙර ශුද්ධ ආදායමෙහි සහ ශුද්ධ වත්කම් වල සංවේදීතාවය නිරූපනය කෙරේ. එවැනි ඉහළයාමක් උද්ගතවීම කෙරෙහි, රක්ෂිත සිදුවීම් ඇතිවීමෙහි වාර ගණන ඉහළයාම හෝ ඒවායේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුකෙරෙන හිමිකම්පෑම් වල බරපතල බව ඉහළයාම හෝ වාර ගණනෙහි සහ බරපතල බවෙහි සංයෝජනයක් හේතුවිය හැක. සංවේදීතාවයන් මගින් එවැනි සිදුවීමක සම්භාවිතාව නිරූපනය නොකෙරෙන අතර ප්‍රතිරක්ෂණය සම්බන්ධ කිසිදු රේඛීය නොවන බලපෑමක් එහිදී සැළකිල්ලට නොගැනේ.

හිමිකම්පෑම් හිග මුදල සහ හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වියදම් (CHE) කෙරෙහි බලපෑමක් ඇති නොවී මධ්‍ය ඇස්තමේන්තු දරන ලද නමුත් ප්‍රමාණවත්ව වාර්තා නොවූ හිමිකම්පෑම් (IBN(E)R) ද එක් ප්‍රතිශත ලකුණක බලපෑමට ලක් වූ බවට මෙහිදී අප විසින් උපකල්පනය කරන ලදී. පහත දැක්වෙන වගුවෙහි සංවේදීතා විශ්ලේෂණ ඉදිරිපත් කිරීමේදී යොදාගන්නා ලද උපකල්පනයන් මත පදනම්ව, වාර්තාගත හිග හිමිකම්පෑම් තුළ එක් එක් ප්‍රතිශත ලකුණක ඉහළයාම බදු වලට පෙර ශුද්ධ ආදායම සහ ශුද්ධ වත්කම් කෙරෙහි රේඛීය බලපෑමක් ඇති කරයි. එයට අමතරව, සමාගම මගින් ප්‍රතිරක්ෂණ හිවිසුම් වල රේඛීය නොවන බලපෑම සැළකිල්ලට ගනිමින්, අත්‍යන්ත තත්ත්වයන් තක්සේරු කිරීම මගින් රක්ෂණ අවදානම ඇගයුමට ලක් කෙරේ.

	උපකල්පනයන්හි වෙනස	වාර්තාගත දළ හිඟ හිමිකම්පෑම් රු.	වාර්තාගත ශුද්ධ හිඟ හිමිකම්පෑම් රු.	දළ වගකීම් මත බලපෑම රු.	ශුද්ධ වගකීම් මත බලපෑම රු.	බදු වලට පෙර ලාභය මත බලපෑම රු.	ස්කන්ධ මත බලපෑම (බදු වලට පසු) රු.
2021 දෙසැම්බර් 31	+1%	6,678මිලි	4,877මිලි	89මිලි	70මිලි	(70)මිලි	(53)මිලි

ආයෝජන අවදානම් කළමනාකරණය

වසර 2020 දී මෙන්ම, 2021 දීද කෝවිඩ් 19 මගින් කැපී පෙනෙන අභියෝගයන් එල්ල විය. කෙසේවුවද, අදාළ දැවැන්ත අභියෝගයන් හමුවේ විශාල අවස්ථාවන්ද නිර්මාණය විය. ආයෝජන මත ප්‍රබල ආදායම් මගින් සනාථ වන පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙම අභියෝග බොහොමයක් ජයගනිමින් අදාළ අවස්ථාවන් නිසි පරිදි උපයෝගී කරගැනීමට සමත් විය.

මෙහිදී ආයෝජන කමිටුව ආයෝජන තීරණ ගැනීමේදී සහ ක්‍රියාවට නැංවීමේදී ක්‍රියාකාරීව හා කාර්යක්ෂමව කටයුතු කලේය. සම්ප්‍රදායික වෙළඳාම් ක්‍රමෝපායන් දිගින් දිගටම පසෙකට දැමුනු අතර, වසංගතය තුළ අපේක්ෂාවන් අභිබවා යන ආකාරයේ ආයෝජනයන් පුරෝකථනය කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු විය.

ලොව පුරා මහ බැංකු විසින් සහනශීලී මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම හමුවේ ස්ථාවර ආදායම් සුරැකුම් මත පොලී අනුපාතයන් පහළ මට්ටමක පැවති බැවින්, 2020 දී ප්‍රතිආයෝජන අවදානම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත දිගින් දිගටම අභියෝගාත්මක විය.

ප්‍රතිආයෝජනයන් ප්‍රධාන වශයෙන් ස්කන්ධ හෝ කෙටි කාලීන ස්ථාවර ආදායම් සාධනපත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් සිදුකරන ලද බැවින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයෝජන කළඹෙහි විවිධත්වය ආධාරයෙන් පහළ ප්‍රතිආයෝජන අනුපාතයන්හි සෘණාත්මක බලපෑම පහත හෙළීමට හැකි විය. ආදායමට අමතරව, ද්‍රවශීලතා සහ ණය අවදානම කෙරෙහිද නිසි අවධානය යොමු කෙරිණි.

ආයෝජන කමිටුව මගින් සිදුකරන ලද මනා ආයෝජන තීරණ ගැනීම සහ නිරීක්ෂණය හේතුවෙන් අරමුදලෙහි ආයෝජන කාර්යසාධනය සම්බන්ධ අපේක්ෂාවන් අභිබවා යාමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමත් විය. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි අදාළ මාර්ගෝපදේශයන්ට තරයේ අනුගත වීම නියාමන අවදානම් තුරන් කිරීම කෙරෙහි උපකාරී විය.

වෙළඳපොල අවදානම

පොලී අනුපාත අවදානම

පොලී අනුපාතයන්හි වෙනස්වීම් සහ ආදායම් වක්‍රයෙහි ස්වරූපය වෙනස්වීම හේතුවෙන් උද්ගත විය හැකි අලාභයන් සම්බන්ධ අවදානම පොලී අනුපාත අවදානම වශයෙන් හැඳින්වේ. කෙටි කාලසීමා ණය සාධනපත්‍රයන්හි අයෝජනය කිරීම තුළින් මෙම අවදානම කළමනාකරණ කරන ලද අතර, වසර අවසානයේදී පොලී අනුපාත ඉහළ යාම ඇරඹුනු බැවින් මෙමගින් වාසි සහගත තත්ත්වයක් උදා විය.

පොලී අනුපාත ඉහළ යාමක් පෙන්නුම් කරන පසුබිමක් තුළ, ඉදිරියට යාමේදී ආයෝජන අවදානම බොහෝසෙයින් පහත වැටෙනු ඇති බවට අපේක්ෂිතය. පොලී අනුපාත ඉහළ යාම හමුවේ වසරේ දෙවන භාගයේදී වෙළඳාම් අවස්ථා අපේක්ෂා කළ හැකි වේ.

විනිමය අනුපාත අවදානම

විනිමය අනුපාතයන්හි සංචලනයන් හේතුවෙන් අලාභ දැරීමට සිදුවීමේ අවස්ථාව විනිමය අනුපාත අවදානම වශයෙන් හැඳින්වේ. 2021 දී ඇමරිකානු ඩොලරයේ අගය රුපියලට සාපේක්ෂව එදා මෙදා තුර ඉහළම අගය වාර්තා කලේය. කෙසේවුවද, මහ බැංකුව විසින් ගනු ලැබූ විචක්ෂණශීලී සහ කාලෝචිත පියවර හේතුවෙන්, රුපියල යළි යථා තත්ත්වයට පත්කරමින් තිරසාර ආර්ථික වර්ධනය පවත්වා ගත හැකි මට්ටමක රඳවා ගත හැකි විය.

අවදානම් කළමනාකරණ වාර්තාව

ස්කන්ධ අවදානම

ස්කන්ධ අවදානම යනු කොටස් මිලෙහි අහිතකර උච්ඡාවචනයන් හේතුවෙන් උද්ගත වන අවදානම වේ.

2021 දී සමස්ත කොටස් මිල දර්ශකය සහ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර් ශ්‍රී ලංකා 20 (S&P SL20) යන දර්ශකයන් ද්විත්වයම ඉහළ ගියේය. කෙසේවුවද, කෝවිඩ් රට වසාදැමීම් වලින් අනතුරුව පැවති සියලු අවිනිශ්චිතතා හේතුවෙන් ඉහළ අතට ගමන් මග අභියෝගාත්මක විය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ස්කන්ධ කළඹ, සමස්ත වෙළඳපොලට ආවේණික වූ අවිනිශ්චිතතාව වන ක්‍රමවේදී අවදානමට නිරාවරණව වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි ස්කන්ධ කළඹෙහි විවිධත්වය ස්කන්ධ වෙළඳපොල තුළ පැවති උච්ඡාවචනයන් වල බලපෑම සමනය කරගැනීම සඳහා උපකාරී වූ අතර, එහිදී ආකර්ශනීය ගුණාකාරයන්ගෙන් කොටස් මිළදී ගැනීම සඳහා ගත් කාලෝචිත පියවර වල ප්‍රතිඵලයක් වශයෙන් කැපී පෙනෙන වෙළඳාම් ලාභ අත් කර ගත හැකි විය.

ක්ෂේත්‍ර වෙන්කිරීම - ලැයිස්තුගත ස්කන්ධ 2021.12.31. දිනට ජීවිත අරමුදල

%



මූල්‍ය	52.19%
පාරිභෝගික අභිමත	6.04%
කාර්මික	28.53%
සෞඛ්‍ය සත්කාරක	5.36%
විදුලි සංදේශ සේවා	2.41%
අමුද්‍රව්‍ය	2.68%
පාරිභෝගික ප්‍රධාන ද්‍රව්‍ය	1.11%
දේපළ	0.30%
බලශක්ති	0.52%
උපයුක්තතා	0.86%

ක්ෂේත්‍ර වෙන්කිරීම - ලැයිස්තුගත ස්කන්ධ 2021.12.31. දිනට සාමාන්‍ය අරමුදල

%



මූල්‍ය	68.65%
සෞඛ්‍ය සත්කාරක	12.37%
කාර්මික	11.62%
උපයුක්තතා	5.51%
විදුලි සංදේශ සේවා	0.60%
අමුද්‍රව්‍ය	0.47%
පාරිභෝගික ප්‍රධාන ද්‍රව්‍ය	0.07%
බලශක්ති	0.71%

ද්‍රවශීලතා අවදානම

ආයෝජන වත්කම් මිලදී ගැනීමේදී හෝ විකිණීමේදී දැරීමට සිදුවිය හැකි අලාභයන් ද්‍රවශීලතා අවදානම යටතේ කාණ්ඩගත කල හැකි වේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් භාණ්ඩාගාර බැඳුම්කර වැනි ඉහළ ද්‍රවශීල වත්කම් වල සිය අරමුදල් වලින් ප්‍රමුඛ කොටස ආයෝජනය කරමින් අදාළ අරමුදල් වල ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලනු ලැබේ. ජීවිත අරමුදල සහ සාමාන්‍ය අරමුදල එකිනෙකට වෙනස් ද්‍රවශීලතා අවශ්‍යතා සහ ආයෝජන අවකාශයන්ගෙන් සමන්විත වේ. එමනිසා අදාළ අරමුදල් වල කල්පිරීමේ ස්වරූපයන් ද්‍රවශීලතා අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි ව්‍යුහගත කිරීමේදී සමාගම ඒ සඳහා නිසි අවධානය යොමු කරයි. ආයෝජන සංකේන්ද්‍රණ සීමාවන් සහ ද්‍රවශීල නොවන සාධනපත්‍රයන්හි ආයෝජන සම්බන්ධයෙන් අභ්‍යන්තරව සකසන ලද දැඩි සීමාකාරී තත්ත්වයන් ඔස්සෙ ද්‍රවශීලතා අවදානම පහත හෙළනු ලැබේ.

ණය අවදානම

පොලිය සහ/හෝ ප්‍රාග්ධනය නොපියවීම හේතුවෙන් උද්ගත විය හැකි අලාභ ණය අවදානම වශයෙන් හැඳින්වේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් ආයෝජන වරනයන් තෝරාගැනීමේදී අනුගමනය කෙරෙන දැඩි ක්‍රියාපටිපාටිය ඔස්සේ මෙම අවදානම පහත හෙළනු ලැබේ. විශේෂයෙන්ම අවිනිශ්චිත කාලසමයන්හිදී ඉහළ අවදානම් කාණ්ඩයන් වෙත නිරාවරනය වීම වළකාලීමේ අරමුණින් යුතුව, ආයෝජන වත්කම් තත්ත්වය ඉහළ මට්ටමින් පවත්වාගෙන යාම උදෙසා ආයෝජනයන්හි ණය අවදානම ප්‍රබල අයුරින් නිරීක්ෂණය හා කළමනාකරණය සිදුකෙරේ.

සංකේන්ද්‍රණ අවදානම

කළඹ වල අවදානම ප්‍රමාණවත් අයුරින් වෙන් නොකිරීම, අවිනිශ්චිතතා ඉහළ මට්ටමක පවතින අවස්ථාවකදී අදාළ කළඹ අනවශ්‍ය අවදානම් වෙත පමණට වඩා නිරාවරනය වීම කෙරෙහි හේතු විය හැක. එහිදී කළඹ විශාල වශයෙන් සංකේන්ද්‍රණගත නම්, අදාළ කාණ්ඩයන්හි අව කාර්යසාධනය සමස්ත කළඹ කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කල හැක. සංකේන්ද්‍රණ අවදානම අවම කරගැනීම සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අයෝජන විවිධාංගීකරණයට ලක් කොට ඇත.

මෙහෙයුම් අවදානම

මානව දෝෂ හා වංචා ඇතුලුව මෙහෙයුම් ක්‍රියාපටිපාටීන්හි ප්‍රමාද දෝෂයන් හේතුවෙන් අලාභ දැරීමට සිදුවීමේ අවදානම මෙහෙයුම් අවදානම යටතට ගැනේ. මෙම අවදානම අවම කරගැනීම සඳහා කාර්යභාරයන් විමධ්‍යගත කිරීම, ද්විත්ව පාලනයන්, දැඩි ප්‍රතිපත්ති සහ විධිමත් විගණනයන් සමගින් සේවා සංග්‍රහයන් යොදාගැනේ.

කල්පිරීමේ ස්වරූපය
ජීවිත අරමුදල 2021.12.31. දිනට

%



<1 වසර	7.78%
1-2 වසර	26.47%
2-5 වසර	32.47%
5-10 වසර	16.98%
> 10 වසර	16.30%

කල්පිරීමේ ස්වරූපය
සාමාන්‍ය අරමුදල 2021.12.31. දිනට

%



<1 වසර	37.48%
1-2 වසර	33.98%
2-5 වසර	28.57%

අවදානම් කළමනාකරණ වාර්තාව

තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් කළමනාකරණය

අපගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අප විසින් වැඩිදියුණු කිරීම් රැසක් සිදු කරන ලදී. මෙම වසරේදී අප විසින් අවම බාධා සහිත ව්‍යාපාරයන් සඳහා වඩාත් යහපත් සේවා මට්ටමේ කැපවීමක් සමගින් අපගේ ආපදා ප්‍රතිසාධන පදනම් වැඩිදියුණු කිරීමට කටයුතු කෙරිණි. සිදුවිය හැකි සයිබර් ආරක්ෂණ තර්ජන වලින් ආරක්ෂා වීම සඳහා සුරක්ෂිත තොරතුරු සහ අවස්ථා කළමනාකරණය (SIEM) සහ ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC) ඇරඹීම ඉන් සමහරකි. අඛණ්ඩවම අපගේ ආරක්ෂණ තාක්ෂණ වපසරිය ඉහළ නැංවීමට කටයුතු කරනු ලබන අතරතුර, සයිබර් ආරක්ෂාව සහ අදාළ යහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් භාවිත කරන්නන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම කෙරෙහිද අපගේ අවධානය යොමු විය. තවද, තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් සහ අදාළ අවදානම් ලැයිස්තුව ව්‍යවසාය අවදානම් කළමනාකරණ අංශය සමග එක්ව තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය මගින් ආවර්තිතව සමාලෝචනය කරනු ලැබේ. මෙකී සමාලෝචනයන්හි ප්‍රතිඵල කාලෝචිතව යාවත්කාලීන කෙරෙන අතර අවශ්‍ය උපදෙස් සඳහා අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ.

අභ්‍යන්තර (තොරතුරු තාක්ෂණ ආරක්ෂණ කණ්ඩායම) සහ බාහිර පාර්ශ්වයන් (තොරතුරු පද්ධති විගණකවරුන්) විසින් අවදානම් තක්සේරුකරණයන් ඔස්සේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් නිරන්තරව නිරීක්ෂණය කෙරේ. ඉන් අනතුරුව, වඩාත් සුරක්ෂිත තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා සැපයුමක් තහවුරු කරමින් මෙකී අවදානම් තක්සේරුකරණයන්හි ප්‍රතිඵල දුර්වලතා මගහරවා ගැනීම සඳහා භාවිත කෙරේ.

සයිබර් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ කෝණයෙන් බලන කල, ව්‍යවසාය අවදානම් කළමනාකරණ අංශය විසින්, චක්‍රලේඛ අංක යොමුව: 02/17/150/0095/001 යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සපයනු ලැබ අති ආකෘතිය අනුගමනය කරමින්, 2021 දී කාර්තුමය වශයෙන් ප්‍රධාන තොරතුරු නිලධාරියාගෙන් ''සයිබර් ආරක්ෂණ සිදුවීම් සම්බන්ධ වාර්තාවක්'' ලබාගැනුනු අතර එය අවදානම් කළමනාකරණ අනුකමිටුව වෙත භාරදෙන ලදී. තවද, අප විසින් සද්භාවයෙන් යුතුව අනුගත විය යුතු, සුරැකුම් හා විනිමය කොමිසම සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් එක්ව නිකුත් කරන ලද, 2017 සාංගමික පාලන සංග්‍රහයේ පී වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි යෝජනාවලිය 17 ට අනුව, අදාළ වාර්තා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙන ලදී.

මානව සම්පත් අවදානම

2021 වසර මධ්‍යයේ කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් උද්ගත වූ අවිනිශ්චිතතාව හමුවේ, ප්‍රධාන ව්‍යාපාර ක්ෂේත්‍රයන් වෙත සේවකයින් අනුයුක්ත කරමින් බාධාවකින් තොරව මෙහෙයුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මානව සම්පත් අංශ විවිධ ගැටලු රැසකට මුහුණ පෑවේය. සේවකයින් වසංගත වෙත නිරාවරනය වීමේ අවදානම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වූ අතර සෞඛ්‍ය අධිකාරීන් විසින් පනවන ලද මාර්ගෝපදේශයන්ට අනුගත වෙමින් දැඩි පාලනයන් ක්‍රියාත්මක කිරීමට අප හට සිදු විය.

කෙසේවුවද, කිසිදු සේවා අවහිරතාවයකින්, වටුප් කප්පාදු කිරීමකින් හෝ කවර හෝ ප්‍රතිලාභ පහත හෙළීමකින් තොරව අදාළ කටයුතු පවත්වාගෙන යාමට අප සමත් වූ අතර, එයට අමතරව අපගේ සේවාලාභීන් වෙත සේවාවෙහි ගුණාත්මකභාවයට හානි නොවන පරිදි අන්තර්ජාල/ඩිජිටල් මාධ්‍යයන් ඔස්සේ සේවා සැලසීමටත් එමගින් සේවකයින් හට අවදානමක් ඇතිවීම වැළැක්වීමටත් අප හට හැකි විය.

තවද, අප විසින් මානව සම්පත් අවදානම අවම කිරීම උදෙසා කෝවිඩ් කාර්ය බලකායක් සහ දුක්ගැනවිලි කමිටුවක් ස්ථාපනය කරන ලද අතර ඒවා මේ වන විටත් ක්‍රියාත්මක වේ.

වංචා සහ විෂමාචාර කළමනාකරණය

පහත දැක්වෙන පරිදි, අප වෙත අදාළ විවිධ වූ නීති රීති හා කොන්දේසි මගින්, අපගේ වංචා සහ විෂමාචාර විරෝධී ප්‍රයත්නයන් කෙරෙහි පුලුල් උපමානයක් සපයනු ලැබේ:

අ. ප්‍රති - මුදල් විශුද්ධිකරණ සහ ත්‍රස්ත්‍ර ක්‍රියා සඳහා අරමුදල් සැපයීමට එරෙහි ව්‍යවස්ථාව : 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (PMLA), සංශෝධිත 2006 අංක 6 දරණ මූල්‍යමය ගනුදෙනු වාර්තාකරණ පනත (FTRA), රක්ෂකයින්ගේ (සේවාලාභීන් කෙරෙහි නිසි උද්යෝගය) 2019 නීති අංක 01, එක්සත් ජාතීන්ගේ නිර්දේශිත ලැයිස්තු, මූල්‍ය බුද්ධි අංශය මගින් සම්පාදනය කරන ලද නීතිරීති හා කොන්දේසි සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි, ප්‍රති - මුදල් විශුද්ධිකරණ ආකෘතිය අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රති - මුදල් විශුද්ධිකරණ ක්‍රියාපටිපාටියක් අනුව ක්‍රියාත්මක වන අතර එය අප විසින් ප්‍රබල ආකාරයෙන් ක්‍රියාවට නංවනු ලැබ ඇත.

ආ. 1975 අංක 01 දරණ, වත්කම් හා වගකීම් හෙළදරව් කිරීමේ පනත: මෙම පනතෙහි අවශ්‍යතාවය ප්‍රකාරව අදාළ නිලධාරීන් විසින් වාර්ෂිකව සිය වත්කම් හා වගකීම් හෙළිදරව් කරනු ලැබේ.

ඇ. 1954 අංක 11 දරණ අල්ලස් පනත - . මෙම පනත යටතේ සිදුකෙරෙන විමර්ශනයන් වෙත අපගේ උපරිම සහයෝගය හිමි වේ.

ඈ. සංගමික පාලන සංග්‍රහයන් - වංචා වැළැක්වීමේදී අදාළ සංග්‍රහයන්හි අවශ්‍යතාවයන් වන මූලධර්ම වලට අනුකූලව අප කටයුතු කරන ලද අතර වංචා කළමනාකරණ ප්‍රතිපත්තියකද ක්‍රියාත්මක වේ.

අනුකූලතා වාර්තාව

රක්ෂණ ක්ෂේත්‍රයෙහි, වර්ධනය වන නියාමන අවශ්‍යතා සහ දිනෙන් දින වෙනස් වන ව්‍යාපාරික වටපිටාව හේතුවෙන් අනුකූලතා අවදානම් සම්බන්ධ වඩාත් ක්‍රියාකාරී කළමනාකරණයක් අවශ්‍ය වේ. විශේෂයෙන්ම, නිර්මාණය වෙමින් පවතින බහුවිධ නෛතික අවශ්‍යතා හමුවේ සේවාලාභී දත්ත සුරක්ෂිතතාව සහ රහස්‍යභාවය සම්බන්ධ තත්ත්වයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම මෙහිදී අනිවාර්ය වේ. මෙකී කරුණු සහ සෙසු වර්ධනීය තත්ත්වයන් තුළ දැනට බොහෝ රක්ෂකයින් සතු ක්‍රියාවලීන්ගෙන් ඔබ්බට ගිය වඩාත් ක්‍රියාකාරී, නූතන සහ ප්‍රබල අනුකූලතා ක්‍රියාවලියක අවශ්‍යතාවය ඉස්මතු වේ.

රක්ෂණ සේවා සම්පාදකයින් හට, අනුකූලතා අවශ්‍යතාවයන් වෙත දැඩි ලෙස අනුගත වීම අවශ්‍ය වන විනිවිදභාවය ප්‍රධාන සාධකයක් වන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තුළ අප විසින් අනුකූලතා අවශ්‍යතා දෛනික ව්‍යාපාරික ක්‍රියාකාරකම් සමග බද්ධ කොට සිදු කරනු ලැබේ. නියාමන වෙනසෙහි ශීඝ්‍රතාවය සහ පුලුල්භාවය රක්ෂණ සමාගම් වෙත අඛණ්ඩ අභියෝගයක් බවට පත්ව ඇති අතර, විශේෂයන්ම නව ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත(IFRS 17) මගින් වසර 20 ක් පුරා රක්ෂණ ගිණුම් අවශ්‍යතා වෙත වඩාත්ම කැපී පෙනෙන වෙනස නියෝජනය කරයි.

රජයේ හිමිකාරිත්වය සහිත සමාගමක් වශයෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, සීමිත වගකීම් සහිත සමාගම්, රක්ෂණ සමාගම් සහ රජයේ හිමිකාරිත්වය සහිත සමාගම් වලට අදාළ නීතිරීති හා රෙගුලාසි රැසකට යටත් වේ.

පහත දැක්වෙන වගුව මගින් සමාගමට අදාළ වන නෛතික ආකෘතිකරාමුව නිරූපනය කෙරේ:



අප විසින් අදාළ සියලුම ව්‍යවස්ථාවන්ට අනුගත වීම සඳහා කැප වී කටයුතු කරන අතර, එමනිසා අනුකූලතාවය හඳුනාගැනීම, නිරීක්ෂණය, වාර්තාකරණය සහ අනුකූලකාවය සකසා ක්‍රියාවේ යොදවනු ලබන බවට තහවුරු කෙරෙන්නා වූ විධිමත් අනුකූලතා ආකෘතිකරාමුවක් සමාගම සතුව පවතී. අනුකූලතා ප්‍රධානි විසින් නිරන්තර පදනමක් මත විගණන හා අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමත අනුකූලතා ප්‍රතිපත්තිය මගින් සමාගමෙහි අනුකූලතා ක්‍රියාවලිය සම්බන්ධ අරමුණු අත්පත් කරගැනීම සඳහා නිර්මිත උපදේශී ප්‍රතිපත්ති, මූලික සංරචකයන් සහ ක්‍රියාපටිපාටීන් විදහා දැක්වේ. නීතිරීති සහ කොන්දේසි වෙත අනුගත වීම අධ්‍යක්ෂ මණ්ඩලය පුරා ආදේශනය කොට ඇති බවට තහවුරු කරමින් සමාගමෙහි විධායක කමිටුව 'උසස්ම ස්ථානයෙහි දිශානතිය' 'මධ්‍යම මට්ටමේ මනෝභාවය' බවට පත් කිරීම සඳහා උපකාරී වේ.

අනුකූලතා අවදානම යන්න, අදාළ නීතිරීති, රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ මූලධර්ම සමග අනුගතවීමට අපොහොසත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි කීර්තිනාමයට සිදුවන අවදානම හෝ හානිය වශයෙන් නිර්වචනය කෙරෙන අතර අනෙක් අතින් අනුකූලතා අවදානම බලාත්මක අයුරින් කළමනාකරණය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් සමාගමට දඩ මුදල්, සිවිල් සහ අපරාධ දඬුවම් ආදියට නිරාවරනය වීමට සිදු වේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි ව්‍යාපාරික මූලධර්ම මගින් සෑම මට්ටකම සියලු සේවකයින්, නීතිරීති හා රෙගුලාසි වෙත අනුගතවීම පමණක් නොව සුපිළිපන්බවින් යුතුව වගවීම සහිතව කටයුතු කිරීම අවශ්‍ය වන බවට ප්‍රකාශයට පත් කෙරේ. මනා අනුකූලතා අවදානම් කළමනාකරණය සේවාලාභීන්ගේ සහ සෙසු පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම හා සම්බන්ධ වන බව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි අවබෝධය වේ.

අනිවාර්ය (රෙගුලාසි සහ ක්ෂේත්‍ර සංග්‍රහ ආදිය) සහ අභිප්‍රේත (ව්‍යාපාර ක්‍රමෝපාය සහ ආයතනික ප්‍රතිපත්ති ආදිය) සමතුලනය ඔස්සේ අනුකූලතා අවදානම් භාරගැනීමේ සූදානම නිර්මාණය කිරීමේ වගකීම සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. බලාත්මක අනුකූලකා කළමනාකරණය යනු, සමාගම තුළ පවතින අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, නෛතික හා මානව සම්පත් වැනි විවිධ වූ පාලන ක්‍රියාකාරකම් සාමූහීකරණය සහ පාලනය සිදු කරන්නා වූ සාමූහික ක්‍රියාවලියකි.

සමාගමෙහි අනුකූලතා අංශය මගින් අදාළ නීතිරීති හා කොන්දේසි සම්බන්ධයෙන් වගකිව යුතු අංශයන් හඳුනාගෙන ඇති අතර එමගින් අනුකූලතා අවශ්‍යතා සපුරාලීම උදෙසා සාමූහික ප්‍රයත්නයක් දරනු ලැබේ. ක්‍රියාකාරී පියවරක් වශයෙන්, අනුකූලතා අංශය මගින් කළමනාකාරීත්වය වෙත අනාගතයේදී අපේක්ෂිත රෙගුලාසි පිළිබඳව උපදෙස් ලබාදෙනුයේ, ක්‍රියාකාරී ව්‍යාපාර කළමනාකරණ ක්‍රියාවලීන් මගින් සමාගමට අදාළ නව රෙගුලාසි සම්බන්ධයෙන් අරපිරිමැසුම් ආකාරයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සපයනු ලබන බැවිනි.

අනුකූලතා වාර්තාව

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ත ක්‍රියා සඳහා මුදල් ලබාදීම තහනම් කිරීම සහ වැළැක්වීම සමාගමෙහි ප්‍රතිපත්තිය වේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් අදාළ නීතිරීති අනුව ප්‍රති මුදල් විශුද්ධිකරණය වෙත අනුකූලවීම සඳහා කැපවී ක්‍රියා කරන අතර, මුදල් විශුද්ධිකරණ අරමුණු උදෙසා සිය සැලසුම් හෝ සේවාවන් භාවිතයෙන් වැළකිය යුතු බවට එහි කළමනාකාරීත්වය, කාර්ය මණ්ඩලය, සහ පත් කරන ලද නියෝජිතයින් දැනුවත් කරමින් මෙකී සම්මතයන්ට අනුගත විය යුතු බවට ප්‍රකාශයට පත් කොට ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතුව මුදල් විශුද්ධිකරණය යනු කුමක්ද, එය සිදුකෙරෙනුයේ කෙසේද, සහ එය වළකාලීමේ පියවර පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තරව සකසන ලද ඉලෙක්ට්‍රොනික අධ්‍යයන මොඩියුලයක්ද පවතී. මෙම ක්‍රියාවලිය අවසානයේදී, සේවකයින් විභාගයකින් සමත් විය යුතු අතර කාර්යසාධන ඇගයුමේදී 5% ක් මෙම කරුණ සඳහා වෙන් කෙරේ.

අප සතුව විස්ල්බ්ලෝවින්ග් ප්‍රතිපත්තියක් පවතින අතර විස්ල්බ්ලෝවින්ග් නිලධාරීවරයා වන අනුකූලතා නිලධාරී විසින් සමාගම තුළ අදාළ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන බවට තහවුරු කෙරේ. ව්‍යාපාර කටයුතු සිදුකිරීමේදී සකසන ලද නීති, ප්‍රතිපත්ති, වටිනාකම්, සම්මතයන් සහ අනුකූලතාවයන් අනුව සමාගමෙහි සාමාජිකයින් කටයුතු කරන බවට තහවුරු කිරීම සඳහා ''අධ්‍යක්ෂවරුන්, ප්‍රමුඛ කළමනාකාරීත්වය සහ සෙසු සියලු සේවකයින් සඳහා වන ව්‍යාපාර චර්යා සහ ආචාරධර්ම සංග්‍රහයක්'' නිර්මාණය කොට ඇත.

අනුකූලතා අංශය මගින් අංශ වශයෙන් පුහුණුව ලබාදෙමින් අභ්‍යන්තර සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ 'අනුකූලතා හෝඩුවාවන්' ලබාදෙමින් ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය දැනුවත් කරයි. අනාගතයේදී අනුකූලතා කළමනාකරණයෙහි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අරමුණින් නිපුණ අනුකූලතා ප්‍රාග්ධනයක් භාවිත කිරීම සඳහා පියවර ගනිමින් සමාගම මගින් සිය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදුකෙරේ. විමර්ශනයට ලක් වන වසර තුළ, සමාගම වෙත අනුකූලතා වටපිටාව ආශ්‍රිත ප්‍රමුඛතා අනුගත කිරීම උදෙසා අනුකූලතා අංශය මගින් ''ඉලෙක්ට්‍රොනික වාණිජ නීති සහ සයිබර් සුරක්ෂිතතාව'' වැනි නව විෂයපථයන් අළලා පුහුණු සැසි පවත්වන ලදී. 2022 දී, ''දත්ත සුරක්ෂිතතාව'' වැනි ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන්ද එවැනි සැසි සංවිධානය කිරීමට අපේක්ෂිතය.

අනුකූලතා අවදානම් ක්ෂේත්‍රය තුළ, සිව් ආරක්ෂණ ධාරා ආකෘතිය ආදේශ කෙරිණි: අදාළ අංශයන්හි අවදානම් සහකරුවන් වශයෙන් හදුනාගත් අවදානම් හිමිකරුවන් පළමු ආරක්ෂණ ධාරාව වශයෙන් කටයුතු කරයි: අවදානම් කළමනාකරණ කමිටුව සහ විගණන හා අනුකූලතා කමිටුව දෙවන ආරක්ෂණ ධාරාව වේ: මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් තෙවන ආරක්ෂණ ධාරාව වශයෙන් අභ්‍යන්තර විගණන අංශය කටයුතු කරයි: නියාමනය, එනම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම සහ බාහිර විගණකවරුන් (2010 අගෝස්තු 23 වැනි දිනැති, චක්‍රලේඛ අංක. 29) සිව් වන ආරක්ෂණ ධාරාව වේ. අනුකූලතා අවදානම් න්‍යායපත්‍රය විගණන න්‍යායපත්‍රයට ද්විතීයික නොවන බවට තහවුරු කිරීම පිණිස, අනුකූලතා අංශය විගණන හා අනුකූලතා කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව යන ද්වි කමිටුවටම වාර්තා කරයි.

පහත දැක්වෙන කරුණු ස්ථාපිත බවට තහවුරු කිරීම ඔස්සේ අනුකූලතා අවදානම ඇතිවීමේ හැකියාව අවම කරනු ලැබ ඇත: අනුකූලතා සහ අවදානම් කළමනාකරණය සම්බන්ධ සමෝධානික නිරීක්ෂණය: විවෘත හා විනිවිදභාවයෙන් යුතු වාර්තාකරණය කෙරෙහි සහාය දැක්වීම: සහ පාර්ශ්වකරුවන් සමග සබඳතා ගොඩනගා ගැනීම ඒ අතර වේ. ආචාරධර්ම හා යහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අනුකූලතා ආකෘතිය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව, නිවැරදි කිරීමේ සහ වළකාලීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අනුකූලතා ගැටලු සහ සිදුවීම් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත ඉදිරිපත් කෙරේ.

කෝවිඩ් 19 වටපිටාව මධ්‍යයේ, මූල්‍යමය අපරාධ සම්බන්ධයෙන් දැනුවත් වීමේ සහ සයිබර් නම්‍යශීලී පියවර ගැනීමේ වැදගත්කම පිළිබඳව අපගේ අවධානය යොමු විය. අනන්‍යතාවය සොරාගැනීම, ව්‍යාජ ඊ මේල් සහ වෙබ් අඩවි භාවිතය සහ කප්පම් ප්‍රහාරයන් ඔස්සේ සේවා සැපයුම බිඳවැටීමට කටයුතු කිරීම වැනි සයිබර් අපරාධ ලොව පුරා ඉහළ යමින් පවතී. දත්ත සුරක්ෂිතතාව සහ නොදැනුවත්ව ත්‍රස්ත ක්‍රියා සඳහා මුදල් සැපයීම වැනි උද්ගත වෙමින් පවතින අනුකූලතා අවදානම් කෙරෙහි අපගේ දැඩි අවධානය යොමු වේ.

විමර්ශනයට ලක් වන වසර තුළදී, බාහිර විගණකවරයාගේ වාර්තාවේ හෙළිදරව් කිරීම්, මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සහ සාංගමික පාලන වාර්තාව ආශ්‍රයෙන්, පහත වගු ගත කොට ඇති පරිදි සමාගම සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා, නීතිරීති හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කොට ඇත.

සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම

නියාමනමය සහ ව්‍යවස්ථාපිත අනුකූලතාවය - 2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා
නියාමනමය/නිරීක්ෂණ අධිකාරීන් වෙත ආදායම් සහ ගෙවීම් අනුකූලතා වාර්තාව භාරදීම

නියාමනමය/ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	ආදායම්/ගෙවීම් භාරදීමේ වාර ගණන	භාරදීම්/ගෙවීම් සිදුකල යුතු දිනය	සිදු කරන ලද දිනය	අනුකූලතාවය සහ සටහන්
කාලපරිච්ඡේදය තුළ නියාමනමය/ව්‍යවස්ථාපිත/සිදු කල යුතු ගෙවීම්				
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම				
රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනතෙහි වගන්ති 49 (බී) මගින් ව්‍යවස්ථාපිත ප්‍රකාර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම වෙත කාර්තුමය ආදායම්				
2012 අප්‍රියෙල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධිත රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනතෙහි වගන්ති 49 (බී) මගින් ව්‍යවස්ථාපිත ප්‍රකාර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම වෙත කාර්තුමය ආදායම් (49 ආකෘති)				
නිර්ණය කිරීමේ ආකෘති	කාර්තුමය වශයෙන් කාර්තුව අවසන් වීමට දින 45 ක් ඇතුළත	4 වැනි කාර්තුව (20) - පෙබරවාරි 15 වැනි දින	15.02.2021	
		1 වැනි කාර්තුව (21) - මැයි 15 වැනි දින	15.05.2021	
		2 වැනි කාර්තුව (21) - අගෝස්තු 15 වැනි දින	13.08.2021	
		3 වැනි කාර්තුව (21) - නොවැම්බර් 15 වැනි දින	15.11.2021	
අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (ආකෘති) - සාමාන්‍ය	කාර්තුමය වශයෙන් කාර්තුව අවසන් වීමට දින 45 ක් ඇතුළත	4 වැනි කාර්තුව (20) - පෙබරවාරි 15 වැනි දින	15.02.2021	
		1 වැනි කාර්තුව (21) - මැයි 15 වැනි දින	15.05.2021	
		2 වැනි කාර්තුව (21) - අගෝස්තු 15 වැනි දින	13.08.2021	
		3 වැනි කාර්තුව (21) - නොවැම්බර් 15 වැනි දින	15.11.2021	
අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (ආකෘති) - ජීවිත	කාර්තුමය වශයෙන් කාර්තුව අවසන් වීමට දින 45 ක් ඇතුළත	4 වැනි කාර්තුව (20) - පෙබරවාරි 15 වැනි දින	15.02.2021	
		1 වැනි කාර්තුව (21) - මැයි 15 වැනි දින	15.05.2021	
		2 වැනි කාර්තුව (21) - අගෝස්තු 15 වැනි දින	13.08.2021	
		3 වැනි කාර්තුව (21) - නොවැම්බර් 15 වැනි දින	15.11.2021	
ශේෂපත්‍රය සහ ලාභ අලාභ ගිණුම	කාර්තුමය වශයෙන් කාර්තුව අවසන් වීමට දින 45 ක් ඇතුළත	4 වැනි කාර්තුව (20) - පෙබරවාරි 15 වැනි දින	15.02.2021	
		1 වැනි කාර්තුව (21) - මැයි 15 වැනි දින	15.05.2021	
		2 වැනි කාර්තුව (21) - අගෝස්තු 15 වැනි දින	13.08.2021	
		3 වැනි කාර්තුව (21) - නොවැම්බර් 15 වැනි දින	15.11.2021	
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම් චක්‍රලේඛ (සහතිකත්වය ඒ) යටතේ ප්‍රවිනි සහ ප්‍රමූනි සහ ප්‍රධාන නිලධාරීවරයාගේ කාර්තුමය සහතිකත්වය	කාර්තුමය වශයෙන් කාර්තුව අවසන් වීමට දින 45 ක් ඇතුළත	4 වැනි කාර්තුව (20) - පෙබරවාරි 15 වැනි දින	15.02.2021	
		1 වැනි කාර්තුව (21) - මැයි 15 වැනි දින	15.05.2021	
		2 වැනි කාර්තුව (21) - අගෝස්තු 15 වැනි දින	13.08.2021	
		3 වැනි කාර්තුව (21) - නොවැම්බර් 15 වැනි දින	15.11.2021	
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම් චක්‍රලේඛ (සහතිකත්වය බී) යටතේ ප්‍රවිනි සහ ප්‍රමූනි සහ ප්‍රධාන නිලධාරීවරයාගේ කාර්තුමය සහතිකත්වය	කාර්තුමය වශයෙන් කාර්තුව අවසන් වීමට දින 45 ක් ඇතුළත	4 වැනි කාර්තුව (20) - පෙබරවාරි 15 වැනි දින	15.02.2021	
		1 වැනි කාර්තුව (21) - මැයි 15 වැනි දින	15.05.2021	
		2 වැනි කාර්තුව (21) - අගෝස්තු 15 වැනි දින	13.08.2021	
		3 වැනි කාර්තුව (21) - නොවැම්බර් 15 වැනි දින	15.11.2021	

අනුකූලතා වාර්තාව

නියාමනමය/ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	ආදායම්/ගෙවීම් භාරදීමේ වාර ගණන	භාරදීම්/ගෙවීම් සිදුකල යුතු දිනය	සිදු කරන ලද දිනය	අනුකූලතාවය සහ සටහන්
වැඩිදුර ආදායම්				
1) ප්‍රතිරක්ෂණ ගිවිසුම් ආවරන සටහන්	වාර්ෂිකව	එළඹෙන වසරේ මාර්තු 15 වැනි දිනට පෙර	15.03.2021	
2) ප්‍රතිරක්ෂණ අවදානම මාරුකිරීමේ වැඩසටහන (වර්ෂ 2020)	වාර්ෂිකව	31.01.2021 දින හෝ එයට පෙර	29.01.2021	
3) වෛකල්පිත ක්‍රියාදාමය	කාර්තුමය වශයෙන්	4 වැනි කාර්තුව (20) - 2021 පෙබරවාරි 15	15.02.2021	
		1 වැනි කාර්තුව (21) - 2021 මැයි 15	15.05.2021	
		2 වැනි කාර්තුව (21) - 2021 අගෝස්තු 15	13.08.2021	
		3 වැනි කාර්තුව (21) - 2021 නොවැම්බර් 15	15.11.2021	
2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත යටතේ වාර්ෂික ගොනුගත කිරීම				
අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (ආකෘති) - සාමාන්‍ය	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (ආකෘති) - ජීවිත	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
නිර්ණය කිරීමේ ආකෘති	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
ශේෂපත්‍රය සහ ලාභ අලාභ ගිණුම	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
ආයුගණන වාර්තාව සහ සාරාංශ	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
වෙනත් ආකෘති				
1. අවදානම් තක්සේරුකරණ වාර්තාව	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	28.04.2021	
2. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
3. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය - රක්ෂකයා විසින් පනතෙහි විධිවිධාන වෙත අනුකූලතාවය සම්බන්ධ සහතිකත්වය	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
4. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය - රක්ෂකයා විසින් පනතෙහි විධිවිධාන වෙත අනුකූලතාවය සම්බන්ධ සහතිකත	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
5. සමාගමෙහි වාර්ෂික වාර්තාව	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	06.07.2021	සමූහ විගණන අංශයෙහි අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රමාදය හේතුවෙනි
6. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි චක්‍රලේඛ 29 සම්බන්ධ සාධනීය සොයාගැනීම් ආශ්‍රිත විගණකවරුන්ගේ වාර්තාව	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම වෙත 2021.04.30 දින දළ පිටපතද 2021.08.06 දින අවසන් පිටපතද භාරදෙන ලදී	

නියාමනමය/ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	ආදායම්/ගෙවීම් භාරදීමේ වාර ගණන	භාරදීම්/ගෙවීම් සිදුකල යුතු දිනය	සිදු කරන ලද දිනය	අනුකූලතාවය සහ සටහන්
7. කළමනාකාරීත්ව ලිපිය	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	05.11.2021	සමූහ විගණන අංශයෙහි අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රමාදය හේතුවෙනි
8. අනුකූලතා සහතිකත්වය ඒ - දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය අනුකූලතා සහතිකත්වය ඒ - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
9. අනුකූලතා සහතිකත්වය බී	වාර්ෂිකව	2020 වසර අවසානය - 2021 අප්‍රියෙල් 30	30.04.2021	
ගෙවීම්				
ශුද්ධ වාරිකයෙන් සෙස් පීවිත 0.2%, සාමාන්‍ය 0.4%	කාර්තුමය	4 වැනි කාර්තුව (20) - ජනවාරි 31 වැනි දින	27.01.2021	
		1 වැනි කාර්තුව (21) - අප්‍රියෙල් 30 වැනි දින	29.04.2021	
		2 වැනි කාර්තුව (21) - ජූලි 31 වැනි දින	28.07.2021	
		3 වැනි කාර්තුව (21) - ඔක්තෝබර් 31 වැනි දින	27.10.2021	
වාර්ෂික ගාස්තු	වාර්ෂිකව	විගණිත ගිණුම් වලින් එක් මසකට පසු හෝ එළඹෙන වසරේ ජූලි 31 වැනි දිනට පෙර	29.04.2021	
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව				
ආදායම්				
එකතු කල අගය මත බදු ආදායම්	කාර්තුමය	4 වැනි කාර්තුව (20) - ජනවාරි 31 වැනි දින	31.01.2021	
		1 වැනි කාර්තුව (21) - අප්‍රියෙල් 30 වැනි දින	30.04.2021	
		2 වැනි කාර්තුව (21) - ජූලි 31 වැනි දින	31.07.2021	
		3 වැනි කාර්තුව (21) - ඔක්තෝබර් 31 වැනි දින	31.10.2021	
මුද්දර ගාස්තු	කාර්තුමය	4 වැනි කාර්තුව (20) - ජනවාරි 31 වැනි දින	14.01.2021	
		1 වැනි කාර්තුව (21) - අප්‍රියෙල් 30 වැනි දින	12.04.2021	
		2 වැනි කාර්තුව (21) - ජූලි 31 වැනි දින	15.07.2021	
		3 වැනි කාර්තුව (21) - ඔක්තෝබර් 31 වැනි දින	15.10.2021	
උපයන විට ගෙවීමේ බදු (PAYE) ආදායම	වාර්ෂිකව	2020 - 2021 අප්‍රියෙල් 30	නියමිත දිනට ගෙවන ලදී	
වගා රක්ෂණ බද්ද	කාර්තුමය	3 වැනි කාර්තුව (20) - ජනවාරි 30 වැනි දින	29.01.2021	
		4 වැනි කාර්තුව (20) - අප්‍රියෙල් 30 වැනි දින	29.04.2021	
		1 වැනි කාර්තුව (21) - ජූලි 30 වැනි දින	30.07.2021	
		අවසාන (20) - සැප්තැම්බර් 30 වැනි දින	30.09.2021	
		2 වැනි කාර්තුව (21) - ඔක්තෝබර් 30 වැනි දින	29.10.2021	

අනුකූලතා වාර්තාව

නියාමනමය/ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	ආදායම්/ගෙවීම් භාරදීමේ වාර ගණන	භාරදීම්/ගෙවීම් සිදුකල යුතු දිනය	සිදු කරන ලද දිනය	අනුකූලතාවය සහ සටහන්
ගෙවීම්				
එකතු කල අගය මත බදු	මාසිකව	එළඹෙන මාසයේ 20 වැනි දින	නියමිත දිනට ගෙවන ලදී	
උපයන විට ගෙවීමේ බදු (PAYE)	මාසිකව	එළඹෙන මාසයේ 15 වැනි දින	නියමිත දිනට ගෙවන ලදී	
ආදායම් බදු	කාර්තුමය	පෙබරවාරි 15 වැනි දින හෝ එයට පෙර	15.02.2021	
		මැයි 15 වැනි දින හෝ එයට පෙර	13.05.2021	
		අගෝස්තු 15 වැනි දින හෝ එයට පෙර	13.08.2021	
		සැප්තැම්බර් 15 වැනි දින හෝ එයට පෙර	30.09.2021	
		නොවැම්බර් 15 වැනි දින හෝ එයට පෙර	15.11.2021	
මුද්දර ගාස්තු	කාර්තුමය	4 වැනි කාර්තුව (20) - ජනවාරි 15 වැනි දින	15.01.2021	
		1 වැනි කාර්තුව (21) - අප්‍රියෙල් 15 වැනි දින	12.04.2021	
		2 වැනි කාර්තුව (21) - ජූලි 15 වැනි දින	15.07.2021	
		3 වැනි කාර්තුව (21) - ඔක්තෝබර් 15 වැනි දින	15.10.2021	
වගා රක්ෂණ බද්ද	කාර්තුමය	3 වැනි කාර්තුව (20) - ජනවාරි 30 වැනි දින	29.01.2021	
		4 වැනි කාර්තුව (20) - අප්‍රියෙල් 30 වැනි දින	29.04.2021	
		1 වැනි කාර්තුව (21) - ජූලි 30 වැනි දින	30.07.2021	
		අවසාන (20) - සැප්තැම්බර් 30 වැනි දින	ගෙවීමක් නොමැත	
		2 වැනි කාර්තුව (21) - ඔක්තෝබර් 30 වැනි දින	29.10.2021	
රදවාගැනීමේ බද්ද	මාසිකව	2020.01.01. දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලදී		
ශ්‍රී ලංකා මහ බැංකුව				
සේවක අර්ථසාධක අරමුදල් ආදායම්	ද්වි වාර්ෂිකව	ජනවාරි 31 සහ ජූලි 31	නියමිත දිනට ගෙවන ලදී	
ප්‍රති මුදල් විශුද්ධිකරණ ආදායම්				
1. මුදල් ගනුදෙනු වාර්තාව	මාසිකව	එළඹෙන මාසයේ 15 වැනි දින	නියමිත දිනට ගෙවන ලදී	
2. අවනිශ්චිත ගනුදෙනු වාර්තා	දින දෙකක් ඇතුළත	දින දෙකක් ඇතුළත	-	
සේවක අර්ථසාෂක අරමුදල් දායකත්වය	මාසිකව	එළඹෙන මාසයේ අවසන් වැඩ කරන දිනට එක් දිනකට පෙර	නියමිත දිනට ගෙවන ලදී	

නියාමනමය/ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය	ආදායම්/ගෙවීම් භාරදීමේ වාර ගණන	භාරදීම්/ගෙවීම් සිදුකල යුතු දිනය	සිදු කරන ලද දිනය	අනුකූලතාවය සහ සටහන්
සේවක භාරකාර අරමුදල් මණ්ඩලය				
සේවක භාරකාර අරමුදල් මණ්ඩල ආදායම්	ද්වි වාර්ෂිකව	ජනවාරි 31 සහ ජූලි 31	නියමිත දිනට ගෙවන ලදී	
සේවක භාරකාර අරමුදල් මණ්ඩල ආදායම් දායකත්වය	මාසිකව	එළඹෙන මාසයේ අවසන් වැඩ කරන දිනට එක් දිනකට පෙර	නියමිත දිනට ගෙවන ලදී	
මෝටර් රථවාහන රෙජිස්ට්‍රාර්				
ගෙවීම - සුඛෝපභෝගී සහ අර්ධ සුඛෝපභෝගී බද්ද	මාසිකව	එළඹෙන මාසයේ 15 වැනි දින	නියමිත දිනට ගෙවන ලදී	
සමාගම් රෙජිස්ට්‍රාර්				
මූල්‍ය ප්‍රකාශ ලියාපදිංචි කිරීම	වාර්ෂිකව	සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන්ගෙන් අනතුරුව වැඩ කරන දින 20 ක් ඇතුළත		
ප්‍රවාහන අමාත්‍යාංශය				
ගෙවීම - මාර්ගස්ථ ආරක්ෂණ අරමුදල	මාසිකව	එළඹෙන මාසයේ 15 වැනි දින	නියමිත දිනට ගෙවන ලදී	
මහනගර/නගර සභාව				
ගෙවීම - ගාස්තු සහ බදු	වාර්ෂිකව	වර්තමාන වසරේ ජනවාරි 31 වැනි දින (ප්‍රතිපූර්ණය සඳහා)	නියමිත දිනට ගෙවන ලදී	
ජාතික රක්ෂණ භාර අරමුදල				
ගෙවීම - එස්ආර්සීසී සහ ත්‍රස්තක්‍රියා අරමුදල	මාසිකව	මාසය අවසානයේ සිට දින 45 ක් ඇතුළත	නියමිත දිනට ගෙවන ලදී	
සේවක වන්දි කොමසාරිස්				
රක්ෂණ	වාර්ෂිකව	මැයි 30 වැනි දිනට පෙර	නියමිත දිනට ගෙවන ලදී	

අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශය

ප්‍රබල අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බවට තහවුරු කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණය සම්බන්ධ පරම අධීක්ෂණය සහ දිශානතිය සැපයීම සිදුකෙරේ. පාර්ශ්වකාර අභිමතයන් සුරැකීමේදී එහි බලාත්මකභාවය තහවුරු කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් අංශයන්හි වර්ධනයන් සම්බන්ධයෙන් අවධානයෙන් කටයුතු කරයි.

සමාගමෙහි සමස්ත අවදානම් කළමනාකරණ ආකෘතියෙහි වැදගත් කොටසක් ප්‍රබල අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් වලින් සමන්විත වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනාගෙන ඇත. අපේක්ෂිත ප්‍රතිඵල සහ ක්‍රමෝපායික අරමුණු අත්කර ගැනීමට අපොහොසත්වීම සම්බන්ධයෙන් වන සියලුම අවදානම් තුරන් කිරීමට වඩා, අදාළ අවදානම සාධාරණ මට්ටමකට කළමනාකාරණය කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය සකසනු ලැබ ඇත. මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගවීමේ ධාරාවන් සහ විමධ්‍යගත අධිකාරිත්වය පැහැදිලිව විදහා දැක්වෙන විස්තරාත්මක සාංගමික් ව්‍යුහයක් සහ අනුකමිටු පහක් ස්ථාපනය කරනු ලැබ ඇත. අදාළ අනුකමිටු පහ වනුයේ, විගණන හා අනුකූලතා, අවදානම් කළමනාකරණ, මානව සම්පත්, ආයෝජන සහ ක්‍රමෝපායික සමාලෝචන යන කමිටු වේ. ප්‍රධාන කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රඥප්ති මගින් පාලනය වන අතර යහ පාලනය ආශ්‍රිත මූලික ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියාත්මක වේ.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණ පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන ක්‍රියාකාරකම් වැනි අංශයන්හි සිය අධීක්ෂණ වගකීම් සපුරාලීම සඳහා විගණන සහ අනුකූලතා කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වයි. අභ්‍යන්තර විගණන අංශය මගින්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සමග මෙහෙයුම් වල අනුකූලතාවය නිශ්චය කෙරෙන අතර අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රමාණවත්බව විමසුමට ලක් කරමින් කවර හෝ අනනුකූලතාවයක් සම්බන්ධ සැළකිය යුතු සොයාගැනීම් අනාවරනය කෙරේ. සියලුම ඒකක සහ ශාඛා සම්බන්ධයෙන් විගණනයන් සිදුකෙරෙන අතර, මෙකී ඒකක සහ ශාඛාවන්හි මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාකාරකම් ආශ්‍රිත විෂයමූලික සහ ස්වාධීන වාර්තාවක් ලබාදීම උදෙසා තක්සේරු කරන ලද අවදානම අනුව ඒවායේ වාර ගණන තීරණය කෙරේ. වාර්ෂික විගණන සැලසුම විගණන කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කෙරෙන අතර විගණනයන් මගින් සොයා ගන්නා ලද කරුණු ආවර්තිත රැස්වීම් වලදී විමර්ශනය සඳහා විගණන කමිටුව වෙත භාරදෙනු ලැබේ. ශාඛාමය විගණන වලදී අනාවරනය වූ කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කොට ඇත.

සමාගමෙහි පාලනය සඳහා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය වැදගත් වේ. අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් විගණන සහ අනුකූලතා කමිටුවෙහි ප්‍රධාන වගකීම වනුයේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය වේ. එයට අමතරව, බලාත්මක අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කොට පවත්වාගෙන යාමේ වගකීම කළමනාකාරිත්වය වෙත පැවරෙන අතර, අදාළ පාලනයන් නිරීක්ෂණය කරමින් සමස්තයක් වශයෙන් පද්ධතියේ බලාත්මකභාවය තහවුරු කිරීම විගණන සහ අනුකූලතා කමිටුවෙහි වගකීම වේ. පද්ධතිවේ කාර්යසාධනය නිරන්තර අධීක්ෂණ ක්‍රියාකාරකම්, අභ්‍යන්තර විගණනය වැනි වෙන් වූ තක්සේරුකරණයන් ඔස්සේ ඇගයුමට ලක් කෙරෙන අතර, හදුනාගත් පාලනයන්හි යෝග්‍යතාවය සහ බලාත්මකභාවය නිරීක්ෂණය කිරීම සඳහා වන ක්‍රියාපටිපාටීන් සමාගමෙහි සාමාන්‍ය මෙහෙයුම් තුළම අන්තර්ගත වේ.

සමාගමෙහි සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය වෙත සමෝධානය කරන ලද ප්‍රබල අනුකූලතා කළමනාකරණ පද්ධයක් පවතින අතර, ඒ පිළිබඳව අනුකූලතා අවදානම් කළමනාකරණ කොටසෙහි විස්තර කෙරේ. සමාගම් පනත, රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත යටත් ලියාපදිංචි රක්ෂණ සමාගමක් වශයෙන් සහ රාජ්‍ය හිමිකාරිත්වය සහිත සීමිත වගකීම් සමාගම් යටතේ පාලනය වන සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන්, අදාළ නෛතික අවශ්‍යතා වෙත අනුගත වීම සඳහා වන අනුකූලතා වැඩසටහනක් ක්‍රියාත්මක වේ. මෙහෙයුම් ආකෘතියෙහි සුපිලිපන්බව සහ ස්ථාවරත්වය සම්බන්ධ දරුණු ප්‍රතිවිපාක සමනය කිරීම සඳහා, නම් කරන ලද දත්ත පදනමක් සමගින් සේවාලාභීන් පරීක්ෂා කිරීම, සේවාලාභීන්ගේ නිසි අවධානය, සේවක ඇගයුම් ක්‍රියාවලියෙහි කොටසක් නිර්මාණය කරන ඉලෙක්ට්‍රොනික අධ්‍යයන මොඩියුලය, වාර්ෂික අභ්‍යන්තර විගණනය සහ ප්‍රති මුදල් විශුද්ධිකරණ ඇගයුම ආදියෙන් සමන්විත ප්‍රබල ප්‍රති මුදල් විශුද්ධිකරණ ආකෘතියක් අප විසින් ක්‍රියාවට නංවනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම වෙනම අවදානම් කමිටුවක් වෙත පවරනු ලැබ ඇති අතර, එමගින් දැඩි අවදානම් සහ අවදානම් කළමනාකරණ හැකියාවන් පිළිබඳ අවධානය යොමු කෙරේ. සමාගම පුරා සුදුසු අවදානම් පිළිබඳ දැනුවත්භාවය ව්‍යාප්ත කෙරන වටපිටාවක් නිර්මාණය කරමින්, සමාගමෙහි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් සමාගමේ ක්‍රමෝපාය සහ අවදානම් භාරගැනීමේ සූදානම සමග සංගතව ක්‍රියාත්මක වන බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත් වේ. අවදානම් අංශය සමාගමෙහි අනුකමිටු නියෝජනය කරන අතර ඒවා නම් වශයෙන්, විධායක කමිටුව, විගණන පසුවිපරම් කමිටුව සහ සැලසුම් නිර්මාණ කමිටුව ආදිය වේ. ඒ අනුව, ව්‍යවසාය අවදානම් කළමනාකරණය මගින් අවදානම් දෘෂ්ටිකෝණයෙන් පරිබාහිර වූ මතයක් සපයනු ලබන අතර, එමගින් අවදානම් බලපෑම සැළකිල්ලට ගනිමින් වඩාත් දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ අවස්ථාව කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩඩලය වෙත උදා වේ.

ඉංජිනේරු විජිත හේරත්
සභාපති

ඩබ්. ඒ. සමන්ත උපනන්ද
සභාපති - විගණන හා අනුකූලතා කමිටුව

2022 මැයි 24 වැනි දින

මූල්‍ය වාර්තා

116 - සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
120 - අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව
121 - ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ වගකීම පිළිබඳ ප්‍රකාශය
122 - වගකීම් ප්‍රමාණවත්තා පරීක්ෂාව
123 - වගකීම් ප්‍රමාණවත්තා පරීක්ෂාව
124 - දරන ලද නමුත් ප්‍රමාණවත් නොවන වාර්තාගත හිමිකම්පෑම් පිළිබඳ සහතිකය
125 - ස්වාධීන විගණකවරුන්ගේ ප්‍රකාශය
128 - මූල්‍යමය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය
130 - ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
132 - ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
138 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය
140 - ආංශික විමර්ශනය : මූල්‍යමය ස්ථාවරය පිළිබඳ ප්‍රකාශය
142 - අංශික විමර්ශනය : ආදායම් ප්‍රකාශය
144 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

LEADER-SHIP

නායකත්වය

අපගේ ක්‍රමෝපාය සංකල්පීය මට්ටමේ සිට ප්‍රායෝගිව ක්‍රියාත්මක කිරීම දක්වා ගෙන ඒමේදී පැහැදිලි දැක්මක් සහිත නායකත්වය මූලිකාංගයක් විය

සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

පොදු කරුණු

සාංගමික පාලන යහ ක්‍රියාකාරකම් පිළිබඳ 2007 අංක 07 දරණ සමාගම් පනත, සංශෝධිත 2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත සහ 1995 ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අංක 15 සහ එයට සිදුකරන ලද සංශෝධනයන්හි අවශ්‍යතා අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ සමාගමෙහි සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධව වාර්ෂික වාර්තාව කොටස් හිමියන්ට ඉදිරිපත් කිරීමට ලැබීම සමාගමෙ හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සතුටට කරුණක් වේ.

2021 දෙසැම්බර් 31 දිනට, ශ්‍රී ලංකා රජය වෙනුනේ කොටස් වලින් 99.97% ක් භාණ්ඩාගාර ලේකම්වරයා භාරයේ පැවතිනි. ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම, කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම සහ මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පුද්ගලික සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමෙහි පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතයන් වේ. සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමෙහි 99.94% ක සහ ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී හි 51.34% ක කොටස් හිමිකාරිත්වයක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතු වේ. එයට අමතරව, කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි 52.05% ක කොටස් හිමිකාරිත්වයක් ද ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සතු වේ.

සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය ''රක්ෂණ මන්දිරය'', අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02. යන ස්ථානයේ පිහිටා ඇත.

මෙම වාර්තාව 2022 මැයි 24 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

සමාගමෙහි සහ සමූහයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්

සමාගම මගින් ශ්‍රී ලංකාව තුළ ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ (සාමාන්‍ය රක්ෂණ) ව්‍යාපාරයන් ප්‍රාරක්ෂණය කරනු ලැබේ. විමර්ශනයට ලක් වන වසර තුළ සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වල කිසිදු කැපී පෙනෙන වෙනසක් සිදුනොවීය. ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගමෙහි ප්‍රධාන කාර්යය ලික්විඩ් පෙට්‍රෝලියම් වායුව ගබඩා කිරීම වන අතර ලිට්‍රෝ ගෑස් සමාගමෙහි ප්‍රධාන කාර්යය ගෘහස්ත, වාණිජ හා තොග වශයෙන් ලික්විඩ් පෙට්‍රෝලියම් වායුව ආනයනය කිරීම සහ බෙදාහැරීම වේ. ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී මගින් සෞඛ්‍ය සත්කාරක සේවාවන් සපයනු ලැබේ. මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පුද්ගලික සමාගම මගින් සේවක කළමනාකරණය සිදුකෙරේ. කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම මගින් මූලිකව තමන් සතු දක්ෂිණ අධිවේගී මාර්ගයේ පවතින වෙළඳසැල් කළමනාකරණය කෙරේ. සමාගම අදාළ නීතිමය රාමුව තුළ ඉහත ක්‍රියාකාරකම් වල නිරතව ඇත.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමූහයේ සහ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන සමාගමේ මූල්‍ය ප්‍රකාශ සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් අතරට, වංචා හෝ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍යතතා වලින් තොර බවට තහවුරු කිරීම උදෙසා, අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලනයන් සැකසීම, ක්‍රියාවට නැංවීම, පවත්වාගෙන යාම මෙන්ම ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරාගැනීම හා ආදේශනය හා අදාළ තත්ත්වයන් තුළ සාධාරණ අයුරින් ගිණුම්කරණ ඇස්තමේන්තු සැකසීම ඇතුළත් වේ.

මේ අනුව, වාර්ෂික වාර්තාවේ ඇතුළත් ලාභ හෝ අලාභ ප්‍රකාශය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ඒවාට සටහන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, සංශෝධිත 2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

මූල්‍ය ප්‍රකාශ සහ විගණකවරයාගේ වාර්තාව

2021.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇත්තේ, ශ්‍රී ලංකා ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මත පදනම්වය. ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ අධයක්ෂවරුන් විසින් අත්සන් තබන ලද සමාගමේ සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශ මෙම වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. මෙම මූල්‍ය ප්‍රකාශ සහ ඒවාට සටහන් මගින් 2021.12.31. දිනට සමාගමෙහි මූල්‍යමය ස්ථාවරය සහ එදිනෙන් අවසන් වූ වසර තුළ එහි කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කෙරේ.

විගණකවරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ වගන්ති 154 (1) ප්‍රකාරව, විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වශයෙන් කටයුතු කරයි.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවේ වගන්ති 154 (1) ප්‍රකාරව, 2021.12.31. දිනෙන් අවසන් වූ වසර සඳහා, සමාගමෙහි මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ වාර්ෂික විගනනයේදී විගණකාධිපතිවරයා වෙත සහාය දැක්වීම උදෙසා, සුදුසුකම් ලත් විගණකවරයකු වශයෙන් විගණකාධිපතිවරයා විසින්, මෙසර්ස් බීඩීඕ පාර්ට්නර්ස් පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ වැදගත් කොටසක් නිර්මාණය කරන මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ විගණකවරයාගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ.

විගණන සහ සෙසු ආශ්‍රිත සේවාවන් සම්බන්ධ ගාස්තු

විමර්ශනයට ලක් වන වසර තුළ විගණන සහ සෙසු ආශ්‍රිත සේවාවන් සම්බන්ධ ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල පහත දැක්වේ. මෙම ඡේදය තුළ හෙළදරව් කෙරෙන කරුණු හැරුනු විට විගණකවරුන් සතුව සමාගම සම්බන්ධයෙන් කිසිදු සබඳතාමය අභිමතයක් නොමැති බවට අධ්‍යක්ෂවරුන් දැනුවත්ව පසුවේ.

	2021 රු.000	2020 රු.000
ව්‍යවස්ථාපිත විගණන ගාස්තු	5,198	5,602
විගණන නොවන සේවා	-	-

ගිණුම්කරණ ප්‍රමිතීන්

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීමේදී භාවිත කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රමිතීන් වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

අවදානම් කළමනාකරණ සහ පාලන පද්ධතීන්

සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කළමනාකාරිත්වය විසින් ISO 31000 අවදානම් ආකෘතිකරාමුව සහ සාංගමික පාලන සංග්‍රහයන්ගේ අවශ්‍යතාවය පරිදි, අංග සම්පූර්ණ අවදානම් හඳුනාගැනීමේ, මැන බැලීමේ සහ පහත හෙළීමේ ක්‍රියාවලියක් ස්ථාපනය කරනු ලැබ ඇත. මෙකී ක්‍රියාවලිය පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ව්‍යවසාය අවදානම් කළමනාකරණ වාර්තාවේ දක්වා ඇත.

සමාගම මගින් දැඩි අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් ක්‍රියාවට නංවා ඇති අතර ඒවා අභ්‍යන්තර විගණන අංශයෙහි අධීක්ෂණයට ලක් වේ. විගණන හා අනුකූලතා කමිටුව මගින් සමාගමෙහි අභ්‍යන්තර පාලන පද්ධතිය නිරීක්ෂණය කෙරේ. විමර්ශනයට ලක් වන වසර තුළ සමාගමෙහි අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි බලාත්මකභාවය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ස්ථාවරය, මුදල් ප්‍රවාහ, නියාමනමය සහ ව්‍යවස්ථාමය සාධක සැළකිල්ලට ගනිමින්, පුරෝකථනය කල හැකි අනාගත කාලයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමකට පත් වේ. තවද, අඛණ්ඩව පවත්වාගෙන යාමට සමූහයට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ගැන කළමනාකරණය හඳුනාගෙන නොමැත. එම නිසා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යෑම පිළිබඳ කරුණු සැලකිල්ලට ගනිමින් කටයුතු කෙරී ඇත.

පිරිවැටුම/දළ ලිඛිත වාරිකය

විමර්ශනයට ලක් වන වසර තුළ සමාගමෙහි සමස්ත පිරිවැටුම රු.මිලියන 64,062 ක් වශයෙන් වාර්තා වූ අතර 2020 දී එය රු.මිලියන 52,614 ක් විය. වසර 2021 සඳහා සමස්ත දළ ලිඛිත වාරිකය රු.මිලියන 43,231 ක් වශයෙන් වාර්තා වූ අතර එය රු.මිලියන 21,976 ක ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකයකින්ද රු.මිලියන 21,255 ක සාමාන්‍ය රක්ෂණ දළ ලිඛිත වාරිකයකින්ද සමන්විත විය. 2020 දී සමස්ත දළ ලිඛිත වාරිකය රු.මිලියන 39,421 ක් වශයෙන් වාර්තා වූ අතර එය රු.මිලියන 19,258 ක ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකයකින්ද රු.මිලියන 20,163 ක සාමාන්‍ය රක්ෂණ දළ ලිඛිත වාරිකයකින්ද සමන්විත විය. වාරිකය. පසුගිය වසර සඳහා රු.මිලියන 20,163 ක් විය. සමාගම මගින් අත්පත් කරගත් සමස්ත දළ ලිඛිත වාරිකය සම්බන්ධ විස්තරාත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වේ.

මූල්‍යමය ප්‍රතිඵල සහ විසර්ජනයන්

	2021 රු.000	2020 රු.000
බදු වලට පෙර ලාභය	11,725,433	7,971,782
ආදායම් බදු වියදම්	1,684,297	2,183,248
බදු වලට පසු ලාභය	10,041,136	5,788,533
වෙනත් විස්තීර්ණ ආදායම	704,012	(368,153)
ක්ෂයවීම් සම්බන්ධ පෙර වසරේ ගැළපුම	-	(182)
ආදායම් සංචිත වෙනත් වගකීම්	-	(118,402)
ඉදිරියට ගෙනඅා විසර්ජනය නොකල ලාභය	29,913,401	27,447,383
ඉඩම් බැහැරකිරීම සම්බන්ධ ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධි කිරීම	-	5,182
විසර්ජනය සඳහා පවතින ලාභ	40,658,549	32,754,362
ගෙවන ලද ලාභාංශ	899,603	695,693
ඉදිරියට ධාරනය කරන ලද විසර්ජනය නොකල ලාභය	4,983,788	2,145,273
ඉදිරියට ගෙන යන ලද විසර්ජනය නොකළ ලාභය	34,775,158	29,913,401

ලාභාංශ

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර 2021 සඳහා, කොටසකට රු.1.26 බැගින් වූ අන්තර්මධ්‍ය ලාභාංශයක් (මුලු මුදල් ප්‍රමාණය රු.755,676,432) ප්‍රකාශයට පත් කෙරිණි. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 ජූනි 30 වැනි දින ව්‍යාපාර කටයුතු අවසන් කල අවස්ථාවේදී, සමාගමෙහි නිකුත් කරන ලද සහ ගෙවා නිම කල කොටස් වල හිමිකරුවන් වෙත ගෙවීම සඳහා කොටසකට රු.1.26 බැගින් වූ අවසන් ලාභාංශයක් (මුලු මුදල් ප්‍රමාණය රු.755,676,432) නිර්දේශ කලේය.

ඉහත සඳහන් කරන ලද ප්‍රකාශිත ලාංශාංශ සඳහා, 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 56 යටතේ වන නුබුනුවත්භාව පරීක්ෂා අවශ්‍යතාවය සමාගම විසින් සපුරනු ලබන බවට අධ්‍යක්ෂවරුන් තහවුරු කරයි.

ප්‍රදානයන්

වසර 2021 දී, සමාගම මගින් රු.මිලියන 1.04 ක ප්‍රදානයන් සිදුකරනු ලැබ ඇත.

බදුකරණය සඳහා ප්‍රතිපාදන

සමාගමෙහි බදු ස්ථාවරය මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කොට ඇත.

සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සංචිත
වසර තුළදී සංචිතයන්හි සංචලනය ස්කන්ධ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇත.

රක්ෂණ වගකීම් සහ ප්‍රතිපාදන
ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරයෙහි දරන ලද නමුත් වාර්තාගත නොවූ හිමිකම්පෑම් (IBNR) සහ දරන ලද නමුත් ප්‍රමාණවත් අයුරින් වාර්තාගත නොවූ හිමිකම්පෑම් (IBNER) ඇතුලුව නොඋපයන ලද වාරික සහ හිමිකම්පෑම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීමට අධ්‍යක්ෂවරුන් විසින් සාධාරණ පියවර ගනු ලැබීය. දරන ලද නමුත් වාර්තාගත නොවූ හිමිකම්පෑම් (IBNR) සහ දරන ලද නමුත් ප්‍රමාණවත් අයුරින් වාර්තාගත නොවූ හිමිකම්පෑම් (IBNER) සංචිත තක්සේරුකරණයේදී අධ්‍යක්ෂවරුන් විසින් ස්වාධීන ආයුගණකයකුගේ උපදෙස් ලබාගත් අතර ඔවුන්ගේ වාර්තාවද මෙම වාර්ෂික වාර්තාවේ ඇතුලත් වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි අවශ්‍යතාවය ප්‍රකාරව, පාරිතෝෂික වගකීමද ස්වාධීන ආයුගණකයකුගේ තක්සේරුවට භාජනය විය. මෙම වාර්තාවේ දිනය වන විට, මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන සම්බන්ධ කිසිදු තත්ත්වයක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් නොවේ.

අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ රක්ෂණ
අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන් අධ්‍යක්ෂවරුන්ගේ සහ නිලධාරීන්ගේ රක්ෂණවරය මගින් ආවරනය කෙරේ.

ආයෝජන
2021.12.31. දිනට සමාගම මගින් රඳවාගන්නා ලද ආයෝජන රු.මිලියන 234,571 ක් (2020 - රු.මිලියන 205,746) විය. රඳවාගත් ආයෝජන පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වේ.

දේපළ, පිරියත සහ උපකරණ
දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කෙරේ.

සින්නක්කර දේපළ වල වෙළඳපොල වටිනාකම
ඉඩම් සහ ගොඩනැගිලි හැරුනු විට සමාගම මගින් දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධ ගිණුම්කරණ ප්‍රමිතිය වශයෙන් පිරිවැය ක්‍රමවේදය භාවිත කරනු ලැබේ. වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ සමාග මෙහි ප්‍රතිපත්තිය වනුයේ වසර තුනකට වරක් එය සිදුකිරීමයි. ඒ අනුව, වසර 2021 සඳහා ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය මෙසර්ස් ට්‍රස්ටස් බිස්නස් සොලියුෂන්ස් ඇන්ඩ් ඇඩ්වයිසරි සර්විසස් පුද්ගලික සමාගම විසින් සිදු කරන ලදී. අදාළ වත්කම් පවතින භාවිත පදනමක් උදෙසා විවෘත වෙළඳපොල වටිනාකම අනුව තක්සේරු කරන ලදී. අදාළ ප්‍රත්‍යාගණන ප්‍රතිඵල එහි බලාත්මක දිනය වන 2021.12.31. සිට මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කෙරිණි.

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් වල හෙළිදරව් කරන ලද කරුණු හැරුනු විට, මූල්‍ය ප්‍රකාශයන්හි ගැළපුම් සිදුකල යුතු හෝ හෙළිදරව් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් වාර්තාකරණ දිනට පසු සිදු නොවීය.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු
ශ්‍රී ලංකා ගිණුමකරණ ප්‍රමිත 24 ට අනුකූලව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී ආදේශ කොටගත් සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කොට ඇත.

සමාගම සමග වන ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුගේ බැඳියාව
සමාගම සමග වන ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුගේ බැඳියාව මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කොට ඇත. මෙම බැඳියාවන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් වලදී නිසි පරිදි හෙළදරව් කොට ඇත. අධ්‍යක්ෂවරුන් සතුව සමාගමෙහි කිසිදු කොටස් හිමිකාරිත්වයක් නොපවතී.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික
වසර තුළදී ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ දීමනා රු.මිලියන 5.1 ක් වූ අතර පසුගිය වසරේ (2020) එම අගය රු. මිලියන 10.2 ක් විය.

ප්‍රකාශිත ප්‍රාග්ධනය
2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව, 2021 දෙසැම්බර් 31 දිනට සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.මිලියන 6,000 ක් විය. 2021.12.31. දිනට, ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, කොටස් වලින් 99.97% ක් භාණ්ඩාගාර ලේකම්වරයා භාරයේ පැවතිනි.

ව්‍යවස්ථාපිත ගෙවීම්
සිය පරම දැනුම සහ විශ්වාසය අනුව, රජය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම සහ සේවකයින් සම්බන්ධයෙන් වන සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කොට ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

අස්පෘශ්‍ය වත්කම්
2021.12.31. දිනට අස්පෘශ්‍ය වත්කම් සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තා කොට ඇත.

පරිසරය
සමාගම අදාළ පාරිසරික නීතිරීති හා රෙගුලාසි අනුව මෙහෙයුම් සිදුකරන අතර කිසිදු හානිදායක ක්‍රියාකාරකමක නිරතව නැත.

නීතිරීති හා රෙගුලාසි වෙත අනුකූලතාවය
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවේ වෙනත් අයුරකින් දක්වා ඇති නම් හැර, සමාගම සියලුම අදාළ නීතිරීති හා රෙගුලාසි වෙත අනුකූල විය. අනුකූලතා කමිටුව සමාගමෙහි අනුකූලතා ක්‍රියාවලිය නිරීක්ෂණය කරමින් විගණන සහ අනුකූලතා කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි. තවද, ආවර්තිත අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශයන් අනුමත කිරීම
විගණිත මූල්‍ය ප්‍රකාශයන් 2022 අප්‍රියෙල් 28 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

වාර්තාකරණ දිනට අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන පරිදි වේ:
හේරත් මුදියන්සේලාගේ විජිත හේරත් මහතා
අනිල් කොස්වත්ත මහතා
සිංහලගේ අරුණ නිශාන්ත දයානන්ද මහතා
මීගහගෙදර ප්‍රශාන්ත අනිල් කුමාර මහතා
ජයංගනී සුරේඛා අලස් මිය
විල්වල ආරච්චිගේ සමන්ත උපනන්ද මහතා
රණතුංග ආරච්චිගේ ලක්මිණි උදය කුමාර මහතා
(කේ.ඒ. විමලේන්තිරාජා මහතා වෙනුවට, ආර්.ඒ. ලක්මිණි උදය කුමාර මහතා 2022 මාර්තු 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධ භාණ්ඩාගාර නියෝජිත වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.)

මහා සභා රැස්වීම
මහා සභා රැස්වීම, කෝවිඩ් වසංගතය පැවතියහොත් අන්තර්ජාලය ඔස්සේ හෝ කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 පිහිටි සිය ලියාපදිංචි කාර්යාලයේ, සමාගම් ශ්‍රවණාගාරයේදී, 2022 ජූනි 30 වැනි දින පෙ.ව. 10.00 ට පවත්වනු ලැබේ.

වර්තාවේ අන්තර්ගතය පිළිගැනීම
2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 168 (1) (කෝ) හි අවශ්‍යතාවය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිගනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

සමාගම් ලේකම්වරු
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

ඉංජිනේරු විජිත හේරත්
අධ්‍යක්ෂ

ඩබ්. ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ

2022 මැයි 24 වැනි දින

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 150, වගන්ති 152 සහ වගන්ති 153 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සහ බැඳීම්, පහත ප්‍රකාශයෙහි දැක්වේ. මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධ විගණකවරුන්ගේ වගකීම, වාර්ෂික වාර්තාවේ ඇතුලත් විගණකවරුන්ගේ වාර්තාවේ දැක්වේ.

2007 අංක 07 දරණ සමාගම් පනත ප්‍රකාරව, සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් මගින් ශේෂපත්‍ර දිනට සමාගමෙහි කටයුතු පිළිබඳ සහ අදාළ ශේෂපත්‍ර දිනෙන් අවසන් වන ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා සමාගමෙහි ලාභ හෝ අලාභ හෝ ආදායම් සහ වියදම් පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කෙරෙන බවට තහවුරු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්), 2007 අංක 07 දරණ සමාගම් පනත, 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන පනත සහ 2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනත මත පදනම්ව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කොට ඉදිරිපත් කෙරෙන බවට තහවුරු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී, සුදුසු ගිණුම්කරණ ප්‍රමිතීන් සංගතව ආදේශනය කරන ලද බවටත් එහිදී විචක්ෂණශීලී විනිසුම සහ ඇස්තමේන්තු භාවිත කල බවටත් අධ්‍යක්ෂවරුන් විසින් තහවුරු කෙරේ. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය පුරෝකථනය කල හැකි අනාගත කාලයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට සෑහීමකට පත් වන අතර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා අඛණ්ඩ පැවැත්ම පදනම ආදේශනය කරන ලදී.

එයට අමතරව, 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි වගන්ති 166 (1) සහ 167 (1) හි අවශ්‍යතාවය අනුව, වාර්ෂික වාර්තාව නිසි කලට සකසමින් අදාළ වාර්තාවේ දෘඩ පිටපතක් ලබාගැනීමට අවශ්‍ය සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙත නියමිත කාලසීමාව තුළ පිටපත් යවන ලද බවටද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කෙරේ.

සිය පරම දැනුම අනුව, ශේෂ පත්‍ර දිනට, සමාගම විසින් ගෙවිය යුතු සියලුම බදු, ව්‍යවස්ථාපිත ගාස්තු සහ මූල්‍යමය වගකීම් සහ සමාග මෙහි සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායකත්වයන් සහ බදු සහ සෙසු සියලු දැනුවත් ව්‍යවස්ථාපිත හිගයන් ගෙවන ලද හෝ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

අධ්‍යක්ෂවරුන් විසින් කොටස් හිමිකරුවන් වෙත ගෙවිය යුතු බෝනස් මුදල සම්බන්ධයෙන් ආයුගණන වාර්තාවක් ආදේශනය කරගනිමින් ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි කොටස් හිමිකරුවන් වෙත පවතින අතිරික්තය නිර්ණය කරන ලදී. මෙම ප්‍රකාශයෙහි දැක්වෙන පරිදි ස්වකීය කාර්යභාරයන් ඉටු කරන ලද බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම
සමාගම් ලේකම්වරු

2022 ජූනි 07 වැනි දින

ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 වැනි දිනට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් (සමාගමේ) සහ අනුබද්ධ සමාගම් (සමූහයේ) සහ එහි පරිපාලිතයන්හි සමෝධානික මූල්‍ය ප්‍රකාශ පහත දැක්වෙන අධිකාරීන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශයන් පහත සඳහන් සම්මතයන්ට අනුකූලව පිළියෙල කොට ඉදිරිපත් කෙරේ:

i. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ (SLFRS/LKASs) ප්‍රමිති
ii. 2007 අංක 07 දරණ සමාගම් පනත
iii. 2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර පනත සහ එයට අදාළ සංශෝධන

මූල්‍ය ප්‍රකාශයන් සහ හෙළිදරව් කිරීම් පිළියෙල කිරීමේදී භාවිත කරන ලද ආකෘතීන් අදාළ නියාමනයන් මගින් නිකුත් කරන ලද නිර්දේශිත ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශය මගින් පූර්ව නිර්දේශිත විශේෂිත ආකෘතීන්ට අනුකූල වේ. ඒවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතාද සපුරාලයි. අපගේ පරම දැනුවත්භාවය අනුව, මෙම වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් මූල්‍ය ප්‍රකාශයන්, සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සෙසු මූල්‍යමය තොරතුරු, විමර්ශනයට ලක් වන කාලපරිච්ඡේදය තුළ සමාගමෙහි සියළුම ප්‍රමාණාත්මකස්වභාවයන් සහ මූල්‍යමය තත්ත්වයන්, මෙහෙයුම් ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් සාධාරණ අයුරින් පිළිබිඹු වන ලෙස ඉදිරිපත් කරනු ලැබ ඇත. එයට අමතරව, අඛණ්ඩව මෙහෙයුම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් සමාගම සතු වන අතර මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගැණිනි. කළමනාකාරීත්වය විසින් සිය මූල්‍ය වාර්තාකරණ වගකීම් ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා වශයෙන්, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ ප්‍රමාණවත් ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටීන්, සහ අභ්‍යන්තර පාලනයන් ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම මාගේ වගකීම වේ. සියලුම ප්‍රමාණාත්මක තත්ත්වයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන් නිවැරදි හා පරිපූර්ණ වන බවට සාධාරණව තහවුරු කිරීම සඳහා නිර්මිත අභ්‍යන්තර පාලන පද්ධතියක් කළමනාකාරීත්වය සතු වේ. මූල්‍යමය වාර්තා විශ්වසනීය බවටත් ඒවා මගින් මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී නිසි පදනමක් සකසන බවටත් වත්කම් නිසි අයුරින් ගිණුම්ගත කොට සුරක්ෂිත කෙරෙන බවටත් සාධාරණ සහතිකත්වයක් මෙම අභ්‍යන්තර පාලනයන් මගින් සැපයෙන බව කළමනාකාරීත්වයේ විශ්වාසය වේ. සමාගමෙහි අභ්‍යන්තර විගණකවරුන් විසින් අභ්‍යන්තර පාලනයන් සංගතව අනුගමනය කෙරෙන බවට තහවුරු කිරීම උදෙසා ආවර්තිත සමාලෝචනයන් සිදු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයකුගේ ප්‍රධානතවයෙන් යුතු විගණන හා අනුකූලතා කමිටුවක් පත් කොට ඇත. එම කමිටුව මගින් අභ්‍යන්තර විගණනය, පසුවිපරම් කමිටු වාර්තා සහ මූල්‍ය ප්‍රකාශයන් සමාලෝචනයට ලක් කරන ලදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වගින්ති 154 (1) හි විධිවිධාන ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින්, සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙනුවෙන්, මූල්‍ය ප්‍රකාශයන් විගණනයට ලක් කොට ඇත. ස්වාධීන විගණකවරයා හට විගණන හා අනුකූලතා කමිටුව සම්පූර්ණ හා නිදහස් පිවිසුමක් පවතින අතර, කළමනාකාරීත්වයේ සහභාගීත්වය සහිතව හෝ රහිතව කමිටුව හමු විය හැකි වේ. අපගේ පරම දැනුම අනුව අප විසින් පහත දැක්වෙන කරුණු තහවුරු කෙරේ –

i. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තුළ වෙනත් අයුරකින් දක්වා ඇති නම් හැර, සමාගම සියලුම අදාළ නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කොට ඇති බව.
ii. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් තුළ වෙනත් අයුරකින් දක්වා ඇති නම් හැර, කිසිදු ප්‍රමාණාත්මක අනනුකූලතාවයක් සිදු වී නොමැති බවට.
iii. වාර්තාකරණ දින වන විට දින වන විට සමාගමෙහි සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම දායකත්වයන්, ගාස්තු හා බදු මුදල් ගෙවනු ලැබ ඇති අතර අදාළ කවර හෝ අවස්ථාවන්හිදී අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරනු ලැබ ඇති බවට.
iv. සංචිතකරණ හා ද්‍රවශීලතා මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කොට ඇති අතර මුළු සංචිත වෙත භාරගත හැකි වත්කම් ගැළපීම මගින් පිටුබලය සපයනු ලබන බවට.
v. අදාළ රෙගුලාසි වලට අනුකූලව ස්කන්ධ ප්‍රාග්ධනය මගින් සකසන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලන බවට.

මාලක බණ්ඩාර
වැඩබලන ප්‍රධාන මූල්‍ය නිලධාරී

2022 මැයි 24

රක්ෂණ සමාගමෙහි ආයුගණකවරයගේ සහතිකය

Willis Towers Watson

පුද්ගලිකයි රහසිගතයි

2022 අප්‍රේල් 15
අධ්‍යක්ෂ මණ්ඩලය
සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම, අංක 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02, ශ්‍රී ලංකාව.

2021 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයුගණන තක්සේරුව

2019 අප්‍රියෙල් 26 වැනි දිනැති සහභාගීත්ව ලිපිය සහ 2021 අගෝස්තු 12 වැනි දිනැති පරිශිෂ්ඨයට අනුකූලව, විලීස් ටවර්ස් වොට්සන් ඉන්ඩියා (පුද්ගලික) සමාගම විසින් (''විලීස් ටවර්ස් වොට්සන්'', ''අපි'', ''අපගේ'' හෝ ''අපට'') විසින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දිගු කාලීන රක්ෂණ වගකීම් සම්බන්ධ තක්සේරුවෙහි ආයුගණන සමාලෝචනය සිදු කරන ලදී.

අප විසින් මෙමගින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් සහතික කරනු ලැබේ:

1. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දිගු කාලීන රක්ෂණ අරමුදලෙහි වගකීම් සම්බන්ධ ආයුගණන තක්සේරුව සඳහා භාවිත කරන ලද දත්ත සම්පූර්ණ හා නිවැරදි බවට තහවුරු කිරීම සඳහා සමාගම මගින් සාධාරණ පියවර ගෙන ඇති බව.
2. අදාළ දිනට සියලුම වර්තමාන හා අසම්භාව්‍ය වගකීම් සැළකිල්ලට ගැනීමේදී, දිගු කාලීන රක්ෂණ අරමුදල සම්බන්ධ සියලුම වගකීම් සඳහා, 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රමාණවත් සහ නිසි සංචිත ප්‍රතිපාදනය කොට ඇති බව.
3. බෙදාහැරීමේ පදනමක් මත ජීවිත අරමුදල තුළ පවත්වා ගෙන යන ලද සමස්ත දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදන රු.මිලියන 87,795 කි. ජීවිත අරමුද තුළ රඳවාගත් වත්කම් වල වටිනාකම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම් පදනමක් මත රු.මිලියන 155,833 ක් වන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පදනමක් මත රු.මිලියන 156,242ක් වේ. 2021 දී ජීවිත අරමුදලෙන් කොටස් හිමිකරුවන් ගේ අරමුදල වෙත මාරුකරන ලද දළ අතිරික්තය රු.මිලියන 3,629 කි. 2021 දී සහභාගීත්ව අරමුදලෙන් කොටස් හිමිකරුවන් වෙත බෝනස් මුදල් ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙන් කරන ලද දළ අතිරික්තය රු.මිලියන 2,143 ක්. කොටස් හිමිකාර මාරුකිරීම් සහ බදු වලින් පසු අගයෙන් අනතුරුව, 2021 දෙසැම්බර් 31 දිනට ජීවිත අරමුදල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම් පදනමක් මත රු.මිලියන 152,176 ක් වන අතර ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පදනමක් මත රු.මිලියන 152,585 ක් වේ.

කුන්ජ් බිහාරි මහේෂ්වරි, FIA, FIAI
අධ්‍යක්ෂ, රක්ෂණ උපදේශන හා තාක්ෂණ, ඉන්ඩියා විලීස් ටවර්ස් වොට්සන් ඉන්ඩියා (පුද්ගලික) සමාගම
ඊ මේල්: kunj.maheshwari@willistowerswatson.com

අත්සන :

ස්ථානය : ඉන්දියාව
දිනය : 2022 අප්‍රේල් 15

විලීස් ටවර්ස් වොට්සන් ඉන්ඩියා (පුද්ගලික) සමාගම ලියාපදිංචි කාර්යාලය:
2 වන මහල, ටවර් බී, යුනිටෙක් බිස්නස් පාක්, සවුත් සිටි - 1, සෙක්ටර් 41,
ගුරුග්‍රාම් 122001 ඉන්දියාව

T +91 124 432 2800
F +91 124 432 2801
E TW.Fin.India@willistowerswatson.com W willistowerswatson.com

වගකීම් ප්‍රමාණවත්තා පරීක්ෂාව

Willis Towers Watson

පුද්ගලිකයි රහසිගතයි

2022 මාර්තු 22
අධ්‍යක්ෂ මණ්ඩලය
සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගම, අංක 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02, ශ්‍රී ලංකාව.

වගකීම් ප්‍රමාණවත් බව පරීක්ෂාව

1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ' SLFRS 4 රක්ෂණ ගිවිසුම්' මගින්, සිය රක්ෂණ ගිවිසුම් යටතේ වන අනාගත මුදල් ප්‍රවාහ වල වර්තමාන ඇස්තමේන්තු භාවිත කරමින්, එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී සිය හදුනාගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත්ද යන්න රක්ෂකයා විසින් පරීක්ෂා කල යුතු වට නිර්දේශ කෙරේ. SLFRS 4 මගින් නිර්දේශිත පරිදි, විලීස් ටවර්ස් වොට්සන් මගින්, සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සමාගමෙහි ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලබන දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදන සම්බන්ධ වගකීම් ප්‍රමාණවත් බව පරීක්ෂාවක් සිදුකරන ලදී,
2. මෙම වගකීම් ප්‍රමාණවත් බව පරීක්ෂාව සිදුකිරීමේදී, විගණිත ගිණුම් අනුව රදවාගත් ප්‍රතිපාදන සහ ආයුගණන වගකීම සන්සන්දනය කරන ලදී. මෙම කාර්යය සඳහා, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම (ඉහතදී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය) (ද්‍රවශීලතා තීරුව (අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධනය) නිතිරීති 2015) මගින් නිර්දේශිත අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ආකෘතිය තුළ පවතින මූලධර්ම අනුගමනය කරමින් ආයුගණන වගකීමෙහි වටිනාමක ගණනය කරන ලද අතර, එහිදී දැනට පවතින සක්‍රීය රක්ෂණ ගිවිසුම් සම්බන්ධ වගකීම් පියවීම සඳහා අවශ්‍ය සියලුම ගලා එන සහ ගලා යන මුදල් ප්‍රවාහ වල සම්පූර්ණ ජීව කාලය ආවරනය කරමින්, වට්ටම්ගත මුදල් ප්‍රවාහ එළඹුමක් භාවිත කරමින් අදාළ වගකීම් තක්සේරු කරන ලදී.
3. 2021 දෙසැම්බර් 31 දිනට සක්‍රීය රක්ෂණවරයන් සහ රයිඩර්ස් මත පුරෝකථනයන් පදනම් වේ.
4. සිදුකරන ලද පරීක්ෂාවන් මත පදනම්ව මවිසින් පහත දැක්වෙන කරණු සහතික කරනු ලැබේ:
   - ආයුගණන වගකීම් තක්සේරුව ජාත්‍යන්තරව පිළිගත් ආයුගණන ක්‍රමවේදයන් මත පදනම් වන බව සහ SLFRS 4 යටතේ වන අවශ්‍යතාවයන්ට අනුකූල වන බව:
   - එබඳු තක්සේරුකරණයන් සඳහා යොදාගත් උපකල්පනයන්, අහිතකර වෙනස්වීම් සහ සුදුසු තීරු සඳහා අවකාශ සැලසීමෙන් අනතුරුව සහ පවතින අත්දැකීම් මත පදනම් වූ සාධාරණ ඇස්තමේන්තු මත පදනම්ව ඇති බව:
- අපේක්ෂිත ආර්ථික අවගමනය, ප්‍රාග්ධන සහ මුදල් වෙළඳපොල සහ දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතය, විරැකියාව, උද්ධමනය, මුදල් ඒකක උච්ඡාවචනය හා වර්තමාන ආර්ථික අවගමනය හේතුවෙන් සිදවූ ජාත්‍යන්තර වෙළඳාම සීමාවීම වැනි සෙසු සාර්ව ආර්ථික සාධක කෙරෙහි ඇති වූ බලපෑමෙහි ප්‍රමාණය සහ කාලසීමාව
- ආර්ථික අවගමනය මගින් සේවාලාභී ක්‍රය ශක්තිය සහ චර්යාව කෙරෙහි ඇති වූ බලපෑමෙහි ප්‍රමාණය සහ කාලසීමාව

සිදුකල යුතු කවර හෝ අවස්ථාවකදී මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අදාළ සටහන් යටතේ ගිණුම්කරණ ඇස්තමේන්තු කෙරෙහි කෝවිඩ් 19 වසංගතයේ සහ ආර්ථික අවගමනයෙහි බලපෑම වැඩිදුරටත් සාකච්ඡා කරනු ලැබ ඇත.

2.6 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

LKAS 1 - ''මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම'' මගින් අනුමත කොට ඇති පරිදි, සමාන අයිතමයන්හි එක් එක් ප්‍රමාණාත්මක වර්ගය වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හා කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2.7 සන්සන්දනාත්මක තොරතුරු

වඩාත් යහපත් ඉදිරිපත් කිරීමක් සහ වර්තමාන වසර සමග සන්සන්දනය කල හැකි වන පරිදි, අදාළ අවස්ථාවන්හිදී පෙර වසරේ මූල්‍ය ප්‍රකාශයන්හි වත්කම් හා වගකීම් ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් සංශෝධනය කොට ඇත.

2.8 අඛණ්ඩ පැවැත්ම

ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමූහය/සමාගම සතු හැකියාව සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තක්සේරුවක් සිදු කරනු ලැබ ඇති අතර, කල්තබා දැකිය හැකි අනාගතය තුළ අඛණ්ඩව පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්ව සිටී.තවද, ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් සුරක්ෂිතව පැවැත්ම සඳහා සමූහය/සමාගම සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරීත්වය දැනුවත් නොවේ. අඛණ්ඩවම මූල්‍ය ප්‍රකාශ සැකසීම අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සිදු කෙරිණි. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ පදනම නිර්ණය කිරීමේදී, කළමනාකාරීත්වය විසින් පවතින තොරතුරු මත, පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හා සමූහය වෙත ඒවායේ බලපෑම සහ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව තක්සේරුවක් සිදුකරන ලදී.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්ම සහිත ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා සමූහය සහ සමාගම තක්සේරු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වේ. කළමනාකාරීත්වය විසින්, විදේශ විනිමය ගැටලුව, රජයේ ෆිස්කල් සහ මුදල් ප්‍රතිපත්තියේ වෙනස්වීම්, කොටස් සහ මුදල් වෙළඳපොල සංචලනයන් ආදිය මගින් සමූහය සහ සමාගම වෙත ඇති විය හැකි බලපෑම තක්සේරු කොට අපේක්ෂණය කරන ලදී. මෙහිදී සවිමත් ව්‍යාපාර අඛණ්ඩත්ව සැලසුම් දැනටමත් ක්‍රියාවට නංවා ඇති අතර විචක්ෂණශීලී ආයෝජන ක්‍රමෝපාය මගින් මෙම වසංගතයේ බලපෑම අවම කොට ගෙන ඇත.

ක්‍රියාකාරී ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමූහය/සමාගම සතු හැකියාව සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තක්සේරුවක් සිදු කරනු ලැබ ඇති අතර, කල්තබා දැකිය හැකි අනාගතය තුළ අඛණ්ඩව පැවතීමට අවශ්‍ය සම්පත් එය සතු වන බවට සෑහීමකට පත්ව සිටී. ඉහත කරුණු නිර්ණය කිරීමේදී, වර්තමාන සාර්ව ආර්ථික අභියෝග ඇතුලු වැදගත් කළමනාකරණ විනිසුම්, ඇස්තම්න්තු සහ උපකල්පන සැළකිල්ලට ගන්නා ලදී. තවද, කෝවිඩ් 19 වසංගත බලපෑම ඇතුලුව මෙම විනිසුම වෙත එලඹීමේදී සැළකිල්ලට ගැනුනු සිදුවය හැකි ප්‍රතිදානයන් රැසක බලපෑම මගින් සමූහයේ හා සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සැළකිය යුතු සැකයක් පහළ වන ආකාරයේ සිදුවීම් හෝ තත්වයන් සම්බන්ධ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා ඇති නොවනු ඇති බවට කළමනාකාරීත්වය නිගමනය කරයි. එමනිසා, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම ආදේශ කරගැනීමට තීරණය කෙරිණි.

අමතර තොරතුරු මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 50 හි දැක්වේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රමිතීන්

සමූහය හා සමාගම මගින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කෙරෙන සියලුම කාලපරිච්ඡේදයන් වෙත පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන් සංගතව අදේශ කොට ගෙන ඇත.

3.1 ඒකාබද්ධකරණ පදනම

3.1.1 ව්‍යාපාරික ඒකාබද්ධකරණයන්

සමූහය වෙත පාලනය මාරුකරනු ලබන අවස්ථාවේදී සමූහය ව්‍යාපාර අත්පත් කරගැනීමේ ක්‍රමවේදය යොදාගනිමින් ව්‍යාපාරික ඒකාබද්ධකරණයන් ගිණුම්ගත කරයි. අත්පත් කරගත් හදුනාගත හැකි ශුද්ධ වත්කම් වශයෙන්, අත්පත් කරගැනීමේදී මාරුකරන ලද ප්‍රතිශ්ධාව සාමාන්‍යයෙන් සාධාරණ අගය අනුව මනිනු ලැබේ. උද්ගත වන කවර හෝ කීර්තිනාමයක් සම්බන්ධයෙන් වාර්ෂිකව අපහායනය සඳහා පරීක්ෂාවන් සිදු කෙරේ. කේවල් කිරීමේ මිලදී ගැනීමේ කවර හෝ ලාභයක් වහාම ලාභ අලාභ ප්‍රකාශයෙහි හදුනාගැනේ. කේවල් කිරීමේ කවර හෝ ලාභයක් වහාම ලාභ අලාභ ප්‍රකාශයෙහි හදුනාග ැනේ. ණය හෝ ස්කන්ධ සුරැකුම් ආශ්‍රිත වන්නේ නම් හැර, ගනුදෙනු පිරිවැය දරන ලද වශයෙන් සළකනු ලැබේ.

මාරුකරන ලද ප්‍රතිශ්ධාවට පෙර පැවති සබදතා පියවීම සම්බන්ධ මුදල් ප්‍රමාණයන් ඇතුළත් නොවේ. එබදු මුදල් ප්‍රමාණයන් සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ වල හදුනාගැනේ.

3.1.2 සුලු කොටස් හිමි අයිතිය

සුලු කොටස් හිමි අයිතිය, අත්පත් කරගනු ලබන දිනයේදී අත්පත් කරගැනීමට ලක්වන්නාගේ හදුනාගත හැකි ශුද්ධ වත්කම්වල ඔවුන්ගේ සමානුපාතික කොටස වශයෙන් මනිනු ලැබේ.

පාලනය අහිමිවීමක් සිදුනොවන මව් සමාගමෙහි පරිපාලිතයක අයිතිය වෙනස්වීම ස්කන්ධ ගනුදෙනු වශයෙන් ගිණුම්ගත කෙරේ.

3.1.3 පරිපාලිතයන්

පරිපාලිතයන් යනු සමූහය මගින් පාලනය කරනු ලබන සමාගම් වේ. එහි ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා කිසියම් සමාගමක මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් පාලනය කිරීමේ බලය සමූහය සතු වන විට පාලනය පවතී. පාලනය තකසේරු කිරීමේදී, වර්තමානයේදී භාවිත කල හැකි විභව ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතීන් සැළකිල්ලට ගැනේ. පාලනය ඇරඹුනු දින සිට පාලනය අවසන් වන දින තෙක් පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශයන් සමෝධානික මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කෙරේ.

පරිපාලිතයන්හි ආයෝජන, අපහායනය අඩු කොට පිරිවැයට ධාරණය කර සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කෙරේ.

3.1.4 පාලනය අහිමිවීම

පාලනය අහිමි වීමෙන් අනතුරුව, සමූහය මගින් පරිපාලිතයෙහි වත්කම් හා වගකීම් කවර හෝ සුලු කොටස් හිමි අයිතයක් සහ පරපාලිතයෙහි ස්කන්ධ ආශ්‍රිත සෙසු සංරචකයන් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. පාලනය අහිමි වීමෙන් උද්ගත වන කවර හෝ අතිරික්තයක් හෝ ඌනයක් ලාභඅලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ. සමූහය මගින් පෙර පරිපාලිතයහි කවර හෝ අයිතියක් රඳවාගනු ලබන්නේ නම්, එබඳු අයිතියක් පාලනය අහිමි වන දිනයේදී සාධාරණ අගය අනුව මනිනු ලැබේ.

3.1.5 ස්කන්ධ ගිණුම්ගත ආයෝජිතයන්ගේ අයිතිය

ආශ්‍රිත සමාගමක් යනු සමූහයට සැලකිය යුතු බලපෑමක් සිදු කල හැකි සමාගමක් වන අතර එය පරිපාලිතයක් හෝ හවුල්කාරිත්වයක් නොවේ. සමූහය/සමාගම මගින් ආයෝජිතයාගේ ඡන්ද බලයෙන් 20% හෝ වැඩි ප්‍රමාණයක් රඳවාගත් විට සැළකිය යුතු බලපෑමක් සිදු කල හැකි බවට උපකල්පනය කෙරේ. ආශ්‍රිත සමාගම් සම්බන්ධ අයිතිය ස්කන්ධ ක්‍රමවේදය යොදාගනිමින් මනිනු ලැබේ. ඒවා මූලිකව පිරිවැය අනුව හදුනාගැනෙන අතර එයට ගනුදෙනු පිරිවැය ඇතුලත් වේ. මූලික හදුනාගැනීමෙන් අනතුරුව, මූලික හදුනාගැනීමෙන් අනතුරුව, සැළකිය යුතු බලපෑම හෝ හවුල් පාලනය අවසන් වන දින දක්වා, ස්කන්ධ ගිණුම්ගත ආයෝජිතයාගේ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම සම්බන්ධ සමූහයෙහි කොටස සමෝධානික මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කෙරේ.

ආශ්‍රිත සමාගමෙහි ආයොජනය අපහායනය අඩුකොට පිරිවැය අනුව ධාරණය කොටෙ සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කෙරේ.

3.1.6 ඒකාබද්ධකරණයේදී ඉවත් කරන ලද ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අභ්‍යන්තර - සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අභ්‍යන්තර - සමූහ ගනුදෙනු වලින් උද්ගත වන කවර හෝ උපලබ්ධි නොවූ ආදායම් හෝ වියදම් ඉවත් කෙරේ. ස්කන්ධ ගිණුම්ගත ආයෝජිතයන් සමග වන ගනුදෙනු වලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභයන්, ආයෝජිතයා කෙරෙහි සමූහයේ අයිතිය පවතින තාක් දුරට ආයෝජනයට එරෙහිව ඉවත් කෙරේ. උපලබ්ධි නොවූ අලාභයන්ද උපලබ්ධි නොවූ ලාභයන් ආකාරයටම ඉවත් කෙරෙන නමුත්, එය සිදු කෙරනුයේ කිසිදු අපහායන සාක්ෂියක් නොමැති තාක් දුරට පමණි.

3.2 විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

සියළුම විදේශ මුදල් ගනුදෙනු අදාළ ගනුදෙනු සිදුකෙරුනු දිනයේ පැවති එතැන් හුවමාරු අනුපාත අනුව ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. වාර්තාකරණ දිනයේදී විදේශ මුදල් ඒකක වලින් දැක්වෙන මුදල් වත්කම් හා වගකීම් වාර්තාකරණ දිනයේ පවතින එතැන් හුවමාරු අනුපාතය අනුව ව්‍යවහාරික මුදල් ඒකකය වෙත පරිවර්තනය කෙරේ.

විදේශ මුදල් ඒකකයකින් සාධාරණ අගයට මනින ලද මුදල් නොවන අයිතම සාධාරණ අගය නිර්ණය කරන ලද දිනයේ පැවති එතැන් හුවමාරු අනුපාත අනුව පරිවර්තනය කෙරේ. විදේශ මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැයට අදාළව මනින ලද මුදල් නොවන අයිතම ගනුදෙනු දිනයේදී එතැන් හුවමාරු අනුපාතය යොදා ගනිමින් පරිවර්තනය කෙරේ.

විදේශ මුදල් වෙනස්වීම් සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ වල හදුනාග ැනේ.

3.3 රක්ෂණ ගිවිසුම්

සැලසුම් වර්ගීකරණය

මාරුකරනු ලබන රක්ෂණ අවදානම මත රදාපවතිමින් රක්ෂකයින් විසින් ලියා තබනු ලබන ගිවිසුම් ''රක්ෂණ ගිවිසුම්'' හෝ ''ආයෝජන ගිවිසුම්'' වශයෙන් වර්ගීකරණය කිරීම SLFRS 4 හි අවශ්‍යතාවයක් වේ.

රක්ෂණ ගිවිසුම් යනු, රක්ෂණවරහිමියා වෙත විශේෂිත අවිනිශ්චිත අනාගත සිදුවීමක් හේතුවෙන් රක්ෂණවරහිමියන් වෙත වන්දි ලබාදීමට එකගවීම මගින්, සමූහය/සමාගම (රක්ෂකයා) විසින් අන් පාර්ශ්වයකින් (රක්ෂණවරහිමියන්) සැළකිය යුතු රක්ෂණ අවදානමක් භාරගනු ලබන ගිවිසුම් වේ. පොදු මාර්ගෝපදේශයක් වශයෙන්, සමූහය/සමාගම මගින්, රක්ෂිත සිදුවීම සිදුවූයේ නම් ගෙවන ලද ප්‍රතිලාභ සහ ගෙවිය යුතු ප්‍රතිලාභ සන්සන්දනය කරමින්, සැළකිය යුතු රක්ෂණ අවදානමක් පවතීද යන්න නිර්ණය කරනු ලැබේ.

කිසියම් ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් වශයෙන් වර්ගීකරණයෙන් අනතුරුව, සියලුම හිමිකම් හා බැඳීම් අවසන්වීම හෝ කල්ඉකුත්වීම සිදුවූයේ නම් හැර, මෙම කාලසීමාව තුළ රක්ෂණ අවදානම කැපී පෙනෙන අයුරින් පහත වැටුනද, එහි ජීව කාලය පුරා එය රක්ෂණ ගිවිසුමක් වශයෙන් පවතී. කෙසේවුවද, ආයෝජන ගිවිසුම් රක්ෂණ අවදානම සැළකිය යුතු මට්ටමකට පත්වුවහොත්, ආරම්භයෙන් අනතුරුව රක්ෂණ ගිවිසුම් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කළ හැකි වේ.

සමූහය/සමාගම මගින් අලෙවි කරනු ලබන සියලුම සැලසුම් රක්ෂණ ගිවිසුම් වන බැවින් SLFRS 4 – ''රක්ෂණ ගිවිසුම්''
යටතේ රක්ෂණ ගිවිසුම් වශයෙන් වර්ග කෙරේ. එමනිසා.
වාර්තාකරණ දිනට සමූහය/සමාගම සතුව එහි සැලසුම් කළඹෙහි කිසිදු ආයෝජන ගිවිසුමක් ඇතුළත් නොවීය.

3.3.1 රක්ෂණ වගකීම් වෙතින කොටස් හිමිකරුවන් වෙත අතිරික්ත ලාභ මාරුකිරීම

සමාගම මගින් එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයේදී, කොටස් හිමිකරුවන් වෙත ආරෝපනය කල යුතු සංචිත භාවිත කරමින් කොටස් හිමිකරුවන්ගේ වටිනාකම තක්සේරු කෙරේ. සංචිත වල ආරම්භක හා අවසාන ශේෂයන් අතර වෙනස කොටස් හිමිකරුවන් වෙත ආරෝපනය කල යුතු අතිරික්තය වශයෙන් සැළකෙන අතර, එය වාර්තාකරණ දිනට රක්ෂණ ගිවිසුම් වගකීමෙන් අඩු කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

පහත දැක්වෙන පරිදි කොටස් හිමිකරුවා වෙත ආරෝපනය කල යුතු අතිරික්ත ලාභය දෙයාකාරකින් සමන්විත වේ:

- රක්ෂණවරන හිමි අරමුදලෙන් කොටස් හිමිකරුවා වෙත ආරෝපනය කල යුතු අතිරික්ත ලාභය
- කොටස් හිමිකාර වත්කම් වලින් උපයන ලද ලාභය

රක්ෂණවරහිමි අරමුදලෙන් කොටස් හිමිකරුවා වෙත ආරෝපනය කල යුතු අතිරික්ත ලාභය

පත්කරන ලද ආයුගණකවරයාගේ නිර්දේශය මත ආයුගණන තක්සේරුවකින් අතිරික්තය උකහා ගනු ලැබේ.

3.4 ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

3.4.1 ආදායම් හඳුනාගැනීම

3.4.1.1 දළ ලිඛිත වාරිකය

(අ) ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකය

රක්ෂණවරහිමියා විසින් ගෙවිය යුතු අවස්ථාවේදී ජීවිත රක්ෂණ ගිවිසුම් සම්බන්ධ දළ ආවර්තිත වාරික, ආදායම වශයෙන් හඳුනාගැනේ (දින 30 ක සහන කාලය ඇතුළත වන රක්ෂණවරයන් හිඟ වශයෙන් සැළකේ). අදාළ රක්ෂණවර කොන්දේසි මගින් ආදායම වශයෙන් හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් පවතී නම් හැර, කල්තබා ලැබෙන කවර හෝ වාරිකයක් ආදායම් වශයෙන් වාර්තා නොකෙරෙන අතර වගකීමක් වශයෙන් වාර්තා කෙරේ. රක්ෂණවරයන්හි ඇස්තමේන්තුගත ජීව කාලය පුරා ලාභ හඳුනාගැනීම සඳහා එබඳු ආදායම් වලට අදාළව ප්‍රතිලාභ සහ වියදම් ප්‍රතිපාදනය කෙරේ.

ඒකල වාරික ව්‍යාපාරය සඳහා රක්ෂණවරය බලාත්මක වන දිනයේ ආදායම හඳුනාගැනේ.

(ආ) සාමාන්‍ය රක්ෂණ දළ ලිඛිත වාරිකය

දළ ලිඛිත වාරිකය, ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ එළඹි ගිවිසුම් මගින් සපයන ලද සම්පූර්ණ ආවරන කාලසීමාව සඳහා ලැබිය යුතු මුලු වාරික වලින් සමන්විත වේ. ඒවා රක්ෂණවරය ඇරඹෙන දිනයේදී හඳුනාගැනේ. ගිවිසුම ඇරඹීමෙන් අනතුරුව, වාරික ලිඛිත වශයෙන් වාර්තා කෙරෙන අතර ආශ්‍රිත රක්ෂණ ආවරනයෙහි කාලසීමාව පුරා ආනුපාතික පදනමක් මත මූලිකව උපයාගනු ලැබේ.

හිමිකම් නොපෑමේ ප්‍රතිදානයන් වැනි, වාරික අනුපාතයේ කොටසක් නිර්මාණය කරනු ලබන ප්‍රතිදානයන්, දළ ලිඛිත වාරිකයෙන් අඩු කෙරේ.

නොඉපැයූ වාරික සංචිතය

නොඉපැයූ වාරික යනු වාර්තාකරණ දිනට පසු අවදානම් කාලසීමාවන් ආශ්‍රිතව වසර තුළදී ලියන ලද වාරික වල කොටස් වේ.නොඉපැයූ රක්ෂණ වාරික සඳහා සංචිතය මගින්, රක්ෂණවරයන්හි ඉකුත් නොවූ කාලසීමාව ආවරනය කරගැනීම සඳහා නොඉපැයූ වාරික සංචිතය වෙත මාරු කරන ලද දළ ලිඛිත වාරිකයේ කොටස නියෝජනය වේ. 2000 අංක 43 දරණ රක්ෂණ නියාමන පනතෙහි විධිවිධාන ප්‍රකාරව, නොඉපැයූ වාරික 365 පදනම මත ගණනය කෙරේ. කෙසේවුවද, ගිවිසුම් කාලසීමාවෙන් සැළකිය යුතු අන්දමින් අවදානම් කාලසීමාව වෙනස් වන ගිවිසුම් සඳහා, සපයන ලද රක්ෂණ ආවරනයට ආනුපාතිකව අවදානම් කාලසීමාව පුරා වාරික අයකර ගැනේ. පසුකාලීන කාලපරිච්ඡේදයන්ට ආරෝපනය කල යුතු ආනුපාතිකය ප්‍රතිපාදනයක් වශයෙන් විලම්බනය කොට වගකීම් යටතේ ඇතුලත් කෙරේ.

3.4.1.2 ප්‍රතිරක්ෂණ වාරික

දළ ප්‍රතිරක්ෂණ වාරිකය, කාලපරිච්ඡේදය තුළ එළඹෙන ලද ගිවිසුම් මගින් සපයන ලද, මුළු ආවරනයට අදාළ ගෙවිය යුතු සමස්ත ප්‍රතිරක්ෂණ වාරිකයෙන් සමන්විත වන අතර රක්ෂණවරය බලාත්මක වන දිනයේදී ඒවා හඳුනාගැනේ. ප්‍රතිරක්ෂණ වාරික, ප්‍රතිරක්ෂකයින් සමග එකගත්වයට පත් අනුපාතයන් මත පදනම්ව නිර්ණය කෙරේ.

(අ) සාමාන්‍ය රක්ෂණ ප්‍රතිරක්ෂණ වාරිකය

ලිඛිත ප්‍රතිරක්ෂණ වාරිකය, කාලපරිච්ඡේදය තුළ එළඹි ගිවිසුම් මගින් සපයනු ලබන සම්පූර්ණ ආවරනය සඳහා ගෙවිය යුතු මුලු වාරිකයෙන් සමන්විත වන අතර රක්ෂණවරය ඇරඹෙන දිනයේදී හඳුනාගැනේ.

නොඉපැයූ ප්‍රතිරක්ෂන වාරික සංචිතය

නොඉපැයූ ප්‍රතිරක්ෂන වාරික යනු, වසරකදී ලියන ලද වාර්තාකරණ දිනයෙන් පසු අවදානම් කාලපරිච්ඡේදයන් හා සම්බන්ධ වාරිකයේ කොටස වේ. නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය පාදක වන සෘජු රක්ෂණවරයන්ගේ කාලසීමාව පුරා වෙනස් වේ (2000 අංක 43 දරණ රක්ෂණ නියාමන පනතෙහි විධිවිධාන ප්‍රකාරව, නොඉපැයූ වාරික 365 පදනම මත ගණනය කෙරේ. කෙසේවුවද, ගිවිසුම් කාලසීමාවෙන් සැළකිය යුතු අන්දමින් අවදානම් කාලසීමාව වෙනස් වන ගිවිසුම් සඳහා, සපයන ලද රක්ෂණ ආවරනයට ආනුපාතිකව අවදානම් කාලසීමාව පුරා වාරික අයකර ගැනේ).

(ආ) ජීවිත රක්ෂණ ප්‍රතිරක්ෂණ වාරිකය

ජීවිත රක්ෂණ සම්බන්ධ ප්‍රතිරක්ෂණ වාරිකය, වාරික ගෙවිය යුතු දිනය හෝ රක්ෂණවරය බලාත්මක වන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේදී වියදමක් වශයෙන් හඳුනාගැනේ.

3.4.1.3 ගාස්තු සහ කොමිස් ආදායම

(අ) ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම

පිටතට ගලා යන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධ ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම ලැබිය යුතු අවස්ථාවේදී ආදායම වශයෙන් හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, පිටතට ගලා යන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධ ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම විලම්බනය කොට අපේක්ෂිත වාරිකය ගෙවිය යුතු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

(ආ) වෙනත් ගාස්තු ආදායම
රක්ෂණ ගිවිසුම් රක්ෂණවරහිමියන්ගෙන් රක්ෂණවර පරිපාලන සේවා සහ වෙනත් ගිවිසුම් ගාස්තු අය කරනු ලැබේ. ලැබීමෙන් පසු හෝ හිඟ බවට පත් වූ විට මෙම ගාස්තු ආදායම් වශයෙන් හඳුනාගැනේ.

3.4.1.4 ආයෝජන ආදායම
ආයෝජන ආදායම ආයෝජිත අරමුදල් මත පොලී ආදායම, ලාභාංශ ආදායම, ප්‍රාග්ධන ලාභ හෝ අලාභ සහ විදේශ මුදල් ලාභ හෝ අලාභ වලින් සමන්විත වේ.

(අ) පොලී ආදායම
පොලී ආදායම එය උපචිත වන විට ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනෙන අතර සඵල පොලී අනුපාතික ක්‍රමය භාවිත කරමින් ගණනය කෙරේ. SLFRS 9 යටතේ, ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන සියලුම මූල්‍ය සාධනපත්‍ර සඳහා පොලී ආදායම සඵල පොලී අනුපාතික ක්‍රමය භාවිත කරමින් වාර්තා කෙරේ. පොලී දරන මූල්‍යමය වත්කම් මත පොලී ආදායමද වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්ගත කෙරේ. සඵල පොලී අනුපාතිකය යනු මූල්‍යමය වත්කමෙහි හෝ මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීව කාලය මුළුල්ලේ හෝ එයට වඩා කෙටි කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මූල්‍යමය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අගයට තත්ත්වාකාරයෙන් වට්ටම් කරනු ලබන අනුපාතිකයයි.

මෙම ආගණනය මූල්‍ය උපකරණයෙහි සියළු ගිවිසුම්ගත නියමයන් සැළකිල්ලට ගන්නා අතර මූල්‍ය උපකරණය වෙත සෘජුවම පැවරිය හැකි සහ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන යම් ගාස්තු හෝ වර්ධනීය පිරිවැය ඇතුළත් කරගන්නා නමුත් අනාගත ණය අලාභ ඇතුළත් කර නොගනී. ගනුදෙනු පිරිවැය වෙත මූල්‍ය වත්කමක හෝ වගකීමක අත්පත් කරගැනීම හෝ නිකුත් කිරීමට සෘජුව ආරෝපනය කළ හැකි වර්ධනීය පිරිවැයද ඇතුළත් වේ.

(ආ) ලාභාංශ ආදායම
ආදායම හිමිකරගැනීමේ අයිතිය ස්ථාපනය වූ පසු ලාභාංශ ආදායම හඳුනාගැනේ.

3.4.1.4 සේවාලාභීන් සමග ගිවිසුම් වලින් ආදායම
සේවාලාභීන් සමග ගිවිසුම් වලින් ආදායම, භාණ්ඩ හෝ සේවාවන්හි පාලනය සේවාලාභියකු වෙත මාරුකිරීමේදී, අදාළ භාණ්ඩ හෝ සේවාවන්ගේ හුවමාරුවට සමූහය අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාව පිළිබිඹු කෙරෙන මුදලක් අනුව හඳුනාගැනේ.

3.4.1.5 ආරෝග්‍යශාලා ආදායම
සේවාලාභියා විසින් අඛණ්ඩවම සමූහය විසින් සපයනු ලබන සේවාවන් සමාගාමීව ලබාගන්නා සහ පරිභරනය කරන බැවින්, සමූහය මගින්, සේවා සම්බන්ධ පූර්ණ තෘප්තිමත්බව මැනීම සඳහා ආදාන ක්‍රමවේදයක් යොදාගනිමින්, කාලසමය පුරා ආරෝග්‍යශාලා සේවාවන්ගෙන් ලැබෙන ආදායම හඳුනාගැනේ.

සමූහය විසින් අභ්‍යන්තර හා බාහිර උපදේශකයින් වෙනුවෙන් එක්රැස් කරනු ලබන උපදේශන ගාස්තු ආදායමෙහි කොටසක් නිර්මාණය කරනු නොලබන අතර ආදායමෙන් බැහැර කෙරේ.

3.4.1.6 භාණ්ඩ විකිණීමෙන් ආදායම
භාණ්ඩ විකිණීමෙන් ආදායම, සාමාන්‍යයෙන් අදාළ භාණ්ඩය ලබාදීමේදී, වත්කමෙහි පාලනය ගනුදෙනුකරුවා වෙත මාරුකරනු ලබන අවස්ථාවේදී හඳුනාගැනේ. මෙහිදී ගනුදෙනු මිළෙහි කොටසක් වෙන් කල යුතු වෙනම කාර්යසාධන බැඳීම් සම්බන්ධ වෙනත් ප්‍රතිඥාවන් ගිවිසුමෙහි පවතීද යන්න සමූහය මගින් සැළකිල්ලට ගැනේ. භාණ්ඩ විකිණීමේ ගනුදෙනු මිළ ගණන් නිර්ණය කිරීමේදී, සමූහය මගින්, විචල්‍ය ප්‍රතිශ්ඨාවෙහි බලපෑම සහ සැළකිය යුතු මූල්‍යමය සංරචකයන්හි පැවැත්ම සැළකිල්ලට ගැනේ.

(i) විචල්‍ය ප්‍රතිශ්ඨාව
ගිවසුමක ප්‍රතිශ්ඨාවෙහි විචල්‍ය මුදල් ප්‍රමාණයක් පැවතියහොත්, සමූහය මගින්, ගනුදෙනුකරු වෙත භාණ්ඩ මාරුකිරීමේ හුවමාරුවට සමූහය හිමිකම් අත්කරගන්නා ප්‍රතිශ්ඨාවෙහි මුදල් ප්‍රමාණයට ඇස්තමේන්තු කරනු ලැබේ. විචල්‍ය ප්‍රතිශ්ඨාව ගිවිසුම ආරම්භයේදී ඇස්තමේන්තුගත කෙරෙන අතර විචල්‍ය ප්‍රතිශ්ඨාව ආශ්‍රිත අවිනිශ්චිතතාව පසුව විසඳාලීමේදී, හඳුනාගත් සමුච්චිත ආදායමෙහි සැළකිය යුතු ප්‍රතිවර්තනයකි සිදුනොවන බවට ඉහළ සම්භාවිතාවක් ඇති වන තෙක් සීමාකාරීව රදවාගැනේ. භාණ්ඩ විකිණීම සම්බන්ධ ඇතැම් ගිවිසුම් මගින් ගනුදෙනුකරු වෙත ආපසු ලබාදීමේ හිමිකමක් ලබාදෙයි. ආපසු ලබාදීමේ හිමිකම මගින් විචල්‍ය ප්‍රතිශ්ඨාව උද්ගත වේ.

(ii) ආපසු ලබාදීමේ හිමිකම්
ඇතැම් ගිවිසුම් මගින් ගනුදෙනුකරු වෙත නිශ්චිත කාලයක් ඇතුළත භාණ්ඩ ආපසු ලබාදීමේ හිමිකමක් ලබාදෙයි. ආපසු ලබානොදෙන භාණ්ඩ ඇස්තමේන්තුගත කිරීම සඳහා සමූහය මගින් අපේක්ෂිත වටිනාකම් ක්‍රමවේදය භාවිත කරනු ලබන්නේ, එම ක්‍රමය මගින් සමූහය හිමිකම් කියන්නා වූ විචල්‍ය ප්‍රතිශ්ඨාවෙහි මුදල ප්‍රශස්ත අයුරින් පුරෝකථනය කරනු ලබන බැවිනි. විචල්‍ය ප්‍රතිශ්ඨාවන් සම්බන්ධ සීමාකාරී රදවාගැනීමේ ඇස්තමේන්තු වලට අදාළ SLFRS 15 අවශ්‍යතාද ගනුදෙනු මිලෙහි ඇතුළක් කල හැකි විචල්‍ය ප්‍රතිශ්ඨා මුදල නිර්ණය කිරීම සඳහා යොදා ගැනේ. ආපසු ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන භාණ්ඩ සඳහා, ආදායම වෙනුවට, සමූහය මගින් මුදල් ආපසු ගෙවීමේ වගකීමක් හඳුනාගැනේ.

(iii) සැළකිය යුතු මූල්‍යකරණ සංරචකය
සාමාන්‍යයෙන්, සමූහය වෙත එහි ගනුදෙනුකරුවන්ගෙන් කෙටි කාලීන අත්තිකාරම් හිමි වේ. SLFRS 15 හි ප්‍රායෝගික තත්ත්වය උපයෝගී කරගනිමින්, සමූහය මගින්, ගිවිසුම ආරම්භයේදී, ගනුදෙනුකරු වෙත පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාව මාරුකිරීම අතර කාලපරිච්ඡේදය සහ ගනුදෙනුකරු විසින් අදාළ භාණ්ඩ හෝ සේවාව වෙත එක් වසරක් හෝ එයට පෙර ගෙවනු ලබන බවට අපේක්ෂා කරන්නේ නම්, පොරොන්දු වූ ප්‍රතිශ්ඨාවෙහි මුදලට වෙත ගැළපීම් සිදුනොකෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

3.4.1.7 ආයෝජන දේපළ වලින් කුලී ආදායම

ආයෝජන දේපළ වලින් කුලී ආදායම, කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත ආදායම වශයෙන් හදුනාගැනේ. පිරිනමන ලද කල්බදු දීමනා කල්බදු කාලසීමාව පුරා, මුලු කුලී ආදායමෙහි අත්‍යාවශ්‍ය කොටසක් වශයෙන් හදුනාගැනේ.

3.4.1.8 දේපළ, පිරියත සහ උපකරණ බැහැරකිරීම මත ලාභය/අලාභය

දේපළ, පිරියත සහ උපකරණ මත ලාභය/අලාභය විකිණීම සිදුවන කාලසීමාව තුළ හදුනාගැනෙන අතර වෙනත් ආදායම් යටතේ වර්ග කෙරේ.

3.4.2 තිලාභ, හිමිකම්පෑම් සහ වියදම්

3.4.2.1 දළ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම්

(අ) ජීවිත රක්ෂණ ව්‍යාපාරය

මරණය හෝ කාලසීමාව කල්පිරීම දැනුම්දීමේදී මරණය සහ කල්පිරීමෙන් වන හිමිකම්පෑම් ආදායමෙන් අය කෙරේ. අතරමැදි හිමිකම්පෑම් සහ පවාරනයන් පියවන අවස්ථාවේදී පමණක් ගිණුම්ගත කෙරේ. උපචිත පදනමින් ගිණුම්ගත කෙරෙන ජීවිත රක්ෂණ ආශ්‍රිත වියදම් අත්පත් කරගැනීමේ වියදම් සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ වියදම් සහ ආයෝජනයෙහි ප්‍රාග්ධන පිරිවැයෙහි කොටසක් වශයෙන් නොසැළකෙන ආයෝජන ආශ්‍රිත වියදම් ආදියෙන් සමන්විත වේ.

(ආ) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි හිමිකම්පෑම්. වාර්තාගත හෝ වාර්තා නොවූ වසර තුළ සිදුවූ හිමිකම්පෑම්, හිමිකම්පෑම් සැකසුම් සහ පියවීම් වෙත සෘජුව සම්බන්ධිත හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පිරිවැය, බේරුම් කිරීමේ වටිනාකම සඳහා අඩුකිරීම් සහ වෙනත් පියවාගැනීම්, සහ පෙර වසර වල හිමිකම්පෑම් වෙත සිදුකරන ලද කවර හෝ ගැලපුම් වලින් සමන්විත වේ. හිඟ හිමිකම්පෑම්, ඒක පුද්ගල හිමිකම්පෑම් ලිපිගොනු විමර්ශනය සහ හිමිකම්පෑම් පියවීමේ අවසන් පිරිවැය ඇස්තමේන්තුගත කිරීම මගින් තක්සේරු කරනු ලැබේ.

දරන ලද නමුත් වාර්තා නොකරන ලද (IBNR) සහ දරන ලද නමුත් ප්‍රමාණවත් අයුරින් වාර්තා නොකරන ලද (IBNER) හිමිකම්පෑම් සම්බන්ධ ප්‍රතිපාදනය, අතීත අත්දැකීම් සහ ප්‍රවණතා මත පදනම්ව අනාගත වගකීම් පිළිබඳ වඩාත් යථාර්ථවාදී ඇස්තමේන්තුවක් තහවුරු කිරීම උදෙසා අනුගණනමය වශයෙන් තක්සේරු කෙරේ. ආයුගණන තක්සේරුකරණයන් කාර්තුමය පදනමක් මත සිදු කෙරේ.

දැනට පවතින තොරතුරු මත පදනම්ව හිමිකම්පෑම් සඳහා වන ප්‍රතිපාදන සාධාරණ අයුරින් ප්‍රකාශිත බවට අධ්‍යක්ෂවරුන් සළකන අතර, පසුකාලීන තොරතුරු සහ සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් පරම වගකීම විචලනය විය හැක. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දක්වා ඇති අගයයන් වෙත ගැලපුම් සිදු කෙරෙනු ඇත. එබඳු අගයයන් අදාළ කාලපරිච්ඡේදයෙහි මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කෙරේ.

3.4.2.2 ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම්

අදාළ ගිවිසුමෙහි කොන්දේසි අනුව ආශ්‍රිත දළ රක්ෂණ හිමිකම්පෑම හදුනාගත් අවස්ථාවේදී ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් හදුනාගැනේ.

3.4.2.3 ශුද්ධ විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය

විචල්‍ය වන කොමිස් නියෝජනය වන, අත්පත් කරගැනීමේ පිරිවැය ව්‍යාපාරයෙහි නිෂ්පාදනයට සෘජුව සම්බන්ධ වේ.

සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් ආශ්‍රිත අත්පත් කරගැනීමේ පිරිවැය, අදාළ ලිඛිත වාරික උපයනු ලබන කාලපරිච්ඡේදය පුරා විලම්බනය කොට ක්‍රමක්ෂය කෙරේ. ප්‍රතිරක්ෂණ කොමිස් සම්බන්ධයෙන්ද විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය ඇතුළත සමාන ආකාරයේ ක්‍රමවේදයක් අනුගමනය කෙරේ.

3.4.2.4 ජීවිත රක්ෂණ අරමුදලෙහි ආයුගණන තක්සේරුකරණය

ජීවිත රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධ සිය වාර්ෂික විමර්ශනයෙන් අනතුරුව ස්වාධීන ආයුගණකවරයා විසින් සිදුකරන ලද නිර්දේශ මත පදනම්ව, අධ්‍යක්ෂවරුන් වසර අවසානයේදී සමාගමෙහි දිගු කාලීන රක්ෂණ ප්‍රතිපාදනය සඳහා එකගත්වය පළ කලහ. ආයුගණන තක්සේරුවේදී සියලුම වගකීම් සැළකිල්ලට ගැනෙන අතර. එය ස්වාධීන උපදේශන ආයුගණකවරයාගේ නිර්දේශ මත පදනම් වේ.

3.4.2.5 වෙනත් වියදම්

වෙනත් වියදම් උපචිත පදනමක් මත හදුනාගැනේ. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරිය සහ උපකරණ නඩත්තු කිරීමේදී දරන ලද සියලුම වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශය වෙත අය කෙරේ.

3.4.3 සේවක ප්‍රතිලාභ

(අ) කෙටි කාලීන ප්‍රතිලාභ

අදාළ සේවාව සපයන ලද අවස්ථාවේදී කෙටිකාලීන සේවක ප්‍රතිලාභ පිරිනමනු ලැබේ. සේවකයා විසින් අතීතයේදී සපයන ලද සේවාවක ප්‍රතිඵලයක් වශයෙන් අදාළ මුදල ගෙවීමට සමූහයට වර්තමාන නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් පවතී නම් සහ අදාළ බැඳීම විශ්වසනීය අයුරින් මැනිය හැකි නම්, කෙටි කාලීන බෝනස් මුදලක් හෝ ලාභ බෙදාගැනීමේ සැලසුම් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල සඳහා වගකීමක් හදුනාගැනේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමක් වන අතර, ඒ යටතේ සමාගම මගින් වෙනත් සමාගමක් වෙත ස්ථාවර දායකත්වයන් ගෙවනු ලබන අතර තවදුරටත් ගෙවීම් සිදුකිරීමේ නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නොපවතී.

නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා වන බැඳීම්, සේවකයින් විසින් සේවාවන් සපයන ලද කාලසීමාව තුළ සේවා නියුක්ති ප්‍රතිලාභ වියදමක් වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

සේවක අර්ථසාධක අරමුදල
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සචි ලිට්‍රෝ ටර්මිනල් ලංකා සමාගම සහ ඒවායේ සේවකයින් විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙලින් 15% ක සහ 10% දායකත්වයක් අනුමත අර්ථසාධක අරමුදල වෙත දක්වනු ලැබේ.

සෙසු සමූහයේ සමාගම් සහ ඒවායේ සේවකයින් විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙලින් 12% ක සහ 8% දායකත්වයක් අනුමත අර්ථසාධක අරමුදල වෙත දක්වනු ලැබේ.

සේවා නියුක්තියන්ගේ භාර අරමුදල
සමූහය/සමාගම මගින් එක් එක් සේවකයාගේ වැටුපෙන් 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල වෙත දායක කෙරේ.

(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම
නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් හැරුනුවිට පවතින පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගැනෙන වගකීම නිශ්චිත ප්‍රතිලාභ බැඳීමෙහි වාර්තාකරණ දිනට වර්තමාන වටිනාකම වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ගණනය කිරීම, LKAS 19 - 'සේවක ප්‍රතිලාභ' මගින් නිර්දේශිත පරිදි වාර්තාකරණ දිනට සුදුසුකම් ලත් ආයුගණකයකු විසින් පුරෝකථනය කරන ලද ඒකක ණය (PUC) ක්‍රමවේදය යොදාගනිමින් වාර්ෂිකව සිදු කරනු ලැබේ. ආයුගණන තක්සේරුවට වට්ටම් අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය සහ සේවකයින්ගේ අවශේෂ සේවා කාලය පිළිබඳ උපකල්පන ඇතුළත් වේ. සැලසුම් වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන් අදාළ උපකල්පන සැළකිය යුතු අවිනිශ්චිතතාවන්ට භාජනය වේ.

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ, සේවකයකු කෙරෙහි වගකීම උද්ගත වනුයේ වසර 5 අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. මෙම වගකීම සඳහා පිටතින් අරමුදල් සම්පාදනය නොකෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ශුද්ධ පොලී වියදම සහ වෙනත් වියදම් ලාභ හෝ අලාභ වල හඳුනාගැනේ. සමූහය මගින් පියවීම සිදු කරන ලද අවස්ථාවේදී නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සම්බන්ධ කවර හෝ ලාභ හෝ අලාභ හඳුනාගැනේ.

ආයුගණන ලාභ සහ අලාභයන්ගෙන් සමන්විත අර්ථ දක්වා ඇති ශුද්ධ ප්‍රතිලාභ වගකීම් නැවත මැනීම, ඒවා පැන නගින කාල සීමාව තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට සිදු කරන ඇති හර කිරීම් හෝ අය කිරීම් ද ඇතුළත් ව සිදු කරනු ලැබේ.

3.4.4 ආදායම් බදු වියදම
ආදායම් බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. ස්කන්ධ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි අයිතම වෙත සම්බන්ධ වන තාක් දුරට ප්‍රවර්තන සහ විලම්බිත බදු ලාභ හෝ අලාභ වල හඳුනාගැනේ.

3.4.4.1 ප්‍රවර්තන බදු
මූල්‍ය ප්‍රකාශයන්හි වාර්තාගත ආදායම් සහ වියදම් සංරචක මත පදනම්ව ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සිදුකෙරෙන අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතෙහි 67 වගන්තිය සහ එහි සංශෝධන ප්‍රකාරව ගණනය කරනු ලැබේ. මෙම කොටස අනුව ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ ලාභ මත ගෙවිය යුතු මුලු බදු මුදල පහත දැක්වෙන අංග වලින් සමන්විත වේ:

- 24% ක අනුපාතයකට ආයුගණක විසින් සහතික කරන ලද පරිදි ජීවිත රක්ෂණ අරමුදලෙන් කොටස් හිමිකරුවන් වෙත බෙදාහරින ලද අතිරික්තය
- 24% ක අනුපාතයකට එම ආදායමෙන් නිෂ්පාදන සඳහා දරන ලද කවර හෝ වියදමක් අඩු කොට කොටස් හිමිකරුවන්ගේ අරමුදලෙහි ආයෝජන ආදායම
- 24% ක අනුපාතයකට ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි නියැලී සිටින පුද්ගලයකුගේ ලාභ බෙදාගනු ලබන ජීවිත රක්ෂණවර හිමියකු වෙත බෙදාහරින ලද අතිරික්තය.

එනමුත් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා, සෙසු සියලු කොටස් අදාළ වන අතර එම ව්‍යාපාරයෙහි ලාභ වල බදු අනුපාතය 24% කි.

ප්‍රවර්තන ආදායම් බදු යනු වසර සඳහා බදු වලට යටත් වන ආදායම හෝ අලාභ මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු යැයි අපේක්ෂිත බදු වන සහ පෙර වසර සම්බන්ධ ගෙවිය යුතු හෝ ලැබිය යුතු වෙත සිදුකෙරෙන තවර හෝ ගැලපුමක් වේ. වාර්තාකරණ දිනයේදී ක්‍රියාත්මක බදු අනුපාතයන් භාවිත කරමින් එය මනිනු ලැබේ.

කළමනාකාරිත්වය විසින් අදාළ බදු රෙගුලාසි අර්ථදැක්වීම් වලට යටත් වනඅවස්ථාවන්හිදී ඇති වන තත්ත්වයන් සම්බන්ධ බදු ආදායම් කෙරෙහි ගත්නා ලද පියවර ආවර්තිතව තක්සේරු කරමින් අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිපාදන සපයනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

3.4.4.2 විලම්බිත බදු

වත්කම් හා වගකීම් වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ කටයුතු සඳහා ඒවායේ ඉදිරියට රැගෙන යන ප්‍රමාණයන් අතර වාර්තා කරන දිනයේදී තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු සම්ප්‍රයුක්ත වේ. පහත සඳහන් අවස්ථාවන්හි දී හැර, බදු අය කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් හා වගකීම් පිළිගනු ලැබේ:

තාවකාලික වෙනස්කම්වල ආපසු හැරවීමේ කාලය පාලනය කළ හැකි සහ අනාගතයේදී තාවකාලික වෙනස්කම් ආපසු හැර නොවීමට ඉඩ ඇති බවට ඒත්තු යන විට දී අනුබද්ධිත සමාගම්වල ආයෝජනය සමඟින් සම්බන්ධ වන තාවකාලික වෙනස්කම්වලට අදාළව විලම්බිත බදු වත්කම් සියළුම අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා පිළිගෙන ඇති අතර, භාවිතයට නොගත් බදු ණය හා භාවිතා නොකළ බදු අලාභයන් ඉදිරියට ගෙන යන අතර, අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සමඟ බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට ඉඩ ඇති අතර, භාවිතයට නොගත් බදු ණය ඉදිරියට ගෙන යාම කළ හැකි වන අතර භාවිතා නොකළ බදු අලාභ මතු දැක්වෙන තත්ත්වයන්හි දී හැර ප්‍රයෝජන ගත හැකිය:

වාර්තා කරන දිනයේදී බලාත්මක කර ඇති හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කර ඇති බදු අනුපාත (සහ බදු නීති) මත පදනම්ව වත්කම් සම්පූර්ණ වූ විටහෝ වගකීම් පියවන විට බලපැවැත්වෙන පරිදි වර්ෂය තුළදී බදු අනුපාතයන් මත විලම්බිත බදු වත්කම් හා වගකීම් මනිනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ඉදිරියට රැගෙන යන ප්‍රමාණය එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කෙරෙන අතර, විලම්භිත බදු වත්කම් වලින් කොටසක් හෝ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට නොහැකි වන ආකාරයට ඌනනය කෙරේ.

වර්තමාන බදු වගකීම්වලට හා විලම්බිත බදු එකම ආයතනයකට සහ එකම බදු අධිකාරියට අයත් වීමට සාපේක්ෂ ව ප්‍රවර්තන බදු වත්කම් අහෝසි කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් පියවනු ඇත.

මූල්‍ය සේවාවන් මත එකතු කල අගය මත බදු

මූල්‍ය සේවාවන් මත එකතු කල අගය මත බදු 2002 අංක 14 දරණ එකතු කල අගය මත බදු පනත සහ එහි සංශෝධන අනුව ගණනය කරනු ලැබේ. මූල්‍ය සේවාවන් මත එකතු කල අගය මත බදු ගණනය කිරීමේ පදනම වනුයේ, ආර්ථික ක්ෂයවීම් සහ සේවකයින් වෙත ගෙවිය යුතු මුදල්, මුදල් නොවන ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ සඳහා වන ප්‍රතිපාදන සඳහා ගළපන ලද, එකතු කල අගය මත බදු සහ ආදායම් බදු වලට පෙර ගිණුම්ගත ලාභයයි.

3.4.4.3 ලාභාංශ මත රදවාගැනීමේ බදු

සමූහය මගින් ලාභාංශ බෙදාදීමේදී පැන නගින රදවාගැනීමේ බද්ද එම අවස්ථාවේදීම ආශ්‍රිත ලාභාංශය හදුනාගත් විට එය ගෙවීමේ වගකීම වශයෙන හදුනාගැනේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත 2020 පෙබරවාරි 18 වැනි දිනැති (PN/IT/2020-03) දැන්වීම අනුව, 2020 ජනවාරි 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ලාභාංශ මත රදවගැනීමේ බදු අඩු කිරීමේ අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

3.4.4.5 වගා රක්ෂණ බද්ද (CIL)

(2013)) අංක (12) දරණ මූල්‍ය පනතේ වගන්ති (14) විධිවිධාන ප්‍රකාර, 2013 අප්‍රේල් පලවෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වගා රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලද අතර, එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. මේ වන විට, වගා රක්ෂණ බද්ද බදු වලට පසු ලාභයෙන් 1% වශයෙන් ගෙවිය යුතු වේ.

3.5 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.5.1 දේපල, පිරියත සහ උපකරණ

3.5.1.1 මූලික හඳුනාගැනීම සහ මිනුම්කරණය

දේපල, පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂය සහ අපහායන අලාභ අඩු කොට පිරිවැය අනුව මනිනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ වල පිරිවැය යනු කිසියම් වත්කමක් ඒවායේ අභිප්‍රේත භාවිතය සඳහා ක්‍රියාකාරී මට්ටිමට ගෙනඒම සඳහා දරන ලද වියදම් සමගින් එය අත්පත් කරගැනීම හෝ ඉදිකිරීම සඳහා දරන ලද පිරිවැය වේ.

පිරිවැය වත්කම අත්පත් කරගැනීම සඳහා සෘජුව ආරෝපනය කල හැකි වියදම් වලින් සමන්විත වේ. ස්වයං නිර්මිත වත්කම් වල පිරිවැය පහත දැක්වෙන කරුණු වලින් සමන්විත වේ:

- අමුද්‍රව්‍ය පිරිවැය හා සෘජු ශ්‍රමය පිරිවැය
- වත්කමක් අභිප්‍රේත භාවිතය සඳහා ක්‍රියාකාරී මට්ටිමට ගෙනඒම සඳහා සෘජුව ආරෝපනය කල හැකි පිරිවැය
- අයිතමයන් ඉවත් කිරීමේ හා අදාළ පරිශ්‍රයේ ප්‍රතිස්ථාපනය කිරීමේදී සමූහයේ බැඳීම

බැහැරකිරීම සම්බන්ධ කවර හෝ ලාභ හෝ අලාභ ලාභ හෝ අලාභයන්හි වෙනත් මෙහෙයුම් ආදායම් වල හදුනාගැනේ.

3.5.1.2 පසුකාලීන වියදම් සහ ප්‍රතිස්ථාපනය

ප්‍රධාන පෙලේ අළුත්වැඩියාවන් සම්බන්ධ පිරිවැය, පවතින වත්කම් වල ආසන්නතම තක්සේරු කරන ලද සම්මත කාර්යසාධනයට වැඩි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලාවීමක් සිදුවන අවස්ථාවේදී සහ අළුත්වැඩියාවේදී අදාළ වත්කමෙහි හඳුනාගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේදී, ධාරණ අගය තුළ ඇතුළත් කෙරේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ධාරණ අගය හදුනාගැනීමෙන් බැහැර කෙරේ. දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධ දෛනික සේවාකරණ පිරිවැය දරන ලද අවස්ථාවේදී ලාභ හෝ අලාභ වල හදුනාගැනේ.

3.5.1.3 ප්‍රත්‍යාගණනයන්

සාධරණ අගය විශ්වසනීය අයුරින් මැනිය හැකි වත්කමක්, ඉඩම් සහ ගොඩනැගිලි හදුනාගැනීමෙන් අනතුරුව, කවර හෝ පසුකාලීන ක්ෂය සහ පසුකාලීන අපහායන අලාභ අඩුකොට ප්‍රත්‍යාගණන දිනයේදී ප්‍රත්‍යාගණන වටිනාකමට ධාරණය කෙරේ. වාර්තාකරණ දිනට ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බවට තහවුරු කිරීම සඳහා තක්සේරුකරණයන් සිදුකරනු ලැබේ.

අවම වශයෙන් වසර තුනකට වරක් වෘත්තීයමය තක්සේරුකරුවන් විසින් ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කෙරෙන අතර සාධාරණ අගය වෙනස්වීම හේතුවෙන් උද්ගත වන කවර හෝ ලාභයක් හෝ අලාභයක් ඒවා උද්ගත වූ වසරේදී වෙනත් විස්තීර්ණ ආදායමෙහි ඇතුළත් කෙරේ.

ප්‍රත්‍යාගනනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ධාරණ අගයෙහි ඉහළයාමක්, වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගෙන ප්‍රත්‍යාගණන සංචිත තේමාව යටතේ ස්කන්ධ තුළ සමුච්චය කෙරේ. කෙසේවුවද, ලාභ හෝ අලාභයන්හි පෙර හඳුනාගත් එම වත්කමෙහිම ප්‍රත්‍යාගණන පහළයාමක් එමගින් ප්‍රතිවර්තනය කරන තාක් දුරට අදාළ ඉහළයාම ලාභ හෝ අලාභයන්හි හඳුනාගැනේ.

ප්‍රත්‍යාගනනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ධාරණ අගයෙහි පහළයාමක්, ලාභ හෝ අලාභයන්හි හඳුනාගැනේ. කෙසේවුවද අදාළ වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි පවතින ණය ශේෂයක් තරමට අදාළ පහළයාම වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගැනේ.

එයට අමතරව, වත්කමෙහි දළ ධාරණ අගයට සාපේක්ෂව ප්‍රත්‍යාගණන දිනට සමුච්චිත ක්ෂය බැහැර කෙරෙන අතර ශුද්ධ අගය වත්කමෙහි ප්‍රත්‍යාගණිත අගයට ප්‍රතිප්‍රකාශ කෙරේ. බැහැර කිරීමෙන් අනතුරුව, නිශ්චිත විකුණන ලද වත්කම සම්බන්ධ කවර හෝ ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවාගත් ඉපැයුම් වෙත සෘජුව මාරු කෙරේ.

3.5.1.4 ක්ෂය වීම්

දේපල, පිරියත සහ උපකරණ වල එක් එක් කොටසක ඇස්තමේන්තුගත සඵල ජීව කාලය පුරා ඒවායේ අවශේෂ වටිනාකම් වෙත සරල රේඛීය පදනමකින් ආදායම් ප්‍රකාශයේ දී ක්ෂය වීම් හඳුනා ගනී මෙම ක්‍රමය මගින් අදාල වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ අපේක්ෂිත ක්‍රමය සමීපව පිළිබිඹු කෙරේ.

ප්‍රවර්තන සහ සන්සන්දනාත්මක කාලපරිච්ඡේදයන් සඳහා ඇස්තමේන්තුගත සඵල ජීව කාලයන් පහත දැක්වෙන පරිදි වේ:

- ගොඩනැගිල - වසර 20 - 40
- දැව භාණ්ඩ සහ උපාංග - වසර 5 - 10
- කාර්යාල සහ වෙනත් උපකරණ - වසර 5 - 10
- විදුලි ජනන යන්ත්‍ර සහ වායු සමන පිරියත - වසර 5 - 10
- මෝටර් රථ - වසර 4 - 5
- මෙවලම් සහ උපාංග - වසර 6 2/3
- පිරියත සහ යන්ත්‍ර - වසර 20
- පරිගනක සහ පරිගනක උපාංග - වසර 4 - 7
- එල්පී ගෑස් ගබඩා ටැංකි, නළ මාර්ග සහ උපාං- වසර 25
- එල්පී ගෑස් සිලින්ඩර - වසර 10
- වෙනත් ස්ථාවර වත්කම් - වසර 3 - 12

එක් එක් වාර්තා කරන දිනයේ දී ක්ෂයවීමේ ක්‍රම, සඵල ජීව කාලයන් සහ අවශේෂ වටිනාකම් ප්‍රතිතක්සේරු ගතකොට සුදුසු පරිදි ගලපනු ලැබේ.

3.5.1.5 හඳුනාගැනීමෙන් බැහැර කිරීම

දේපළ, පිරියත හා උපකරණ ඒවා ඉවත් කිරීමේදී හෝ එමගින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කළ නොහැකි විටකදී හඳුනාගැනීමෙන් බැහැර කෙරේ දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් හඳුනාගැනීමේන බැහැර කිරීමෙන් උද්ගත වන ලාභය හෝ අලාභය අදාළ අයිතමය හඳුනාගැගීමෙන් බැහැර කරන ලද අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය වෙත ඇතුළත් කෙරේ.

3.5.1.5 අපහායනය

අධ්‍යක්ෂවරුන් විසින්, කෝවිඩ් 19 වසංගත බලපෑමද සැළකිල්ලට ගනිමින් 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණ වල අපහායනය තක්සේරු කරන ලදී. තක්සේරුව අනුව, වාර්තාකරණ දිනට දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු අපහායන ප්‍රතිපාදනයක් අවශ්‍ය නොවේ.

3.5.1.6 නොනිමි කාර්ය ප්‍රාග්ධනය

නොනිමි කාර්ය ප්‍රාග්ධනය පිරිවැය අනුව ප්‍රකාශ කෙරේ. ප්‍රාග්ධනීකරණය අපේක්ෂා කෙරෙන ගොඩනැගිලි ඉදිකිරීම් වලදී සෘජුව දරනු ලබන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

3.5.2 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමකට ආරෝපනය කල හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලාඒම සිදුවිය හැකි නම් සහ එය විශ්වසනීය අයුරින් මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගැනේ.

3.5.2.1 කීර්තිනාමය

පරිපාලිතයන් අත්පත් කරගැනීමේදී උද්ගත වන කීර්තිනාමය සමුච්චිත අපහායන අලාභ අඩුකොට පිරිවැය අනුව මනිනු ලැබේ.

කීර්තිනාමය අපහායනය

අදාළ තත්ත්වයන් මගින් ධාරණ අගය අපහායනයට ලක්ව ඇති බවට දර්ශනය වන අවස්ථාවන්හිදී සහ වාර්ෂිකව ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගන්නා ලද කීර්තිනාමය පරීක්ෂාවට ලක් කෙරේ. මුදල් උත්පාදන ඒකකයක පියවාගැනීම් අගය දාරණ අගයට වඩා පහළ නම්, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි අපහායන අලාභයක් හඳුනාගැනේ. කීර්තිනාමය සම්බන්ධ අපහායනය ප්‍රතිවර්තනය නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

3.5.2.2 මෘදුකාංග

වෙනත් අස්පෘශ්‍ය වත්කම් සමූහය මගින් අත්පත් කරගනු ලබන අතර පරිමිත ජීව කාලයක් සහිත වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ කවර හෝ සමුච්චිත අපහායන අලාභ අඩු කොට පිරිවැය අනුව මනිනු ලැබේ. පරිමිත ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් අදාළ වත්කම අපහායනය වී ඇති බවට කිසියම් දර්ශකයක් පැවතියහොත් අපහායනය සඳහා තක්සේරු කෙරේ. අපරිමිත ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ඒකලව හෝ මුදල් උත්පාදන ඒකක මට්ටමින් වාර්ෂිකව අපහායනය සඳහා තක්සේරු කෙරේ.

සමූහය මගින් වාර්තාකරණ දිනට වෙනත් අස්පෘශ්‍ය වත්කම් වශයෙන් මෘදුකාංග අත්පත් කොට ගෙන ඇත.

පසුකාලීන වියදම්

මෘදුකාංග සම්බන්ධ පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එමගින් එය සම්බන්ධ වන නිශ්චිත වත්කමෙහි ඇතුළත් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළයාමේදී පමණි. සෙසු සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

ක්‍රමක්ෂය

අස්පෘශ්‍ය වත්කමෙහි පිරිවැය කපාහැරීම සඳහා ක්‍රමක්ෂය ගණනය කෙරෙන අතර එහිදී ඒවායේ ඇස්තමේන්තුගත සඵල ජීව කාලය පුරා සරල රේඛීය ක්‍රමය භාවිත කරමින් ඒවායේ අවශේෂ වටිනාකම් අඩු කොට ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ. මෘදුකාංග වල ඇස්තමේන්තුගත සඵල ජීව කාලය වසර පහකි.

ක්‍රමක්ෂය ක්‍රමවේදයන්, සඵල ජීව කාලයන් සහ අවශේෂ වටිනාකම් එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කොට සුදුසු පරිදි ගළපනු ලැබේ.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම

බැහැර කිරීමේදී හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකෙරෙන විට අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ. එමගින් උද්ගත වන ලාභය හෝ අලාභය අදාළ අයිතමය හඳුනාගැනීමෙන් බැහැර කරන ලද අවස්ථාවේදී ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ.

සමූහය මගින් 2021 දෙසැම්බර් 31 දිනට කෝවිඩ් 19 බලපෑමද ඇතුළත්ව අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධ සිදුවිය හැකි අපහායන දර්ශකයන් තක්සේරු කරන ලදී. ඒ මත පදනම්ව කිසිදු අපහායන දර්ශකයක් හඳුනා නොගැනිනි.

3.5.3 භාවිත හිමිකම් වත්කම්

SLFRS 16 මගින්, LKAS 17 කල්බදු, ගිවිසුමක් තුළ කල්බදු ඇතුළත් වේද යන්න නිර්ණය කෙරෙන IFRIC 4, SIC-15 මෙහෙයුම් කල්බදු - දීමනා සහ SIC-17 කල්බදු වල නෛතික ආකාරය සහිත ගනුදෙනු වල අඩංගු කරුණු තක්සේරු කිරීම යන ප්‍රමිතීන් අවලංගු කෙරේ. මෙම ප්‍රමිතිය මගින් කල්බදු හඳුනාගැනීම, මැනීම. ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සම්බන්ධ මූලධර්ම දැක්වෙන අතර, එහිදී බදුගැනුම්කරු විසින් ඒකල ශේෂපත්‍ර ආකෘතියක් යටතේ සියලුම කල්බදු ගිණුම්ගත කිරීම අවශ්‍ය වේ. සමූහය මගින් ප්‍රමිතියෙහි විශේෂිත පරිවර්තනීය ප්‍රතිපාදනයන් යටතේ, 2018 වාර්තාකරණ කාලසීමාව සඳහා සන්සන්දනාත්මක තොරතුරු ප්‍රතිප්‍රකාශ කිරීමකින් තොරව, 2019 ජනවාරි 1 දින සිට පූර්ණ ප්‍රත්‍යවලෝකන ක්‍රමවේදයක් භාවිත කරමින් SLFRS 16 ආදේශ කරගැනිනි. ගිවිසුමක් ආරම්භයේදී, සමූහය මගින් අදාළ ගිවිසුම කල්බදු ද නැතහොත් එහි කල්බදු ඇතුළත් වේද යන්න තක්සේරු කෙරේ. ගිවිසුම කල්බදු හෝ නැතහොත් එහි කල්බදු ඇතුළත් වේනම්, ප්‍රතිශ්ධාවෙහි හුවමාරුවට කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ හිමිකම ගිවිසුම මගින් ප්‍රකාශයට පත්වන්නේ නම් එය කල්බදු හෝ නැතහොත් එහි කල්බදු ඇතුළත් ගිවිසුමක් වේ. ප්‍රතිශ්ධාවෙහි හුවමාරුවට කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ හිමිකම ගිවිසුම මගින් ප්‍රකාශයට පත්වන්නේද යන්න තක්සේරු කිරීම සඳහා සමූහය පහත දැක්වෙන කරුණු ඇගයුමට ලක් කරයි:

- ගිවිසුමෙහි හඳුනාගත් වත්කමක භාවිතය ඇතුළත් වේද,
- සමාගමට භාවිත කරනු ලබන කාලසීමාව පුරා අදාළ වත්කම භාවිත කිරීමෙන් සැළකිය යුතු අයුරින් සියලුම ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමේ හිමිකම පවතීද, සහ
- වත්කම භාවිතය මෙහෙයවීමේ හිමිකම සමාගම සතු වේද යන්න.

සමූහය මගින් කල්බදු ආරම්භක දිනයේදී භාවිත හිමිකම් වත්කම සහ කල්බදු වගකීම හඳුනාගැනේ. සමූහයේ භාවිත හිමිකම් වත්කම්, ඉහතදී LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු වශයෙන් හඳුනාගත්, කුලියක ලබාගත් ශාඛා පරිශ්‍රයන්ගෙන් සමන්විත වේ.

මූලික මිනුම්කරණය

සමූහය මගින්, භාවිත හිමිකම් වත්කම් මූලිකව පිරිවැය මත මිනුම්කරණය කරනු ලබන අතර, එය ආරම්භක දිනයේදී හෝ එයට පෙර සිදුකරන ලද කවර හෝ කල්බදු ගෙවීම් වලට ගළපන ලද කල්බදු වගකීමෙහි මූලික වටිනාකම, මෙන්ම පාදක වන වත්කම කඩා ඉවත් කිරීමට හෝ පාදක වන වත්කම හෝ එය පිහිටා ඇති පරිශ්‍රය ප්‍රතිස්ථාපනය කිරීමට දරන ලද කවර හෝ මූලික පිරිවැයක් හෝ පිරිවැය ඇස්තමේන්තුවක් අඩු කිරීම ලද කවර හෝ කල්බදු දීමනාවන්ගෙන් සමන්විත වේ.

කල්බදු මගින් කල්බදු කාලසීමාව අවසානයේදී පාදක වන වත්කමෙහි හිමිකාරිත්වය සමාගම වෙත පවරනු නොලබයි නම් හෝ භාවිත හිමිකම් වත්කමෙහි පිරිවැය මගින් අදාළ නම් සමාගම මගින් මිළදී ගැනීමේ වරණයක් සිදුකරනු ලබන බවට පිළිබිඹු නොවන්නේ නම්, භාවිත හිමිකම් වත්කම පසුව කල්බදු කාලසීමාවේ ආරම්භයේ සිට අවසානය දක්වා සරල රේඛීය ක්‍රමවේදයක් මත ක්ෂය කරනු ලැබේ. එහිදී, භාවිත හිමිකම් වත්කම පාදක වන වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය පුරා ක්ෂය කෙරෙන අතර එය දේපළ, පිරියත සහ උපකරණ වලට සමාන පදනමකින් නිර්ණය කෙරේ. එයට අමතරව, භාවිත හිමිකම් වත්කම හානිකරණයන් ඇත්නම්, ඒ අනුව ආවර්තිතව හානිකරණ අලාභයන්ගෙන් අඩු කෙරෙන අතර, කල්බදු වගකීමෙහි නිශ්චිත ප්‍රතිමිනුම්කරණයන් අනුව ගළපනු ලැබේ.

සමාගම මගින් පරිපාලිතයක් වෙත කුලියට ලබාදුන් දේපළක ප්‍රතිඵලයක් වශයෙන් පරිපාලිත සමාගමක් සතුව භාවිත හිමිකම් වත්කම් සහ කල්බදු වගකීමක් පවතී නම්, එබඳු භාවිත හිමිකම් වත්කම් සහ කල්බදු වගකීම සමෝධානික මූල්‍ය ප්‍රකාශයන්ගෙන් ඉවත් කෙරේ.

පසුකාලීන මිනුම්කරණය
සමාගම/ සමූහය මගින් ආරම්භ දිනයේ සිට භාවිත හිමිකම් වත්කමෙහි සඵල ජීවකාලයේ අවසානය හෝ කල්බදු කාලසීමාවේ අවසානය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා ඒවායේ ඇස්තමේන්තුගත සඵල ජීව කාලය පුරා සරල රේඛීය ක්‍රමය භාවිත කරමින් භාවිත හිමිකම් වත්කම් පසුකාලීනව ක්ෂය කෙරේ. භාවිත හිමිකම් වත්කම් වල සඵල ජීව කාලය දේපළ සහ උපකරණ කෙරෙහි යොදාගනු ලබන පදනම්න්ම නිර්ණය කෙරේ. එයට අමතරව, භාවිත හිමිකම් වත්කම් අපහායන අලාභ මගින් ආවර්තිතව අඩු කෙරන අතර, එවැනි තත්ත්වයක් ඇත්නම්, කල්බදු වගකීමෙහි නිශ්චිත ප්‍රති මිනුම් සඳහා ගැළපුම් සිදුකෙරේ.

කල්බදු වගකීම සඵල පොලී අනුපාතික ක්‍රම යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. දර්ශකයෙහි හෝ අනුපාතයෙහි වෙනසක් මගින් උද්ගත වන අනාගත කල්බදු ගෙවීම් වල වෙනසක්, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල පිළිබඳ සමූහයේ ඇස්තමේන්තුවේ වෙනසක් සිදුවුවහොත් හෝ , තමන් විසින් මිලදී ගැනීමේ, දීර්ඝ කිරීමේ හෝ අවසන් කිරීමේ වරණයක් භාවිත කරන්නේ යන්න පිළිබඳ සිය තක්සේරුව සමූහය මගින් වෙනස් කරන්නේ නම් එය ප්‍රති මිනුම්ගත කෙරේ.

භාවිත හිමිකම් වත්කම් අපහායනය
වාර්තාකරණ දිනට, කෝවිඩ් වසංගතය හේතුවෙන් භාවිත හිමිකම් වත්කම්වල කිසිදු අපහායනයක් සමූහය මගින් හදුනානොගත් අතර රජයේ නියෝගයන්ට අනුගත වෙමින්, එක් එක් ව්‍යාපාර ඒකකයන් විසින් සමාගමෙහි අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය අනුව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබයි.

3.5.4 ආයෝජන දේපළ
ආයෝජන දේපල යනු භාණ්ඩ හෝ සේවා සැපයීම් හෝ පරිපාලන අවස්ථා වෙනුවෙන් භාවිත කෙරෙන, නමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිනීම සඳහා නොපවතින, කුලී ආදායම් උපයා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීම සඳහා හෝ මෙම අරමුණු දෙකම සඳහා රඳවාගත් දේපළ වේ. ආයෝජන දේපල මූලිකව පිරිවැය අනුව මිනුම්ගත කොට පසුව සාධාරණ අගය අනුව මනිනු ලබන අතර කවර හෝ වෙනත් ආදායම් ප්‍රකාශයෙහි හදුනාගැනේ.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනයේ දී වෙළෙඳපොළ තත්ත්වයන් පිලිබිඹු වන පරිදි අයෝජන දේපළ සාධාරණ අගය අනුව ප්‍රකාශයට පත් කෙරේ. සාධාරණ අගය වෙනස් වීම හේතුවෙන් උද්ගතවන ලාභ හෝ අලාභ ඒවා උද්ගත වන වසරේ ආදායම් ප්‍රකාශයෙහි ඇතුළත් කෙරේ. එක් සමූහ සමාගමක් මගින් තවත් සමූහ සමාගමක ආයෝජන දේපළ වලින් සැලකිය යුතු කොටසක් අත්පත් කොටගෙන ඇති නම්, එවැනි ආයෝජන දේපල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්හි දේපල, පිරියත හා උපකරණ වශයෙන් සැලකෙන අතර ප්‍රත්‍යාගණන සංචිතයෙහි ඇතුළත් කොට රඳවාගත් ඉපැයුම් වෙත මාරු කෙරේ.

භාවිතයේ වෙනසක් සිදුවූ විට ආයෝජන දේපළ වෙත පැවරීම් සිදුකෙරේ. සමූහ සමාගම විසින් පරිපාලිතයක ආයෝජන දේපළක සැළකිය යුතු කොටසක් හිමිකරගෙන ඇති නම්, එබදු ආයෝජන දේපළක් සමෝධානික මූල්‍ය ප්‍රකාශයන්හි දේපළ, පිරියත සහ උපකරණ වශයෙන් සැළකෙන අතර LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ අනුව ගිණුම්ගත කෙරේ

3.5.5 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය
සමූහය මගින් එක් එක් වාර්තාකරණ දිනයේදී සිය මූල්‍ය නොවන වත්කම් වල (ආයෝජන දේපළ, තොග සහ විලම්බිත බදු වත්කම් හැර) ධාරණ අගයන් සමාලෝචනය කරමින් හානිකරණය පිළිබඳ කවර හෝ දර්ශකයක් පවතීද යන්න ඇගයුමට ලක් කෙරේ. එවැනි කවර හෝ දර්ශකයක් පවතී නම්, හෝ කිසියම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය වේ නම්, සමාගම මගින් අදාළ වත්කමෙහි පියවාගත හැකි වටිනාකම ඇස්තමේන්තුගත කෙරේ. හානිකරණය සඳහා කීර්තිනාමය වාර්ෂිකව පරීක්ෂාවට ලක් කෙරේ.

කිසියම් වත්කමක පියවාගත හැකි වටිනාකම යනු අදාළ වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි සාධාරණ අගය අඩුකිරීම එහි විකිණුම් පිරිවැය සහ එහි ප්‍රයෝජ්‍ය වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වේ. ප්‍රයෝජ්‍ය වටිනාකම තක්සේරු කිරීමේදී, මුදලෙහි කාල වටිනාකම සහ අදාළ වත්කමට විශේෂිත අවදානම් සම්බන්ධ වාර්තමාන වෙළඳපොල ඇගයුම් පිළිබිඹු කරන්නා වූ, පූර්ව බදු වට්ටම් අනුපාතිකයක් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කෙරේ.

කිසියම් වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක ධාරණ අගය එහි පියවාගත හැකි වටිනාකම ඉක්මවා ගිය විට, අදාළ වත්කම හානිකරණයට ලක්වූ වශයෙන් සැළකේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශයෙහි හදුනාග ැනේ. ඒවා පළමුවෙන්ම මුදල් උත්පාදන ඒකකයට වෙන් කරන ලද කවර හෝ කීර්තිනාමයක ධාරණ අගය අඩුකරගැනීම සඳහා වෙන් කෙරෙන අතර, ඉන් අනතුරුව සමානුපාතික පදනමක් මත මුදල් උත්පාදන ඒකකයෙහි සෙසු වත්කම් වල ධාරණ අගයයන් අඩු කරගැනීම සඳහා වෙන් කෙරේ.

කීර්තිනාමය සම්බන්ධයෙන් වන හානිකරන අලාභ ප්‍රතිවර්තනය කල නොහැක. වෙනත් වත්කම් සඳහා, කිසිදු හානිකරන අලාභයක් හදුනාගනු නොලැබුවේ නම්, ක්ෂය සහ ක්‍රමක්ෂයෙන් ශුද්ධව, අදාළ වත්කමෙහි ධාරණ අගය නිර්ණය කරන ලද ධාරණ අගය ඉක්මවා නොයන තාක් දුරට හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කෙරේ.

3.5.6 තොග
තොග, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් පහළ අගය අනුව ප්‍රකාශිත සියලුම පරිභෝජනය කල හැකි අයිතම වලින් සමන්විත වේ.

සමූහය මගින් රඳවාගෙන ඇති තොග වල ස්වභාවය ඇගයුමට ලක් කරමින්, සමූහය මගින් කෝවිඩ් 19 හේතුවෙන් තොග වල ශුද්ධ උපලබ්ධි අගය කෙරෙහි බලපෑමක් සිදුවීද යන්න තක්සේරු කරන ලද අතර තොග වල ධාරණ අගය ගැලපීම අවශ්‍යද යන්න නිර්ණය කෙරිණි. තොග වල ධාරණ අගය පහත දැමීමේ ගැලපීම් අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්ත්වයක් සමූහය මගින් හදුනා නොගැනිනි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

3.5.7 මූල්‍ය සාධනපත්‍ර – LKAS 39

සමාගම මගින් අව්‍යුත්පන්න මූල්‍ය වත්කම් පහත දැක්වෙන කාණ්ඩයන්ට වර්ග කරනු ලැබේ. ඒවා නම්, විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දේ, කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් වේ.

සමාගම මගින් අව්‍යුත්පන්න මූල්‍ය වගකීම් වෙනත් මූල්‍ය වගකීම් කාණ්ඩයට වර්ග කෙරේ.

3.5.7.1 අව්‍යුත්පන්න මූල්‍ය වත්කම්

සමාගම මගින් ණය හා ලැබිය යුතු දේ සහ නිකුත් කරන ලද ණය සුරැකුම ඒවා ඇරඹී දිනයේදී මූලිකව හඳුනාගැනේ. වෙනත් මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද වත්කම් ඇතුලුව) සාධනපත්‍රයෙහි ගිවිසුම්ගත විධිවිධාන වලට සමාගම පාර්ශ්වකරුවකු බවට පත් වන වෙළඳාම් දිනයේදී මූලිකව හඳුනාගැනේ.

මූල්‍ය වත්කමක් මූලිකව සාධාරණ අගය අනුව මනිනු ලබන අතර, ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නොවන වත්කමක් සඳහා, එහි අත්පත් කරගැනීම හෝ නිකුතුව වෙත සෘජුව ආරෝපනය කල හැකි පිරිවැය අනුව මනිනු ලැබේ.

කිසියම් මූල්‍ය වත්කමක මුදල් ප්‍රවාහ වෙත වන ගිවිසුම්ගත හිමිකම කල් ඉකුත් වූ විට හෝ, සමාගම මගින් මූල්‍ය වත්කමෙහි හිමිකාරිත්වය සම්බන්ධ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පැවරෙන ආකාරයේ ගනුදෙනුවකින් මූල්‍ය වත්කම සම්බන්ධ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ හිමිකම පවරන ලද විට සමාගම අදාළ මූල්‍ය වත්කම හඳුනාගැනීමෙන් බැහැර කරයි. සමාගම මගින් රඳවාගන්නා ලද පවරන ලද වත්කම් වල කවර හෝ හිමිකාරිත්වයක් වෙනම වත්කමක් හෝ වගකීමක් වශයෙන් හඳුනාගැනේ.

ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධි කොට සමාගාමීව වගකීම පියවීම සඳහා අදාළ මුදල් හිලව් කිරීමට නෛතිකව බලාත්මක කල හැකි අයිතියක් සමාගම සතුව දැනට පවතින්නේ නම් පමණක්, මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කරන ලබන අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කෙරේ.

පසුකාලීන මිනුම්කරණය

(අ) විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන යනු, විකිණීම සඳහා රඳවා නොගත් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් නොකරන ලද ඒවා වේ.

සාධාරණ අගයට මූලිකව මිනුම්කරණයෙන් පසු විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන පසුව සාධාරණ අගයට මිනුම්ගත කොට අදාළ වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාග නිමින් විකිණීම සඳහා පවතින සංචිතයෙහි සමුච්චය කෙරේ. මෙම වත්කම් හඳුනාගැනීමෙන් බැහැර කිරීමේදී. ස්කන්ධ තුළ සමුච්චය කරන ලද ලාභය හෝ අලාභය ලාභ හෝ අලාභ ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කෙරේ.

විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් සමාගම මගින් තක්සේරු කොට නුදුරු කාලසීමාවකදී ඒවා විකිණීම සඳහා වන අභිප්‍රාය සහ හැකියාව තවමත් යෝග්‍ය වේද යන්න නිර්ණය කරනු ලැබේ. අක්‍රීය වෙළඳපොල තත්ත්වයන් හෝ නුදුරු අනාගතයේදී එය සිදුකිරීමේ කළමනාකාරිත්වයේ අරමුණ වෙනස්වීම හේතුවෙන් මෙම වත්කම් විකිණීමට සමාගම අපොහෙසත් වන අවස්ථාවකදී, දුර්ලභ තත්ත්වයන් හිදී සමාගම මෙකී මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය සිදුකරයි. ණය සහ ලැබිය යුතු දේ ප්‍රතිවර්ගීකරණය සඳහා අවසර හිමිවන්නේ, මූල්‍ය වත්කම ණය සහ ලැබිය යුතු දේ පිළිබඳ නිර්වචනය සපුරාලමින් මෙම වත්කම් පුරෝකථනය කල හැකි අනාගත කාලයක් සඳහා හෝ කල්පිරීම තෙක් අදාළ වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහ හැකියාව කළමනාකාරිත්වය සතු නම් වේ. කල්පිරීම තෙක් රඳවාගත් වත්කම් ප්‍රතිවර්ගීකරණය සඳහා අවසර හිමිවන්නේ කල්පිරීම තෙක් අදාළ වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහ හැකියාව සමාගම සතු වන්නේ නම් පමණි.

සමාගමෙහි විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන යනු, විකිණීම සඳහා රඳවා නොගත් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් නොකරන ලද ඒවා වේ.

(ආ) ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම්

කිසියම් මූල්‍ය වත්කමක් විකිණීම සඳහා රඳවාගත් වශයෙන් වර්ග කොට ඇතිනම් හෝ මූලික හඳුනාගැනීමේදී එසේ නම් කොට ඇති නම් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට වර්ග කෙරේ. සෘජුව ආරෝපනය කල හැකි ගනුදෙනු පිරිවැය ඒවා දරන ලද අවස්ථාවේදී ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් සාධාරණ අගය අනුව මනිනු ලබන අතර, පොලී හෝ ලාභාංශ ඇතුලුව කවර හෝ වෙනසක්, ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

කළමනාකරණය කරනු ලබන වත්කම් සහ වගකීම් සමාගමෙහි මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල කොටසක් වන අතර සමූහයේ ආයෝජන ක්‍රමෝපාය අනුව ඒවායේ කාර්යසාධනය සාධාරණ අගය පදනමක් මත තක්සේරු කෙරේ. සමාගමෙහි ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලැයිස්තුගත කොටස් ආයෝජනයන්ගෙන් සමන්විත වේ.

(ඇ) කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්

මේවා ස්ථාවර හෝ නිර්ණය කල හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීම් සහිත අව්‍යුත්පන්න මූල්‍ය වත්කම් වන අතර කල්පිරීම තෙක් අදාළ වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහ හැකියාව සමාගම සතු වන විට කල්පිරීම තෙක් රඳවාගත් වශයෙන් වර්ග කෙරේ. මෙම වත්කම් කවර හෝ සෘජුව ආරෝපනය කල හැකි ගනුදෙනු පිරිවැය සමගින් සාධාරණ අගය අනුව මූලිකව හඳුනාගැනේ.

කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් සමාගම මගින් සිදුකරන ලද භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන වලින් සමන්විත වේ.

(ඇ) ණය සහ ලැබිය යුතු දේ - ක්‍රමක්ෂය පිරිවැය

පහත දැක්වෙන දෑ හැරුණු විට, ණය සහ ලැබිය යුතු දෑ වශයෙන් වර්ග කෙරෙන මූල්‍ය වත්කම් ක්‍රියාකාරී වෙළඳපොලක් තුළ ප්‍රකාශයට පත් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වලින් සමන්විත වේ. ණය සහ ලැබිය යුතු දේ සාධාරණ අගයට මූලිකව හඳුනාගැනෙන අතර සෘජුව ආරෝපනය කල හැකි ගනුදෙනු පිරිවැයද එයට ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, ණය සහ ලැබිය යුතු දේ සඵල පොලී අනුපාතිකය යොදාගනිමින් ක්‍රමයක් පිරිවැය අනුව මනිනු ලැබේ.

ණය සහ ලැබිය යුතු දේ අප්‍රකාශිත ආයතනික ණය වල ආයෝජන, කාලසීමා තැන්පතු, වත්කම් ඇප මත සුරැකුම්, වෙනත් ණය සහ ලැබිය යුතු දේ, මුදල් හා මුදල් සමාන දේ වලින් සමන්විත වේ.

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සමාගම මගින් ප්‍රතිරක්ෂකයින් වෙත රක්ෂණ අවදානම පවරනු ලැබේ.

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ මගින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු හිඟ ශේෂයන් නියෝජනය වේ. ප්‍රතිරක්ෂකයින්ගෙන් පියවා ගත යුතු වටිනාකම් හිඟ හිමිකම්පෑම් වෙන්කිරීමට ගැළපෙන පරිදි හෝ ප්‍රතිරක්ෂකයාගේ රක්ෂණවරයන් ආශ්‍රිත පියවන ලද හිමිකම්පෑම් ආකාරයෙන් සහ ආශ්‍රිත ප්‍රතිරක්ෂණ ගිවිසුම අනුව ඇස්තමේන්තුගත කෙරේ.

හිලව් කිරීමේ අයිතියක් පවතින්නේ නම් හැර ප්‍රතිරක්ෂණ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ.

ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දෑ ආශ්‍රිත හානිකරණ අලාභ හඳුනාග ැනෙනුයේ ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනාගැනීමෙන් පසු සිදුවීමක් හේතුවෙන් ගිවිසුමෙහි කොන්දේසි අනුව සමාගම වෙත සියළු හිඟ මුදල් නොලැබී යා හැකි අන්දමේ වාස්තවික සාක්ෂි පවතින විට සහ අදාළ සිදුවීම සමාගම වෙත ප්‍රතිරක්ෂකයාගෙ න් ලැබිය යුතු වටිනාකම කෙරෙහි මැනිය හැකි බලපෑමක් සහිත වූවක් වූ විටකදීය. හානිකරණ අලාභ, ඇත්නම්, ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි වාර්තා කෙරේ.

පවරන ලද ප්‍රතිරක්ෂණ කටයුතු මගින් සමාගම ස්වකීය රක්ෂණවරහිමියන් කෙරෙහි වන බැඳීම් වලින් නිදහස් නොකෙරේ.

ගිවසුම්ගත හිමිකම් අවසන් වූ හෝ කල්ඉකුත් වූ පසු හෝ ගිවිසුම වෙනත් පාර්ශ්වයක් වෙත පවරන ලද අවස්ථාවකදී ප්‍රතිරක්ෂණ වත්කම් හා වගකීම් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

ලැබිය යුතු වාරික

ගෙවීමට නියමිත වූ විට රක්ෂණ ලැබිය යුතු දේ හඳුනාගැනෙන අතර ලැබිය යුතු ප්‍රතිශ්ධාවෙහි සාධාරණ අගය අනුව මූලික හඳුනාගැනීමේදී මනිනු ලැබේ. වාරික එක්රැස් කරගැනීමේ හැකියාව අඛණ්ඩවම විමර්ශනයට ලක් කෙරේ. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සහ කළමනාකාරීත්වේ විමසුම අනුව, ගිවිසුම්ගත ගෙවීම් දිගු කලක් හිඟව පවතී නම් ලැබිය යුතු ගෙවීම පැහැර හරින ලද බව සමාගම සළකයි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පියවා ගැනීම සම්බන්ධ කිසිදු සාධාරණ අපේක්ෂාවක් නොමැති වූ විට කවර හෝ ලැබිය යුතු වාරිකයක් කපාහරිනු ලැබේ.

සමාගම මගින් උපචිත පදනමක් මත ජීවිත රක්ෂණ වාරික ගිණුම්ගත කරනු ලැබේ. ඒ අනුව, ගෙවීමට නියමිත ජීවිත රක්ෂණ වාරික (දින 30 සහන කාලය තුළ ගෙවීමට නියමිත වාරික පමණක්) එක් එක් වාර්තාකරණ දිනයේදී හඳුනාගැනෙන අතර පසුව එළඹෙන මාසයේදී වාරික නොගෙවන ලද නම් ඒවා ප්‍රතිවර්තනය කෙරෙන අතර එහිදී සමාගමෙහි ප්‍රතිපත්තිය අනුව අදාළ රක්ෂණාවර අක්‍රීය වේ.

වෙනත් ලැබිය යුතු දේ සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් හිග මුදල්

වෙනත් ලැබිය යුතු දේ සහ සම්බන්ධිත පාර්ශ්වයන්ගෙන් හිග මුදල් බොල් ණය අවිනිශ්චිත ලැබිය යුතු දේ අඩු කොට පිරිවැය අනුව හඳුනාගැනේ.

රක්ෂණාවර හිමියන් වෙත ණය

සමාන වෙළඳපොල අනුපාතයන් යටතේ ජීවිත රක්ෂණවරයක ගෙවන ලද වටිනාකමින් 90% ක් දක්වා රක්ෂණවර හිමියන් වෙත ණය ලබාදෙනු ලැබේ. රක්ෂණවරහිමියන් වෙත ණය මූලික සාධාරණ අගය අනුව මනිනු ලබන අතර, පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. ණය මුදල සම්පූර්ණයෙන් ආපසු ගෙවීමට පෙර රක්ෂණවර හිමියා මිය ගියහොත්, ණය ශේෂය මරණ ප්‍රතිලාභයෙන් අඩු කර ගැනේ. රක්ෂණවරහිමියන්ගේ ණය මුදල් වල සාධාරණ අගය එහි ධාරණ අගයට සමාන වේ. රක්ෂණවර හිමියන්ගේ ණය එක් එක් වාර්තාකරණ දිනයේදී අපහායනය සඳහා විමර්ශනයට ලක් කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

- **මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් හා මුදල් සමාන දෑ අතැති මුදල්, බැංකුවල තැන්පතු සහ කෙටි දැනුම්දීම් ණය වලින් සමන්විත වන අතර ඒවා ඒවායේ සාධාරණ අගය වෙනස් වීම සම්බන්ධ සැලකිය යුතු නොවන අවදානමකට යටත් වේ. ඒවා සමූහය මගින් සිය කෙටි කාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගැනේ.

3.5.7.2 අව්‍යුත්පන්න මූල්‍ය වගකීම්

සමාගම මගින් නිකුත් කරන ලද ණය සුරැකුම් සහ ඒ යටතේ වන වගකීම් ඒවා ඇරඹි දිනයේදී මූලිකව හඳුනාගැනේ. සියලුම වෙනත් මූල්‍ය වගකීම් සාධනපත්‍රයෙහි ගිවිසුම්ගත විධිවිධාන වලට සමාගම පාර්ශ්වකරුවකු බවට පත් වන වෙළඳාම් දිනයේදී මූලිකව හඳුනාගැනේ.

මූල්‍ය වගකීමක් සෘජුව ආරෝපනය කල හැකි පිරිවැය අඩුකොට මූලිකව සාධාරණ අගය අනුව මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, මෙකී වගකීම් සඵල පොලී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. සිය ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමෙන්, අවලංගු වීමෙන් හෝ කල්ඉකුත් වීමේ අනතුරුව සමාගම අදාළ මූල්‍ය වගකීම හඳුනාගැනීමෙන් බැහැර කරයි. වෙනත් මූල්‍ය වගකීම් ණය සහ මුදල් ලබාගැනීම්, බැංකු අයිරා සහ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දේ වලින් සමන්විත වේ.

3.5.8 මූල්‍ය වත්කම් හානිකරණය (අව්‍යුත්පන්න)

හානිකරණය පිළිබඳ වාස්තවික සාක්ෂි පවතීද යන්න නිර්ණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට වර්ග නොකරන ලද මූල්‍ය වත්කම් තක්සේරු කෙරේ.

මූල්‍ය වත්කම් හානිකරණයට ලක්ව ඇති බවට වාස්තවික සාක්ෂි පහත දැක්වෙන කරුණු වලින් සමන්විත වේ:

- ණයගැතියා විසින් පැහැරහැරීම හෝ අවනීතිකව කටයුතු කිරීම
- ණය ලබාගන්නන් සහ ණය ලබාදෙන්නන් ගේ ගෙවීමේ තත්ත්වයන්හි අහිතකර වෙනස්වීම්
- මූල්‍ය අසීරුතා හේතුවෙන් සුරැකුමක් සඳහා ක්‍රියාකාරී වෙළඳපොලක් අහිමිව යාම: හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයකින් අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හි මැනිය හැකි පහළයාමක් පිළිබඳ නිරීක්ෂණය කල හැකි දත්ත මගින් නිරූපනය වීම
- විකිණීම සඳහා පවතින වශයෙන් වර්ග කොට ඇති කොටස් ආයෝජන සම්බන්ධයෙන්, වාස්තවික සාක්ෂි වල ඒවායේ පිරිවැයට පහළ දක්වා ආයෝජනයෙහි සාධාරණ අගය ''සැළකිය යුතු'' හෝ ''දිගු කාලීන'' ලෙස පහළ යාමක්ද ඇතුළත් වේ.

3.5.8.1 ක්‍රමක්ෂය පිරිවැය අනුව ධාරණය කෙරෙන මූල්‍ය වත්කම්

මෙහිදී මෙකී වත්කම් වල හානිකරණ සාක්ෂි කේවල සහ සාමූහික මට්ටම් ද්විත්වයෙන්ම සැළකිල්ලට ගැනේ. කේවන වශයෙන් සැළකිය යුතු සියලුම වත්කම් හානිකරනය සඳහා කේවල වශයෙන් තක්සේරු කෙරේ. ඉන්පසු හානිකරනය නොවූ වශයෙන් හඳුනාගත් වත්කම් දරන ලද නමුත් තවමත් කේවල වශයෙන් හඳුනානොගත් කවර හෝ හානිකරණයක් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් තක්සේරු කෙරේ. කේවල වශයෙන් වැදගත් නොවන වත්කම් හානිකරනය සඳහා සාමූහිකව තක්සේරු කෙරේ. සමාන අවදානම් ගති ලක්ෂණ සහිත වත්කම් සාමූහීකරණය මගින් සාමූහික තක්සේරුව සිදු කෙරේ.

හානිකරණ අලාභය තක්සේරු කරනු ලබන්නේ, වත්කමක ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහන්හි වර්තමාන අගය අතර වෙනස අදාළ වත්කමෙහි මුල් සඵල පොලී අනුපාතිකයට වට්ටම් කිරීමෙනි. අලාභයන් ලාභ හෝ අලාභවල හඳුනාගැනෙන අතර ප්‍රතිපාදන ගිණුමක දක්වනු ලැබේ. හානිකරණ අලාභය පසුකාලීනව පහළ ගියහොත් සහ අදාළ පහළයාම හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදුවීමකට වාස්තවිකව සම්බන්ධ වේ නම්, එවිට පෙර හඳුනාගත් හානිකරණ අලාභය ලාභ හො අලාභ ඔස්සේ ප්‍රතිවර්තනය කෙරේ.

3.5.8.2 විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභය හඳුනාගනු ලබනුයේ විකිණීම සඳහා පවතින සංචිතයේ සමුච්චිත අලාභ ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය මගිනි. ප්‍රතිවර්ගීකෘත මුදල වනුයේ ලාභ හෝ අලාභයන්හි පෙර හඳුනාගත් කවර හෝ හානිකරණ අලාභයක් අඩු කොට, අත්පත් කරගැනීමේ පිරිවැය (කවර හෝ මුල් මුදල ආපසු ගෙවීමකින් හෝ ක්‍රමක්ෂයකින් ශුද්ධව) සහ ප්‍රවර්තන සාධාරණ අගය අතර වෙනස වේ.

විකිණීම සඳහා පවතින ණය සුරැකුමක සාධාරණ අගය පසුකාලීනව ඉහළ ගියහොත් සහ අදාළ ඉහළයාම හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදුවීමකට වාස්තවිකව සම්බන්ධ වේ නම්, එවිට පෙර හඳුනාගත් හානිකරණ අලාභය ලාභ හෝ අලාභ ඔස්සේ ප්‍රතිවර්තනය කෙරේ. විකිණීම සඳහා පවතින වශයෙන් වර්ග කරන ලද ස්කන්ධ සාධනපත්‍රයක ආයෝජනයක් සඳහා ලාභ හෝ අලාභයන්හි හඳුනාගත් හානිකරණ අලාභ ලාභ හෝ අලාභ ඔස්සේ ප්‍රතිවර්තනය නොකෙරේ.

3.5.9 මූල්‍ය සාධනපත්‍ර – SLFRS 09

SLFRS 09 මගින් මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් හඳුනාගැනීමේ සහ මැනීමේ සහ මූල්‍ය නොවන අයිතම විකිණීමේ සහ මිලදී ගැනීමේ ඇතැම් ගිවිසුම් සම්බන්ධ අවශ්‍යතා විදහා දැක්වේ. මෙම ප්‍රමිතිය මගින් LKAS 39 මූල්‍ය සාධනපත්‍ර: හඳුනාගැනීම සහ මිනුම ප්‍රමිතිය ප්‍රතිස්ථාපනය කෙරේ. එයට අමතරව, සමූහය මගින් SLFRS 07 මූල්‍ය සාධනපත්‍ර වෙත ප්‍රතිවිපාකීය සංශෝධන ආදේශ කොට ගෙන ඇත: 2018 පිළිබඳ හෙළදරව් කිරීම් වෙත හෙළදරව් කිරීම් ආදේශ කරන ලද නමුත් ඒවා සන්සන්දනාත්මක තොරතුරු වෙත පොදුවේ ආදේශ කොට නොමැත

SLFRS 9 මූල්‍ය වත්කම් සම්බන්ධ මූලික වර්ගීකරණ කාණ්ඩයන් තුනකින් සමන්විත වේ: ක්‍රමක්ෂය පිරිවැය අනුව, වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මැනීම එයට අයත් වේ. SLFRS 9 යටතේ මූල්‍ය වත්කම් වර්ගීකරණය පොදුවේ අදාළ මූල්‍ය වත්කම කළමනාකරණය කරනු ලබන ව්‍යාපාර ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ගති ලක්ෂණ මත පදනම් වේ. SLFRS 9 මගින් පෙර පැවති LKAS 39 කල්පිරීම තෙක් රඳවාගත්, ණය සහ ලැබිය යුතු දේ සහ විකිණීම සඳහා පවතින යන කාණ්ඩයන් ඉවත් කෙරේ.

ඉහතදී LKAS 39 යටතේ ණය සහ ලැබිය යුතු දේ වශයෙන් වර්ගීකෘත වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ, මුදල් සහ මුදල් සමාන දේ සහ සම්බන්ධිත පාර්ශ්ව ලැබිය යුතු දේ, SLFRS 9 යටතේ ක්‍රමක්ෂය පිරිවැය වශයෙන් වර්ග කෙරේ.

මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මිනුම්කරණය සඳහා LKAS 39 හි පවතින අවශ්‍යතා විශාල වශයෙන් SLFRS 9 මගින් රඳවාගැනෙන අතර මූල්‍ය වගකීම් ආශ්‍රිත සමාගමෙහි ගිණුම්කරණ ප්‍රමිතීන් හැරුනු විට මෙම ප්‍රමිතිය සමූහය මත සැළකිය යුතු බලපෑමක් ඇති නොකරයි.

3.5.10 විලම්බිත වියදම්

විලම්බිත අත්පත් කරගැනීම් පිරිවැය

විලම්බිත අත්පත් කරගැනීම් පිරිවැය අදාළ කරගැනෙනුයේ ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහා පමණි. උපයන ලද ආදායම් වලට සමගාමීව අත්පත් කරගැනීමේ පිරිවැය දරන බැවින් ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා විලම්බිත අත්පත් කරගැනීම් පිරිවැය ගණනය නොකෙරේ.

මූල්‍ය කාලපරිච්ඡේදය තුල රක්ෂණ ගිවිසුම් ලියාතැබීමෙන් සහ නැවත අලුත් කිරීමෙන් උද්ගත වන දරන ලද සෘජු හා වක්‍ර පිරිවැය අනාගත වාරික වලින් පියවාගත හැකිතාක් දුරට විලම්බනය කෙරේ. සියළුම අත්පත් කරගැනීමේ පිරිවැය දරන ලද අවස්ථාවේදී වියදම් වශයෙන් හඳුනාගැනේ.

ශ්‍රී ලංකා රක්ෂන නියාමන කොමිසමෙහි මාර්ගෝපදේශ අනුව, විලම්බිත අත්පත් කරගැනීම් පිරිවැය 365 පදනම මත ගණනය කෙරේ.

හානිකරණය සම්බන්ධ දර්ශකයක් ඉස්මතු වූ විට එක් එක් වාර්තාකරණ දිනයේදී හෝ වඩාත් නිරන්තරව විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය සම්බන්ධ හානිකරණ විමර්ශනයක් සිදුකෙරේ. පියවාගත හැකි වටිනාකම ධාරණ අගයට වඩා අඩු වන අවස්ථාවකදී, ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභයක් හඳුනාගැනේ.

විලම්බිත අත්පත් කරගැනීමේ පිරිවැය, ආශ්‍රිත ගිවිසුම් පියවන ලද හෝ අවලංගු වූ පසු හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

3.5.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධ වශයෙන් වර්ග කෙරේ. සාමාන්‍ය කොටස් නිකුතුවට සෘජුව ආරෝපනය කල හැකි වර්ධිත පිරිවැය, කවර හෝ බදු බලපෑමකින් ශුද්ධව, ස්කන්ධ වලින් අඩු කිරීමක් වශයෙන් හඳුනාගැනේ.

3.5.12 වගකීම් සහ ප්‍රතිපාදන

3.5.12.1 රක්ෂණ ගිවිසුම් වගකීම්

රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ

ගිවිසුම් වෙත එළඹෙන අවස්ථාවේදී සහ වාරික අය කිරීමේදී ජීවිත රක්ෂණ වගකීම් හඳුනාගැනේ. ස්වාධීන උපදේශන ආයුගණකවරයකුගේ නිර්දේශ මත පදනම්ව, 2000 අංක 43 දරණ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම් පනත මගින් විශේෂ කොට දක්වා ඇති පරිදි මෙකී වගකීම් ශුද්ධ වාරික ක්‍රමවේදය යොදාගනිමින් මනිනු ලැබේ. වගකීම නිර්ණය කරනු ලබන්නේ, භාවිත කල තක්සේරුකරණ උපකල්පන පදනම් කරගනිමින් අනාගත මුදල් ප්‍රවාහ සපුරාලීමට අවශ්‍ය විය හැකි අපේක්ෂිත අනාගත වාරික වල වට්ටම්ගත වටිනාකම අඩු කොට, අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ වල වට්ටම්ගත වටිනාකමෙහි මුදල වශයෙනි. අහිතකර අපගමනයන් සඳහා පූර්ව නිර්දේශිත අවදානම් තීරුවක් සමගින්, ප්‍රශස්ත ඇස්තමේන්තු අත්දැකීම මත පදනම්ව තක්සේරුකරණ උපකල්පන සිදුකරනු ලැබේ. සහභාගීත්ව නොවන වගකීම් අවදානම් රහිත ආදායම භාවිත කරමින් වට්ටම්ගත කෙරේ.

සහභාගීත්ව රක්ෂණවර වගකීම් වටිනාකම, සහතික කරන ලද ප්‍රතිලාභ වගකීම් වටිනාකම සහ මුලු ප්‍රතිලාභ වගකීම අතරින් ඉහළ අගය වන අතර, එය සහභාගීත්ව රක්ෂන අරමුදල් මට්ටමේදී නිර්ණය කෙරේ. සහතික කරන ලද ප්‍රතිලාභ වටිනාකම ගණනය කිරීමේදී, සහතික කරන ලද ප්‍රතිලාභ පමණක් සැළකිල්ලට ගැනෙන අතර, මුදල් ප්‍රවාහ අවදානම් රහිත ආදායම් වක්‍රය යොදාගනිමින් වට්ටම්ගත කෙරේ. මුලු ප්‍රතිලාභ වගකීම සියලුම සහතික කරන ලද සහ නොකරන ලද ප්‍රතිලාභ වලින් සමන්විත වන අතර එහිදී සහභාගීත්ව රක්ෂණ අරමුදලෙහි අරමුදල් මත පදනම් වූ ආදායම යොදාගනිමින් මුදල් ප්‍රවාහ වට්ටම්ගත කෙරේ.

තවද, වර්තමානයේ අක්‍රීය වූ රක්ෂණවරයන් අනාගතයේදී නැවත අලුත් කිරීම කරණ කොට ගෙන ඇති විය හැකි වගකීම් ආවරනය කිරීම උදෙසා ගැලපුම් සිදුකරනු ලැබේ.

SLFRS 4- 'රක්ෂණ ගිවිසුම්' හි අවශ්‍යතාවය අනුව, සමාගම මගින් බාහිර ආයුගණකවරයකුගේ සහයෝගය සහිතව ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් වගකීම් ප්‍රමාණවත්තා පරීක්ෂාවක් (LAT) සිදුකරන ලදී. මෙම වගකීම් ප්‍රමාණවත්තා පරීක්ෂාව සිදුකිරීමේදී, හිමිකම්පෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ සහ රක්ෂණවර පරිපාලන වියදම්, රක්ෂණහිමි වරනයන් සහ ඇප, එබදු වගකීම් සඳහා ඇප වලින් ආයෝජන ආදායම වැනි ආශ්‍රිත මුදල් ප්‍රවාහ ඇතුලුව, අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි ප්‍රශස්ත ඇස්තමේන්තු භාවිත කරන ලදී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ
සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම්, දරන ලද නමුත් වාර්තා නොකරන ලද (IBNR) සහ දරන ලද නමුත් ප්‍රමාණවත් අයුරින් වාර්තා නොකරන ලද (IBNER), නොඉපැයූ වාරිකය සඳහා ප්‍රතිපාදන සහ වාරික ඌනතාවය සඳහා ප්‍රතිපාදන ඇතුලුව හිඟ හිමිකම්පෑම් ප්‍රතිපාදන වලින් සමන්විත වේ.

2000 අංක 43 දරණ රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනතෙහි උපදෙස් අනුව (එනම් 365 පදනම මත) නොඉපැයූ වාරික සංචිතයේ තක්සේරුව මිනුම්ගත කෙරිනි. කෙසේවුවද, අවදානම් කාලසීමාව ගිවිසුම් කාලසීමාවෙන් සැළකිය යුතු අයුරින් වෙනස් වන ගිවිසුම් සම්බන්ධයෙන්, සපයන ලද රක්ෂණ ආවරන මුදලට සමානුපාතිකව අවදානම් කාලසීමාව පුරා වාරික උපයනු ලැබේ.

දරන ලද නමුත් වාර්තා නොකරන ලද (IBNR) සහ දරන ලද නමුත් ප්‍රමාණවත් අයුරින් වාර්තා නොකරන ලද (IBNER) සංචිත ආයුගණනමය වශයෙන් ගණනය කරන ලදී.

සමානකරණය සඳහා කවර හෝ ප්‍රතිපාදනයක් හෝ ආපදා සංචිතයක් හදුනා නොගැනුනි. හිමිකම්පෑමක් ගෙවීම සඳහා වන බැඳීම කල් ඉකුත් වූ, සපුරාලන ලද හෝ අවලංගු වූ විට වගකීම් හදුනාගැනීමෙන් බැහැර කෙරේ.

SLFRS 4- 'රක්ෂණ ගිවිසුම්' හි අවශ්‍යතාවය අනුව, සමාගම මගින් බාහිර ආයුගණකවරයකුගේ සහයෝගය සහිතව සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් වගකීම් ප්‍රමාණවත්තා පරීක්ෂාවක් (LAT) සිදුකරන ලදී.

3.5.12.2 ඔප්පු රක්ෂණ සංචිතය
ඔප්පු රක්ෂණවරයන් වෙතින් උද්ගත විය හැකි හිමිකම්පෑම් සඳහා ගෙවීම් සිදුකිරීමට සමාගම මගින් ඔප්පු රක්ෂණ සංචිතය පවත්වා ගෙන යනු ලැබේ. ඔප්පු රක්ෂණවරයන් සාමාන්‍යයෙන් වසර 5 ක් හෝ එයට වැඩි දිගු කලක් සඳහා නිකුත් කෙරේ. එමනිසා, එම වසරේදී හිමිකම්පෑම් සිදුවීමේ ඉහළ සම්භාවිතාව හමුවේ පළමු රක්ෂණවර වසරේදී කිසිදු ලාභයක් හදුනානොගැනේ. 2 වැනි වසරේ සිට, ලද වාරික ක්‍රමක්ෂය කිරීම මගින් ලාභ හදුනාගැනෙන අතර එය සරල රේඛීය ක්‍රමය භාවිත කරමින් රක්ෂණවරයේ අවශේෂ කාලසීමාව පුරා බෙදාහරිනු ලැබේ. පළමු වසර සඳහා ලාභය දෙවන වසරේදී පමණක් හදුනාගැනෙන අතර ඉන් අනතුරුව එය ආවර්තිතව හදුනාගැනේ.

ඔප්පු රක්ෂණවරයෙහි අනුරූපී ණය මුදල කල්පිරීමට පෙර පියවනු ලැබුවහොත්, එබදු ණය මුදලක් පියවන ලද දිනයේදී එබදු රක්ෂණවරයන්හි අවශේෂී මුලු වාරිකය එය අදාළ බැංකුවෙන් තහවුරු කල පසු ලාභ හෝ අලාභයන්හි හදුනාගැනේ.

3.5.12.3 ප්‍රතිපාදන (රක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් හැර)
අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් කිසියම් බැඳීමක් සපුරාලීමට ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් සිදුවිය හැකි සහ එය විශ්වසනීය අයුරින් මැනිය හැකි ආකාරයේ නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් සමූහය/සමාගම සතු වන විට මූල්‍ය තත්ත්වය පිළිබද ප්‍රකාශයෙහි ප්‍රතිපාදනයක් හදුනාගැනේ. රක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් හැර ප්‍රතිපාදන, මුදල් වල කාලීන වටිනාකම සම්බන්ධ වෙළඳපොල තක්සේරුවක් සහ වගකීමට ආවේනික අවදානම් පිළිබිඹු කෙරෙන පූර්ව බදු අනුපාතයක් අනුව අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කිරීමෙන් නිර්ණය කෙරේ.

3.6 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්
අසම්භාව්‍ය වගකීම් යනු සම්පූර්ණයෙන් සමූහයේ/සමාගමේ පාලනය ඇතුළත හෝ ආර්ථික ප්‍රතිලාභ පවරනු ලබන වර්තමාන බැඳීම් යටතේ නොපවතින අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇති වීම හෝ නොවීම මගින් පමණක් තහවුරු කල හැකි ඇති විය හැකි බැඳීම් වේ. ඒවා විශ්වසනීය අයුරින් මැනිය නොහැකි වේ.

සමූහයෙහි/සමාගමෙහි ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් අදාළ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් වල දක්වා ඇත.

3.7 ආංශික වාර්තාකරණය
මෙහෙයුම් අංශයක් යනු සමූහයේ කවර හෝ වෙනත් සංරචකයන් සමග වන ගනුදෙනු ආශ්‍රිත ආදායම් හා වියදම් ඇතුලුව, ආදායම් උපනය සහ වියදම් දරන ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන සමූහයේ සංරචකයකි. අංශයන් වෙත සම්පත් වෙන්කිරීම සම්බන්ධ තීරණ ගැනීමට සහ ඒවායේ කාර්යසාධනය තක්සේරු කිරීමට සියලුම මෙහෙයුම් ප්‍රතිඵල ප්‍රධාන විධායක නිලධාරීවරයා විසින් නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

ප්‍රධාන විධායක වෙත වාර්තා කරනු ලබන ආංශික ප්‍රතිඵල අදාළ අංශයට සෘජුව ආරෝපනය කල හැකි අයිතම මෙන්ම සාධාරණ පදනමක් මත වෙන් කල හැකි අයිතමයන්ගෙන්ද සමන්විත වේ. ඒ අනුව, සමූහයේ ආංශික තොරතුරු මගින් සාමාන්‍ය රක්ෂණ, ජීවිත රක්ෂණ, සෞඛ්‍ය සත්කාරක, බලශක්ති සහ සෙසු අංශයන්ගේ තත්ත්වය පිළිබිඹු වේ.

3.8 කොටසකට ඉපැයුම
සමූහයෙහි සාමාන්‍ය කොටස් හිමියන් වෙත ආරෝපනය කළ හැකි ලාභය හෝ අලාභය අදාළ කාලපරිච්ඡේදය තුළ හිඟ හිටි සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් බෙදීමෙන් මූලික කොටසකට ඉපැයීම් ගණනය කෙරේ. කොටසකට ඉපැයීම් අනුව සියළු තනුක විභවය සහිත සාමාන්‍ය කොටස් වල බලපෑම සඳහා ගැළපුම් කිරීමෙන් අනතුරුව සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන සහ වසර තුළ හිඟ හිටි සාමාන්‍ය කොටස් වල බර තැබූ සාමාන්‍යය මත පදනම්ව කොටසකට තනුක ඉපැයීම් ගණනය කොට ඇත. ඉදිරිපත් කරනු ලබන ආසන්නතම කාලපරිච්ඡේදයේ ආරම්භයේදී සිද්ධිය සිදුවූ ලෙස සළකමින් කිසිදු අමතර ප්‍රතිශ්ඨාවක් සඳහා නිකුත් නොකරන ලද කොටස් ගළපනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS 33 -කොටසකට ඉපැයීම් අනුව කොටසකට ඉපැයීම් ගණනය කොට ඇත.

3.9 යෝජිත ලාභාංශ

වාර්තාකරණ දිනයෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජිත ලාභාංශ වගකීමක් වශයෙන් හඳුනානොගැනෙන අතර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 41 හි පමණක් හෙළදරව් කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජිත ලාභාංශ සඳහා ප්‍රතිපාදන ඔවුන් විසින් ලාභාංශ ප්‍රකාශයට පත් කරන ලද අවස්ථාවේදී පමණක් හඳුනාගැනෙන අතර වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමිකරුවන් විසින් අනුමත කෙරේ.

3.10 වාර්තාකරණ දිනට පසු සිදුවීම්

වාර්තාකරණ දිනට පසු සිදුවීම් යනු, වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශයන් නිකුත් කිරීම සඳහා අනුමත කරනු ලබන දිනය අතර සිදුවන්නා වූ, හිතකර සහ අහිතකර, සිදුවීම් වේ. වාර්තාකරණ දිනට පසු සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සළකා බලන ලද අතර යෝග්‍ය අවස්ථාවන් හිදී, ගැලපුම් සහ හෙළදරව් කිරීම් අදාළ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් වල දක්වා ඇත. වැඩිදුර සටහන් 46 වැනි සටහනෙහි දැක්වේ.

3.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුදල් ප්‍රවාහ පිළියෙල කෙරෙන වක්‍ර ක්‍රමය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත.

මුදල් ප්‍රවාහ අරමුණු උදේසා හා මුදල් ඉපැයුම් ශුද්ධ බැංකු නොවන අයිරාවන්හි ඉදිරිපත් කෙරේ.

4. නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලාත්මක නොවන ප්‍රමිතීන්

4.1. දෙසැම්බර් 31 දිනට නිකුත් කරන ලද නමුත් තවමත් බලාත්මක නොවූ ප්‍රමිතීන්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිතීන්/සංශෝධන 2022 ජනවාරි 1 දින සහ එයට පසු වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වේ.

පහත දැක්වෙන සංශෝධිත ප්‍රමිතීන් සහ අර්ථදැක්වීම් සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි වාස්තවික බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

SLFRS 3 - ව්‍යාපාර සංයෝජන (2022 ජනවාරි 1 වැනි දින සිට බලාත්මකය)
සංශෝධනය මගින් එහි අවශ්‍යතා සැලකිය යුතු අන්දමින් වෙනස් නොකරමින් 2018 මාර්තු මස නිකුත් කරන ලද මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පීය අකෘතිකරාමුව වෙත යොමුවක් සමගින්, 1989 දී නිකුත් කරන ලද, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ ආකෘතිකරාමුව වෙත යොමුව ප්‍රතිස්ථාපනය කිරීමට අදහස් කෙරේ.

LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් (2022 ජනවාරි 1 වැනි දින සිට බලාත්මකය)
සංශෝධනය මගින් කිසියම් ගිවසුමක් අසීරු හෝ අලාභ උපදවන බවට තක්සේරු කිරීමේදී සමාගමක් විසින් ඇතුළත් කල යුතු පිරිවැය විශේෂ කොට දැක්වේ.

LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ (2022 ජනවාරි 1 වැනි දින සිට බලාත්මකය)
සංශෝධනය මගින් නිෂ්පාදිත අයිතම විකිණීමෙන් ලද ආදායමෙන්, කළමනාකාරීත්වයේ අරමුණ අනුව කිසියම් වත්කමක් මෙහෙයවීම සඳහා අදාළ වත්කම පරිශ්‍රය සහ තත්ත්වය වෙත ගෙන ඒමේදී දරන ලද කවර හෝ පිරිවැයක් දේපළ, පිරියත සහ උපකරණ වලින් අඩු කිරීම තහනම් කෙරේ.

නව හෝ සංශෝධිත ප්‍රකාශයන් කිසිවක් සමූහයේ සමෝධානික මූල්‍ය වාර්තා කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බවට අපේක්ෂිතය.

SLFRS 09 වෙතින් තාවකාලික බැහැරකිරීම

SLFRS 9 – "මූල්‍ය සාධනපත්‍ර"

මෙම ප්‍රමිතිය මගින් පවතින මාර්ගෝපදේශය වන LKAS 39 - 'මූල්‍ය සාධනපත්‍ර :හඳුනාගැනීම සහ මිනුම්කරණය' ප්‍රතිස්ථාපනය කෙරේ. SLFRS 9 හි මූල්‍ය සාධනපත්‍ර වර්ගීකරණය සහ මිනුම්කරණය සම්බන්ධ නව උපදෙස්, මූල්‍ය වත්කම් සම්බන්ධ හානිකරනය තක්සේරු කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් සහ නව පොදු හෙජ් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ. SLFRS 9 2018 ජනවාරි 1 වැනි දින සිට ඇරඹෙන වාර්ෂික වාර්තා කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන අතර කල්තබා ආදේශ කරගැනීමේ අවසරය හිමි වේ.

සමාගම (ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්) ප්‍රධාන වශයෙන් SLFRS 4 'රක්ෂණ ගිවිසුම්' වෙත යෝජිත සංශෝධනයන් මත පදනම්ව කටයුතු කරන අතර, 2022 ඇරඹෙතැයි අපේක්ෂිත, SLFRS 4 සංශෝධිත ආදේශනය සිදුවන තෙක් රක්ෂණ ගිවිසුම් නිකුත් කිරීම ප්‍රධාන ක්‍රියාකාරකම කොට ගත් සමාගම් වෙත SLFRS 9 පූර්ණ වශයෙන් යොදාගැනීමෙන් වෙනස්වීමේ අවසරය අනුව කටයුතු කරයි. IFRS 17 - ජාත්‍යන්තර වෙනස්වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් - රක්ෂණ ගිවිසුම් බලාත්මක දිනය ජනවාරි 2021 සිට ජනවාරි 2023 දක්වා, සමාගම 2023 ජනවාරි දක්වා තාවකාලික බැහැරකිරීම වෙනස්වීම අපේක්ෂා කරයි

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

පහත සඳහන් තත්ත්වයන් යටතේ පමණක් රක්ෂකයකු හට SLFRS 9 වෙතින් බැහැර කිරීමක් අයැදුම් කල හැකි වේ:

අ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද මූල්‍ය වගකීම් මත ලාභ හෝ අලාභ ඉදිරිපත් කිරීම සඳහා වන අවශ්‍යතා පමණක් හැරුනු විට, එමගින් ඉහතදී SLFRS 9 ප්‍රමිතියෙහි කිසිදු පිටපතක් ආදේශ කොට නොගැනීම
ආ. SLFRS 4 - රක්ෂණ ගිවිසුම් සහ එහි සංශෝධන අනුව, 2016 අප්‍රියෙල් 1 ට පෙර,හෝ පසුකාලීන වාර්ෂික වාර්තා දිනකට එහි ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණ හා සම්බන්ධිතව පවතින විට.

SLFRS 4 - රක්ෂණ ගිවිසුම් වෙත සංශෝධන අනුව, පහත සඳහන් කරුණු සපුරාලන්නේ නම් පමණක් රක්ෂකයකුගේ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණ සමග සම්බන්ධ වේ:

අ. කවර හෝ තැන්පතු සංරචකයන් හෝ රක්ෂණ ගිවිසුම් වලින් පිටත අන්තර්ගත ව්‍යතිරේකියන් ඇතුලුව, මෙම SLFRS හි විෂයපථය තුළ පවතින ගිවිසුම් මගින් උද්ගත වන වගකීම් වල ධාරණ අගයයන්, සිය සියලුම වගකීම් වල ධාරණ අගය හා සැසඳීමේදී සැළකිය යුතු මට්ටමක පැවතීම: සහ
ආ. සිය සියලු වගකීම් වල ධාරණ අගයට සාපේක්ෂව රක්ෂණ හා සම්බන්ධිත එහි වගකීම් වල මුලු ධාරණ අගයෙහි ප්‍රතිශතය:
   I. සියයට 90 වැඩි : හෝ
   II. සියයට 90 ට සමාන හෝ අඩු නමුත් සියයට 80 ට වැඩි, සහ රක්ෂකයා රක්ෂණ හා සම්බන්ධ නොවූ සැළකිය යුතු ක්‍රියාකාරකමක නිරත නොවන විට.

වාර්තාකරණ දිනයෙන් අවසන් වන වසර තුළ සමාගමෙහි ක්‍රියාකාරකම් වල වෙනසක් සිදුවී නම් පමණක්, පසුකාලීන වාර්ෂික වාර්තා දිනයකදී සිය ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් රක්ෂණ හා සම්බන්ධ වීද යන්න සොයාබැලීම සඳහා SLFRS 9 වෙතින් වන තාවකාලික බැහැරකිරීම ප්‍රතිඇගයුමට ලක් කෙරේ.

සංශෝධිත SLFRS 4 ආදේශනය කල කාලයට සමීපව SLFRS 9 යටතේ වන සිය ආයෝජන සම්බන්ධ යෝග්‍ය වර්ගීකරණය සම්බන්ධයෙන් සමාගම තීරණය කරන අතර වාර්තාකරණ දිනට සිය ආයෝජන මත SLFRS 9 ආදේශ කරගැනීමේ බලපෑම සම්පූර්ණයෙන් ප්‍රමාණීකරණය කිරීමට අපොහොසත් වේ. කෙසේවුවද එමගින් සමාගමෙහි සමස්ත ස්කන්ධ වෙනස් නොවන බවට අපේක්ෂා කෙරේ.

SLFRS 15 – "සේවාලාභීන් සමග වන ගිවිසුම් වලින් ආදායම"
SLFRS 4 - රක්ෂණ ගිවිසුම මෙම ප්‍රමිතිය මගින් වගුහ කෙරේ. එමනිසා, මෙම ප්‍රමිතිය මගින් සමාගමෙහි රක්ෂණ ගිවිසුම් වෙත සැළකිය යුතු බලපෑමක් ඇති නොවේ. කෙසේවුවද, මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීමත් සමග වෙනත් ආදායම් ගනුදෙනු කෙරෙහි බලපෑමක් ඇති විය හැක. සමාගම මගින් මෙම ප්‍රමිතිය ක්‍රියාවට නැංවීම මගින් සිය මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි ඇතිවිය හැකි බලපෑම ඇගයුමට ලක් කෙරේ.

SLFRS 17 – රක්ෂණ ගිවිසුම්
කල්තබා ආදේශ කරගැනීමේ අවසරය සහිතව, 2020 ජනවාරි මස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින්, 2023 ජනවාරි 1 සහ එදිනට පසු ඇරඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) 17 - රක්ෂණ ගිවිසුම් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) 17 - මගින්, රක්ෂණ ගිවිසුම් සඳහා පුළුල් පරාසයක පැතිරුනු ගිණුම්කරණ ක්‍රියාකරකම් රැසක් භාවිත කිරීමේ අවස්ථාව සමාගම් වෙත ලබා දෙන ලද SLFRS 4 - රක්ෂණ ගිවිසුම්, යන ප්‍රමිතිය ප්‍රතිස්ථාපනය කෙරේ.

SLFRS 4 මගින් 2005 ජනවාරි මසට පෙර සිය අධිකාරීත්වය යටතේ පැවති රක්ෂණ වත්කම් සහ වගකීම් ගිණුම්ගත කිරීම සඳහා ව්‍යවස්ථාපිත පදනම අඛණ්ඩව යොදා ගැනීම සඳහා රක්ෂකයින් හට අවසර ලබාදෙන ලදී. SLFRS 17 මගින් සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා මෙම නව මිනුම් ආකෘතිය ප්‍රතිස්ථාපනය කෙරේ.

මෙම ප්‍රමිතිය තුළ 'පොදු ආකෘතිය' යනුවෙන් හැඳින්වෙන රක්ෂණ ගිවිසුම් සමූහයක් මිනුම්කරණය සඳහා මූලික මිනුම්කරණ එළඹුමක් ඇතුළත් වේ. මූලික මිනුම්කරණ ආකෘතිය හැරුනු විට, එක්තරා ක්‍රියාපටිපාටියක් සපුරාලනු ලැබුවහොත් සමාගම් හට සෘජු සහභාගීත්ව අංග සහිත ගිවිසුම් සඳහා 'වාරික වෙන්කිරීමේ එළඹුම' (PAA) සහ 'විචල්‍ය ගාස්තු එළඹුම' යන පොදු ආකෘතියේ සරලකරණය කරන ලද වෙළුමක් ආදේශ කරගැනීමේ අවස්ථාවද පවතී. IFRS 17 ආකෘතිය මගින් රක්ෂණ ගිවිසුම් වල ප්‍රවර්තන ශේෂපත්‍ර මිනුම්කරණය සේවාවන් සපයනු ලබන කාලසීමාව පුරා ලාභය හඳුනාගැනීම සමග සංයෝජනය කරනු ලැබේ. ප්‍රමිතියේ පොදු ආකෘතිය සඳහා අනාගත මුදල් ප්‍රවාහයන්හි සම්භාවිතා බර තබන ලද ප්‍රවර්තන ඇස්තමේන්තු භාවිත කරමින් රක්ෂණ ගිවිසුම් වගකීම් මිනුම්කරණය, අවදානම සඳහා ගැලපුමක් සහ ගිවිසුම සපුරාලීම මගින් අපේක්ෂිත ලාභය නියෝජනය කරන්නා වූ ගිවිසුම්ගත සේවා තීරුවක් අවශ්‍ය වේ.

SLFRS 17 හි අවශ්‍යතාවය අනුව අනාගත මුදල් ප්‍රවාහ වල ප්‍රවර්තන අගය මැනීම, නිශ්චිත අවදානම් ගැලපුමක් යොදාග නිමින්, සෑම වාර්තාකරණ දිනකම ප්‍රතිමිනුම්ගත කෙරෙන අතර මූලික හඳුනාගැනීමේදී එක් ලාභයක් සම්බන්ධයෙන් ඕනෑම දිනකට සමාන හා ප්‍රතිවිරුද්ධ ගිවිසුම්ගත සේවා තීරුවක් (CSM) හඳුනාග ැනීම අවශ්‍ය වේ. අලාභ සෘජුව ආදායම් ප්‍රකාශයෙහි වාර්තා කෙරේ. වාර්තාකරණ අරමුණු උදෙසා, වෙනම කළමනාකරණය කරනු ලබන ගිවිසුම් වෙත තවවදුරටත් බෙදීම් සමගින්, සමාන අවදානම් සම්භාවිතා ස්වභාවක් සහ නිකුතු වසර සහිත ගිවිසුම් සාමූහීකරණය කෙරේ.

SLFRS 17 යටතේ රක්ෂණ සඳහා ලාභය, ආර්ථික නොවන අවදානමෙන් නිදහස් වීම (අවදානම් ගැලපුමෙන් නිදහස් වීම) සහ ආයෝජන ලාභය ආශ්‍රයෙන් කාලපරිච්ඡේදය තුළ සේවාලාභීන් වෙත සපයන ලද සේවාවන් හඳුනාගැනීම මගින් නියෝජනය වේ. (ගිවිසුම්ගත සේවා තීරුවෙන් නිදහස් වීම).

රක්ෂණ ගිවිසුම් කාලසීමාව පුරා ලාභ වශයෙන් නිදහස් කරන ලද ගිවිසුම්ගත සේවා තීරුව මගින්, රක්ෂණවර හිමියා වෙත සේවා සැපයුම නිරූපනය වේ. සහභාගීත්ව ලක්ෂණ සහිත ඇතැම් ගිවිසුම් සඳහා (ආශ්‍රිත ආයෝජනයන්හි සාධාරණ අගයෙන් සහ සෙසු පාදක වන අයිතමයන්ගෙන් සැළකිය යුතු කොටසක් රක්ෂණවර හිමියන් වෙත ගෙවනු ලබන) ගිවිසුම්ගත සේවා තීරුව මගින් කොටස් හිමිකරුවන් වෙත විචල්‍ය ගාස්තුව පිළිබිඹු වේ. මෙකී ගිවිසුම් සඳහා, ආර්ථික අත්දැකීම සහ උපකල්පනයන් නිරූපනය වන පරිදි ගිවිසුම්ගත සේවා තීරුව ගළපනු ලැබේ. සෙසු සියලු ගිවිසුම් සඳහා ගිවිසුම්ගත සේවා තීරුව ගළපනු ලබන්නේ ආර්ථිකමය නොවන උපකල්පන සඳහා පමණි.

ආදායම් ප්‍රකාශයෙහි දැනට වාර්තාගත පවතින වාරික ආදායම් මිනුම් වලින් සැළකිය යුතු අයුරින් වෙන් වන, රක්ෂණවරයන්හි ආයෝජන සංරචකයන් ආශ්‍රිත වාරික බැහැර කරමින් SLFRS 17 මගින් රක්ෂණවර හිමියන් වෙත සේවා සැපයුම මත පදනම් වූ, රක්ෂණ ආදායම සම්බන්ධ නව මිනුමක් හඳුන්වාදෙනු ලැබේ. SLFRS 17 වෙත පරිවර්තනය වීම සඳහා, පරිවර්තන දිනට ගිවිසුම්ගත සේවා තීරුව වන, විලම්බිත ලාභ අගය, නිර්ණය කල යුතු වේ.

SLFRS 17 හි අවශ්‍යතාවය පරිදි, ගිවිසුම්ගත සේවා තීරුව ප්‍රමිතීන් ප්‍රත්‍යාලෝකමය වශයෙන් යොදා ගන්නා ලද වශයෙන් සළකා ගණනය කල යුතු වේ. මෙය ප්‍රායෝගික නොවේ නම්, සමාගම මගින් සරලකරණය කරන ලද ප්‍රත්‍යාලෝකනමය එළඹුමක් තෝරාගැනීම හෝ පරිවර්තන දිනයේදී වගකීම් වල සාධාරණ අගය වෙත යොමු වෙමින් ගිවිසුම්ගත සේවා තීරුව නිර්ණය කිරීම අවශ්‍ය වේ. ගිවිසුම්ගත සේවා තීරුව නිර්ණය කිරීමේ එළඹුම, කොටස් හිමිකරුවන්ගේ ස්කන්ධ සහ අනාගත වාර්තාකරණ කාලසීමාවන්හි සක්‍රීය ව්‍යාපාර කටයුතු වල ලාභ ප්‍රමාණය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරයි.

නව ප්‍රමිතියෙහි අවශ්‍යතා වල සංකීර්ණත්වය හේතුවෙන් SLFRS 17 මගින් මූල්‍ය ප්‍රකාශයන් සහ හෙළදරව් කිරීම් ඉදිරිපත් කිරීම කෙරෙහි සැළකිය යුතු වෙනසක් සිදුවනු ඇතැයි අපේක්ෂිත අතර, එහිදී රක්ෂණ ගිවිසුම් ගිණුම්ගත කිරීම මෙන්ම සැළකිය යුතු විනිසුම සහ නව ඇස්තමේන්තුකරණ ශිල්පක්‍රම ආදේශ කරගැනීම සම්බන්ධ මූලික වෙනසක් අවශ්‍ය වේ. මෙකී ප්‍රමිතීන් යොදාගැනීම දැනට අවිනිශ්චිත බැවින් සමාගමෙහි ගිණුම්කරණ ප්‍රමිතීන් වෙත වෙනස්වීම් වල බලපෑමක් අවශ්‍ය වූ අතර, නමුත් මෙකී වෙනස්කම් සිදුවීමට අපේක්ෂිතය.

SLFRS 17 ක්‍රියාවට නැංවීමත් සමග, රක්ෂණ ආශ්‍රිත වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් ජායාත්මක ගිණුම්කරණය ආදේශ කරගත නොහැකි වේ. සමාගම SLFRS 17 ක්‍රියාවට නැංවීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මත කරමින් පවතී. මෙම වැඩසටහන මගින්, ගිණුම්කණ ප්‍රමිතීන් සැකසීම සහ ආදේශන ක්‍රමවේදයන් නිර්මාණය, යෝග්‍ය වූ ක්‍රියාවලීන් සහ පාලනයන් ස්ථාපනය, සුදුසු දිනය හඳුනාගැනීම සහ ආයුගණන හා මූල්‍ය ක්‍රමවේද වෙනස් කම් යොදාගැනීම සිදු කෙරේ.

වසර තුළදී නිකුත් කරන ලද නව ගිණුම්කරණ ප්‍රමිතීන්/දැනටමත් පවතින ගිණුම්කරණ ප්‍රමිතීන් වෙත සංශෝධන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 16 (කල්බදු) වෙත සිදුකරන ලද සංශෝධන : කෝවිඩ් 19 ආශ්‍රිත කුලී සහනයන්, සමාග මෙහි/සමූහයෙහි සමෝධානික/ඒකල මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන ලදී. ඉහත කරුණු වලට අමතරව වසර තුළදී කිසිදු නව ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ/දැනට පවතින ප්‍රමිතීන් වෙත සංශෝධනයක් බලාත්මක නොවීය. සමූහය මගින්, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී, 2021 දෙසැම්බර් 31 දක්වා නිකුත් කරන ලද සියලුම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් ආදේශනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

5 මූල්‍ය ආයෝජන

දෙසැම්බර් 31 දිනට	සටහන	සමූහය 2021 ධාරණ අගය රු. '000	සමූහය 2021 සාධාරණ අගය රු. '000	සමූහය 2020 ධාරණ අගය රු. '000	සමූහය 2020 සාධාරණ අගය රු. '000	සමාගම 2021 ධාරණ අගය රු. '000	සමාගම 2021 සාධාරණ අගය රු. '000	සමාගම 2020 ධාරණ අගය රු. '000	සමාගම 2020 සාධාරණ අගය රු. '000
කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්	5.1	60,916,652	59,364,484	51,885,786	61,606,054	60,916,652	59,364,484	51,885,786	61,606,054
ණය සහ ලැබිය යුතු දේ	5.2	51,541,273	51,541,273	50,861,422	50,861,422	46,691,301	46,691,301	47,654,428	47,654,428
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්	5.3	65,429,537	65,429,542	55,420,439	55,420,439	65,429,537	65,429,542	55,420,439	55,420,439
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම්	5.4	22,859,816	22,859,816	15,346,680	15,346,680	22,859,816	22,859,816	15,346,680	15,346,680
මුලු මූල්‍ය ආයෝජන		200,747,278	199,195,115	173,514,327	183,234,595	195,897,306	194,345,143	170,307,333	180,027,601

5.1 කල්පිරීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම්

දෙසැම්බර් 31 දිනට	සමූහය 2021 ධාරණ අගය රු. '000	සමූහය 2021 සාධාරණ අගය රු. '000	සමූහය 2020 ධාරණ අගය රු. '000	සමූහය 2020 සාධාරණ අගය රු. '000	සමාගම 2021 ධාරණ අගය රු. '000	සමාගම 2021 සාධාරණ අගය රු. '000	සමාගම 2020 ධාරණ අගය රු. '000	සමාගම 2020 සාධාරණ අගය රු. '000
භාණ්ඩාගාර බැඳුම්කර	60,916,652	59,364,484	51,885,786	61,606,054	60,916,652	59,364,484	51,885,786	61,606,054
	60,916,652	59,364,484	51,885,786	61,606,054	60,916,652	59,364,484	51,885,786	61,606,054

5.2 ණය සහ ලැබිය යුතු දේ

	සමූහය				සමාගම			
	2021		2020		2021		2020	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත නොවූ ණයකරය	22,343,977	22,343,977	22,310,237	22,310,237	22,343,977	22,343,977	22,310,237	22,310,237
කාලසීමා තැන්පතු	16,440,634	16,440,634	17,293,583	17,293,583	11,590,662	11,590,662	14,086,589	14,086,589
සංවර්ධන බැඳුම්කර	12,756,662	12,756,662	11,257,602	11,257,602	12,756,662	12,756,662	11,257,602	11,257,602
	51,541,273	51,541,273	50,861,422	50,861,422	46,691,301	46,691,301	47,654,428	47,654,428

5.3 විකිණීම සඳහා පවතින

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට	2021		2020		2021		2020	
සමූහය/සමාගම	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත කොටස්	20,373,280	20,373,280	19,215,501	19,215,501	20,373,280	20,373,280	19,215,501	19,215,501
ලැයිස්තුගත නොවූ කොටස්	7,850	7,855	11,267	11,267	7,850	7,855	11,267	11,267
ඒකක භාර	1,739,055	1,739,055	1,590,984	1,590,984	1,739,055	1,739,055	1,590,984	1,590,984
ලැයිස්තුගත ණයකර	39,379,579	39,379,579	33,376,199	33,376,199	39,379,579	39,379,579	33,376,199	33,376,199
භාණ්ඩාගාර බැඳුම්කර	3,929,773	3,929,773	1,226,488	1,226,488	3,929,773	3,929,773	1,226,488	1,226,488
	65,429,537	65,429,542	55,420,439	55,420,439	65,429,537	65,429,542	55,420,439	55,420,439

5.4 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට	2021		2020		2021		2020	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
ලැයිස්තුගත කොටස්	19,198,031	19,198,031	12,454,354	12,454,354	19,198,031	19,198,031	12,454,354	12,454,354
ඒකක භාර	3,661,785	3,661,785	2,892,326	2,892,326	3,661,785	3,661,785	2,892,326	2,892,326
	22,859,816	22,859,816	15,346,680	15,346,680	22,859,816	22,859,816	15,346,680	15,346,680

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ආයෝජන සහ විකිණීම සඳහා පවතින ආයෝජන සාධාරණ අගයට මිනුම්කරණය කොට ඇත. කල්පිරීම තෙක් රඳවාගත් ආයෝජන සහ ණය සහ ලැබිය යුතු දේ ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම් කොට ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

5 මූල්‍ය ආයෝජන (සබැඳේ)

5.5 මූල්‍ය ආයෝජනයන්හි ධාරණ අගයන්හි සංචලනය

සමාගම	විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්	ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම්	කල්පිරීම තෙක් මූල්‍ය වත්කම්	ණය සහ ලැබිය යුතු දේ	එකතුව
	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'
2021 ජනවාරි 01 දිනට	55,420,440	15,346,680	51,885,786	47,654,428	170,307,334
මිලදීගැනීම්	12,400,028	7,695,735	12,405,237	12,022,237	44,523,237
කල්පිරීම්	(2,950,243)	-	(3,651,700)	(13,230,065)	(19,832,008)
බැහැර කිරීම්	(57,000)	(7,729,791)	-	-	(7,786,791)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගය ලාභය	5,248	7,684,338	(34,795)	-	7,654,791
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	(27,868)	-	-	-	(27,868)
උපලබ්ධි වූ/ උපලබ්ධි නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	-	(167,020)	-	-	(167,020)
පොලී ක්‍රමක්ෂය	196,925	-	2,906	-	199,831
විදේශ මුදල් පරිවර්තන ගැළපුම්	81,185	29,874	-	845,184	956,243
පොලී ආදායම	4,148,386	-	5,755,061	3,848,681	13,752,128
පොලී/කූපන් ලැබීම්	(3,787,529)	-	(5,445,842)	(4,449,200)	(13,682,571)
2021 දෙසැම්බර් 31 දිනට	65,429,572	22,859,816	60,916,653	46,691,265	195,897,306
2020 ජනවාරි 01 දිනට	59,956,407	5,643,021	53,113,519	43,437,082	162,150,030
මිලදීගැනීම්	1,288,761	11,352,842	584,368	27,376,378	40,602,349
කල්පිරීම්	(3,152,545)	(2,002,047)	(1,800,000)	(23,617,970)	(30,572,562)
බැහැර කිරීම්	(38,609)	(1,112,592)	-	-	(1,151,201)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගය ලාභය	(4,844,854)	-	6,625	-	(4,838,229)
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	25,908	-	-	-	25,908
උපලබ්ධි වූ/ උපලබ්ධි නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	-	1,474,881	-	-	1,474,881
පොලී ක්‍රමක්ෂය	2,123,057	-	-	-	2,123,057
විදේශ මුදල් පරිවර්තන ගැළපුම්	19,342	(9,425)	-	269,095	279,012
පොලී ආදායම	3,914,179	-	5,511,279	4,022,605	13,448,063
පොලී/කූපන් ලැබීම්	(3,871,206)	-	(5,530,005)	(3,832,762)	(13,233,973)
2020 දෙසැම්බර් 31 දිනට	55,420,440	15,346,680	51,885,786	47,654,428	170,307,335

සමූහය	විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්	ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය වත්කම්	කල්පිරීම තෙක් මූල්‍ය වත්කම්	ණය සහ ලැබිය යුතු දේ	එකතුව
	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′
2021 ජනවාරි 01 දිනට	55,420,439	15,346,682	51,885,787	50,861,422	173,514,330
මිලදීගැනීම්	12,400,028	7,695,735	12,405,237	13,665,213	46,166,213
කල්පිරීම්	(2,950,243)	-	(3,651,700)	(13,230,065)	(19,832,008)
බැහැර කිරීම්	(57,000)	(7,729,791)	-	-	(7,786,791)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගය ලාභය	5,248	7,684,338	(34,795)	-	7,654,791
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	(27,868)	-	-	-	(27,868)
උපලබ්ධි වූ/ උපලබ්ධි නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	-	(167,020)	-	-	(167,020)
පොලී ක්‍රමක්ෂය	196,925	-	2,906	-	199,831
විදේශ මුදල් පරිවර්තන ගැළපුම්	81,185	29,874	-	845,184	956,243
පොලී ආදායම	4,148,386	-	5,755,061	3,848,681	13,752,128
පොලී/කූපන් ලැබීම්	(3,787,529)	-	(5,445,842)	(4,449,200)	(13,682,571)
2021 දෙසැම්බර් 31 දිනට	65,429,571	22,859,818	60,916,654	51,541,235	200,747,278
2020 ජනවාරි 01 දිනට	59,956,406	5,643,023	53,113,520	46,019,481	164,732,430
මිලදීගැනීම්	1,288,761	11,352,842	584,368	28,000,973	41,226,944
කල්පිරීම්	(3,152,545)	(2,002,047)	(1,800,000)	(23,617,970)	(30,572,562)
බැහැර කිරීම්	(38,609)	(1,112,592)	-	-	(1,151,201)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාගත සාධාරණ අගය ලාභය	(4,844,854)	-	6,625	-	(4,838,229)
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	25,908	-	-	-	25,908
උපලබ්ධි වූ/ උපලබ්ධි නොවූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	-	1,474,881	-	-	1,474,881
පොලී ක්‍රමක්ෂය	2,123,057	-	-	-	2,123,057
විදේශ මුදල් පරිවර්තන ගැළපුම්	19,342	(9,425)	-	269,095	279,012
පොලී ආදායම	3,914,179	-	5,511,279	4,022,605	13,448,063
පොලී/කූපන් ලැබීම්	(3,871,206)	-	(5,530,005)	(3,832,762)	(13,233,973)
2020 දෙසැම්බර් 31 දිනට	55,420,439	15,346,682	51,885,787	50,861,422	173,514,327

6 පරිපාලිතයන්හි ආයෝජන

දෙසැම්බර් 31 දිනට		සමාගම	
		2021	2020
	අනු සටහන	රු. 000′	රු. 000′
පිරිවැය අනුව			
ලැයිස්තුගත පරිපාලිතයන්	6.1	2,764,196	2,764,196
ලැයිස්තුගත නොවූ පරිපාලිතයන්	6.2	20,059,696	18,059,696
		22,823,892	20,823,892

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

6.1 ලැයිස්තුගත පරිපාලිතයන්

	2021				2020			
	කොටස් සංඛ්‍යාව	හිමිකාරීත්වය %	පිරිවැය රු. 000′	සාධාරණ අගය රු. 000′	කොටස් සංඛ්‍යාව	හිමිකාරීත්වය %	පිරිවැය රු. 000′	සාධාරණ අගය රු. 000′
ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී	114,861,951	51.34%	2,764,196	6,409,297	114,861,951	51.34%	2,764,196	6,179,573
			2,764,196	6,409,297			2,764,196	6,179,573

6.2 ලැයිස්තුගත නොවූ පරිපාලිතයන්

දෙසැම්බර් 31 දිනට	2021			2020		
	කොටස් සංඛ්‍යාව	ශ්‍රී ලං ඉ හිමිකාරීත්වය %	ධාරණ අගය රු. 000′	කොටස් සංඛ්‍යාව	ශ්‍රී ලං ඉ හිමිකාරීත්වය %	ධාරණ අගය රු. 000′
සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	35,976,853	99.94%	3,510,063	35,976,853	99.94%	3,510,063
ලිට්‍රෝ ගෑස් ටර්මිනල් පුද්ගලික සමාගම	158,710,945	100.00%	5,280,188	158,710,945	100%	5,280,188
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පුද්ගලික සමාගම	5	100.00%	-	5	100%	-
කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම	1,085,294,117	52.05%	10,399,358	850,000,000	45.95%	8,399,358
කැන්වින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම	87,008,686	100.00%	870,087	87,008,686	100%	870,087
			20,059,696			18,059,696

2021 මූල්‍ය වර්ෂය තුළදී, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි රු. බිලියන 2 ක අමතර ආයෝජනයක් සිදුකරමින් කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි සිය හිමිකාරීත්ව කොටස 45.95% සිට 52.05% දක්වා ඉහළ නංවන ලදී.

6.3 ප්‍රධාන පරිපාලිතයන්හි සමූහයේ හිමිකාරීත්වය

පහත දැක්වෙන හෙළදරව් කිරීම මගින් සුලු කොටස් හිමි අයිතිය මගින් රදවාගත් සමූහයේ හිමිකාරීත්ව සංයුතිය සහ කොටස විශේෂ කොට දැක්වේ.

සමාගම	ප්‍රධාන ක්‍රියාකාරකම්	හිමි කොටස් කාණ්ඩය	සමූහයේ හිමිකාරීත්වය		සුලු කොටස් හිමි අයිතිය	
			2021	2020	2021	2020
ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී	සෞඛ්‍ය සත්කාරක හා රසායනාගාර සේවා	සාමාන්‍ය	51.34%	51.34%	48.66%	48.66%
ලංකා හොස්පිට්ල්ස් ඩයග්නෝස්ටික් පුද්ගලික සමාගම	සෞඛ්‍ය සත්කාරක හා රසායනාගාර සේවා	සාමාන්‍ය	51.34%	51.34%	48.66%	48.66%
සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	එල්පී ගෑස් ආනයනය, සැකසීම, බෙදාහැරීම සහ අලෙවිය සහ සෙසු අනුශාංගික සේවාවන් සැපයීම	සාමාන්‍ය	99.94%	99.94%	0.06%	0.06%
ලිට්‍රෝ ගෑස් ටර්මිනල් පුද්ගලික සමාගම	එල්පී ගෑස් තොග ගබඩා පහසුකම් සැපයීම	සාමාන්‍ය	100.00%	100.00%	0.00%	0.00%
කැන්වින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම	හෝටල් සේවාවන් සැපයීම	සාමාන්‍ය	100.00%	100.00%	0.00%	0.00%

සමාගම	ප්‍රධාන ක්‍රියාකාරකම්	හිමි කොටස් කාණ්ඩය	සමූහයේ හිමිකාරීත්වය 2021	2020	සුලු කොටස් හිමි අයිතිය 2021	2020
කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම	සංචාරක ක්ෂේත්‍රය ආශ්‍රිත ආයෝජන ප්‍රවර්ධනය	සමාන්‍ය	79.06%	72.97%	20.94%	27.03%
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම	හෝටල් සේවාවන් සැපයීම	සමාන්‍ය	79.06%	72.97%	20.94%	27.03%
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම	හෝටල් සේවාවන් සැපයීම	සමාන්‍ය	79.06%	72.97%	20.94%	27.03%
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පුද්ගලික සමාගම	කළමනාකාරණ සේවා	සමාන්‍ය	100.00%	100.00%	0.00%	0.00%

6.4 සුලු කොටස් හිමි අයිතිය

සමූහය මගින් ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක පදනමක් මත සමූහය වෙත ප්‍රමාණාත්මක සුලු කොටස් හිමි අයිතියක හදුනාගෙන නොමැත.

කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම දෙසැම්බර් 31 දිනට	හිමිකාරීත්ව ප්‍රතිශතය	සමාගම 2021 රු.	2020 රු.
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම	100%	19,999,999,995	18,000,000,000
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම	100%	500,000,000	500,000,000
නිල්යාන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම	100%	10	10
		20,500,000,005	18,500,000,010
අපහායනය සඳහා ප්‍රතිපාදනය		(10)	(10)
		20,499,999,995	18,500,000,000

නිල්යාන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සමාගම ව්‍යාපාර කටයුතු ඉදිරියට සිදු නොකරන බැවින්, සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයෙන් සමාගමෙහි නාමය ඉවත් කරගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව, වසර 2017 දී නිල්යාන් හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම යටතේ ආයෝජනයේ වටිනාකම රු.10/- ක් වන පරිදි ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී.

7 ආශ්‍රිත සමාගම් වල ආයෝජන

සමූහය/සමාගම	2021 කොටස් සංඛ්‍යාව	ශ්‍රී ලං ඉ හිමිකාරීත්වය %	ධාරණ අගය රු. 000′	Fair Value රු. 000′	2020 කොටස් සංඛ්‍යාව	ශ්‍රී ලං ඉ හිමිකාරීත්වය %	ධාරණ අගය රු. 000′	Fair Value රු. 000′
සීමාසහත ඇසෙට් මැනේජ්මින්ට් සමාගම	1,250,000	18.95%	7,378	7,378	1,250,000	18.95%	5,808	5,808
සීමාසහිත සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	759,998	26.57%	191,295	191,295	759,998	26.57%	158,317	158,317
			198,673	198,673			164,125	164,125

* ඉහත දැක්වෙන ආයෝජනයන්, ආයෝජිතයන්ගේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි කොටසෙහි ශුද්ධ වත්කම් අගය අනුව මනින ලද අතර (විගණනය නොකල මූල්‍ය ප්‍රකාශයන් මත පදනම්ව) අගයයන් වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායමෙහි හදුනාගෙන ඇත. බදු වලින් හෝ කොටසකට ඉපැයුමෙන් පසු හෝ මුදල් වලින් සමූහයෙහි ලාභ කෙරෙහි කිසිදු ප්‍රමාණාත්මක බලපෑමක් නොවීය.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

8 දේපළ, පිරියත සහ උපකරණ

	2021 රු. 000′	2020 රු. 000′
8.1 සමූහය		
ධාරණ අගය	44,936,097	40,012,092
නොනිමි කාර්ය (Note 8.1.3)	20,455,410	16,740,141
	65,391,507	56,752,233

	ඉඩම්	සින්නක්කර ඉඩම් වල ගොඩනැගිලි	බදු ගත් ඉඩම්	උපකරණ	ගෘහභාණ්ඩ සහ උපාංග	මෝටර් රථ
	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′
පිරිවැය/තක්සේරුව						
සින්නක්කර						
2021 ජනවාරි 01 දිනට ශේෂය	13,366,882	2,389,884	6,793,061	5,160,441	805,438	1,085,030
වසර තුළදී එකතු කිරීම්	27,332	35,655	16,477	402,268	62,912	73,246
ප්‍රත්‍යාගණනය	1,975,224	66,142	1,037,198	4,112	3,680	315,984
සමච්චිත ක්ෂය වෙත පිරිවැය මාරුකිරීම	-	(67,902)	-	-	-	(458,787)
ප්‍රත්‍යාගණන සංචිතය වෙත පිරිවැය මාරුකිරීම්	729,561	466,262	-	-	-	86,858
බැහැර කිරීම්	-	-	-	(15,854)	(689)	(50,949)
වසර තුළදී මාරුකිරීම්	-	-	-	-	-	-
ආයෝජන දේපළ වලින් මාරු කිරීම්	-	-	-	-	-	-
නොනිමි කාර්ය වෙතින් මාරුකිරීම්	-	39,921	1,902	40,507	31,486	9,879
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	16,098,999	2,929,962	7,848,638	5,591,474	902,827	1,061,261
සමුච්චිත ක්ෂය						
සින්නක්කර						
2021 ජනවාරි 01 දිනට ශේෂය	11,022	293,380	100,835	2,935,481	446,655	796,560
වසර තුළදී ක්ෂය අයකිරීම	1,741	117,302	159,881	390,575	78,284	149,430
සමච්චිත ක්ෂය වෙත පිරිවැය මාරුකිරීම	-	(67,902)	-	-	-	(458,787)
ප්‍රත්‍යාගණන සංචිතය වෙත ක්ෂය මාරුකිරීම්	-	(281,920)	-	-	-	(351,370)
බැහැරකිරීම්	-	-	-	(11,043)	(423)	(50,946)
වසර තුළදී මාරුකිරීම්	-	-	-	-	-	-
ප්‍රත්‍යාගණනය	-	-	-	-	-	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	12,763	60,860	260,716	3,315,013	524,516	84,887
ශුද්ධ පොත් අගය						
2020 දෙසැම්බර් 31 දිනට	13,355,860	2,096,504	6,345,738	2,571,452	358,785	288,470
2021 දෙසැම්බර් 31 දිනට	16,086,236	2,869,102	7,587,922	2,276,461	378,311	976,374

විදුලි උත්පාදන යන්ත්‍ර සහ මගී සෝපාන	උපාංග සහ මෙවලම්	වායුසමන පිරියත	පිරියත සහ යන්ත්‍ර	ගබඩා ටැංකි, නළ මාර්ග සහ පොම්පකරණ ස්ථාන	එල්පී ගෑස් සිලින්ඩර	වෙනත්	එකතුව 2020	එකතුව 2021
රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′
56,482	5,283	127,882	1,522,003	5,494,161	17,321,748	343,515	54,471,811	48,749,625
3,826	-	15,361	-	-	-	45,640	682,717	666,453
-	-	-	-	-	-	-	3,402,340	(131,475)
-	-	-	-	-	-	-	(526,689)	-
(1,354)	-	2,583	-	-	-	-	1,283,910	-
-	-	-	-	-	(7,122)	(2,012)	(76,626)	(157,833)
-	-	-	-	-	-	-	-	(2,217)
-	-	-	-	-	-	709	709	-
-	-	-	9,237	227	672,645	-	805,804	5,347,262
58,954	5,283	145,826	1,531,240	5,494,388	17,987,271	387,852	60,043,976	54,471,815
21,156	3,488	34,514	463,225	2,051,572	7,043,965	257,874	14,459,727	12,867,853
6,574	20,406	19,542	69,964	222,892	641,679	39,171	1,917,441	2,072,424
-	-	-	-	-	-	-	(526,689)	-
(14,865)	-	(22,949)	-	-	-	-	(671,104)	-
-	(39)	-	-	-	(7,101)	(1,944)	(71,496)	(133,851)
-	-	-	-	-	-	-	-	(214)
-	-	-	-	-	-	-	-	(346,489)
12,865	23,855	31,107	533,189	2,274,464	7,678,543	295,101	15,107,879	14,459,723
35,326	1,795	93,368	1,058,778	3,442,589	10,277,783	85,641	-	40,012,092
46,089	(18,572)	114,719	998,051	3,219,924	10,308,728	92,751	44,936,097	-

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

8 දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)

8.1.1 ඉඩම්

සින්නක්කර ඉඩම්

ලංකා හොස්පිටිල්ස් කෝර්පරේෂන් පීඑල්සී - ප්‍රත්‍යාගණන අගයට ධාරනය කරන ලද

පරිශ්‍රය	වපසරිය (පර්චස්)	තක්සේරුකරණ ක්‍රමවේදය	දේපළ තක්සේරුකරු	තක්සේරුවේ බලාත්මක දිනය	සැළකිය යුතු නිරීක්ෂණය කල නොහැකි ආදායයන්	2021.12.31 දිනට ධාරණ අගය	ප්‍රත්‍යාගණන අතිරික්තය	පිරිවැය අනුව ධාරණ අගය
						රු.	රු.	රු.
හත්බෝධිය, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.	10.35	විවෘත වෙළඳපොල තක්සේරුකරණ ක්‍රමවේදය	ඒ.ඒ.එම්. ෆාතිහු (FIV), වරලත් තක්සේරුකරු	2020 දෙසැම්බර් 31	පර්චසයකට ඇස්තමේන්තුගත වටිනාකම රු.3,144,963.23	37,127,764	30,659,318	6,468,447
හත්බෝධිය, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.	10.00	විවෘත වෙළඳපොල තක්සේරුකරණ ක්‍රමවේදය	ඒ.ඒ.එම්. ෆාතිහු (FIV), වරලත් තක්සේරුකරු	2020 දෙසැම්බර් 31	පර්චසයකට ඇස්තමේන්තුගත වටිනාකම රු.3,144,963.23	35,872,236	29,622,529	6,249,706
						73,000,000	60,281,847	12,718,153

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

සමාගම මගින්, නියාමන අවශ්‍යතාවය සහිතව, උත්සව ශාලාව විශාල කිරීම, රථවාහන ගාල් කිරීමේ පහසුකම් පුලුල් කිරීම, රථවාහන ගමනාගමනය ප්‍රති සංවිධානය කිරීම සඳහා 2014 දී ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ අරමුණින්, බිම් කොටස් තුනක් එහි පැවති ගොඩනැගිල සමග මිලදී ගන්නා ලදී. 2013 දී මිලදී ගන්නා ලද දේපළ වල සමස්ත පිරිවැය රු. 1,139,357,179 ක් විය. මෙම සමස්ත පිරිවැය සින්නක්කර ඉඩම් සහ නොනිමි ප්‍රාග්ධනය අතර වෙන් කරන ලදී. සින්නක්කර ඉඩම් වෙත වෙන් කරන ලද පිරිවැය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නිර්ණය කරන ලද පදනමක් මත නිර්නය කෙරුනු අතර එය පර්චසයකට රු.මිලියන 7 ත් විය. එමගින් මිලදී ගත් සින්නක්කර ඉඩම සඳහා පිරිවැය වශයෙන් රු.716, 734, 184 ක් වෙන් කරන ලදී. බිම් කොටස් තුනෙහි ඉඩම් වපසරිය තක්සේරු අංක 112 - පර්චස් 62.77, තකසේරු අංක 108 - පර්චස් 15 සහ තක්සේරු අංක 134 පර්චස් 20.10 ක් විය.

ඉහත සින්නක්කර ඉඩමට අමතරව, සමාගම මගින් පෙර සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනැල් ලිමිටඩ් විසින් හිමිකාරිත්වය දරන ලද පර්චස් 22.56 ක ඉඩමක් සතු කොට ගෙන ඇති අතර ඒ හා සම්බන්ධ නෛතික තත්ත්වයන් පහත දැක්වේ.

සෙලින්කෝ හෝම්ස් ඉන්ටර්නැෂනැල් ලිමිටඩ් විසින් (ලෝටස් ටවර්) සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ නඩු අංක DLM/43/18 යටතේ නඩු පවරන ලද අතර, එහිදී ඔවුන් අදාළ දේපලෙහි නීත්‍යානුකූල හිමිකරුවන් බවට ප්‍රකාශයට පත් කරන ලෙසත් දැනට අදාළ දේපළ අත්පත් කරගෙන සිටින හිමිකරු ඉවත් කරමින්, සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම අදාළ දේපළ අත්පත් කරගැනීම සහ තවදුරටත් ඉදිකිරීම් සිදුකිරීම වළකාලමින් හානි පියවා ගැනීම සඳහා ස්ථාවර නියෝගයක් නිකුත් කරන ලෙසටත් ඉල්ලා සිටින ලදී. ඇයගේ 2018 ජූලි 24 වැනි දිනැති නියෝගය ප්‍රකාරව උගත් දිස්ත්‍රිත් විනිසුරුතුමිය විසින් පසුව නඩුව නිෂ්ප්‍රභා කරන ලදී.

බදු පදනමට ගත් ඉඩම්

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම නාගරික සංවර්ධන අධිකාරිය (මින්පසු බදු දීමනාකරු වශයෙන් හැඳින්වෙන) සමග 2012 ජූලි 16 වැනි දිනැති ගිවිසුමකට එළඹුනු අතර, එහිදී බදු දීමනාකරු විසින් සමාගම (මින්පසු බදු ගැනුම්කරු වශයෙන් හැඳින්වෙන) වෙත, සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම සහ මෙහෙයවීම සඳහා වසර 99 ක කාලසීමාවකට රු.10,000/- ක වාර්ෂික නාමික කල්බදු යටතේ, අර්ධ වශයෙන් ඉදිකරන ලද ගොඩනැගිලි සහිතව හෙක්ටයාර 0.6057 ක වපසරියකින් සමන්විත කොළඹ 03, ගාලු පාරේ, තක්සේරු අංක 116 දරණ බිම් කොටස පවරන ලදී. අදාළ ගිවසුමෙහි ප්‍රතිපාදන අනුව තවදුරටත් වසර 99 ක කාලසීමාව සඳහා වන නාමික වාර්ෂික කල්බදු රු.990,000/- ක එකවර ගෙවන මුදලකින් පියවීමේ අවස්ථාව සලසන ලදී.

කල්ගත වීමත් සමග කල්බදු අවසන් වීමෙන් අනතුරුව, බදු දීමනාකරු හට බදුගැනුම්කරු හෝ එහි අනුප්‍රාප්තිකයින් වෙත තවත් 99 අවුරුදු කාලසීමාවක් සඳහා හෝ බදු දීමනාකරු සහ බදුගැනුම්කරු අතර ද්විපාර්ශ්වීය වශයෙන් එකගත්වයට පත් කාලසීමාවක් සඳහා කල්බදු නැවත අලුත් කිරීමක් සිදුකල හැකි වේ.

කල්බදු අවසන් වීමේ හෝ සදහන් කරන ලද කාලසීමාවේදී කල්ඉකුත් වීම නිර්ණය කරන ලද අවස්ථාවේදී, සහ බදුගැනුම්කරු විසින් සදහන් ලද පරිශ්‍රය සියලු ගොඩනැගිලි සහ සියලු ගෘහභාණ්ඩ සහ උපාංග සමග බදු දීමනාකරු හට ලබාදිය හැකි අතර, බදු දීමනාකරු හට ගොඩනැගිල්ල සහ අවශේෂ සියලු දේ ආදායම ලබන කාලයේ පවතින වෙළඳපොල වටිනාකම අනුව මිලදී ගත හැකි වේ.

ඉහත සදහන් කරන ලද කල්බදු ගිවිසුමට අමතරව, 116, ගාලු පාර, කොළඹ 03 පිහිටි ඉහත සදහන් දේපළ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පූර්ණ සහ අවසන් ප්‍රතිශ්ඨාවක් වශයෙන් රු.බිලියන 5.0 ක වටිනාකමක් සමාගම විසින් ගෙවිය යුතු බවට රජයේ තක්සේරුකරණ දෙපාර්තමේන්තුව විසින් නිර්ණය කරන ලදී. තක්සේරුකරණ දෙපාර්තමේතුව මගින් තවදුරටත් සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම සහ මෙහෙයවීම සඳහා වසර 99 ක කල්බදු කාලසීමාවකට හෙක්ටයාර 0.6057 ක වපසරියකින් සමන්විත ඉඩම සඳහා ආරෝපනය කල හැකි වටිනාකම රු.බිලියන 1.228 ක් වශයෙන් නිර්ණය කරන ලදී. අවශේෂ වටිනාකම නොනිමි ප්‍රාග්ධනයෙහි ඇතුලත් කරන ලදී. ඉහත සදහන් කරන ලද රු.බිලියන 5.0 න්, රු.බිලියන 4.8 ක් අද දින වන විට භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ගෙවනු ලැබ ඇත. වසර 2016 දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මත, භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ගෙවිය යුතු යැයි පෙර හඳුනාගත් රු.මිලියන 200 ක් ලියා අත්හරින ලදී.

SLFRS 16 – කල්බදු ප්‍රමිතිය ආදේශ කරගැනීමත් සමග බදු පදනමට ගත් ඉඩම් 2019 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි භාවිත හිමිකම් වත්කම් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කෙරිණි. මූලික පෙරගෙවීම සහ කල්බදු සම්බන්ධ භාවිත හිමිකම් වත්කම අත්පත් කරගැනීම සඳහා කල්තබා ගෙවනු ලබන කුලිය ප්‍රාග්ධනිත කොට සපයනු ලබන ප්‍රතිලාභ මාදිලිය අනුව කල්බදු කාලසීමාව පුරා ක්‍රමක්ෂය කෙරේ.

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

සමාගම නාගරික සංවර්ධන අධිකාරිය (මින්පසු බදු දීමනාකරු වශයෙන් හැඳින්වෙන) සමග 2014 සැප්තැම්බර් 1 වැනි දින ගිවිසුමකට එළඹුනු අතර, එහිදී බදු දීමනාකරු විසින් සමාගම (මින්පසු බදු ගැනුම්කරු වශයෙන් හැඳින්වෙන) වෙත, සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම සහ මෙහෙයවීම සඳහා වසර 99 ක කාලසීමාවකට රු.149,601,875 ක මුදලකට 3.812 ක වපසරියකින් සමන්විත හම්බන්තොට, ලේවාය පාරේ පිහිටි බිම් කොටස පවරන ලදී. ගිවිසුම මගින් තවදුරටත් 99 අවුරුදු කාලසීමාව සඳහා බිම් කුලිය රු.4,950,000 ක එකවර ගෙවන මුදලකින් ගෙවිය යුතු බවටත් විධිවිධාන සපයන ලදී.

SLFRS 16 – කල්බදු ප්‍රමිතිය ආදේශ කරගැනීමත් සමග බදු පදනමට ගත් ඉඩම් 2019 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි භාවිත හිමිකම් වත්කම් වශයෙන් ප්‍රතිවර්ගීකරණය කෙරිණි. මූලික පෙරගෙවීම සහ කල්බදු සම්බන්ධ භාවිත හිමිකම් වත්කම අත්පත් කරගැනීම සඳහා කල්තබා ගෙවනු ලබන කුලිය ප්‍රාග්ධනිත කොට සපයනු ලබන ප්‍රතිලාභ මාදිලිය අනුව කල්බදු කාලසීමාව පුරා ක්‍රමක්ෂය කෙරේ.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

8 දේපළ,පිරියත සහ උපකරණ (සබැඳේ)

8.1.2 බදු පදනමට ගත් ඉඩම් මත ගොඩනැගිලි

ලංකා හොස්පිටල්ස් කෝර්පරේෂන් පීඑල්සී

පරිශ්‍රය	දේපලෙහි මාදිලිය	තක්සේරුකරණ ක්‍රමවේදය	තක්සේරුකරණය සම්බන්ධ බලාත්මක දිනය	දේපළ තක්සේරුකරු	සැළකිය යුතු නිරීක්ෂණය කල නොහැකි ආදානයන්	2021.12.31 දිනට ධාරණ අගය	වත්කම් පිරිවැය අනුව ධාරණය කරන ලද නම් සමුච්චිත ක්ෂය	ශුද්ධ ධාරණ අගය
						රු.	රු.	රු.
අංක 578, ඇල්විටිගල මාවත, කොළඹ 05.	ගොඩනැගිල්ල		2020 දෙසැම්බර් 31 වැනි දින	ඒ.ඒ.එම්. ෆාතියු මයා (FIV), වරලත් තක්සේරුකරු	වර්ග අඩියක ඇස්තමේන්තුගත වටිනාකම රු. 5,000 - 13,500	1,750,755,095	402,633,427	1,348,121,668

8.1.3 නොනිමි කාර්ය ප්‍රාග්ධනය

දෙසැම්බර් 31 දිනට	සමූහය		සමාගම	
	2021	2020	2021	2020
	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′
වසර ආරම්භයේදී	16,740,141	16,464,931	-	-
මෙහෙයුම් වියදම් වෙත ලාභ හෝ අලාභ ගිණුම වෙත මාරුකරන ලද	-	-	-	-
වසර තුළදී දරන ලද පිරිවැය	3,346,943	5,624,355	-	-
වසර තුළදී ප්‍රාග්ධනිත මුදල	(805,805)	(5,349,145)	-	-
වත්කම ප්‍රත්‍යාගණනය	1,174,131	-	-	-
අපහායනය සඳහා ප්‍රතිපාදන	-	-		
වසර අවසානයේදී	20,455,410	16,740,141	-	-

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

නොනිමි කාර්ය ප්‍රාග්ධන මගින්, වාර්තාකරණ දිනට ඉදිකෙරෙමින් පවතින අංක 116, ගාලු පාර, කොළඹ 03, පිහිටි ග්‍රෑන්ඩ් හයැට් කළම්බෝ හි 2021 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් වටිනාකම පිළිබිඹු වේ.

ග්‍රෑන්ඩ් හයැට් කළම්බෝ හි හිමිකාරීත්වය ආපසු පැවරීම 2017 අගෝස්තු 01 වැනි දින කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර යෝජිත ආපසු පැවරීමේ වැඩසටහන 2019 ජූනි මස අවසානයේදී අවසන් වීමට නියමිත විය. කෙසේවුවද, ඉහත සඳහන් කරන ලද ආපසු පැවරීමේ වැඩසටහන නියමිත කාලසීමාව තුළ ක්‍රියාත්මක නොවූ අතර ව්‍යාපෘතියේ කටයුතු අත්හිටවන ලදී. ඉදිකිරීම් සම්බන්ධ දිගු විරාම කාලසීමාවකින් පසු, කැබිනට් මණ්ඩලය විසින් 2020 ජූලි 08 වැනි දිනැති කැබිනට් මණ්ඩල රැස්වීමේදී ඉදිකිරීම් කටයුතු නැවත ඇරඹීම සඳහා අනුමැතිය පිරිනමන ලදී. ඒ අනුව, ග්‍රෑන්ඩ් හයැට් කළම්බෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 දී නැවත ඇරඹී අතර වාර්තාකරණ දින වන විට සාර්ථකව සිදුවෙමින් පවතී.

8.1.4 දේපළ, පිරියත සහ උපකරණ අපහායනය

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

(LKAS) 16 දේපළ, පිරියත සහ උපකරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව, හම්බන්තොට හයැට් හෝටලය ඉදිකිරීම ඇරඹීම සඳහා දරන ලද මූලික පිරිවැය ප්‍රාග්ධනීකරණය කරන ලදී. එතැන් පටන් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝටලය ඉදිකිරීම නවතා දැමීමට තීරණය කරන ලදී. එහි ප්‍රතිවිපාකයක් වශයෙන්, මෙකී පිරිවැය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලාඒමේ සම්භාවිතාවක් නොමැති බැවින්, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනට දරන ලද පිරිවැය අපහායනය වූ ලෙස සළකන ලදී. ඒ අයුරින්, 2015 මූල්‍ය ප්‍රකාශයන්හි රු.111,103,548/- ක නොනිමි කාර්ය ප්‍රාග්ධනය සම්බන්ධ අපහායන ප්‍රතිපාදනයක් හදුනාගැනුනි.

හම්බන්තොට පිහිටි හෝටලය 99 අවුරුදු බදු පදනමක් මත නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් ඉඩමක ඉදිකිරීමට නියමිත විය. ඉඩම භාවිත කිරීමේ අයිතිය වෙනුනේ ආශ්‍රිත බදු සහ ගෙවන ලද වෙනත් මුදල් සමගින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවන ලද ප්‍රතිශ්ධාව 2014 මූල්‍ය ප්‍රකාශයන්හි බදු පදනමට ගත් ඉඩම් සහ දේපළ වශයෙන් හදුනාගැනුනි. එතැන් පටන් සමාගම හෝටල් ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කිරීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම සතු වරණයන් ඇගයුමට ලක් කරයි. අධ්‍යක්ෂවරුන්ගේ මතය වනුයේ 2021 දෙසැම්බර් 31 වැනි දිනට රු.159,555,147/- ක වටිනාකමකින් යුතු ක්‍රමක්ෂය නොකරන ලද බදු පදනමට ගත් ඉඩමක් දේපළ බැහැරකිරීම මගින් පියවා ගත හැකි බවයි. එමනිසා, වත්කම මත කිසිදු අපහායන ප්‍රතිපාදනයක් අවශ්‍ය වන බවට සළකා නොබැලුනි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

8 දේපළ, පිරියත සහ උපකරණ (සබැඳේ)

8.1.5 පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්

සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝර්පරේෂන්

2021 අවසානයේදී, පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් වල වටිනාකම රු.මිලියන 335.5 ක් විය.

ලංකා හොස්පිටල්ස් කෝර්පරේෂන් පීඑල්සී

2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණ වලට රු.බිලියන 1.96 ක (2020 රු.බිලියන 1.59) ක දළ ධාරණ අගයක් (පිරිවැය) සහිත පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ඇතුළත් වේ.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම

මූල්‍ය වත්කම් වල ධාරණ අගය මගින් උපරිම ණය නිරාවරනය නියෝජනය වේ. වාර්තාකරණ දිනට ණය අවදානම කෙරෙහි උපරිම නිරාවරනය පහත දැක්වෙන පරිදි වේ:

		සමූහය		සමාගම	
දෙසැම්බර් 31 දිනට	සටහන	2021	2020	2021	2020
		රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'
කල්පිරීම තෙක් රඳවාගත්	5	60,916,652	51,885,786	60,916,652	51,885,786
ණය සහ ලැබිය යුතු දේ	5	35,100,639	33,567,839	35,100,639	33,567,839
විකිණීම සඳහා රඳවාගත්	5	43,309,352	34,602,687	43,309,352	34,602,687
රක්ෂණවර හිමියන් වෙත ණය	12	1,637,187	1,734,723	1,637,187	1,734,723
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ	13	2,901,995	2,180,977	2,901,995	2,180,977
ලැබිය යුතු වාරික	14	7,977,747	6,733,833	7,977,747	6,733,833
වෙනත් වත්කම්	16	8,695,391	6,682,254	8,695,391	6,682,254
මුදල් සහ මුදල් සමාන දේ	18	27,378,865	31,546,403	16,920,370	16,149,956
		187,917,828	168,934,502	177,459,333	153,538,055

රජයේ සුරැකුම්

රජයේ සුරැකුම්, ස්වභාවයෙන්ම අවදානම් රහිත සාධනපත්‍රයන් වශයෙන් හැඳින්වෙන භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගර බැඳුම්කර, B615 සංවර්ධන බැඳුම්කර සහ ප්‍රතිවර්ත්‍ය ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් වලින් සමන්විත වේ.

ආයතනික ණය සුරැකුම්

ආයතනික ණය සුරැකුම්, කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත ආයතනික ණයකර වලින් සමන්විත අතර ඒවා දේශීය හා විදේශීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් සහතික කෙරේ.

රක්ෂණවර හිමියන් වෙත ණය

රක්ෂණවර හිමියන් වෙත ණය සම්බන්ධ ණය අවදානම යනු, අදාළ රක්ෂණවර හිමියන් විසින් ණය නොපියවීම හේතුවෙන් උද්ගත වන මූල්‍ය අලාභය වේ.

රක්ෂණවරයේ පවාරන අගය ඇපයක් වශයෙන් සළකමින් සමූහය රක්ෂණවර හිමියන් වෙත ණය නිකුත් කරන ලදී. වාර්තාකරණ දිනට, පිරිනමන ලද රක්ෂණවර ණය වල ධාරණ අගය රු.මිලියන 1,471 ක් (2020: රු.මිලියන 1,591) ක් වූ අතර ආශ්‍රිත පවාරන අගය රු.මිලියන 2,648 ක් (2020: රු.මිලියන 2,801) විය.

ලැබිය යුතු ප්‍රතිරක්ෂන

මෙය ප්‍රතිරක්ෂකයින් සමූහය වෙත පවතින වගකීම් සපුරාලීමට අපොහොසත්වීම මගින් පැන නගින අවදානමයි.

කළමනාකාරීත්වය විසින් ප්‍රතිරක්ෂකයින්ගේ ණය ගුණාත්මකභාවය නිරන්තරයෙන් ඇගයුමට ලක් කරමින් ප්‍රතිරක්ෂණ වත්කම් සඳහා සුදුසු අපහායන ප්‍රතිපාදන තීරණය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්තාකරන දිනට ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිරක්ෂණ ලැබිය යුතු දේ සම්බන්ධ සිදුවිය හැකි අපහායන අලාභය තක්සේරු කරන ලදී.

ලැබිය යුතු වාරික

මෙය හිග මුදල් නොපියවීම හෝ හිග මුදල් පියවීම සඳහා විශාල කාලයක් ගැනීම හේතුවෙන් මූල්‍ය අලාභයන් නිර්මාණය කරනු ලබන, රක්ෂණවර හිමියන්ගෙන් සහ අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරික වලින් සමන්විත වේ.

ජීවිත රක්ෂණ සම්බන්ධයෙන්, රක්ෂණවරය නිකුත් කිරීමට පෙර වාරික එක්රැස් කෙරෙන බැවින ණය අවදානම අවම වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේදී, දින 60 ක් ඇතුළත වාරිකය නොගෙවූයේ නම් හිමිකම්පෑම් සඳහා ගෙවීම් නොකෙරෙන බවට වන කොන්දේසිය මගින්, විශාල වශයෙන් ණය අවදානම පහත හෙළනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්තාකරණ දිනට ලැබිය යුතු වාරික මත සිදුවිය හැකි අපහායන අලාභය තක්සේරු කොට මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කරන ලදී.

වෙනත් ලැබිය යුතු දේ

ණය අවදානම වෙත සමූහයේ නිරාවරනය එක් එක් සේවාලාභියාගේ පුද්ගල ගතිලක්ෂණ වල බලපෑමට ලක් වේ. සමූහය මගින්, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දේ සම්බන්ධයෙන් සිය දරන ලද අලාභයන්හි ඇස්තමේන්තුව නියෝජනය කරන්නා වූ අපහායනය සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපනය කොට ඇත.

මුදල් සහ මුදල් සමාන දේ

මෙය වාර්තාකරණ දිනට කෙටි කාලීන ආයෝජන, බැංකුවේ පවතින මුදල් සහ අතැති මුදල් වලින් සමන්විත වේ. කෙටි කාලීන තැන්පතු වලට, බැංකු සහ මූල්‍ය ආයතන වල සිදුකරන ලද ස්ථාවර තැන්පතු සහ කැදවුම් තැන්පතු ඇතුළත් වේ. තවද, බැංකු වල පවතින මුදල් ප්‍රධාන වශයෙන් පුද්ගලික සහ රජයේ වාණිජ බැංකු වල ඉතුරුම් සහ ජංගම ගිණුම් වල පවතින ධණාත්මක ශේෂයන්ගෙන් සමන්විත වේ.

සමූහය මගින්, ශ්‍රේණිගත කිරීමේ ආයතනයන්හි ශ්‍රේණිගත කිරීම් සහ ගනුදෙනුව සැකසීමේ කාර්යක්ෂමතාවය සැළකිල්ලට ගනිමින් බැංකු තෝරා ගැනේ. 2021 දෙසැම්බර් 31 දිට සමූහය සතුව රු.මිලියන 27,379 ක (2020: රු.මිලියන 31,545) මුදල් සහ මුදල් සමාන දේ පැවති අතර එමගින් මෙකී වත්කම් මත එහි උපරිම ණය සඳහා නිරාවරනය නියෝජනය වේ.

දෙසැම්බර් 31 දිනට ණය සඳහා නිරාවරනය - ජීවිත රක්ෂණ ව්‍යාපාරය	2021 රු. 000'	වෙන්කිරීමේ %	2020 රු. 000'	වෙන්කිරීමේ %
මූල්‍ය ආයෝජන				
ණය සුරැකුම් - ණය සහ ලැබිය යුතු දේ	28,160,410	44%	29,178,899	49%
ණය සුරැකුම් - විකණීම සඳහා පවතින	35,907,929	56%	30,096,138	51%
	64,068,339	100%	59,275,036	100%

දෙසැම්බර් 31 දිනට ණය සඳහා නිරාවරනය - ජීවිත රක්ෂණ ව්‍යාපාරය	2021 රු. 000'	වෙන්කිරීමේ %	2020 රු. 000'	වෙන්කිරීමේ %
මූල්‍ය ආයෝජන				
ණය සුරැකුම් - ණය සහ ලැබිය යුතු දේ	5,774,228	62%	7,217,928	47%
ණය සුරැකුම් - විකණීම සඳහා පවතින	3,573,594	38%	8,083,372	53%
	9,347,822	100%	15,301,299	100%

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

44 රක්ෂණ සහ මූල්‍ය අවදානම් කළමනාකරණය (සබැඳේ)

44.3 ණය අවදානම (සබැඳේ)

ණය ශ්‍රේණිගත කිරීම් අනුව ණය සුරැකුම් වෙන්කිරීම

ජීවිත රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 දිනට	2021		2020	
ශ්‍රේණිගත කිරීම	රු.මිලියන	එකතුවෙහි % ලෙස	රු.මිලියන	එකතුවෙහි % ලෙස
AAA	3,797	9%	3,825	10%
AA+	1,831	4%	2,058	5%
AA	75	0%	83	0%
AA-	15,793	36%	10,693	27%
A+	10,276	24%	8,291	21%
A	7,442	17%	5,855	15%
A-	2,419	6%	4,499	12%
BBB+	1,932	4%	1,986	5%
BBB	152	0%	152	0%
BBB-	-	0%	-	0%
BB+	-	0%	-	0%
BB-	-	0%	-	0%
ශ්‍රේණිගත නොකල	-	0%	1,515	4%
එකතුව	43,717	100%	38,958	100%

*ස්ථාවර තැන්පතු මත ණය අවදානම බැංකුවේ ණය අවදානම මත පදනම් වේ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 දිනට	2021		2020	
ශ්‍රේණිගත කිරීම	රු.මිලියන	එකතුවෙහි % ලෙස	රු.මිලියන	එකතුවෙහි % ලෙස
AAA	1,795	25%	4,207	49%
AA+	57	1%	52	1%
AA	23	0%	22	0%
AA-	1,627	22%	1,758	21%
A+	2,276	31%	599	7%
A	-	0%	7	0%
A-	1,343	19%	1,725	20%
BBB+	132	2%	134	2%
BBB-	-	0%	-	0%
එකතුව	7,253	100%	8,505	100%

*ස්ථාවර තැන්පතු මත ණය අවදානම බැංකුවේ ණය අවදානම මත පදනම් වේ.

44.4 ද්‍රවශීලතා අවදානම

මුදල් ලබාදීමෙන් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබාදීමෙන් සිය මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් පියවීමේදී සමූහය මුහුණපාන අසීරුතා සම්බන්ධ අවදානම ද්‍රවශීලතා අවදානම් වේ.

කල්පිරීමේ විශ්ලේෂණය

පහත වගුව මගින්, ගෙවිය යුතු සහ ලැබිය යුතු පොලිය ඇතුලුව, අවශේෂ වට්ටම් නොකල ගිවිසුම්ගත බැඳීම් මත පදනම්ව ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල කල්පිරීමේ ස්වරූපයන් සාරාංශගත කොට දැක්වේ.

2021 දෙසැම්බර් 31 දිනට සමාගම	ධාරණ අගය	ස්ථාවර නොකල කාලසීමාව	වසරක් දක්වා	වසර 1 - 2 දක්වා	වසර 2 - 5 දක්වා	වසර 5 - 10 දක්වා	වසර 10 ට වැඩි	එකතුව
	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′
මූල්‍ය වත්කම්								
කල්පිරීම තෙක් රඳවාගත්	60,916,652	-	1,150,000	15,770,000	11,050,000	12,407,717	17,500,000	57,877,717
ණය සහ ලැබිය යුතු දේ	49,685,073	-	14,392,840	14,513,750	13,344,175	3,000,000	-	45,250,765
විකිණීම සඳහා පවතින	65,429,542	22,120,190	1,625,000	9,115,108	21,270,024	5,449,520	2,519,525	62,099,368
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය	22,859,816	22,859,816	-	-	-	-	-	22,859,816
රක්ෂණවර හිමියන් වෙත ණය	1,637,187	-	1,637,187	-	-	-	-	1,637,187
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ	2,901,995	-	1,896,152	168,993	55,037	60,009	787	2,180,978
ලැබිය යුතු වාරික	7,977,747	-	7,977,747	-	-	-	-	7,977,747
වෙනත් වත්කම්	4,319,689	-	4,319,689	-	-	-	-	4,319,689
මුදල් සහ මුදල් සමාන දේ	16,920,370	-	16,920,370	-	-	-	-	16,920,370
	232,648,071	44,980,006	49,918,986	39,567,851	45,719,236	20,917,246	20,020,312	221,123,637
මූල්‍ය වගකීම්								
ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ	2,868,291	-	2,716,590	109,414	41,335	952	-	2,868,291
ප්‍රවර්තන බදු වගකීම්	1,684,872	-	1,684,872	-	-	-	-	1,684,872
වෙනත් වගකීම්	5,987,182	-	5,987,182	-	-	-	-	5,987,182
මූල්‍ය වගකීම්	539,283	-	539,283	-	-	-	-	539,283
	11,079,628	-	10,927,927	109,414	41,335	952	-	11,079,628

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

44 රක්ෂණ සහ මූල්‍ය අවදානම් කළමනාකරණය (සබැඳේ)

44.4 ද්‍රවශීලතා අවදානම (සබැඳේ)

කල්පිරීමේ විශ්ලේෂණය (සබැඳේ)

2020 දෙසැම්බර් 31 දිනට සමාගම	ධාරණ අගය	ස්ථාවර නොකල කාලසීමාව	වසරක් දක්වා	වසර 1 - 2 දක්වා	වසර 2 - 5 දක්වා	වසර 5 - 10 දක්වා	වසර 10 ට වැඩි	එකතුව
	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′	රු. 000′
මූල්‍ය වත්කම්								
කල්පිරීම තෙක් රඳවාගත්	51,885,786	-	3,651,700	1,150,000	10,270,000	16,457,717	17,500,000	49,029,417
ණය සහ ලැබිය යුතු දේ	47,654,430	-	11,227,033	7,773,255	23,612,575	3,000,000	-	45,612,863
විකිණීම සඳහා පවතින	55,420,438	20,817,752	2,944,969	2,529,000	14,215,652	11,234,630	-	51,742,003
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය	15,346,680	15,346,680	-	-	-	-	-	15,346,680
රක්ෂණවර හිමියන් වෙත ණය	1,734,722	-	1,734,722	-	-	-	-	1,734,722
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ	2,180,978	-	1,896,152	168,993	55,037	60,009	787	2,180,978
ලැබිය යුතු වාරික	6,733,832	-	6,733,832	-	-	-	-	6,733,832
වෙනත් වත්කම්	3,801,275	-	3,801,275	-	-	-	-	3,801,275
මුදල් සහ මුදල් සමාන දේ	16,149,955	-	16,149,955	-	-	-	-	16,149,955
	200,908,097	36,164,432	48,139,639	11,621,248	48,153,264	30,752,356	17,500,787	192,331,726
මූල්‍ය වගකීම්								
ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ	1,675,280	-	1,486,078	139,055	32,497	8,868	8,782	1,675,280
ප්‍රවර්තන බදු වගකීම්	2,033,052	-	2,033,052	-	-	-	-	2,033,052
වෙනත් වගකීම්	6,075,756	-	6,075,756	-	-	-	-	6,075,756
මූල්‍ය වගකීම්	453,997	-	453,997	-	-	-	-	453,997
	10,238,085	-	10,048,883	139,055	32,497	8,868	8,782	10,238,085

44.5 ප්‍රාග්ධන කළමනාකරණය

සමූහය මගින්, ආර්ථික තත්ත්වයන්හි වෙනස්වීම් හමුවේ සිය ප්‍රාග්ධන ව්‍යුහය කළමනාකරණය කරමින්, එය වෙත ගැලපුමේ සිදුකරනු ලැබේ.

45 බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර

45.1 වගකීම්

පහත විස්තර කෙරෙන කරුණු හැරුනුවිට වාර්තාකරණ දිනට සමූහය සතුව කිසිදු සැළකිය යුතු ප්‍රාග්ධන බැඳීමක් නොපැවතිනි.

ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී

මූල්‍ය වර්ෂය අවසානයේදී, දැනට සිදුකෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ නමුත් නොදරන ලද, සමූහයේ සහ සමාගමෙහි ප්‍රාග්ධන බැඳීම් රු. මිලියන 43 ක (2020 රු.මිලියන 56) වටිනාකමින් යුක්ත විය.

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම

2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද නමුත් ගිවිසුම්ගතත නොකල ප්‍රාග්ධන වියදම් රු. මිලියන 17.9 ක (2020 රු.මිලියන 18.4) වටිනාකමින් යුක්ත විය.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද නමුත් ගිවිසුම්ගගත නොකල ප්‍රාග්ධන වියදම් රු. මිලියන 104 ක (2020 රු.මිලියන 361) වටිනාකමින් යුක්ත විය.

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම
ග්‍රන්ඩ් හයට් කළම්බෝ ඉදිකිරීමේ මුලු ස්ථාපන පිරිවැය රු.බිලියන 50.7 කි.

2021 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද පහත දැක්වෙන බැඳීම් සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන්හි සපයනු ලැබ නොමැත.

	2021 '000	2020 '000
ගිවිසුම්ගත නමුත් නොදරන ලද දළ වටිනාකම	14,285,779	10,856,270

45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර
වාර්තාකරන දිනට, පහත විස්තර කෙරෙන කරුණු හැරුනු විට, මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපුම් හෝ හෙළදරව් කිරීම් අවශ්‍ය වන ආකාරයේ කිසිදු අසම්භාව්‍ය වගකීමක් සහ ඇපකර නොපැවති අතර ගිණුම් වල කිසිදු ප්‍රතිපාදන වෙන්කිරීමක් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නමුත් ගිවිසුම්ගත නොකිරීමක් සිදු නොවීය.

සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝර්පරේෂන්
එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු තක්සේරුකරණයන් ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලදී.

සාමාන්‍ය රක්ෂණ සඳහා විදේශීය ප්‍රතිරක්ෂකයින්ගෙන් ලද ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් එකතු කල අගය මත බදු වලට යටත් විය යුතු බව ආදායම් බදු දෙපාර්තමේන්තුවේ මතය විය. ඒ අනුව, පිළිවෙලින් තක්සේරු වසර 2004/2005 සහ 2005/2006 සඳහා රු.318,099,913/- ක සහ 26,903,739 ක හිග ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් මත එකතු කල අගය මත බදු තක්සේරුවක් සමාගමට හිමි විය.

මෙය ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නිරත සමාගම් වත නිකුත් කරනු ලබන පොදු තක්සේරුවකි.කෙසේවුවද මේ පිළිබඳ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ මතය වනුයේ, ඔවුන් ප්‍රතිරක්ෂණ හිමිකම්පෑම් මත එකතු කල අගය මත බදු ගෙවීමට බැඳී නොසිටින බවයි.

සමාගම මගින්, බදු උපදේශකවරුන්ගේ උපදෙස් සමගින් මෙකී තක්සේරු වලට එරෙහිව වලංගු අභියාචනා ගොනු කරනු ලැබ ඇත. සමාලෝචන මණ්ඩලය මගින් 2010 ජූලි 21 දිනැති ලිපිය මගින් තත්සේරු වලංගු බවට නිර්ණය කෙරිණි. සමාගම මගින්, සමාලෝචන මණ්ඩලය විසින් සිදුකරන ලද නිර්ණය කිරීම අභියෝගයට ලක් කරමින් අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනු කරමින් පවතී. අභියාචනාධිකරණයේ තීන්දුව ලැබීමට නියමිතව පවතින තත්ත්වයක් හමුවේ සමාගම රු.මිලියන 345 ක වගකීමක් සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් සමාගම වෙත, 2002 අංක 14 දරණ එකතු කල අගය මත බදු පනතෙහි 25සී වගන්තිය අනුව මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු ගෙවීමට සමාගම බැඳී සිටින බව දක්වමින් නිල දැනුම්දීමක් ලැබී ඇත. ඒ අනුව, සමාගම වෙත, 2010,2011,2012,2013,2014,2015,2016,2017 සහ 2018 දෙසැම්බර් 31 න් අවසන් වන කාලසීමාවන් සඳහා පිළිවෙලින් රු.මිලියන 2,364, රු. මිලියන 374 රු.මිලියන 192, රු.මිලියන 232, රු.මිලියන 208, රු.මිලියන 247, රු.මිලියන 834, රු.මිලියන 464 සහ රු.මිලියන 564 ක මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු සහ මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැංවීමේ බදු තක්සේරුවක් ලැබී ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

45 බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර (සබඳේ)

45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර (සබඳේ)

සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝර්පරේෂන් (සබැඳේ)

සමාගම මගින්, බදු උපදේශකවරුන්ගේ උපදෙස් සමගින් මෙකී තක්සේරු වලට එරෙහිව විධිමත්ව අභියාචනා ගොනු කරනු ලැබ ඇත. පිළිවෙලින් 2019 ජූලි 01, ජූනි 26, සහ 2020 අගෝස්තු 27 වැනි දිනැති ලිපි මගින්, බදු අභියාචනා කමිටුව විසින් 2010,2011 සහ 2012 කාලසීමාවන් සඳහා නිකුත් කරන ලද මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු තක්සේරුව වලංගු වන බවට නිර්ණය කෙරිනි. සමාගම මගින් ඉහත සඳහන් කරන ලද තීන්දු සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අභියාචනා ගොනු කොට ඇති අතර, තවදුරටත්, බැංකු ඇපකරයක් මුදල් බවට හරවා ගැනීමේ බදු අභියාචනා කොමිසමෙහි තීන්දුව අවලංගු කරන මෙන් රිට් ආඥාවක් නිකත් කරන ලෙස අභියාචනාධිකරණයේ අභියාචනා ගොනු කොට ඇත.

තක්සේරු වසර	තක්සේරුවේ තත්ත්වය	අසම්භව්‍ය වගකීමෙහි ස්වභාවය	සමාගම වෙත අසම්භව්‍ය බලපෑමෙහි මිනුම
2010/2011	අභියාචනාධිකරණ තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු	රු. මිලියන 2,364 ක බදු වගකීම
2011/2012	අභියාචනාධිකරණ තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු	රු. මිලියන 374 ක බදු වගකීම
2012/2013	අභියාචනාධිකරණ තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු	රු. මිලියන 192 ක බදු වගකීම
2013/2014	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු	රු.මිලියන 232 ක අමතර බදු වගකීම
2014/2015	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු	රු.මිලියන 208 ක අමතර බදු වගකීම
2015/2016	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු	රු.මිලියන 247 ක අමතර බදු වගකීම
2016/2017	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු	රු.මිලියන 834 ක අමතර බදු වගකීම
2017/2018	කොමිසම් ජනරාල්වරයා විසින් තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු	රු.මිලියන 464 ක අමතර බදු වගකීම
2018/2019	කොමිසම් ජනරාල්වරයා විසින් තීන්දුව ලබාදීමට නියමිත	මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු	රු.මිලියන 564 ක අමතර බදු වගකීම

සමාගම මූල්‍ය සේවා සම්බන්ධ ව්‍යාපාරයෙහි නොයෙදෙන බැවින්, ක්ෂේත්‍රයේ රක්ෂණ සමාගම් වල සහ බදු උපදේශකවරුන්ගේ මතය වනුයේ මූල්‍ය සේවා මත එකතු කරන ලද අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී නොසිටින බවයි. එමනිසා, මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු අමතර ප්‍රතිපාදනයක් වෙන් නොකරන ලදී.

45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර

ආදායම් බදු

සමාගම වෙත, ජීවිත රක්ෂණ බදුකරණය සම්බන්ධව 2011/2012 සිට 2017/208 දක්වා තක්සේරු වසර සඳහා ආදායම් බදු තක්සේරු හිමි වූ අතර අදාළ කාලසීමාවන් සඳහා තක්සේරු වටිනාකම් පහත වගුවෙහි දැක්වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් මෙම තක්සේරුව නිකුත් කරන ලද්දේ 2016 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 92 වගන්තියට පටහැණිවය. තවද මෙය රක්ෂණ ව්‍යාපාරය තුළ ජීවිත රක්ෂණ සමාගම් වෙත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන පොදු ආදායම් බදු තක්සේරුවකි. ක්ෂේත්‍රයේ, සමාගමේ සහ සමාගමෙහි බදු උපදේශකවරුන්ගේ මතය වන්නේ මෙවැනි තක්සේරු ප්‍රායෝගිකව බලනොපාන බවයි. එමනිසා, මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු අමතර ප්‍රතිපාදනයක් වෙන් නොකරන ලදී

සමාගම මගින්, බදු උපදේශකවරුන්ගේ උපදෙස් සමගින් මෙකී තක්සේරු වලට එරෙහිව විධිමත්ව අභියාචනා ගොනු කරනු ලැබ ඇති අතර පිළිවෙලින් 2020 අගෝස්තු 18 සහ 2021 දෙසැම්බර් 14 වැනි දිනැති ලිපි මගින්, බදු අභියාචනා කමිටුව විසින් 2012/2013 සහ සහ 2011/2012 කාලසීමාවන් සඳහා නිකුත් කරන ආදායම් බදු තක්සේරුව වලංගු වන බවට නිර්ණය කෙරිනි. සමාගම මගින් තවදුරටත්, බැංකු ඇපකරයක් මුදල් බවට හරවා ගැනීමේ බදු අභියාචනා කොමිසමෙහි තීන්දුව අවලංගු කරන මෙන් රිට් ආඥාවක් නිකත් කරන ලෙස අභියාචනාධිකරණයේ අභියාචනා ගොනු කොට ඇත. එබදු තක්සේරු සම්බන්ධ තත්ත්වය පහත වගුවෙහි දැක්වේ.

තක්සේරු වසර	තක්සේරුවේ තත්ත්වය	අසම්භාව්‍ය වගකීමෙහි ස්වභාවය	සමාගම වෙත අසම්භාව්‍ය බලපෑමෙහි මිනුම
2011/2012	අභියාචනාධිකරණ තීන්දුව ලබාදීමට නියමිත	ආදායම් බදු	රු. මිලියන 524 ක අමතර බදු වගකීම
2012/2013	අභියාචනාධිකරණ තීන්දුව ලබාදීමට නියමිත	ආදායම් බදු	රු. මිලියන 296 ක අමතර බදු වගකීම
2013/2014	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	ආදායම් බදු	රු. මිලියන 768 ක අමතර බදු වගකීම
2014/2015	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	ආදායම් බදු	රු. මිලියන 1,149 ක අමතර බදු වගකීම
2015/2016	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	ආදායම් බදු	රු. මිලියන 1,374 ක අමතර බදු වගකීම
2016/2017	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	ආදායම් බදු	රු. මිලියන 1,823 ක අමතර බදු වගකීම
2017/2018	බදු අභියාචනා කොමිසම මගින් තීන්දුව ලබාදීමට නියමිත	ආදායම් බදු	රු. මිලියන 2,170 ක අමතර බදු වගකීම

ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී

වාර්තාකරණ දිනට ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී ට එරෙහිව අසම්පූර්ණ නඩු කටයුතු වල රු.මිලියන 56 ක උපරිම වගකීමක් පවතී. දැනට පවතින තොරතුරු මත පදනම්ව සමාගමෙහි නීති උපදේශකවරුන් විසින් සමාගම වෙත උපදෙස් දී ඇති පරිදි, එවැනි නීතිමය ක්‍රියාමාර්ගයන් වල අවසන් සමථයක පත්වීම මගින් සමාගමෙහි මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය සහ ද්‍රවශීලතා ප්‍රතිඵල මත ප්‍රමාණාත්මක අයහපත් බලපෑමක් ඇති නොකරන බවයි.

ඒ අනුව, මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු වගකීමක් සඳහා ප්‍රතිපාදන වෙන් නොකරන ලදී. වාර්තාකරන දිනට, ඉහත විස්තර කෙරුනු කරුණු හැරුනු විට, මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපුම් හෝ හෙළදරව් කිරීම් අවශ්‍ය වන ආකාරයේ කිසිදු අසම්භාව්‍ය වගකීමක් නොපැවතිනි.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

45 බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර (සබඳේ)

45.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර (සබැඳේ)

කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම

පහත හෙළිදරව් කෙරෙන කරුණු හැරුනු විට, මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපුම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ආකාරයේ කිසිදු සැළකිය යුතු අසම්භාව්‍ය වගකීමක් නොපැවතිනි.

කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා වූ ඩී.ආර්.පී. අබේසිංහ මහතා, මුදල් අමාත්‍යාංශයේ එකගත්වය අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් 2019 ජූලි 23 වැනි දින ඉවත් කෙරිණි. තවද, 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි වගන්ති 206 ප්‍රකාරව සහ 2019 අගෝස්තු 06 වැනි දින පැවති අති විශේෂ මහා සභා රැස්වීමකදී සමාගම් ව්‍යවස්ථාවේ වගන්ති 25 (4) අනුව හෙතෙම කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි අධ්‍යක්ෂ ධූරයෙන්ද පහ කරන ලදී.

ඒ අනුව, අබේසිංහ මහතා විසින් සිය ඉවත් කිරීම නීති විරෝධී බවට හේතු දක්වමින් සමාගමට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් (නඩු අංක. LT2/907/2019) ගොනු කරන ලදී. තවද, කම්කරු දෙපාර්තමේන්තුව සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය වෙතද වෙනත් පැමිණිලි සිදුකරන ලදී. ඉහත සඳහන් කරන ලද LT2/907/2019 නඩුවේ තීන්දුව පැමිණිලිකරු හට වාසිදායක වන අයුරින් ප්‍රකාශයට පත් වූ අතර, 2021 ජනවාරි 20 වැනි දින කම්කරු උසාවියේ ගරු සභාපතිවරයාගේ නියෝගය පරිදි ඉහත සඳහන් පැමිණිලිකරු හට වන්දි වශයෙන් රු.1,600,000 ක් කොළඹ නැගෙනහිර සහකාර කම්කරු කොමසාරිස්වරයා භාරයේ තැන්පත් කරන ලෙස සමාගමට නියෝග කෙරිණි. පසුව, මෙම නඩුව සම්බන්ධව නීති උපදේශකවරයකු යොදා ගනිමින්, කළමනාකාරිත්වය විසින් 2021 පෙබරවාරි 19 වැනි දින කොළඹ, බස්නාහිර පළාත් පළාත්බද මහාධිකරණය වෙත අභියාචනයක් ගොනු කරන ලදී. මීළඟ නඩු වාරය 2022 ජූනි 22 වැනි දින පැවැත්වීමට නියමිත අතර වාර්තාකරණ දිනට නඩුව විභාග වෙමින් පවතී.

තවද, ඩී.ආර්.පී. අබේසිංහ මහතා විසින් කම්කරු දෙපාර්තුමේන්තුවේ 2019 අගෝස්තු 15 වැනි දිනැති පැමිණිල්ලකින් සේවක අර්ථසාධක අරමුදලේ ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ වශයෙන් රු. 8,065,000 ක මුදලක් ඉල්ලා සිටින ලදී. මෙම කරුණ සමාගම් නීතිඥවරුන් මාර්ගයෙන් නියෝජනය වූ අතර කම්කරු කොමසාරිස්වරයා විසින් 2022 ජනවාරි මස ලිඛිත කරුණු දැක්වීමක් සිදුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

ග්‍රෑන්ඩ් හයැට් ව්‍යාපෘතියේ භූමි අලංකරණ සහ නඩත්තු කොන්ත්‍රාත්කරු වන ග්‍රීනරි කම්පැණි පුද්ගලික සමාගම විසින්, අදාළ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ ඔවුන්ගේ ගිවිසුම්ගත බැඳීම් කඩ කරන ලදී. ඒ අනුව, සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම මගින් ඔවුන් විසින් භාරදෙන ලද රු.3,629,275 ක කාර්යසාධන බැඳුම්කරයේ සම්පූර්ණ වටිනාකම ඉල්ලා සිටීමට අදහස් කරන ලදී. කෙසේවුවද, ග්‍රීනරි කම්පැණි පුද්ගලික සමාගම විසින්, මගින් කාර්යසාධන බැඳුම්කරය මුදල් බවට හරවා ගැනීම වළකාලීම සඳහා සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමට එරෙහිව වාරණ නියෝගයක් සහ අතුරු තහනම් නියෝගයක් ලබාගැනීම සඳහා නඩුවක් ගොනු කරන ලදී.

මූලිකව උසාවිය විසින් ග්‍රීනරි කම්පැණි පුද්ගලික සමාගම විසින් ඉල්ලා සිටින ලද වාරණ නියෝගය පිරිනමන ලදී. ඉහත සඳහන් කරන ලද බැඳුම්කරයේ වලංගුතාවය 2019.07.19. දින කල් ඉකුත් වන බැවින් විත්තිකරුගේ නීතිඥවරයා විසින් අදාළ වාරණ නියෝගයට විරෝධතා දක්වන ලදී. එමනිසා, ග්‍රීනරි කම්පැණි පුද්ගලික සමාගම විසින් 2019.07.22. දින සිට මාස 3 ක කාලයක් සමාන ආකාරයේ කාර්සාධන බැඳුම්කරයක් ක්‍රියාත්මක කරමින් කාලසීමාව දිගු කරගැනීම සඳහා එකගත්වය පළ කරන ලදී. දෙපාර්ශ්වයේම ලිඛිත කරුණු දැක්වීම් සැළකිල්ලට ගනිමින්, උසාවිය, ග්‍රීනරි කම්පැණි පුද්ගලික සමාගම විසින් ඉල්ලා සිටින ලද අතුරු තහනම් නියෝගය නිෂ්ප්‍රභා කරන ලද අතර වාර්තාකරණ දිනට මෙම නඩුව විභාග වෙමින් පවතින පරිදි නියෝග කරන ලදී.

46 වාර්තාකරණ දිනට පසු සිදුවීම්

පහත හෙළදරව් කරනු ලබන කරුණු හැරුනුවිට, මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපුම් හෝ හෙළදරව් කිරීම් සිදුකල යුතු ආකාරයේ කිසිදු සැළකිය යුතු අසම්භාව්‍ය වගකීමක් නොවීය.

ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී

සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2021 දෙසැම්බර් 31 වැනි දින අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා 2022 ජනවාරි 20 වැනි දින කොටසකට රු.1.00 බැගින් වූ අන්තර්මධ්‍ය ලාභාංශයක් ප්‍රකාශයට පත් කරන ලද අතර එය 2022 පෙබරවාරි 23 වැනි දින ගෙවන ලදී.

46.1 අධි අය බද්ද

2022 අප්‍රියෙල් 22 වැනි දින සහතික කරන ලද 2022 අංක 14 දරණ අධි අය පනත ප්‍රකාරව, තක්සේරු වසර 2020/21 සම්බන්ධ රු.9,706,499,829 ක් වන බදු වලට යටත් වන ආදායමෙන් රු.2,426,624,957 ක අධි අය බදු ගෙවීමට සමාගම බැඳී සිටී. ඉහත සඳහන් කරන ලද පනත ප්‍රකාරව, අධි අය බද්ද මූල්‍ය ප්‍රකාශයන්හි 2020 ජනවාරි 01 වැනි දින ඇරඹී තක්සේරු වසර ආශ්‍රිත වියදමක් වශයෙන් සැලකිය හැකි වේ. පනත මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අවශ්‍යතා අවලංගු කෙරෙන බැවින්, 2022 අප්‍රියේ මස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද අධි අය බද්ද සඳහා ගිණුම්කරණය සම්බන්ධ වෛකල්පිත සත්කාරක ප්‍රකාශය (SoAT) මගින් නිර්දේශිත පරිදි අධි අය බදු වියදම ගිණුම්ගත කරන ලදී.

සන්සන්දනාත්මක වසර සම්බන්ධ අධි අය බදු පනත යටතේ අධි අය බදු බලපෑම පහත දැක්වේ:

	සමාගම රු. 000'	සමූහය රු. 000'
බදු වලට පසු ලාභය 31.12.2020	5,788,533	6,930,328
අධි අය බදු පනත යටතේ අය කරන ලද අධි අය බදු	(2,426,625)	(2,853,981)
වසර 2020 සඳහා සන්සන්දනාත්මක ලාභය	3,361,908	4,076,347

තවද, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමූහයේ අධි අය බදු වගකීම පහත දැක්වෙන පරිදි වේ:

සමාගමෙහි නාමය	2020.12.31. දිනට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි හිමිකාරීත්ව % (සෘජු)	2020.12.31. දිනට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි හිමිකාරීත්ව % (වක්‍ර)	අධි අය බදු වලට යටත් වන බදු ගෙවිය යුතු ආදායම (රු. 000')	අධි අය බදු (රු. 000')
සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝර්පරේෂන්	-	-	9,706,500	2,426,625
ලංකා හොස්පිට්ල්ස් කෝර්පරේෂන් පීඑල්සී	51.34%	-	140,381	35,095
ලංකා හොස්පිට්ල්ස් ඩයග්නෝස්ටික්ස් පුද්ගලික සමාගම	-	51.34%	27,644	6,911
සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	99.94%	-	ශූන්‍ය	ශූන්‍ය
සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම	100%	-	1,493,999	373,500
කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම	45.95%	27.02%	ශූන්‍ය	ශූන්‍ය
සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම	-	72.97%	ශූන්‍ය	ශූන්‍ය
හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම	-	72.97%	17,706	4,426
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් පුද්ගලික සමාගම	100%	-	ශූන්‍ය	ශූන්‍ය
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පුද්ගලික සමාගම	100%	-	29,695	7,424
සමූහය එකතුව (රු.000)				2,853,981

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

46 වාර්තාකරණ දිනට පසු සිදුවීම් (සබැඳේ)

46.2 46.2 සමාගමෙහි මූල්‍ය ස්ථාවරය සහ කාර්යසාධනය කෙරෙහි කෝවිඩ් 19 බලපෑම

2020 මාර්තු මුල් භාගයේදී සිට සමාගම සහ සමූහයෙහි පරිපාලිතයන් වෙත කෝවිඩ් 19 හි බලපෑම අඛණ්ඩවම පැවිතිනි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී, කළමනාකාරිත්වය විසින් කෝවිඩ් 19 හි බලපෑම මූලිකව පහත දැක්වෙන පරිදි සැළකිල්ලට ගන්නා ලදී: සමාගම සහ සමූහය, කෝවිඩ් 19 වසංගතය හමුවේ සමූහයට අඛණ්ඩ පැවැත්ම සහිතව පැවතීමේ හැකියාවට සැළකිය යුතු සැක උපදවන සිදුවීම් හෝ තත්ත්වයන් හදුනා නොගැනුනි. කළමනාකාරිත්ව විනිසුම් සහ ඇස්තමේන්තු රැසකට යටත්ව, කෝවිඩ් 19 ආශ්‍රිත සිදුවීම් වල අවිනිශ්චිතතාවය, සිය වෙළඳ ලැබිය යුතු දේ සහ වෙනත් මූල්‍ය වත්කම් වලින් අපේක්ෂිත ණය අලාභ සම්බන්ධ සමූහයේ තක්සේරුවේ නිරූපනය කෙරේ.

47 වසර සඳහා ආදායම් ප්‍රකාශය, ලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම සහ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශයෙහි සන්සන්දනාත්මක අගයයන්හි ප්‍රතිවර්ගීකරණය

2020 දෙසැම්බර් 31 දිනට වර්ගීකරණයන් සහ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම උදෙස ඇතැම් සන්සන්දනාත්මක අගයයන් ප්‍රතිප්‍රකාශ කරන ලදී. ඒ අනුව, රු.මිලියන 82.9 ක් වූ ශුද්ධ උපලබ්ධි ලාභ යටතේ ඇතුලත් කරන ලද කල්බදු පොලී වියදම් වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් යටතට ප්‍රතිවර්ගීකරණය කරන ලදී.

48 ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන්කිරීම

2011 අංක 03 දරණ රක්ෂණ පනතෙහි සංශෝධන තුළ ව්‍යවස්ථාපිත පරිදි, සංයුක්ත රක්ෂණ සමාගම් විසින්, ඔවුන් විසින් සිදුකරනු ලබන ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්, වෙන වෙනම ස්ථාපනය කරන ලද සමාගම් දෙකකට වෙන් කිරීම අවශ්‍ය වන අතර මෙම අනුකූලතාවය 2015.02.11. දින බලාත්මක වීමට නියමිත විය. සමාගම මගින් නෛතික ආකෘතිකරාමුව සපුරාලීම සඳහා ක්‍රමවේදයක් වෙත එකගවීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ සමග සාකච්ඡා කරනු ලැබේ. ඉහත දක්වන ලද කරුණු හේතුවෙන් සමාගම සංයුක්ත ව්‍යාපාරය වෙන්කිරීමට අපොහොසත්වීම හේතුවෙන්, ''ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද 2011 අංක 3 දරණ (සංශෝධන) රක්ෂණ ක්ෂේත්‍ර නියාමන පනතෙහි වගන්ති 53 යටතේ වන ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සම්බන්ධ ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ මාර්ගෝපදේශයන්' අදළ නොවේ.

''සමාගම සඳහා වන ඉහත කොටස බැහැර කිරීමේ අයවැය යෝජනාව 2021 නොවැම්බර් 12 වැනි දින 2022 සඳහා වන අයවැය යෝජනා විවාදයේදී සහාගත කෙරුණද, එය වාර්තාකරණ කාලසීමාව වන විට ගැසට් නිවේදනයක් මාර්ගයෙන් බලාත්මක නොවීය. ''

49 පර්යන්ත අංගනය භාවිතය

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම

සමාගම මගින් සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගමෙන් තොග ගබඩා පහසකම් ලබාගැනේ. මෙම සේවා ලබාග ැනීමේදී, සමාගම මගින් පසු සමාගමෙහි ගබඩා ටැංකි, නළ මාර්ග සහ පොම්පකරණ ස්ථාන භාවිත කරමින්, ලබාගත් සේවාවන් සඳහා සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම වෙත නිෂ්පාදන ගාස්තුවක් ගෙවනු ලැබේ. මෙම නිෂ්පාදන ගාස්තු ගිවිසුම IFRIC 4 යටතේ හදුනාගත් කල්බදු ගිවිසුමකින් සමන්විත වන අතර, එමනිසා, ගිවිසුමෙහි කොන්දේසි අනුව මූල්‍ය කල්බදු ගිවිසුමක් ස්ථාපනය කරයි. කෙසේවුවද, වෙනත් ආනයනකරුවන් හටද පර්යන්ත අංගනයේ ගබඩා පහසුකම් ලබාදීම හමුවේ සහ එල්පී ගෑස් ගබඩා කිරීම සඳහා වෙනත් ආනයනකරුවන් සමග ගිවිසුම්ගතවීමේ කළමනාකාරිත්වයේ අභිමතය අනුව, අදාළ ගබඩා පහසුකම් සමාගමෙහි ගිණුම් පොත් තුළ හදුනා නොගැනුනි. කෙසේවුවද, විමර්ශනයට ලක් වන වසර තුළදී ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම, අනාගත ආනයනකරුවන්ගෙන් කිසිදු හිතකර යෝජනාවක් ඉදිරිපත් නොවීම හේතුවෙන් පහසුකම කල්බදු දීම සඳහා කිසිදු ගිවිසුමකට නොඑළඹිනි.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම

සමාගම මගින් සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම වෙත එල්පී ගෑස් තොග ගබඩා සහ බෙදාහැරීමේ සේවාවන් සපයනු ලැබේ. මෙම ක්‍රියාවලිය සිදුකිරීමේදී, සමාගම මගින් පසු සිය ගබඩා ටැංකි, නළ මාර්ග සහ පොම්පකරණ ස්ථාන භාවිත කරමින්, ලබාගත් සේවාවන් සඳහා සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම වෙතින් නිෂ්පාදන ගාස්තුවක් අය කරනු ලැබේ.මෙම නිෂ්පාදන ගාස්තු ගිවිසුම IFRIC 4 යටතේ හදුනාගත් කල්බදු ගිවිසුමකින් සමන්විත වන අතර, එමනිසා, ගිවිසුමෙහි කොන්දේසි අනුව මූල්‍ය කල්බදු ගිවිසුමක් ස්ථාපනය කරයි. කෙසේවුවද, වෙනත් ආනයනකරුවන් හටද පර්යන්ත අංගනයේ එල්පී ගෑස් ගබඩා පහසුකම් ලබාදීම හමුවේ සහ එල්පී ගෑස් ගබඩා කිරීම සඳහා වෙනත් ආනයනකරුවන් සමග ගිවිසුම්ගතවීමේ කළමනාකාරිත්වයේ අභිමතය අනුව, අදාළ ගබඩා පහසුකම් සමාගමෙහි ගිණුම් පොත් තුළ හදුනා නොගැනුනි. කෙසේවුවද, විමර්ශනයට ලක් වන වසර තුළදී ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා පුද්ගලික සමාගම, අනාගත ආනයනකරුවන්ගෙන් කිසිදු හිතකර යෝජනාවක් ඉදිරිපත් නොවීම හේතුවෙන් පහසුකම කල්බදු දීම සඳහා කිසිදු ගිවිසුමකට නොඑළඹිනි.

50 අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂවරුන් විසින් අඛණ්ඩ පැවැත්ම සහිතව ඉදිරියට යාමට සමූහය සතු හැකියාව පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද අතර, පුරෝකථනය කල හැකි අනාගත කාලයක් සඳහා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට එය සතු සම්පත් සම්බන්ධයෙන් සෑහීමකට පත් වේ. තවද, අඛණ්ඩ පැවැත්ම සහිතව ඉදිරියට යාමට සමූහය සතු හැකියාව පිළිබඳ සැළකිය යුතු සැක උපදවන්නා වූ කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් දැනුවත් නොවේ. එමනිසා, මූල්‍ය ප්‍රකාශයන් අඛණ්ඩවම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරන ලදී.

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමෙහි අධ්‍යක්ෂවරුන් විසින් වසර 2015 දී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝටලය ඉදිකිරීමේ කටයුතු අවසන් විය. තවද, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය මගින්, 2017 අගෝස්තු 01 වැනි දිනැති අංක. 17/1613/733/029 දරණ කැබිනට් තීරණය අනුව, සමාගමෙහි කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි (මව් සමාගම) කොටස් හිමිකාරිත්වය සමානුපාතිකව පවරන ලෙසට උපදෙස් දෙන ලදී. වාර්තාකරණ දින වන විට මෙම වැඩසටහන ක්‍රියාත්මක කොට නොතිබිණි. සමාගම පුරෝකථනය කල හැකි අනාගත කාලයකදී ඈවර කිරීමට අදහස් නොකරන අතර ඉදිරියට යාම සඳහා කළමනාකාරිත්වය අමාත්‍යාංශයෙන් අවශ්‍ය නියෝග අපේක්ෂා කරයි. එමනිසා, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් අඛණ්ඩවම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරන ලදී.

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගම

සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා පුද්ගලික සමාගමෙහි කළමනාකාරිත්වය මගින් අඛණ්ඩ පැවැත්ම සහිතව ඉදිරියට යාමට සමූහය සතු හැකියාව පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද අතර, පුරෝකථනය කල හැකි අනාගත කාලයක් සඳහා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට එය සතු සම්පත් සම්බන්ධයෙන් සෑහීමකට පත් වේ.තවද, අඛණ්ඩ පැවැත්ම සහිතව ඉදිරියට යාමට සමූහය සතු හැකියාව පිළිබඳ සැළකිය යුතු සැක උපදවන්නා වූ කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් දැනුවත් නොවේ. එයට අමතරව, 2020 ජූලි 08 වැනි දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී කැබිනට් අමාත්‍යවරුන් විසින් ග්‍රෑන්ඩ් හයට් කළම්බේ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව, 2022 ජනවාරි 01 වැනි දිනැති කැබිනට් මණ්ඩල අනුමැති යොමු අංක 21/2278/306/100 මත පදනම්ව, සමාගමෙහි කළමනාකාරිත්වය විසින්. ඇමරිකානු ඩොලර් මිලියන 25 ක ස්කන්ධ සහ ඇමරිකානු ඩොලර් මිලියන 150 ක ණය ප්‍රාග්ධනයක් මාර්ගයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 175 ක ව්‍යාපෘති මූල්‍යකරණයක් සඳහා කටයුතු කෙරේ.

කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම

කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමෙහි කළමනාකාරිත්වය මගින් අඛණ්ඩ පැවැත්ම සහිතව ඉදිරියට යාමට සමූහය සතු හැකියාව පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද අතර, පුරෝකථනය කල හැකි අනාගත කාලයක් සඳහා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට එය සතු සම්පත් සම්බන්ධයෙන් සෑහීමකට පත් වේ.තවද, අඛණ්ඩ පැවැත්ම සහිතව ඉදිරියට යාමට සමූහය සතු හැකියාව පිළිබඳ සැළකිය යුතු සැක උපදවන්නා වූ කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් දැනුවත් නොවේ. එමනිසා, සමාගමෙහි මූල්‍ය ප්‍රකාශයන් අඛණ්ඩවම අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කරන ලදී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

51 වර්තමාන ආර්ථික නිරීක්ෂණයන්ගේ බලපෑම

පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ඒවායේ බලපෑම් මගින් මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු වල අවිනිශ්චිතතාව ඉහළ නංවන ලදී. ඇස්තමේන්තු අවිනිශ්චිතතාව පහත දැක්වෙන කරුණු හා සම්බන්ධ වේ:

1. පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් වෙතින් උද්ගත වන ව්‍යාපාරයන් කෙරෙහි බාධාවන්ගේ බරපතල බව සහ කාලසීමාව සහ රජය, ව්‍යාපාරයන් සහ සේවාලාභීන් වැනි පාර්ශ්වකරුවන්ගේ ආශ්‍රිත ක්‍රියාකාරකම්
2. දළ දේශීය නිෂ්පාදිතය, ප්‍රාග්ධන වෙළඳපොල සේවාලාභීන්ගේ ණය අවදානම වෙත බලපෑම සහ විරැකියාව වෙත බලපෑම සහ සේවාලාභී අභිමත වියදම් කිරීමේ සිදුවිය හැකි පහළයාම හේතුවෙන් පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් වෙතින් උද්ගත වන බරපතල බව සහ කාලසීමාව
3. පවතින තත්ත්වයන්ට ප්‍රතිචාරයක් වශයෙන් රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ පියවර වල බලාත්මක බව

පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කල හැකි මෑත කාලීන ආර්ථික නිරීක්ෂණයන් රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කලේය: ඒවා නම්, ඉහළගිය උද්ධමනය, ඉහළගිය විරැකියාව, ඉහළ යමින් පවතින වෙළඳපොල පොලී අනුපාත සහ රජයේ සුරැකුම් මත ආදායම, පුලුල් වන ෆිස්කල් හිඟය, පුලුල් වන රජයේ ණය සහ ණය සේවාකිරීමේ ගෙවීම්, ප්‍රධාන මුදල් ඒකකයන්ට සාපේක්ෂව රුපියල අවප්‍රමාණ වීම, වර්ධනය වන අපනයන ඉපැයුම් හමුවේ වුවද පුලුල් වන ගෙවුම් ශේෂය, දළ නිල සංචිත වල දැඩි පහළයාම, පහත වැටෙමින් පවතින සංචාරක ඉපැයුම් සහ විදේශ ප්‍රේශන සහ ණය අවශ්‍රේණිගත කිරීම් ආදිය වේ.

අප විසින් පහත දැක්වෙන පරිදි අපගේ ව්‍යාපාරයේ විවිධ පැතිකඩ මත ආර්ථික අර්බුධයේ බලපෑම සළකා බලනු ලැබ ඇත.

අයෝජන කෙරෙහි බලපෑම

ඉහළ උද්ධමනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සෘණාත්මක තථ්‍ය ආදායම, සේවාලාභීන් හට තථ්‍ය ප්‍රතිලාභ ලබාදීමේදී සහ තරගකාරව පැවතීමේදී ප්‍රබල බලපෑමක් එල්ල කරයි. එමෙන්ම, ඇමරිකානු ඩොලරයේ අගය ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව සැළකිය යුතු අයුරින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ අවිනිශ්චිතබව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සිදුකෙරෙන සාකච්ඡා පිළිබඳව සියලු වෙළඳපොල සහභාගිකයින්ගේ දැඩි අවධානය යොමු වෙ. අප විසින් මෙම තත්ත්වයන් දෙකටම ආවරනයක් වශයෙන්, ඇමරිකානු ඩොලර් පදනම් කරගත් ප්‍රතිපාර්ශ්වයන් වෙත අවධානය යොමු කෙරෙන ස්කන්ධ මත පදනම් වූ ක්‍රමෝපායක් කෙරෙහි අවධානය යොමු කෙරේ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි බලපෑම

කෝවිඩ් 19 සහ රටේ පවතින ආර්ථික අවගමනය හේතුවෙන්, සාමාන්‍ය රක්ෂණ සම්බන්ධයෙන් 2022 සඳහා ඉලක්කගත අගයයන් ප්‍රති-පුරෝකථනය කල යුතු බවට තීරණය කෙරිණි. එමනිසා, 2022 මූල්‍ය වර්ෂය සඳහා ඉලක්කගත දළ ලිඛිත වාරිකයට වඩා, මෝටර් රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය 3% කින් පමණද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය 4% කින් පමණද පහත වැටෙනු ඇතැයි අපේක්ෂිතය.

එය සාමාන්‍ය ව්‍යාපාරයේ 4% ක පමණ සමස්ත පහත වැටීමකි. එයට අමතරව, අමතර කොටස් වල මිල ඉහළයාම හේතුවෙන් මොටර් රක්ෂණ ව්‍යාපාරයේ හිමිකම්පෑම්/අලාභ අනුපාතය 35% කින් ඉහල යනු ඇතැයි අපේක්ෂිතය. වෛද්‍ය උපකරණ සහ ඖෂධ වල මිල ඉහළනැගීම හේතුවෙන්, සෞඛ්‍ය හා සුරක්ෂිතතා (SHE) හිමිකම්පෑම් 35% කින් පමණ ඉහළයනු ඇතැයිද අපේක්ෂිතය. එමනිසා, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත හිමිකම්පෑම් අනුපාතය 85% ක් වනු ඇත.

ඉන්ධන මිල ශීඝ්‍රයෙන් ඉහළයාම සහ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණ වීම කරණ කොට ගෙන, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ කළමනාකරණ වියදමද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමනිසා, ඉන්ධන ආශ්‍රිත වියදම් වල 45% ක සහ ඩොලර් මගින් නම් කරන ලද වියදම් වල 50% ඉහළයාමක් සිදුවනු ඇතැයි උපකල්පනය කෙරේ.

අමතර කොටස් සහ ඖෂධ මිල ඉහළයාම හේතුවෙන් මෝටර් සහ වෛද්‍යමය ක්ෂේත්‍රයන්හි හිමිකම්පෑම් පිරිවැය ඉහළ යනු ඇත. මෙයට ප්‍රධාන වශයෙන් සාධක දෙකක් හේතුවේ: ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ සෘණාත්මක උච්ඡාවචනය සහ ආනයන සීමා කිරීම එම සාධක වේ. ඉදිකිරීම් අමුද්‍රව්‍ය සහ යන්ත්‍ර අමතර කොටස් ආදියෙහි විශාල මිල ඉහළයාම හේතුවෙන් ඉහළ යන පිරිවැය ගිනි රක්ෂණ හිමිකම්පෑම් කෙරෙහිද බලපානු ඇත.

මුදල් ඒකකය උච්ඡාවචනය වීම සහ සැපයුම් දුර්ලභ වීම නිසාවෙන් අපගේම මෙහෙයුම් පිරිවැය ද ඉහළ යනු ඇත.

මූල්‍ය අසීරුතා හේතුවෙන් ඇතැම් සේවාලාභීන් සම්පූර්ණ රක්ෂණාවරන වලින් තෙවන පාර්ශ්වීය රක්ෂණ වෙත යොමු විට හැක. ඔවුන් හට මූලික අවශ්‍යතා වෙත ප්‍රමුඛත්වය ලබාදීමට අවශ්‍ය බැවින් මෝටර් නොවන සේවාලාභීන් සිය රක්ෂණ මිලදී ගැනීමේ තීරණ ප්‍රමාද කරනු ඇත. ඒ අනුව, අප හට අපේක්ෂිත ආදායමට වඩා අඩු ආදායමක් යටතේ ඉහලයන පිරිවැයට මුහුණදීහමට සිදු වනු ඇත.

එයට අමතරව, හිමිකම්පෑම් ඉහළ නංවමින් (ගිනි, හිතාමතා අතිශෝක්තිකරණය, වංචා සහගත හිමිකම්පෑම් ආදිය) ආර්ථික අර්බුදය නිසාවෙන් සදාචාරාත්මක ආපදාවන්හි වර්ධනයක්ද සිදුවිය හැක. උදාහරණයක් වශයෙන්, සිවිල් කැරලි කෝලාහල මගින් දේපළ හානි සහ අබාධයන් සිදුවිය හැකි අතර අවසානයේ එය හිමිකම්පෑම් ඉහළයාම කෙරෙහි බලපානු ඇත.

සේවාලාභීන් විසින් අවලංගු කිරීම් ඉහළයාමේ ගෙවීම් ප්‍රමාද කිරීමේ තර්ජනය

ජීවිත රක්ෂණ ව්‍යාපාරය වෙත බලපෑම

රටේ පවතින වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ නැවත අලුත් කිරීමේ වාරික එක්රැස් කිරීම සහ නව ජීවිත රක්ෂණ සැලසුම් ප්‍රවර්ධනය කිරීම අතිශය අසීරු කාර්යයක් වන පසුබිමක් හමුවේ, ජීවිත රක්ෂණ ව්‍යාපාරය වෙත ප්‍රබල බලපෑමක් ඇති විය හැකි බවට නිරීක්ෂණය වේ. එමෙන්ම, මෙහෙයුම් වියදම්ද සැළකිය යුතු අයුරින් ඉහළ යමින් පවතී. තවද, විශේෂයෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ, ශ්‍රී ලංකාවේ විදේශ මුදල් හිගය හේතුවෙන් ප්‍රතිරක්ෂණ වාරික ගෙවීමේ කෙරෙහි දැඩි අහිතකර බලපෑමක් ඇති වී තිබේ.

අනිත් අතින්, දිගු විදුලි කප්පාදුව සහ ගමනාගමන දුෂ්කරතා හේතුවෙන් මෙහෙයුම් අසීරුතාද උද්ගත වේ. වසංගතය සහ ආර්ථික හා බලශක්ති අර්බුදය හමුවේ, අප විසින් තාක්ෂණය උපයෝගී කරගනිමින් දුරස්ථව කාර්යයන් සිදුකිරීම සහ ඩිජිටල් මාධ්‍යයන් එස්සේ අපගේ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධ වීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

තවද, එබඳු කරුණු සම්බන්ධයෙන් ව්‍යාපාර අඛණ්ඩත්ව නියමු කමිටුව කටයුතු කරන අතර, මූල්‍යමය බලපෑම හා යෝජිත ක්‍රමෝපායන් පිළිබඳව සතිපතා විධායක කමිටු සාමාජිකයින් සමග පසුවිපරම් සිදුකෙරේ.

ප්‍රාග්ධනය මත පදනම් වූ අවදානම සහ නුබුන්වත් බව කෙරෙහි බලපෑම

අපගේ සියලු පාර්ශ්වකරුන් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි මතය වන්නේ කිසිදු ප්‍රබල බාධාවකින් තොරව දිවයින පුරා අපගේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යා හැකි බවයි. ශ්‍රී ලංකාව තුල සාර්ථක එන්නත්කරණ වැඩසටහනකින් අනතුරුව, මේ වන විට දිවයින පුරා කෝවිඩ් 19 ආශ්‍රිත සිදුවීම් වල විශාල පහළයාමක් දක්නට ලැබෙන අතර සමාගම සිය මූල්‍යමය සවිබලය සහ මනා කළමනාකාරිත්වය සමගින්, 2021 දී වසංගත තත්ත්වයට සාර්ථකව මුහුණදීමට සමත් විය. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙම අභියෝගාත්මක කාලසමය තුළ සිය ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතයන් පිළිවෙලින් 400% ක් 200% ක් වශයෙන් පවත්වා ගෙන යාමට සමත් විය.

පවතින ආර්ථික අර්බුදය රක්ෂණ ක්ෂේත්‍රය වෙත කෙටි කාලීනස හ දිගු කාලීන බලපෑම් ඇති කරයි. රට තුළ පවතින ඉහළ උද්ධමනය හේතුවෙන්, සේවාලාභී අවශ්‍යතා වෙනස් වනු ඇති අතර රක්ෂණ වාරික ගෙවීම කෙරෙහි බලපෑම් ඇති වනු ඇත. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් සාමාන්‍යයෙන් නිරීක්ෂණය කෙරෙන මට්ටමට වඩා වැඩි රක්ෂණවර පවාරනයන් සහ අක්‍රීය වීම් අපේක්ෂා කෙරේ. කෙසේවුවද, සවිමත් වත්කම් පදනම, ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් දෙකෙහිම ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය අවම නියාමන මට්ටමට ඉහළ තබා ගැනීම සඳහා උපකාරී වනු ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

51 වර්තමාන ආර්ථික නිරීක්ෂණයන්හි බලපෑම (සබැඳේ)

මෘත්‍යතා සහ අකර්මන්‍යතා ආශ්‍රිත උපකල්පනයන් කෙරෙහි බලපෑම

කෝවිඩ් වසංගතය හේතුවෙන් 2021 දී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි හිමිකම්පෑම් වල වර්ධනයක් දක්නට ලැබිණි. කෙසේවුවද, මිලියන 14.3 ක ජනතාවක් අවම වශයෙන් කෝවිඩ් 19 ප්‍රතිශක්තිකරණ එන්නත් දෙකක් සහ ඉන් මිලියන 7.9 ක පිරිසක් එන්නත් තුනම ලබාගැනීම හමුවේ (මූලය:https://epid.gov.lk as at 2022.04.02), මේ වන විට කෝවිඩ් ආශ්‍රිත සිදුවීම් විශාල වශයෙන් පහත වැටී ඇත. 2021 දී කෝවිඩ් 19 හේතුවෙන් සිදු වූ මරණ වලින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත ඇති වූ බලපෑම අවම විය.

මේ වන විට තවත් කෝවිඩ් 19 පැතිර යාමක් පිළිබඳව සාක්ෂි නොමැති වුවද, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මගින් SLFRS අරමුණු උදෙසා, ජීවිත රක්ෂණවර හිමියන් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේදී විචක්ෂණශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබේ. අහිතකර වෙනස්වීම් සඳහා තීරුවක් වෙන් කරමින්, ප්‍රශස්ත ඇස්තමේන්තු උපකල්පන මත පදනම්ව විචක්ෂණශීලී තීරුවක් සමගින් වගකීම් සකසනු ලැබේ. මෘත්‍යතා සහ අකර්මන්‍යතා කෙරෙහි කෝවිඩ් බලපෑම මගින් කෙටි කාලීනව පමණක් අදාළ අත්දැකීම් කෙරෙහි හානි පැමිණවිය හැකි බැවින්, වගකීම් වල ප්‍රමාණවත්භාවය හේතුවෙන් දැනටමත් සකසන ලද උපකල්පන සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් මතු නොවේ.

ශ්‍රේණිගත කිරීම කෙරෙහි බලපෑම

ෆිච් රේටින්ග්ස් මගින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ස්ථාවර ස්වරූපයක් සමගින් ''ජාතික රක්ෂක මූල්‍ය සවිබල ශ්‍රේණිගත කිරීම'' AA(lka) 2021.11.24 වශයෙන් ශ්‍රේණිගත කරන ලදී. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් තවදුරටත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ඉහළම ශ්‍රේණිගත කිරීම් සහිත රක්ෂණ සමාගම වශයෙන් පවතී.

කවර හෝ අහිතකර ආර්ථික තත්ත්වයක් ශ්‍රේණිගත කිරීම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කල හැකි නමුත් එබඳු අහිතකර බලපෑමක් පිළිබඳව පුරෝකථනය කිරීමට තවමත් කාලය ප්‍රමාණවත් නොවේ.

අනුශාංගික තොරතුරු

270 - ජීවිත රක්ෂණය පිළිබඳ මූල්‍යමය ස්ථාවරත්ව වාර්තාව
271 - මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල
276 - දස වසරක් සාරාංශ ආදායම් ප්‍රකාශය
278 - දස වසරක සාරාංශ ශේෂ පත්‍රය - සමූහය
280 - දස වසරක සාරාංශ ශේෂ පත්‍රය - සමාගම
284 - ශාඛා ජාලය
293 - ආයතනික තොරතුරු
294 - වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම
295 - සටහන්
297 - ලියාපදිංචි වීමේ පෝරමය
299 - පෙරකලාසි පෝරමය

STRATEGY

ක්‍රමෝපාය

අනාගත අවධානාත්මක ක්‍රමෝපාය අපගේ අඛණ්ඩ විශිෂ්ටත්වයෙහි වැදගත් සංරකචකයක් වන බව අපගේ විශ්වාසයයි.

ජීවිත රක්ෂණය පිළිබඳ මූල්‍යමය ස්ථාවරත්ව වාර්තාව

	සටහන	2021 රු. 000'	2020 රු. 000'
වත්කම්			
මූල්‍ය ආයෝජන	A	160,554,249	138,614,218
පරිපාලිතයන්හි ආයෝජන	B	3,296,543	1,296,543
දේපළ, පිරියත සහ උපකරණ	E	97,939	86,004
භාවිත හිමිකම් වත්කම්		388,059	458,820
රක්ෂණවර හිමියන් වෙත ණය	C	1,637,187	1,734,723
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ		811,913	488,859
රක්ෂණවර හිමියන්ගෙන් ලැබිය යුතු වාරික		507,391	531,495
වෙනත් වත්කම්	D	3,539,443	3,877,779
මුදල් සහ මුදල් සමාන දේ		13,782,374	12,963,071
මුලු වත්කම්		184,615,098	160,051,512
ස්කන්ධ			
විකිණීම සඳහා පවතින සංචිත	F	3,260,333	2,884,888
ආදායම් සංචිත	G	18,381,630	12,987,262
සීමා කරන ලද නියාමන සංචිත		98,237	98,237
ප්‍රත්‍යාගණන සංචිතය		71,673	57,378
සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙත ආරෝපනය කල යුතු මුලු ස්කන්ධ		21,811,873	16,027,765
වගකීම්			
රක්ෂණ ගිවිසුම් වගකීම් (ප්‍රතිපාදනය) - ජීවිත	H	155,788,928	137,129,036
භාවිත හිමිකම් වගකීම්		450,308	510,975
ප්‍රතිරක්ෂණ ණයහිමියන්		1,095,095	615,341
බදු වගකීම්		1,257,284	1,113,679
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන		917,180	1,221,234
වෙනත් වගකීම්	I	3,080,779	3,260,971
මූල්‍ය වගකීම් (බැංකු අයිරාව)		213,651	172,510
මුලු වගකීම්		162,803,225	144,023,746
මුලු ස්කන්ධ සහ වගකීම්		184,615,098	160,051,512

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල

A. මූල්‍ය අයෝජන

දෙසැම්බර් 31 දිනට	සටහන	2021 ධාරණ අගය රු. 000'	2021 සාධාරණ අගය රු. 000'	2020 ධාරණ අගය රු. 000'	2020 සාධාරණ අගය රු. 000'
කල්පිරීම තෙක් රඳවාගත්	A.1	60,399,783	58,824,840	51,319,076	60,961,319
ණය සහ ලැබිය යුතු දේ	A.2	31,897,236	31,897,236	32,654,202	32,654,202
විකිණීම සඳහා පවතින	A.3	50,606,618	50,606,618	43,263,216	43,263,216
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට	A.4	17,650,612	17,650,612	11,377,724	11,377,724
		160,554,249	158,979,305	138,614,218	148,256,461

A.1 කල්පිරීම තෙක් රඳවාගත්

	2021 ධාරණ අගය රු. 000'	2021 සාධාරණ අගය රු. 000'	2020 ධාරණ අගය රු. 000'	2020 සාධාරණ අගය රු. 000'
භාණ්ඩාගාර බැඳුම්කර	60,399,783	58,824,840	51,319,076	60,961,319
	60,399,783	58,824,840	51,319,076	60,961,319

A.2 ණය සහ ලැබිය යුතු දේ

දෙසැම්බර් 31 දිනට	2021 ධාරණ අගය රු. 000'	2021 සාධාරණ අගය රු. 000'	2020 ධාරණ අගය රු. 000'	2020 සාධාරණ අගය රු. 000'
අප්‍රකාශිත ණයකර	20,248,744	20,248,744	20,215,004	20,215,004
ස්ථාවර තැන්පතු	7,911,667	7,911,667	8,963,895	8,963,895
සංවර්ධන බැඳුම්කර	3,736,825	3,736,825	3,475,304	3,475,304
	31,897,236	31,897,236	32,654,202	32,654,202

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල

A.3 විකිණීම සඳහා පවතින

දෙසැම්බර් 31 දිනට	2021		2020	
	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'
ප්‍රකාශිත තොග	11,813,255	11,813,255	11,186,021	11,186,021
ඒකක භාර	967,235	967,235	856,514	856,514
ප්‍රකාශිත ණයකර	35,805,985	35,805,985	29,994,194	29,994,194
භාණ්ඩාගාර බැඳුම්කර	2,020,143	2,020,143	1,226,488	1,226,488
	50,606,618	50,606,618	43,263,216	43,263,216

A.4 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට

දෙසැම්බර් 31 දිනට	2021		2020	
	ධාරණ අගය	සාධාරණ අගය	ධාරණ අගය	සාධාරණ අගය
	රු. 000'	රු. 000'	රු. 000'	රු. 000'
ප්‍රකාශිත තොග	15,860,785	15,860,785	10,435,667	10,435,667
ඒකක භාර	1,789,827	1,789,827	942,057	942,057
	17,650,612	17,650,612	11,377,724	11,377,724

ආයෝජන සහ විකිණීම සඳහා පවතින ආයෝජන සාධාරණ අගය අනුව තක්සේරු කෙරේ. කල්පිරීම තෙක් රඳවාගත් සහ ණය සහ ලැබිය යුතු දේ ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය අනුව තක්සේරු කෙරේ.

B. පරිපාලිතයන්හි ආයෝජන

	2021	2020
	රු. 000'	රු. 000'
	3,296,543	1,296,543

	සටහන	2021	2020
		රු. 000'	රු. 000'
පිරිවැය අනුව			
ප්‍රකාශිත පරිපාලිත	B.1	1,296,543	1,296,543
අප්‍රකාශිත පරිපාලිත	B.2	2,000,000	-
		3,296,543	1,296,543

B.1 ප්‍රකාශිත පරිපාලිත

	2021			2020		
	කොටස් සංඛ්‍යාව	ධාරණ අගය රු. 000′	සාධාරණ අගය රු. 000′	කොටස් සංඛ්‍යාව	ධාරණ අගය රු. 000′	සාධාරණ අගය රු. 000′
ලංකා හොස්පිටල්ස් කෝර්පරේෂන් පීඑල්සී	58,781,308	1,296,543	3,279,997	58,781,308	1,296,543	3,162,434
	58,781,308	1,296,543	3,279,997	58,781,308	1,296,543	3,162,434

B.2 අප්‍රකාශිත පරිපාලිත

	2021		2020	
	කොටස් සංඛ්‍යාව	ධාරණ අගය රු. 000′	කොටස් සංඛ්‍යාව	ධාරණ අගය රු. 000′
කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම	235,294,117	2,000,000	-	-
	235,294,117	2,000,000	-	-

C. රක්ෂණවරහිමියන් වෙත ණය

	2021 රු. 000′	2020 රු. 000′
රක්ෂණවරහිමි ණය	1,637,187	1,734,722
	1,637,187	1,734,722

D. වෙනත් වත්කම්

	2021 රු. 000′	2020 රු. 000′
තොග	97,275	49,167
වෙනත් ණයගැතියන් සහ ලැබිය යුතු දේ	176,693	170,662
වෙනත් ණය	2,506,115	2,404,777
සාමාන්‍ය රක්ෂණ අංශයෙන් හිඟ මුදල	263,713	714,188
ණය මත පෙරදායක ප්‍රතිලාභය	495,647	538,986
	3,539,443	3,877,779

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් - ජීවිත රක්ෂණ අරමුදල

E. දේපළ, පිරියත සහ උපකරණ

සින්නක්කර	ඉඩම් රු. 000′	ගොඩනැගිලි රු. 000′	එකතුව රු. 000′
පිරිවැය			
2021.01.01. දිනට ශේෂය	43,530	47,193	90,723
එකතු කිරීම්	-	-	-
ප්‍රත්‍යාගණනය	4,638	2,579	7,216
ප්‍රත්‍යාගණන සංචිතය වෙත පවරන ලද සමුච්චිත ක්ෂය	-	-	-
2021.12.31. දිනට ශේෂය	48,168	49,772	97,939
සමුච්චිත ක්ෂය			
2021.01.01. දිනට ශේෂය	-	4,719	4,719
කාලසීමාව සඳහා ක්ෂය අයකිරීම්	-	2,360	2,360
ප්‍රත්‍යාගණන සංචිතය වෙත පවරන ලද	-	(7,079)	(7,079)
2021.12.31. දිනට ශේෂය	-	-	-
ධාරණ අගය			
2021 දෙසැම්බර් 31 දිනට	48,168	49,772	97,939

F. විකිණීම සඳහා පවතින සංචිතය

පිළිවෙලින් ජීවිත රක්ෂණවර හිමියන් රු.මිලියන 4,584 කට සහ කොටස් හිමිකරුවන් රු. මිලියන 3,260 කට හිමිකරගැනීමේ සුදුසුකමක් ලබයි.

G. ආදායම් සංචිතය

	සටහන	2021 රු. 000′	2020 රු. 000′
පොදු සංචිතය		42,100	42,100
විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණන ලාභ/(අලාභ) සම්බන්ධ සංචිත		(46,924)	(457,504)
ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් අතිරික්තය	G.1	18,386,454	13,402,666
		18,381,630	12,987,262

G.1. ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙන් අතිරික්තය

	2021 රු. 000′	2020 රු. 000′
ජනවාරි 01 දිනට ශේෂය	13,402,666	11,257,397
ජීවිත රක්ෂණ වෙතින් කොටස් හිමිකරුවන් වෙත ආරෝපනය කල යුතු අතිරික්තය	4,983,788	2,145,269
දෙසැම්බර් 31 දිනට ශේෂය	18,386,454	13,402,666

H. රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත

	2021 රු. 000'	2020 රු. 000'
ජීවිත රක්ෂණ අරමුදල	129,151,483	112,914,376
අරමුදලෙහි සංචලනය	23,832,975	18,263,974
විකිණීම සඳහා පවතින වශයෙන් කොටස් හිමිකරුවන් වෙත වෙන් කරන ලද ප්‍රවර්තන වසර ලාභ පැවරුම	-	118,402
දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය වෙතින් පවරන ලද අතිරික්තය	(4,983,788)	(2,145,269)
	148,000,670	129,151,483
විකිණීම සඳහා පවතින සංචිත		
විකිණීම සඳහා පවතින සංචිත - ජීවිත අරමුදල	4,584,389	4,862,059
රක්ෂණාවර හිමි හිඟ හිමිකම්පෑම්	3,203,869	3,115,494
	155,788,928	137,129,036

I. වෙනත් වගකීම්

	2021 රු. 000'	2020 රු. 000'
කල්තබා ලද වාරික	287,586	293,850
වෙළඳ ණය හිමියන් සහ උපචිත වියදම්	2,793,193	2,967,121
	3,080,779	3,260,971

දස වසරක් සාරාංශ ආදායම් ප්‍රකාශය

	2021	2020	2019
	රු. 000'	රු. 000'	රු. 000'
සාමාන්‍ය රක්ෂණ			
දළ ලිඛිත වාරිකය	21,255,023	20,163,296	18,974,323
ප්‍රතිරක්ෂණ	(4,029,008)	(3,133,728)	(3,358,526)
නොඉපැයූ වාරිකය	(325,424)	(1,667,533)	(306,793)
ශුද්ධ ඉපැයුම් වාරිකය	16,900,591	15,362,035	15,309,003
ශුද්ධ දරන ලද හිමිකම්පෑම්	(10,206,589)	(7,786,221)	(9,290,432)
ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කරගැනීමේ වියදම්/කොමිස් වියදම්	(653,821)	(864,830)	(967,782)
මෙහෙයුම් සහ පරිපාලන වියදම්	(5,457,312)	(5,047,881)	(4,546,109)
ආයෝජන සහ වෙනත් ආදායම්	4,655,818	3,159,227	4,483,050
බදු වලට පෙර ලාභය	5,238,687	4,822,331	4,987,730
බදු	(181,339)	(1,179,070)	(330,151)
බදු වලට පසු ලාභය	5,057,348	3,643,261	4,657,579
දිගු කාලීන			
දළ ලිඛිත වාරිකය	21,975,988	19,257,997	14,820,025
ශුද්ධ ලිඛිත වාරිකය	21,496,234	18,844,423	14,463,057
ආයෝජන සහ වෙනත් ආදායම්	21,082,101	15,321,245	14,425,899
ශුද්ධ දරන ලද හිමිකම්පෑම්	(9,978,828)	(7,986,076)	(7,333,265)
කොමිස් වියදම්	(2,566,486)	(2,131,963)	(2,018,406)
මෙහෙයුම් සහ පරිපාලන වියදම්	(4,697,086)	(4,779,473)	(4,660,164)
ගිවිසුම් වගකීම් වල වෙනස්වීම - ජීවිත අරමුදල	(18,849,187)	(16,118,705)	(11,659,844)
බදු වලට පෙර ලාභය	6,486,748	3,149,451	3,217,278
බදු	(1,502,959)	(1,004,178)	(845,900)
බදු වලට පසු ලාභය	4,983,789	2,145,273	2,371,377
සමස්ත ව්‍යාපාරය			
ආදායම	64,062,308	52,614,495	48,608,571
දළ ලිඛිත වාරිකය	43,231,011	39,421,293	33,794,347
ශුද්ධ ඉපැයුම් වාරික	38,396,825	34,206,458	29,772,061
ශුද්ධ දරන ලද හිමිකම්පෑම්	(20,185,417)	(15,772,297)	(16,623,696)
ගිවිසුම් වගකීම් වල වෙනස්වීම - ජීවිත අරමුදල	(18,849,187)	(16,118,705)	(11,659,844)
ආයෝජන සහ වෙනත් ආදායම්	25,665,483	18,408,038	18,836,510
ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කරගැනීමේ වියදම්/කොමිස් වියදම්	(3,220,308)	(2,996,793)	(2,986,189)
